# 2020 ජුලි මස 07 වන දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පැවති මාසික සභා රැස්වීම් වාර්තාව

**<u>සහභාගිත්වය</u>**

| | |
|---|---|
| ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා | ගරු සභාපති |
| ජී. සරත් ශ්‍රී ලාල් මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඒ.ඩබ්. ජගත් කුමාර මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ග්‍රේෂන් කෙරම්ණියගේ මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඒ.පී ලක්ෂ්මි හේමන්තා මැතිතුමිය | ගරු නගර සභා මන්ත්‍රී |
| දිනයාදුර ධර්මදාස මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| නන්දන රාජපක්ෂ මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ලලිත් ධම්මික කොඩිකාර මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඩෙනට් පනියන්දුවගේ මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඩබ්.ඒ. සෝභිත රංජිත් මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| මහගේ අතුල ප්‍රියන්ත මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඊ.ඉන්ද්‍රා අයිරාංගනි මැතිතුමිය | ගරු නගර සභා මන්ත්‍රී |
| ජී.ජී. ආර්. පේෂලා කුමාරි මැතිතුමිය | ගරු නගර සභා මන්ත්‍රී |
| එච්. ඉනෝකා ක්‍රිශාන්ති මැතිතුමිය | ගරු නගර සභා මන්ත්‍රී |
| රාහුල ලලිත වික්‍රම මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඩබ්.එම්. නිලානි මැතිතුමිය | ගරු නගර සභා මන්ත්‍රී |
| ධනසේන මාදුවගේ මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| එස්.එම්.සරත් චන්ද්‍ර මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |

- **පන්සිල් සමාදන් විමෙන් අනතුරුව පෙ.ව.9.35 ට රැස්වීමේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී**

**( 01 )** සභා රැස්වීම් වාර්තා සම්මත කිරිම

**01.01** 2020.06.02වන දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාව සම්මත කිරිම

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

2020.06.02 වන දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාව සම්මත කිරිම.

**<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා කතා කරමින්</u>**

2020.06.02 වන දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාව සම්මත කිරිම සුදුසු බවට යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා කතා කරමින්</u>**

එම වාර්තාව මා ස්ථිර කරනවා.

**තීරණය**

2020.06.02 වන දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාව පිළිගත යුතු බවට ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**( 02)** සභාපතිවරයා විසින් නිකුත් කරන විශේෂ නිවේදන **නැත**

**( 03)** ලැබී ඇති පැමිණිලි , පෙත්සම් හා ලිපි සභාවට ඉදිරිපත් කිරිම

**03.01 මුල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ජාතික විගණන කාර්යාලය. අම්බලන්ගොඩ නගර සභාවේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 11( 1) වගන්තිය ප්‍රකාර විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව . යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත. මුල්‍ය ප්‍රකාශන . තත්වාගණනය කළ මතය: අම්බලන්ගොඩ නගර සභාවේ 2019 දෙසැම්බර් 31 දිනට මුල්‍ය තත්ත්ව ප්‍රකාශනය , එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය , මුදල් ප්‍රවාහ ප්‍රකාශනය , වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ

තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ 225 වන අධිකාරය හා එම පනතේ 181 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 11(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ. මාගේ වාර්තාවේ තත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර නගර සභාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ කියා මතය ප්‍රකාශ කර තිබෙනවා. ඊට අමතරව තත්වාගණනය කළ මතය සඳහා වූ පදනම : ගිණුම්කරණ අඩුපාඩු , නොසැසඳු පාලන ගිණුම්, ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් , ගෙවිය යුතු ගිණුම් , විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම, තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරිම, මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකිම, මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකිම හා වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාර්තාව , පොඩි පොඩි අඩුපාඩුකම් තිබෙන බව සඳහන් කර වෙනම ඇමුණුමක් තිබෙනවා. දැනට එතුමා ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සර්ව හා සාධාරණත්වයක් පෙන්නුම් කරන බව මා විසින් ප්‍රකාශ කරන මතය බව ප්‍රකාශ කර තිබෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මොන මාසයේද මේ

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා. ගිය අවුරුද්දේ.

**තීරණය -**

අම්බලන්ගොඩ නගර සභාවේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාර විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව ගරු සභාවේ දැනගැනීම පිණිස ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් ඉදිරිපත් කරන ලදී.

**03.02 විලේගොඩ හල්වතුර අවමංගල්‍ය හා සුභ සාධක සංගමයට පුටු සියයක් ඉල්ලා ප්‍රජා සංවර්ධන නිලධාරී විසින් ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්රදීප් මහතා කතා කරමින්</u>**

විලේගොඩ හල්වතුර අවමංගල්‍ය හා සුභ සාධක සංගමයට පුටු සියයක් ඉල්ලා සිටිම සම්බන්ධවයි. අම්බලන්ගොඩ නගර සභා සිමාවේ විලේගොඩ ග්‍රාම නිලධාරි වසමේ විලේගොඩ හල්වතුර අවමංගල්‍ය හා සුභ සාධක සංගමයට අඩුපාඩුවක්ව පවතින පුටු 100ක් ඔබතුමාගේ අනුග්‍රහය යටතේ අප සමිතියට ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා. සභාපති , ලේකම් , භාණ්ඩාගාරික ලිපියක් ඉදිරිපත් කර තිබෙනවා. එය ප්‍රජා සංවර්ධන නිලධාරි විසින් මේ විදියට වාර්තා කර තිබෙනවා. අම්බලන්ගොඩ විලේගොඩ ප්‍රජා මණ්ඩලය සක්‍රිය සංවිධානයක් වේ. එමනිසා විලේගොඩ ගම් වාසින්ගේ පොදු අවස්ථාවලදි පාවිච්චි කිරිමට විලේගොඩ ප්‍රජා මණ්ඩලය විසින් ඉල්ලිමක් කරන්නේ නම් ප්‍රජා මණ්ඩලයේ මුදල් නිදහස් කිරිම හෝ සභා අරමුදල් නිදහස් කර එම අවශ්‍යතාවය සම්පූර්ණ කළ හැක. මේ ඉල්ලිම තිබෙන්නේ හල්වතුර අවමංගල්‍ය හා සුබ සාධක සමිතියෙන්. මේ ඉල්ලිම විලේගොඩ ප්‍රජා මණ්ඩලය මඟින් ඉදිරිපත් කරනවානම් මේ ඉල්ලිම ඉෂ්ඨ කරන්න පුළුවන් කියා තමයි තිබෙන්නේ. ඒ අනුව නිවැරදි ඉල්ලිමක් ඉල්ලුම් කරන්න.

**තීරණය -**

විලේගොඩ, හල්වතුර අවමංගල්‍ය හා සුභ සාධක සංගමයට පුටු සියයක් ලබාදෙන ලෙස ඉල්ලා හල්වතුර අවමංගල්‍ය හා සුභසාධක සංගමය විසින් එවා ඇති ලිපිය අනුව, එම ඉල්ලීම කළ යුත්තේ විලේගොඩ ප්‍රජා මණ්ඩලය විසින් බැවින් නිවැරදිව ඉල්ලීමක් කරන ලෙස ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් දන්වන ලදී.

**03.03 2020 මැයි මස නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ මාසික වාර්තාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ආයතනයේ සායන තැබූ ගණන 16 ½ , ආයතනයට පැමිණි රෝගින් සංඛ්‍යාව 542, රෝගින් පැමිණිමේ දෛනික සාමාන්‍ය ගණන 33, මාසය සඳහා වැය වූ ඖෂධවල මුළු වටිනාකම රු.45824.90, එක් රෝගියෙකු සඳහා වැය වූ මුදල රු.84.55 ක් වශයෙන් දක්වා තිබෙනවා. මෙය සභාවේ දැන ගැනිම සඳහා ඉදිරිපත් කර තිබෙනවා.

**තීරණය -**

2020 මැයි මස නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ මාසික වාර්තාව ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් ගරු සභාවේ දැනගැනිම පිණිස ඉදිරිපත් කරන ලදී.

**03.04 සුදු කොඩි මැසීම සඳහා ලබාගත් අත්තිකාරම් මුදල පියවීමට අනුමැතිය ඉල්ලා සංවර්ධන නිලධාරී මධූෂා විතානාච්චි මහත්මිය විසින් ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

සුදු කොඩි මැසිම සඳහා ලබා ගත් රු.10000/= අත්තිකාරම් මුදලින් පහත වියදම් දරා ඇත. බිල්පත් අංක 01)රු.4100/=, බිල්පත් අංක 02) රු.2650/=. මෙම රෙදි අරගෙන තිබෙනවා. එම රෙදි වලට බිල්පත් කර තිබෙනවා රු.4920/= ක් . වට්ටමක් දි තිබෙනවා රු 850/=ක් . රු.4100/= ලබා දි තිබෙනවා. මැහුම් කුළි 2650/=. මෙය හදිස්සි අවශ්‍යතාවයක්. සම්පූර්ණම කොඩි ජාරා වාසයට පත්වෙලා තිබුණා. අපේ සභාවට විශාල සේවයක් කරපු අපේ වැඩ පරිපාලක ඇල්ටන් මහතා මිය ගියා. අපට ඇත්තටම කළුපාට වු කොඩිවගයක් තමයි තිබුණේ. එමනිසා අපි කල්පනා කළා. එතුමා කළ සේවයත් සලකා හදිසි මිල ගණන් කැඳවා ඉතා අඩු මුදලට මෙය කර ගැනිමට. මේ සඳහා සම්පුර්ණ මුදල ගිහින් තිබෙන්නේ රු.6750/= ක් පමණි. ඒ සඳහා සභාවේ අනුමැතිය සඳා ඉදිරිපත් කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රි මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , මේ සම්බන්ධව කතා කළ යුතුයි. ඔබතුමා කිවූ පරිදි මේවා ජාරා වෙලා තිබුණා. සතුටු වෙනවා ඒ අවස්ථාවේ කොඩි ටික මසා එම කාර්ය ඉටු කිරිම සම්බන්ධව. පොඩ්ඩක් මා චෝදනා කරනවා. මේ සේවකයන්ට මේ කොඩි ගැලවිමේදි හා සවිකිරිමේදි කොඩි ටික පරිස්සම් කරලා වැඩි කාලයක් පාවිච්චි කළ හැකි අයුරින් මේ කාර්ය සිදු කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මෙහිදි ඇත්තටම ගරු මන්ත්‍රිතුමා වෙන්නේ අපි කොඩි ගසා දෙනවා. මේවා ගලවා බිම දමනවා. ඒ අපේ වැසියන්ගේම ප්‍රශ්න තමයි. අපි කවදාවත්ම කොඩි පාවිච්චි කළා කියා අපි මුදල් අය කරන්නේ නැහැ. අපි මෙය නගර සභාව සේවාවක් වශයෙන් තමයි කරන්නේ. මෙවැනි අවස්ථාවකදි දුර්වර්ණ වීම වෙනවා ඇත්තටම. කරන්න දෙයක් නැහැ. හැම දෙයක්ම නැතිවෙන සුළු දෙයක්නේ. විශේෂයෙන් මරණයක් වුණොත් සුදු කොඩි ගසා දීම, පුටු ලබා දීම , ටේන්ට් එක ලබා දීම අපේ නගර සභාවෙන් කළ යුතු සේවාවක් . එක ජනතාව අභය කරනවා.

පක්ෂභේදයකින් තොරව. මිනිසුන්ට වන සේවය අනුව. එමනිසා අපි ඉදිරියටත් මෙය මේ විදිට කරගෙන යන්නම්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්.ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>**

මෙය පාවිච්චි කර ගෙනාවිට පිරිසිදු කර ගෙන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

සාමානයෙන් මාසයකට එන මළ ගෙවල් බැලුවාම මේක හොඳන්නවත් වේලාවක් නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්.ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමා දැන් කොඩි කොච්චර ප්‍රමාණයක් මසා තිබෙනවාද?

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

දැන් අපි අලුතින් කොඩි 100ක් ගෙන්වීමට අනුමතිය ඉල්ලනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්.ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , කොඩි 100ක් තිබෙනවා නම් 50ක් සෝදා දෙන්න පුළුවන්. එතකොට ඡාරා වෙන්නේ නැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

දැන් වෙලා තිබෙන්නේ සාමාන්‍යයෙන් එක මළගෙදරක කොඩි 20ක් වත් ගහනවා. එතකොට මළ ගෙවල් 5ක් අවොත් මේ කොඩි 100ම යනවා. මේ මළ ගෙවල් තිබෙන අතර තමයි ඊළඟ මළ ගෙදර එන්නේ. සමහර වේලාවට ඒ මළගෙදර වැඩ කරනකම් බලන් ඉන්නවා කොඩි ටික ගලවන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්.ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමා තව සියයක් මසා ගන්න. එතකොට සියයක් පිරිසිදු කරන කොට අනිත් සියය දෙන්න පුළුවන්.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඉතිං යෝජනාවක් වශයෙන් ගෙන්න.

**ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්.ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්**

එතකොට හැම තිස්සේම පිරිසිදු වෙලා තිබෙනවානේ.

**ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්**

කොට්ඨාශ මට්ටමින් කළානම් හරි. කොට්ඨාශ මට්ටමින් කොඩි ටික ලබා දෙන්න වැඩ කටයුතු කළානම් හරි.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

එතකොට රැක බලා ගැනීම කවුද කරන්නේ.

**ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්**

ගරු සභාපතිතුමනි , ඇත්තටම මම නම් අදහස් කරන්නේ. අපි කොඩි ලබා දීම සිදු කරනවානේ. හැබැයි කොඩි අරගෙන යන්නේ මා නම් මාත් ටිකක් වගකියන්න වෙනවා. එය සභාවට ම කරන්න බැහැ. මානේ ඉල්ලාගෙන යන්නේ. මාත් චුට්ටක් වගකියන්න ඕන. කොඩි කණු බිම දමන ඒවා . මිනිසුන්ට ඕන විදියට කළොත් ඒවා විනාශ වෙලා යනවා. ඉවර ඉවර වෙන්න ගෙන එක නෙමේ වැඩේ. ඒවා ආරක්ෂා කරන එකයි. කොඩි 200ක් ගන්න එක හොඳයි. කොඩි සවිකිරිමේදි එය සේවකයන් සවි කරනවානම් මාත් වගකියන්න ඕන කොඩි කණු වලට මොනවාද වෙන්නේ කියා. එකත් අපි අවධානය වෙන්න ඕන. කොඩි ඉල්ලා ගන්නවා වගේම. අපි සේවය තමයි සපයන්නේ. එහෙත් හැම තිස්සේම විනාශ වෙනවා කියා එහෙම කරන්න . එක ආරක්ෂා කර ගන්න ගමන් වැඩය කෙරෙන්න ඕන. මොකද කම්කරුවන්ගේ පලියට දමා එගොල්ලන්ටම කරන්න දෙන්න හොඳ නැහැ. එහෙම බැහැ. අපි දෙයක් සපයන්නේ සේවයක් වශයෙන් අපි උදවු කරනවා. එම කොඩි කණු හිටවා දෙනවා. ඇත්තටම මගේ මළ ගෙදර අරගෙන ගිහින් මා කොඩි කණුටික ගලවා , නවලා ඔක්කොම කරලා දුන්නේ. මේක මා ආරක්ෂා කළා. සභාවේ නිසා. අපි ගෙනගිය හැම ගෙදරකටම අපි කවුරු හරි වගකීමක් අරගෙන මෙය අපේ කම්කරුවන් පැමිණ සවිකළා. එය පරිස්සම් කර ගන්න. එකත් කම්කරුවන්ගේ පලියටම තියන්න එපා. එකත් අපි මන්ත්‍රීවරු ඉල්ලා ඇවිත් ගෙනියනවා නම් එකත් අවධානයෙන් කරන්න.

**ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි , මේ කොඩි ගෙන යන විට ගිය පෝය දිනයේ හා ඉරිදා දිනයේ මළගෙදරක් සිදු වුණා. එහිදි බඩුටික ලබා ගැනීමේදි දැඩි අපහසුතාවයකට පත්වුණා. ඒ අවස්ථාවේ කොඩි කණුටික අරගෙන යාමට රියදුරු මහතෙකු සිටියේ නැහැ. වාහනයක් හරි ගෙනවිත් ගෙනියන්න තිබුණා. ඒ අවස්ථාවේ මහජන සෞඛ්‍ය පරික්ෂක යසවර්ධන මහතා තමයි වාහනයක් සොයා බඩුටික පටවා එවා තිබුණේ. අන්න ඒ නිවාඩු දිනවලට මොකක් හරි වැඩ පිළිවළක් යොදන්න.

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා  කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, මා හිතන්නේ විශාල සේවාවක් වෙනවා මේ කොඩි සවිකිරිමේදි . ආරක්ෂා කර ගැනීමත් අපේ යුතුකමක් වෙනවා. එමනිසා මොනවාහරි ක්‍රමවේදයකට යන එක හොඳයි. මොකද සමහර මළ ගෙවල් වල ගලවන්න සේවකයා එනකම්ම කොඩි ටික පාරේ. ගලවලා නැහැ. නිවාඩු දවස් වුණාම ඊට පස්සෙන්දා වෙනකම්ම කොඩි කණුටික ගලවා නැහැ. ඒ ගෙදර අයත් එච්චර සැලකිල්ලක් නැහැ. මොකද ඒ අයට සේවාවක් දුන්නාට එච්චර හිතට ගන්නේ නැහැ . ඒ පාර ඕවා ගලවන්න ගියාම ඇඳලා මඩ තැවරෙනවා. නමුත් ආරක්ෂා කර ගත යුතුයි. එකටත් අපි ක්‍රමවේදයක් සකස් කර ගත යුතුයි. ගරු නගර සභා මන්ත්‍රී නිලානි මෙනවිය කියන කතාවත් හරි. කොට්ඨාශ මට්ටමින් එහි වගකිම දිම , ගරු මන්ත්‍රිවරුත් එහි වගකිම ගත යුතුයි. හැමෝටම රැකියාවල් වලට ගියාම ඕක කරන්න බැරි තත්ත්වයකුත් තිබෙනවා. මා හිතන්නේ මොනවා හරි ක්‍රමවේදයක් අනුගමනය කර එය කරන්න. අපි කලිනුත් සියයක් ගෙනවා. මා හිතන්නේ දැන් ඒවා තියෙනවාද දන්නේත් නැහැ. පයිප්ප සියයම තියෙනවාද ? මා හිතන්නේ සියයම නැහැ කියා.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

මේ සම්බන්ධව අපි කලින් අනුගමනය කළ යුතු ක්‍රමය අනුගමනය කළ යුතු වෙනවා. මේ සම්බන්ධව අපි පුටුවක් හරි කොඩි කණුවක් හරි ලබා දෙනවා නම් ඒ අදාළ මන්ත්‍රිවරයෙක් වගකිම සඳහා අත්සන් කළ යුතුයි. වර්ෂ අවසානයේ අපි අත්සන් කරන ලද මළගෙවල් වලින් පුටුවක් අඩු වුණත් පුටුවේ වටිනාකම අපට ගෙවන දිමනාවෙන් කපා අයින් කළා. දැන් වෙලා තිබෙන්නේ මන්ත්‍රිතුමා දුරකථන ඇමතුමක් දෙනවා . එතකොට මේ අය ගිහින් මෙය හිටවනවා. එහෙම හිටවනවා නම් මෙහෙම සේවාවක් අපේ මහජනතාවට දෙනවා නම් වගකිම අපිත් ගත යුතු වෙනවා. ඒ කියන්නේ බටවලට සහ කොඩි වලට තිබෙන වගකිම සභාවේ සිටින මන්ත්‍රිවරයෙක් අත්සන් කළ යුතු වෙනවා. එය කලින් තිබුණ ක්‍රමය? දැන් ඔබතුමා අසන ලද දෙයට පිළිතුරු දෙන්න ගියොත් එහෙම .කවදා හරි පිළිතුරු හම්බ වෙනවා. දැනට ඉන්වෙන්ට්‍රි භාණ්ඩ භාරව

සිටින පුද්ගලයාගේ පඩියෙන් කැපෙනවා. අඩුම ගණනේ මන්ත්‍රීතුමා එහි වගකීම දරනවා නම් නිලධාරියා විසින් කියනවා මන්ත්‍රීතුමා අපි අහවල් මළ ගෙදරට ගෙනියන ලද බටයක් අඩුවෙන් ගෙනාවේ. එතකොට මන්ත්‍රීතුමාට විමසීමක් කරලා මෙය සොයා දෙන්න පුළුවන් . නමුත් දැන් මේ යන ක්‍රමයට කවදාහරි දිනයක මේ බට වලින් මෙච්චර සංඛ්‍යාවක් අඩුයි කියා කිවූ විට එයාගේ ඉන්වෙන්ට්‍රිය බැලුවාම ඉන්වෙන්ට්‍රි භාණ්ඩ අඩුවීම මත ඔවුන්ගේ වැටුපෙන් කැපෙනවා. එමනිසා වගකීම වෙනදා වගේ මන්ත්‍රීවරු අපේ වගකීම දරනවා. අපේ අයදුම්පතක් තිබෙනවා. අයදුම්පත අත්සන් කර අපි එය දැරුවාට පසු අපි දන්නවා මෙතනට පුටු සියයක් ගෙනිච්චා , මෙතැනට බට කියක් ගෙනිච්චාද කියා. කොඩි 20ක් ගෙනිච්චා කියන එක අපි දන්නවා. මෙතනට ලැබුණාමත් ඒ පුද්ගලයා අපි වගකීම දන්නවා. ඒ තිබුණ ක්‍රමය ඇත්තටම ලේකම්තුමිය අපි එය ක්‍රියාත්මක කරන්න. නිලධාරින් අමාරුවේ වැටෙන්න එපා නිකං.

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

මා මෙය කතා නොකරම හිටියේ. නිකුත් කරන විට වගකීම ගත යුතුයි. අපේ කොට්ඨාශයේ මළ ගෙදරක සමාජ සේවය කරන කොට නිතිය ක්‍රියාත්මක කරන්න ඕන. මොකද නිලධාරිනුත් ආරක්ෂා කර ගත යුතුයි. සමහර වේලාවට ඔය වගේ ප්‍රශ්න ගැටළු ඇතිවෙන්න පුළුවන්. කොඩි කණුවක් නැති වෙන්න පුළුවන් . එය සොයා දිමේ වගකිම අපේ තිබෙනවා නේ. ඒක හොඳයි. ඒ වැඩ පිළිවළ හොඳයි. කොට්ඨාශ මට්ටමින් හරි කරන වැඩ පිළිවළක් යොදන්න. මේ වැඩ සටහන හොඳයි. මොකද මරණය ගෙදරට ගෙන්නත් කලින් කොඩි ටික වදිනවා. මිනිසුන් දන්නවා ඒක හොඳයි. එමනිසා එක ක්‍රියාත්මක කරන්න.කොට්ඨාශ මට්ටමින් හරි ක්‍රියාත්මක කරන්න.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

කොට්ඨාශ මට්ටමින් හරි විමධ්‍යගත වෙන කාට කොට්ඨාශ මට්ටමට දැන් මේ කරන සේවය කරන්න පුළුවන් වෙවිද කියන එක තමයි ගැටළුව. දැන් අපි මෙය සභාවෙන්ම හිටවා නැවත මෙය සභාවෙන් ගලවා ගෙන යනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

එකත් හොඳයි. දැන් මෙහෙම ප්‍රශ්න ගැටළු ආවාම කොට්ඨාශ මට්ටමින් යනකොට. එහෙම බැරිනම් අර විදියට යනවා නම් නගර සභාවෙන් කරනවා නම් මන්ත්‍රීවරයාට වගකීම දෙන්න.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

එයට වැඩපිළිවළක් යොදන්නම්.

**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මේ ආකාරයට අපි දකින්නේ මේ ක්‍රියාවලියේ එක පැත්තක්. ඉතාමත් ලොකු දෙයක් ඉතාමත්ම කලෝචිත දෙයක් . හැබැයි මේ ක්‍රියාවලිය නිසා නගර සභාවේ කර්මාන්ත අංශයට සිදුවන හානිය පිළිබඳව අපි කල්පනා කර නැහැ. මරණ තුනක් වුණොත් එදාට සභාවේ කිසිම වැඩක් කරන්න බැහැ. මරණ දෙකක් වුණත් කරන්න බැහැ. මරණයක් වුණත් කරන්න බැහැ. මොකද මේ සියළු වැඩ නතර කර කොඩි දමන්න යන්න ඕනැ. ඔබතුමා කිවුවත් මා කිවුවත් මේ සියළු මන්ත්‍රීවරු කිවුවත් ගරු කරලා මෙය සිදු කරන්න ඕන. එක්කෝ අපි තුන්දෙනෙක් හතර දෙනෙක් මේ කාර්ය සඳහා පුද්ගලිකව හෝ යොදවන්න වෙනවා. මේ කොඩි සම්බන්ධවත් කතා කළා. මේ කොඩි සම්බන්ධව අපට රෙදි අපුල්ලන කෙනෙකුගේ සේවය ලබා ගන්න පුළුවන් ඉතාමත් හොඳින්. එය අවසන් කර එයාට භාර දුන්නාම එය මැද මෙතනට ගෙනවිත් භාර දෙනවා. මේ මුදල් ගෙවීමේදි අපට ඒ සියල්ලටම අත ඔසවන්න පුළුවන්ද කියන ගැටළුවත් තිබෙනවා. ඒ හැරෙන්නට මේ මන්ත්‍රීවරයාට මේ සභාවේ මේ සඳහා යම් ගාස්තුවක් අය කරනවාද කියන එක. ඒ කියන්නේ කොඩි කණු අවශ්‍ය අයට විතරයි එතකොට ලබා දෙන්න අවශ්‍ය වෙන්නේ. රු.1000/= හරි රු.2000/= හරි යම්කිසි සාධාරණ ගාස්තුවක් සභාවට ගෙව්වාම ඒ ගාස්තුවට අදාල කුලි කරුවන් තුන්දෙනෙක් හෝ දෙදෙනෙකු යොදවන්න පුළුවන්. එදාට අපේ නිලධාරින්ට තාවකාලිකව සේවකයන් ගැනීමේ හැකියාව තිබෙනවා. මෙය මේ මා කතා කරන්නේ සභාව පැත්තෙන් හිතා. මෙය ජනතාව පැත්තෙන් හිතුවාම මේ යෝජනාවට සමහර වේලාවට කැමති නැති වෙන්න පුළුවන්. ලොකු මුදලක් නෙමේ . රු.1000/=ක රු.2000/= ක මුදලක් සංකේතවත් කරන මුදලක් අවොත් ඒ රෙදි ටික ලබා දිමේ වගකීමත් ඔවුන් දරනවා. මෙහිදි පුටු , කොඩි කණු. මේ සියල්ලටම එක මුදලක්. එතකොට එම සේවය මේ ඔබතුමා හරහා මේ මන්ත්‍රීවරු හරහා ලබා දෙනවා. අසරණ වෙන්නේ අකර්මණ්‍ය වෙන්නේ අපේ සභාව. සභාවේ ක්‍රියාවලිය ඔබතුමා නියම කර තිබෙනවා පාරේ තාර දමන්න. එතකොට ඒ දිනයේ තාර දමන්නේ නැහැ. එතකොට එය නතර කර තමයි මේ ක්‍රියාවලිය කරන්න වෙන්නේ. තේරුම් ගන්න. මාගේ අදහසක් විතරයි මා මේ ඉදිරිපත් කරන්නේ. මෙකත් සලකා බලන්න. ඔබතුමා මේ පිළිබඳව තින්දුවක් ගන්න.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

මේ ගැන අපි ටිකක් හිතන්න ඕන. අය කිරිමක් ගැන බැලුවාම දැනට අපි මෙය කරන්නේ දුප්පත් පොහොසත් භේදයකින් තොරවයි මෙය සිදු කරන්නේ. දැන් මරණයක් වුණාම කොඩි දමන එක මෙතනින් බට ගෙනහින් දමා ගන්නවා කියන එක ටිකක් ප්‍රශ්නයක්. මොකද මරණයක් වුණාම දැන් වෙනදා වගේ ගමේ ළමයින් නැහැ. අපි පොඩි කාලේ වෙසක් එකට ගමේ කොඩි ටික

දමනවා. මරණයක් වුණත් අපි ගිහින් රට කොඩි ටික දමනවා. දැන් මළ ගෙදරක් වුණාම කරන්න ගම්වල පිරිසුත් නැහැ. ඇත්තටම එහෙම තැන් රාශියක් අම්බලන්ගොඩ තිබෙනවා. මුදල් තිබෙන තැන් ඉටිකොළ අඳිනවා. දැන් මෙයින් අපි පරිසරය දූෂණය වෙන එක වැලැක්කුවා. අපිට පරිසරය පැත්තෙන් තිබෙන ලාභය තිබෙනවා. වෙනදා මුදල් තිබෙන කෙනා ඉටිකොළ ඇඳගෙන ඇඳගෙන යනවා. අපි සුදු කොඩි දුන්නාට පසු මෙය දැන් නැතිවුණා. මෙය සේවාවක් වශයෙන් අපි ඉදිරියටත් පවත්වාගෙන යන්න. සභාවේ කාර්ය භාර්යට බාධාවක් නොවන පරිදි පවත්වාගෙන යාමට අපි කළමනාකරණ කමිටුවේදි සාකච්ඡා කරන්න පිළියමක් යොදා සභාවට වාර්තා කරන්නම්.

**තීරණය -**

සුදු කොඩි මැසීම සඳහා ලබාගත් රු.10000/- ක අත්තිකාරම් මුදල පියවීමට අනුමැතිය ඉල්ලා සංවර්ධන නිලධාරී මධූෂා විතානාච්චි මහත්මිය විසින් ඉදිරිපත් කර ඇති ලිපිය අනුව, ඒ සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.05 අම්බලන්ගොඩ ප්‍රධාන බස් නැවතුම්පල පරිශ්‍රයේ ඇති පොදු වැසිකිළියේ වහලයේ අලුත්වැඩියා කටයුතු සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබාදෙන ලෙස ඉල්ලා තාක්ෂණ සේවා නිලධාරී විසින් ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

අම්බලන්ගොඩ බස්නැවතුම්පොළ ප්‍රධාන පොදු වැසිකිළියේ වහලයේ අලුත්වැඩියා කටයුතු සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබාදෙන ලෙස ඉල්ලා තාක්ෂණසේවා නිලධාරි විසින් ඉදිරිපත් කරන වාර්තාව. අම්බලන්ගොඩ බස්නැවතුම්පොළ ප්‍රධාන පොදු වැසිකිළියේ වහලයේ අලුත්වැඩියා කටයුතු සිදි කිරිම මේ වනවිට සිදු වෙමින් පවති. බාහරින් බැලුවිට නොපෙනෙන වහලයේ අලුත්වැඩියාවන් සිදු කළ යුතුව බවට අලුත්වැඩියාවන් සිදු කරන අවස්ථාවේදි නිරික්ෂණය විය. ඒ අනුව ඇස්තමේන්තු නොකරන ලද වහලයේ අලුත්වැඩියාවන් කටයුතු ස්ථානයන් පිළිබඳ අවශ්‍ය අමුද්‍රව්‍යයන් පිළිබඳව අප නගර සභාවේ වඩුකාර්මික මහතාගෙන් අප අධික්ෂණය යටතේ ලබා ගන්නා ලදී. ඒ අනුව දැනට අලුත්වැඩියාවන් කෙරිගෙන යන අලුත්වැඩියාවන් නොවන කඩිනමින් සකස් කල යුතු මෙම වහලේ අලුත්වැඩියා කටයුතු සේවකයන් මඟින් සිදු කර ගැනීමට අවශ්‍ය වන ද්‍රව්‍ය පහත පරිදි වේ . එම ලැයිස්තුවේ බඩු ගෙන්වා දිමට කටයුතු කරන ලෙසත් එය අනිකුත්

අලුත්වැඩියා කටයුතු සඳහා පහසු වන  බවත් වාර්තා කර තිබෙනවා. සුදුසු ආයතනයකින් මිලදී ගෙන කැඳවා මිලදී ගැනිමට ලබා දෙන ලෙස ඉල්ලා සිටි. 75mmx100mm(දිග අඩි 13) ලී දඬු 01 යි, 50mmx100mm(දිග අඩි 08) ලී දඬු 05 යි, 50mmx50mm (දිග අඩි 06) ලී දඬු 10 යි, ඇස්බැස්ටෝස් ෂීට් (දිග අඩි 08) ෂීට් 03 යි, අඩි 4x4 සිවිලින් ෂීට් 06 යි, මුදුන් උළු කැට 04 යි, වඩිම්බු ලෑලි(250mmx250mm)දිග අඩි 10 න් 01 යි, කොච්චි ඇණ (අඟල් 3½)25යි, යකඩ ඇණ (අඟල්5)1kgයි, යකඩ ඇණ (අඟල් 3 1/2)  500g යි, යකඩ ඇණ(අඟල් 2)  500g යි, යකඩ ඇණ(අඟල් 1)500g යි . සභා අනුමැතියට යටත්ව මෙම කාර්ය සිදු කර තිබෙනවා. එය සභාවේ අනුමැතිය ඉල්ලා සිටිනවා. ඒ අදාල භාණ්ඩ ඇණවුම් කර තිබෙන්නේ. ඒ සඳහා සභාවේ අනුමැතිය ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, එය ලබා දෙන්න. එය අනුමත කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, බස්නැවතුම්පොළ ඔරලොසු කණුවේ තිබෙන ඔරලොසුව වැඩ කරන්නේ නැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එය සමාගමට දන්වා යවන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි,  රාත්‍රී 7.00 වෙනකොට බස්නැවතුම්පොළ ගාලු බස් නතර කරන තැන ත්‍රිවිල් නතර කරනවා. රාජකාරි කරන ආරක්ෂක නිලධාරි මහතා සමඟ කතා කළා. ඒ මහතාටත් මේ ත්‍රිවිල් රියදුරන් සමඟ හැප්පෙන්න බැහැ. එක්කෝ පොලිසිය ඒ අය එක්ක සම්බන්ධ කරන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඒ කියන්නේ කොතනද නතර කරන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

හරියටම බස්එක නවත්වන තැන

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එක පොලිසියේ වැඩක්. අපි එක පොලිසියට ලියන්නම්. මේ කියන්නේ කොළඹ සිට එන බස්එකක් නතර කරන තැන. එක අපි පොලිසියට දන්වන්න. ඇතුල්වෙන තැන නෙමේ. ඇතුල්වෙන තැන ගැසුවොත් බස්එකක වැදි කුඩු පට්ටම් වෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

මට කතා කරන්න දෙන්න. මා කියන්නේ කොළඹ සිට එන බස් නතර කරන්නේ එතැන. එතැන තමයි මේ ත්‍රිවිල් ගසන්නේ. එතැන ඇතුල්විමට පොඩි දොරටුවක් තිබෙනවා. එකත් වහලා තමයි ගහන්නේ. එතකොට ආරක්ෂක නිලධාරි මහතා ගිහින් ත්‍රිවිල් රථ ගලේ සිටින අයට මෙය අයින් කරන්න කියා  අද රටේ පවතින තත්ත්වයත් එක්ක ඒ මනුස්සයා ගහලා මරන්නත් පුළුවන්. අද තත්ත්වය එකයි. එකයි කියන්නේ. ඔය නිලධාරි මහතාට කියන්න පොලිසියට දැනුම් දෙන්න කියා. මොකද එයාට පාලනය කරන්න බැහැ එතැන. එමනිසා එවැනි ක්‍රියාමාර්ගයක් ගන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ලේකම්තුමිය නිත්‍යානුකූලව කටයුතු කරන්න. අවශ්‍ය අවට තිබෙන අවශ්‍යතා ඉෂ්ඨ කරන්න බැරිනම් ඒ අයගේ අදාල මුදලින් කොන්ත්‍රාත් වලින් කපා හරින්න. සමාන්‍යායෙන් ආරක්ෂක අංශයේ රාජකාරිය එකයි. ඒ අයගේ රාජකාරිය ඉටු කරන්න අපි යන්නේ නැහැ. අපි ඒ අයට රාජකාරිය පවරලා සභාවෙන් ඒ අයට ලක්ෂ 2 ½  පමණ ගෙවනවා. එහෙම ගෙවන ගමන් ඒ ගොල්ලන්ගේ රණ්ඩු බේරන්න අපට මැදිහත් වෙන්න අපට බැහැ. අපි ආරක්ෂක අංශයට පැහැදිලිව කියා තිබෙනවා. එවැනි බාධාවක් තිබෙනවා නම් ඒ ඉවත් කිරිම සඳහා අවශ්‍ය  පෞරුෂය තිබෙන පුද්ගලයන් ඉදිරිපත් කරන්න. ඒ වයසක අය දැම්මාම ඔය ඔබතුමා කියන දේ කෙරෙනවා. අපි ලක්ෂ 2ක් 3ක් වියදම් කරලා ඒ වගේ වැඩ නගර සභාව භාර ගන්න ඕන නැහැ. ඔය කියන එක එක දවසක් තිබුණොත් එදාට ඒ අයගේ ගෙවීම් අඩු කර දමන්න. එක තමයි කරන්න ඕන. එතකොට දවසින් දවස අඩු කරනකොට ඒ ගොල්ලන් එකට අවශ්‍ය පුද්ගලයන් යොදා ගනී.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

මහජනතාව දන්නේ නැහැ එහෙම වැඩපිළිවළක් තිබෙනවාද කියා. එහෙම පැමිණිලි කරන්න ඕනද කියා.  එහෙම වැඩපිළිවළක් තිබෙනවාද කියා. අපිට තමයි මේ සම්බන්ධව කියන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එක දවසක් කර ගමන් මේක වෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මටත් තිබෙනවා ආරක්ෂක අංශය ගැන කතා කරන්න. ඇත්තටම අපේ ගිවිසුමේ තිබෙනවා හැටට වැඩි අය දමන්න බැහැ කියා. ඊළඟ එක තමයි පැය 24කට වඩා යොදවන්න බැහැ කියා. දැනට පැය 24ටවැඩියේ වැඩ කරනවා. මා දැනුවත්ව මේ කරුණු සිදු කරනු ලබනවා. ඒ ගැනත් අපට ක්‍රියාත්මක වෙන්න වෙයි සභාවට. අපි ඉක්මනින්න ක්‍රියාත්මක වෙයි. පටන් ගත්ත ගමන්ම මේ විදියට යනවා නම් ගිවිසුම් කඩ කරා කියා මොකක් හරි කරන්න වෙයි. අපි මුදලුත් ගෙවනවා. දෙවැනි කෙනා එක්ක මෙයාගේ ලොකු වෙනසක් තිබුණේ නැහැ. මෙයාට දුන්නාට. හරියට ක්‍රියාත්මක වෙන්නේ නැතිනම් අපිට ක්‍රියාත්මක වෙන්න වෙයි. සභාවට

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අධික්ෂණ නිලධාරියෙකු පත්කරන්න ආරක්ෂක අංශය සඳහා

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, අර බස්නැවතුම්පොළේ අර කම්බි දමපුවා දැන් දිරලා. සමහර වේලාවට කකුල එහෙම ගියොත් විශාල හානියක් වෙනවා. එක අත්‍යවශ්‍යයි. අනිත් එක මිනිසුන්ට පෙනෙනවා. ලෑලි කෑලි දමා. වහලත් තිබෙනවා. සමහර තැන්වල පෙන්නේත් නැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එකට ඇස්තමේන්තුවක් දුන්නාද? අනුමත වෙලා තිබෙන්නේ. එහෙනම් ටෙන්ඩර් කරන්න.

**තීරණය -**

අම්බලන්ගොඩ ප්‍රධාන බස් නැවතුම්පල පරිශ්‍රයේ ඇති පොදු වැසිකිළියේ වහලේ අලුත්වැඩියා කටයුතු සඳහා අවශ්‍ය ද්‍රව්‍ය (75mmx100mm(දිග අඩි 13) ලී දඬු 01 යි, 50mmx100mm(දිග අඩි 08) ලී දඬු 05 යි, 50mmx50mm (දිග අඩි 06) ලී දඬු 10 යි, ඇස්බැස්ටෝස් ෂීට් (දිග අඩි 08) ෂීට් 03 යි, අඩි 4x4 සිවිලින් ෂීට් 06 යි, මුදුන් උළු කැට 04 යි, වඩිම්බු ලෑලි(250mmx250mm)දිග අඩි 10 න් 01 යි, කොච්චි ඇණ (අඟල් 3½)25යි, යකඩ ඇණ(අඟල් 5)1kgයි, යකඩ ඇණ (අඟල් 3 1/2) 500g යි, යකඩ ඇණ(අඟල් 2) 500g යි, යකඩ ඇණ(අඟල් 1)500g යි) ලබාදෙන

ලෙස ඉල්ලා තාක්ෂණ සේවා නිලධාරී විසින් ඉදිරිපත් කර ඇති ලිපිය අනුව එම ද්‍රව්‍ය ලබාදීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.06 වැඩි දියුණු වී ඇති පාරිසරික තත්ත්වය අඛණ්ඩව පවත්වා ගැනීම යන මැයෙන් මධ්‍යම පරිසර අධිකාරිය විසින් එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

මාධ්‍යම පරිසර අධිකාරිය . වැඩිදියුණු වි ඇති පාරිසරික තත්ත්වය අඛණ්ඩව පවත්වා ගැනීම. මෑතකදි පැන නැගුණු නව කොරෝනා වසංගතය සහ රටතුළ ඇඳිරි නිතිය පැනවීමෙන් පසු රාජ්‍ය හා පුද්ගලික අංශයේ සේවාවන් , කර්මාන්ත කටයුතු හා ප්‍රවාහන කටයුතු ආදි රටේ ජනජීවිතයට අදාල සියළුම කටයුතු අඩපණ වන ලදී . එහෙත් පරිසරය සම්බන්ධයෙන් ගත්කළ මේ තත්ත්වය නිසා පරිසරයේ ගුණාත්මකභාවය සාධණීය මට්ටමකින් ඉහළ ගොස් ඇතිබව විශ්ලේෂණ මඟින් අනාවරණය වී ඇත. කාර්මික ජල අපසන්දන බැහැර කිරිම අවම වීමෙන් රට අභ්‍යන්තර ජල දේහවල හා භූගත ජල දේහ වල ගුණාත්මක තත්ත්වය ඉහළ ගොස් ඇති අතර , කාර්මික වායු විමෝචන අවම විම හා මෝටර් රථ , බස් රථ දුම්රිය යනාදි ගමනා ගමන පහසුකම් බොහෝ දුරට අඩු වීම නිසා වාහන වලින් පිටවල දුම් අවමවීම හේතුවෙන්ද නගර ආශ්‍රිත වායුවල ගුණාත්මක තත්ත්වය වැඩි වි ඇත. එමෙන්ම ඝන අපද්‍රව්‍ය ජනනය විම හා බැහැර කිරිම අවම විමද මෙම කාලය තුළ සිදුවු බැවින් , පාරිසරික තත්ත්වය තවදුරටත් ඉහල යාමට එයද පිටුවහලක් වී ඇත. තවද පසුගිය කාලයේදී රට තුළ සමස්තයක් ලෙස ගත් කළ බොහෝ දුරට ක්‍රමවත් හෝ විධිමත් කසළ කළමණාකරණ ක්‍රමවේදයක් ක්‍රියාත්මක නොවීම තුළින් පාරිසරික සහ සෞඛ්‍යමය ගැටළු රාශියක් හට ගන්නා ලදී . රජය විසින් සාමාන්‍ය ජන ජිවිතය යථාතත්ත්වයට පත් කිරිමේදි නැවතත් කර්මාන්ත ක්‍රියාකාරිත්වය ආරම්භ කිරීම , ගමනා ගමන පහසුකම් යලි ආරම්භ විම , මහජනතාවගේ පරිභෝජන රටාව වෙනස්විම නිසා කසළ උත්පාදනය සහ බැහැරලිම බොහෝ දුරට වැඩිවිම යනාදී කරුණු නිසා වර්තමානයේ ඇති වී තිබෙන පාරිසරික ගුණාත්මක භාවය අනාගතයේදි යලි තර්ජනයට ලක්විමට ඉඩ ඇත. එබැවින් වර්තමානයේ පවතින මෙම පාරිසරික ගුණාත්මක භාවය , සාමාන්‍ය ජන ජිවිතය යථාතත්ත්වයට පත්කළ පසුද දිගටම පවත්වාගෙන යාම අත්‍යාවශ්‍ය කරුණකි. විශේෂයෙන් අවිධිමත් කසළ කළමණාකරනය තුළින් සිදු වී ඇති පරිසරික විනාශය හා සෞඛ්‍යමය ගැටළු වළක්වා ගැනීම ඔබගේ ආයතනයට පැවරි ඇති කාර්යභාර්යක් හා

සුවිශාල වගකීමකි. එබැවින් ගරු ආණ්ඩුකාරතුමාගේ නායකත්වයෙන් සහ මඟපෙන්වීම යටතේ , සියළු රාජ්‍ය ආයතනවල සහායෝගය ඇතිව ක්‍රමවත් කසළ කළමණාකරන වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරන ලෙස කාරුණිකව දන්වමි. තවද මේ සම්බන්ධව මධ්‍යම පරිසර අධිකාරියේ නොමසුරු සහායෝගය ලබා දීමට හැකි බව තවදුරටත් දන්වන අතර පිවිතුරු හරිත පරිසරයක් පවත්වාගෙන යාමට ඔබෙන් ලැබෙන සහායෝගය අගේ කොට සලකනවා. කියා මධ්‍යම පරිසර අධිකාරියේ සභාපතිවරයා විසින් ලිපියක් එවා තිබෙනවා.

**තීරණය -**

**වැඩි දියුණු වී ඇති පාරිසරික තත්ත්වය අඛණ්ඩව පවත්වා ගැනීම** යන මැයෙන් මධ්‍යම පරිසර අධිකාරිය විසින් එවා ඇති ලිපිය ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් ගරු සභාවේ දැනගැනිම පිණිස ඉදිරිපත් කරන ලදී.

## 03.07 අම්බලන්ගොඩ මාදින්නාගහවත්ත ලංකා ධීවර සංස්ථා ඉඩම තුළ පිහිටි ධීවර සංකීර්ණ ගොඩනැගිල්ල සම්බන්ධව ලංකා ධීවර සංස්ථාව විසින් එවා ඇති ලිපිය සභාගත කරන ලදී.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

ලංකා ධිවර සංස්ථාව. අම්බලන්ගොඩ මාදින්නාගහවත්ත ලංකා ධිවර සංස්ථා ඉඩම තුළ පිහිටි ධිවර සංකීර්ණ ගොඩනැගිල්ල සම්බන්ධවයි. ( ධිවර සංකිර්ණය ) උක්ත කරුණ සම්බන්ධයෙන් විෂයභාර රාජ්‍ය අමාත්‍යාවරයා විසින් මටද පිටපත් සහිතව මා ඇමතු ඔබගේ 2020.02.25 දරණ ලිපිය හා බැදේ. ඒ අනුව මාදින්නාගහවත්ත ශ්‍රී ලංකා ධිවර සංකිර්ණ ඉඩම තුළ පිහිටි ධිවර සංකිර්ණ ගොඩනැගිල්ල ඔබ ප්‍රදේශයේ ධිවර කටයුතු සඳහා වාණිජ්‍ය නොවන පොදු කටයුතු සඳහා ධිවර පරික්ෂණ තැනගේ නිර්දේශ සහිතව කලින් කරන ලද ඉල්ලිමකට අනුව වෙන්කරවා ගැනිමට කටයුතු කළ හැකිය. ඒ අනුව ඉතාමත් සහනදායි ගෙවීම් කිරිමට විදුලිය සහ ජලය වෙනුවෙන් සැලසුම් යෙදිය හැකිය. වෙන්කිරිම් නොකල දිනයන්හි ඉල්ලිමක් අනුව සහන පදනම මත වෙන්කිරිම කිරිමට ඉල්ලුම් කරන්න. ලංකා ධිවර සංස්ථාවේ ඉඩමක පිහිටි දේපලක් වෙනත් පාර්ශවයකට පවරා දීමට නොහැකි බැවින් ප්‍රදේශයේ අවශ්‍යතා වෙනුවෙන් පහත කරුණ කෙරෙහි අවධානය යොමු කිරිම ගැන දන්වා සිටි. මෙම කරුණ සම්බන්ධයෙන් නගර සභාව හා ලංකා ධිවර සංස්ථාව සමඟ සහායෝගයෙන් කටයුතු කිරිම ගැන අතිශයින් සතුටට පත්වේ. සභාපති මේජර් ජනරාල් දවුලුගේ මහතා විසින් ලිපියක් එවා තිබෙනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි , ධිවර සංකිර්ණය සම්බන්ධව නේද ඔය කතා කරන්නේ. දැන් ඔය ධිවර සංකීර්ණය නගර සභාවට පවරා කටයුතු කරද්දි ලොකු සේවාවක් ලබා දුන්නා. දැන් එහි සුද්ද පවිත්‍ර කටයුතු කිරිම් , නඩත්තු කටයුතු කිරිම් අනිකුත් කටයුතු ඒ හැම එකක්ම හොඳින් කරගෙන ගියා. දැන් නගර සභාව කලින් ඕක ලබා දුන්නේ පොඩි ගණනකට ධිවර කට්ටියට හා අනෙකුත් කට්ටියට.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

ධිවර කට්ටියට නොමිලේ දුන්නේ.

<u>ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

දැන් එයාලා අය කරනවා රු.10000/= කට වැඩියේ. එහි විදුලි පංකාවක් නැහැ. කම්බි කැලි එල්ලා තිබෙන්නේ. තින්ත ආලේප කරන්නේ නැහැ. වටේ සම්පුර්ණම ගස් කොළන් වැවිලා. මදුරුවෝ බෝවිලා. අර එහා පැත්ත ගන්න දෙයක් නැහැ. පුළුවන් මෙය අපි පාලනය කරන ක්‍රමවේදයකට යන්න පුළුවන් නම් හොඳයි. පැහැදිලි කර දිලා. කවුද මේ ලිපිය එවන්න ඇත්තේ සභාපතිතුමාද ? එතුමා එවන්න ඇත්තේ මෙහේ තිබෙන තත්ත්වය නොදැන. මේක මේ පාවිච්චි කරන ආකාරය නොදැන. කලින් ඉන්නකොට අපි නගර සභාව ගණනේ දමා තින්ත ආලේප කරනවා, සුද්ද කරනවා. මේ කරුණු කරණා ඉදිරිපත් කරලා පුළුවන්නම් එය ලබා ගන්න. අඩු මුදලකට හොඳ සේවාවක් ලබා දෙන්න පුළුවන්. ධිවර ජනතාවටත් දෙන්න පුළුවන්. අනිකුත් වෙළඳ ව්‍යාපාරිකයන්ටත් එය මේවා කරන්න පුළුවන්. හදවත වගේ තැනක තිබෙන්නේ ඕක. දැන් මිනිසුන් කතා කරගෙන යනකොට තමයි.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

දැන් ඔබතුමාට මැදිහත්වෙලා වැඩය කර දිය හැකියි. ගරු අමාත්‍ය මහින්ද අමරවිර මැතිතුමා තමයි විෂය භාර සිටින්නේ. සම්බන්ධවෙලා එය කර දෙන්න.

<u>ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

හරි අපි කර දෙන්නම්. ඔහොම එනකොට තමයි අපිටත් සතුටු සහායෝගයෙන් වැඩ කරන්න.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

නැහැ මෙහි ධිවර ඇමති ඩග්ලස් දේවනාන්ද මැතිතුමා. නියෝජ්‍ය ඇමති කෙනෙක් දැන් නැහැ. මේ සම්බන්ධව අපි සාකච්ඡා කරන්නම් නව රජයක් පත්වුණාට පසු. නැතිනම් මේ කියන

කාරණය නිලධාරින්ගේ අපිට දිලා තිබෙන්නේ. අපි ගරු අමාත්‍යතුමා සමඟ සාකච්ඡා කර මෙය කරගන්නම්.

**තීරණය -**

අම්බලන්ගොඩ මාදින්නාගහවත්ත ලංකා ධීවර සංස්ථා ඉඩම තුළ පිහිටි ධීවර සංකීර්ණ ගොඩනැගිල්ල සම්බන්ධව ලංකා ධීවර සංස්ථාව විසින් එවා ඇති ලිපිය සම්බන්ධව ගරු ධීවර අමාත්‍යතුමා සමග සාකච්ඡා කර විසඳුමක් ලබාගන්නා බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් දන්වන ලදි.

**03.08 නගර සභාව මගින් පාලනය වන පෙරපාසල් 07 ක් සඳහා දැත් සේදීමට සින්ක් 07 ක් සාදා ස්ථානගත කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය හා උපාංග ලබාදෙන ලෙස වැඩ ක්ෂේත්‍ර පරිපාලක කේ.ජේ.ඒ.සිල්වා මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

නගර සභාව මගින් පාලනය වන පෙරපාසල් 07 ක් සඳහා දැත් සේදීමට සින්ක් 07 ක් ස්ථානගත කිරීම. ගරු සභාපතිතුමාගේ අනුමැතිය සහිත 2020.06.22 දින ඉල්ලීම් කරන ලද ලිපිය අනුව මෙකී සින්ක් යොදා ස්ථාන ගත කිරිම සඳහා නල ජලය සැපයිම සඳහා පහත සඳහන් උපාංග අවශ්‍ය බව දන්වා තිබෙනවා.18*19 සින්ක් 07, සින්ක් ටැප් 07යි ඒ ආදි වශයෙන්. ඒ අවශ්‍ය කරන දේවල් ලබා දිමට සභාවේ අනුමැතිය ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

එය ලබා දෙන්න.

**තීරණය -**

නගර සභාව මගින් පාලනය වන පෙර පාසල් 07 ක් සඳහා දැත් සේදීමට සින්ක් 07 ක් සාදා ස්ථානගත කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය හා උපාංග ලබාදෙන ලෙස වැඩ ක්ෂේත්‍ර පරිපාලක කේ.ජේ.ඒ.සිල්වා මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපිය අනුව එම ද්‍රව්‍ය හා උපාංග ලබාගැනීමට අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.09 2020 අප්‍රේල්,මැයි සහ ජුනි යන මාස 03 සඳහා අම්බලන්ගොඩ බැඩ්මින්ටන් සංගමය විසින් නගර සභාවට ගෙවිය යුතු බදු මුදල් අයකර නොගන්නා ලෙස ඉල්ලා බැඩ්මින්ටන් සංගමයේ ලේකම් විසින් එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

- **පෙ.ව. 10.15 ට පමණ ටෙන්ඩර් විවෘත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

03.09 සහ 03.019 යන කරුණු දෙකම එකයි. එමනිසා 03.19 ඉවත් කරනවා. අම්බලන්ගොඩ බැඩ්මින්ටන් සංගමය.2020 කොවිඩ් වසංගතය හේතුවෙන් මාස තුනක කාලයක් වසා දමා තිබූ බැඩ්මින්ටන් ක්‍රිඩාංගණය සඳහා එකි මාසය සඳහා බදු මුදල් නිදහස් කරන ලෙස කරන ඉල්ලිම. උක්ත කරුණට අදාල අප සංගමයේ නගර සභාවට යොමුකරන ලද 2020.05.03 දැනැති ලිපියෙන් අප ඉල්ලා ඇති සහනය ලබා දි ඇත්තේ එක් මාසයකට පමණි. ඒ සඳහා ස්තුතිවන්ත වන අතර අප සංගමය මඟින් 2020 අප්‍රේල් . මැයි , ජුනි මාස සඳහා බදු ගෙවීමෙන් නිදහස් කරන ලෙස ඉල්ලා සිටින බව දන්වා ඉල්ලිමක් කර තිබෙනවා. ඒ අනුව 2020 වෙනුවෙන් අම්බලන්ගොඩ බැඩ්මින්ටන් සංගමයේ ගාස්තු නිදහස් කිරිම වෙනුවෙන් මෙම ඉල්ලිම අපි ක්‍රිඩා කමිටුව යොමු කර තිබෙනවා. මේක නැවත සලකා බලන ලෙසත් ක්‍රිඩා කමිටුවත් ඉල්ලා සිටිනවා. එම ඉල්ලිම . එමෙන්ම 2020.06.30 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ අත්සනින් යුතුව 255 අධිකාරිය යුතුව නගර සභා ආඥා පණතේ 170 වගන්තිය ප්‍රකාරව සභාවට අයවිය යුතු මුදල් අත්හැරිම සම්බන්ධව අංක 02 ප්‍රකාරව මේ සම්බන්ධව කරුණු සලකා බලන ලෙස ඉල්ලා සිටිනවා. ඒ අනුව චක්‍රලේඛයක් නිකුත් කර තිබෙනවා. එම චක්‍ර ලේඛය පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් නිකුත් කර තිබෙන්නේ . පළාත් පාලන කොමසාරිස්තුමා . එහි දෙවන ජේදයේ කියන්නේ උක්ත තත්ත්වය සම්බන්ධයෙන් පළාත් පාලන ආයතන විසින් බදු පදනම මත ලබා දි ඇති දේපල උදාහරණ සතිපොළ , කඩකාමර , වැසිකිළි, මස්කඩ ,රථගාලවල් ,බිම්කඩඅල්ලි , බිම්බදු තනායම් ආදි දේපළ සඳහා වන මුදල් වෙළඳ බලපත්‍ර ගාස්තු , වරිපණම් ගාස්තු , ප්‍රචාරණ ගාස්තු , ඩිජිටල් දැන්විම් පුවරු ගාස්තු ඇතුළු අක්කර බදු , කර්මාන්ත බදු , ව්‍යාපාර බදු , ජල ව්‍යාපාර සඳහා වන ගාස්තු , පුස්තකාල දඩ , කසළ දඩ යන වෙනත් බදු අයකර ගැනීම මේ වනවිට ගැටළු සහගත තත්ත්වයක් බව අවධාරණය කළ යුතු කරුණකි. ඒ අනුව පළාත් පාලන ආයතන විසින් බදු පදනම මත දි ඇති දේපළ සතිපොළ , කඩකාමර , වැසිකිළි, මස්කඩ ,රථගාලවල් ,බිම්කඩඅල්ලි , බිම්බදු දේපළ සභාව විසින් අයකර බදු දේපළ සඳහා එම කාලය තුළ වන බදු මුදල් එය මාසිකව හෝ යම් කාලයකට අයකරන බදු කුලියක් නම් එය මාසිකව හෝ සමානුපාතිකව අයකරන බදු

කුලියක් නම් යම් ප්‍රතිශතයක් බදු කුලි වලින් අතහැරිම කරන්න පුළුවන් බව කියා තිබෙනවා. ඒ වගේම උක්ත 01 සහ 05 ආදායම් ශිර්ෂ වලට අදාල කරුණු සභාව විසින් අතහරිනු ලබන්නේ නම් ඒ සඳහා අතහරිනු ලබන විස්තර සහිත වාර්තාවක් සභාව වෙත ඉදිරිපත් කර විධිමත් සභා අනුමැතියක් ලබා ගැනීමෙන් අනතුරුව කළ යුතුයි. එසේම උක්ත 01,02,03,04,05,06 සහනයක් ලබා දිම සභාව විසින් විධිමත්ව සම්මුතියක් ලබා ගැනීමෙන් පමණක් ලබා දිම සිදු කළ යුතුයි. මීට අමතරව අයවිය යුතු සුවිශේෂී තත්ත්වයන් පිළිබඳව ආදායම් අත්හැරිම් කපා හැරිම් කටයුක්තක් වේ නම් 255 අධිකාරිය යටතේ නගර සභා ආඥා පණතේ 170 යටතේ ඒ පෙර පරිදි විධිමත් පටිපාටියට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියක් සඳහා යොමුකළ යුතුය කියා දන්වා තිබෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ඒ නිදහස් කරන්නේ කොච්චර මුදලක්ද ?

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මෙහි බද්ද කියද?

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

එතුමාගේ නිර්දේශයක් දමා ඇති නේද ? නිලධාරින් දමා තිබෙන්නේ මොනවාද නිර්දේශ

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

නිලධාරින් දමා තිබෙන්නේ මේ චක්‍ර ලේඛය ප්‍රකාරව නිදහස් කරන්න පුළුවන් කියා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

එහෙනම් සහන ලබා දෙන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්.ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, කඩහිමියන්ටත් මෙය ලබා දෙන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

එහෙනම් නගර සභාව වහන්න වෙනවා. කඩ හිමියන්ට දෙන්න ගියොත් මේක වහන්න වෙනවා. මෙය විටින් විට අවශ්‍යතාවයෙන් අවශ්‍යතාවයට සභාවට ඉදිරිපත් කරලා සම්මත කරනවා ඇරෙන්න අපට වැඩ කරන්න එහෙම වුණොත් මුදල් නැති වෙනවා. වැටුප් ගෙවන්න මුදල් නැති වෙනවා. ඒ වහපු කාලේ නිදහස් කරන්න බලමු අපි කල්පනා කරලා. එමනිසා මේ ඉල්ලිමට එකඟවෙලා එය අනුමත කරන්න. එය එකමතිකව සම්මතයි.

**තීරණය -**

2020 Covid 19 වසංගතය හේතුවෙන් 2020 අප්‍රේල්, මැයි සහ ජූනි යන මාස 03 අම්බලන්ගොඩ බැඩ්මින්ටන් ක්‍රීඩාංගනය වසා දැමූ බවත් එම මාස 03 සඳහා නගර සභාවට ගෙවිය යුතු බදු මුදල් අයකර නොගන්නා ලෙසත් ඉල්ලා බැඩ්මින්ටන් සංගමයේ ලේකම් විසින් එවා ඇති ලිපිය අනුව, එම මාස 03 සඳහා බදු මුදල් අයකර නොගැනීමට අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.10 මහජන ක්‍රීඩාංගනයේ නඩත්තු කටයුතු සඳහා අවශ්‍ය උපකරණ හා උපාංග ලබාදෙන ලෙස ඉල්ලා ක්‍රීඩා භූමි භාරකරු ජී.එච්.සහන් සංකල්ප මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මහජන ක්‍රීඩාංගනයේ නඩත්තු කටයුතු සඳහා අවශ්‍ය උපකරණ හා උපාංග ලබාදෙන ලෙස ඉල්ලා ක්‍රීඩා භූමි භාරකරු ජී.එච්.සහන් සංකල්ප මහතා විසින් ඉල්ලීමක් කර තිබෙනවාත මහජන ක්‍රිඩාංගණය තණතිලි සාදන රෝල් , තණතිලි ආවරණ කවර්ස් සම්බන්ධව. කඩිනමින් සංවර්ධනය වන මහජන ක්‍රිඩාංගණ සඳහා අවශ්‍ය වන තණතිලි සාදන රෝල් , තණතිලි ආවරණ කවර්ස් යන උපකරණ හා උපාංග අවශ්‍ය වනු ඇත. මෙම රෝල් වල උපකරණ සහ තණතිලි ආවරණ සංවර්ධනය අවසන් වනවාත් සමඟම ක්‍රිඩාංගණයේ ඉදිරි කටයුතු සඳහා අවශ්‍ය වනවා ඇත. අවශ්‍ය වන රෝල් වර්ග කියා අඩි 4ක් දිග අඩි 4ක් උස 2 ½ දිග විස්තර සහිතව ඉදිරිපත් කර තිබෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මෙය අවශ්‍යයි කියා නිර්දේශ කර තිබෙනවාද?

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඒ අය නිර්දේශ කර තිබෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

එහෙනම් එය ලබා දෙන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙයින් කොටසක් අපිට ක්‍රිකට් ආයතනයෙන් ලබා දෙයි. එතකං අපි ගන්නම් . ඒ ඉතිරි අඩුපාඩු ටික හදා අපිට දන්වන්නම්. අපි එය දෙන්නම්. මෙය අනුමත කරනවා. එතකොට මෙකෙන් නැති වෙන අඩුවන ඒවා විතරක් ගැනීම කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>**

පුළුවන්තරම් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයෙන්ම ගන්න බලන්න

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඒ ගොල්ලන් දෙනවා කිවුවා.

**තීරණය -**

මහජන ක්‍රීඩාංගනයේ නඩත්තු කටයුතු සඳහා අවශ්‍ය උපකරණ හා උපාංග ලබාදෙන ලෙස ඉල්ලා ක්‍රීඩා භූමි භාරකරු ජී.එච්.සහන් සංකල්ප මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපියට අනුමැතිය ලබාදීම සුදුසු බවත් , ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් ලබාදෙන බවට දැනුම් දී ඇති උපකරණවලට ඇතුලත් වී නොමැති අනෙකුත් උපකරණ හා උපාංග පමණක් ලබාගැනීම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.11 පිඹුරු අංක 3711 මගින් එම්.ඩබ්.චන්ද්‍රලතා මහත්මිය ඇතුලු පවුල් 04 කට නේවාසික භාවිතය සඳහා ලබාදී ඇති නගර සභාව සතු පොදු කටයුතු සඳහා වෙන්කර තබූ ඉඩම් කොටස වෙනුවට පිඹුරු අංක 3771 හි කැබලි අංක 02 පොදු කටයුතු සඳහා වෙන්කරීමට අදාල අනුමැතිය ලබාගැනීම සඳහා ලිපිගොණුව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නාගරික සංවර්ධන අධිකාරියේ පිටු අංක 35 ලිපිය මඟින්. මෙහිදී මතක් කළ යුතුයි නාගරික සංවර්ධන අධිකාරිය මඟින් දන්වා තිබෙනවා මිට ඉහත නගර සභාව පෙත්සම් කාරක සභාවේ තින්දුවක් පරිදි කැබලි 4ක් ලබා දුන්නා. ඒ අනුබෙදුම අනුමත කරන්න කියා අපි නාගරික සංවර්ධන අධිකාරියට දැම්මා. මෙන්න මේ විදියට ලිපියක් එවා තිබෙනවා. SD2019/51 අනුබෙදුම සම්බන්ධවයි. ඒ අනුව පිඹුරු අංක 3711 කැබලි අංක 02 අනුමත කරන ලෙස ඉල්ලා ඇති අතර එය පොදු කටයුතු සඳහා වෙන්කරන භූමියක් බැවින් උපදෙස් සඳහා 2019.05.01 දින අම්බලන්ගොඩ නගර සභා සැලසුම් කමිටුව මෙම කාර්යාලයට යොමු කරන ලදි. 2019.05.09 දිස්ත්‍රික් කමිටුවට යොමු කරන ලද අතර 392/9 හා 1986/03/10 දින ගැසට් නිවේදනය මඟින් නිවේදන නියෝග අංක 22:1 අනුව මෙම කොටස අයත් භූමි භාගය හෙක්ටාර් 1 ට වැඩි අවස්ථාවේදි ඉඩමේ භූමි භාගය ඉඩමේ භූමියෙන් 10% විශාලත්වයකින් යුක්ත වීම ප්‍රමාණය ප්‍රජා කටයුතු , විනෝද කටයුතු සඳහා වෙන්කළ යුතු සඳහා වෙන්කර ඇති බව දන්වා ඇති බැවින් පොදු

කටයුතු සඳහා වෙන්කරන ලද භූමියක් නේවාසික කටයුතු සඳහා වෙන්කිරිමට ලබා දිය නොහැකි බව 2019.05.08 දිනැති දිස්ත්‍රික් සැලසුම් කමිටුව මඟින් තින්දු කරන ලදී. එම කමිටු තින්දුව 2019.06.22 අම්බලන්ගොඩ නගර සභාවට ලිඛිතව දැනුම් දෙන ලදි. මේ සම්බන්ධව නැවත අයදුම්කරන ලෙස ඉල්ලිම් කරන ලද අතර නගර සභාව විසින් ආණ්ඩුකාරතුමාට යොමු කරන ලදී. එයට පිළිතුරු ලෙස ආණ්ඩුකාරතුමාගේ දින රහිතව යොමුකරන ලද ලිපිය මඟින් ඉඩම අව සතු කරන බැවින් අනුමැතිය සලකා බලන ලෙස දන්වා ඇත. මේ සම්බන්ධව 2019.09.03 දින සභා තීරණය අනුව උපදෙස් සඳහා මේ ලිපිය යොමුකරන ලදී. ඒ අනුව නැවත ලිපි ගොණුව 2019.11.13 දින දිස්ත්‍රික් සැලසුම් කමිටුවට යොමු කනර ලද ප්‍රධාන කාර්යාලයේ සැලසුම් උප කමිටුවට යොමු කිරිමට තින්දු කරන ලදී. ඒ අනුව 2020.01.20 දින සැලසුම් හා උප කමිටුවට යොමු කරන ලදී. මේ කරුණ සම්බන්ධයෙන් කමිටුව සාකච්ඡා කළ අතර මෙම ගොණුවේ ඇති අම්බලන්ගොඩ නගර සභාව මඟින් අංක 715 දරණ පිඹුර අනුමත කරන අතර පොදු කටයුතු සඳහා වෙන්කරන ලද භූමිය එම නගර සභාවේන් ඔප්පු ලබා දීම සිදු කළ ඇති බවත් එම ඉඩම් වලට නිවාස ඉදිකර ඇතිබවත් තහවුරු විණි. මෙහිදි අම්බලන්ගොඩ නගර සභාවේ පොදු කටයුතු සඳහා භූමියක් යෝජනා කර සැලසුම් ඉදිරිපත් කිරිමෙන් අනතුරුව පිඹුරු අංක 3711හි කැබලි අංක 02 අනුමැතිය සලකා බැලිම සුදුසු බව සැලසුම් කමිටුව තීරණය කරන බව දන්වා ඇත. ඒ අනුව යෝජනා ඉදිරිපත් කරන ලෙස ඉල්ලා ඇත. ඒ අනුව මෙයට සුදුසු භූමියක් වශයෙන් යෝජනා කරනවා දැනට T.H.W. නිවාස ව්‍යාපෘතියේ කැබලි අංක 02 පර්චස් 66.2 ප්‍රමාණය එයට පොදු කටයුතු සඳහා ලබා දිලා මේ සඳහා ඔප්පු ලබා දිමට අනුමැතිය ලබා දීම සුදුසු යයි සභාවට මා යෝජනා කරනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මා හිතන විදියට දැන් ඉඩම් කැලි 4ක් තිබුණා නම් දෙදෙනෙකු තමයි මුදල් දී තිබෙන්නේ. ඉතිරි දෙදෙනාට දැන් මුදල් දිලා තිබෙන්නේ . මොකක්ද ගත් තීරණය.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

ඒ වෙනුවට දැන් පෙත්සම් කාරක සභාවේ යෝජනා කර තිබෙන්නේ මුදලින් ගන්න බැරිනම් ඒ අයට බදු ක්‍රමයක් යටතේ එන්න ඕන. නැතිනම් ඉවත් කිරිම කරන්න ඕන.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>

එකතමයි ඒ සඳහා ක්‍රියාත්මක විය යුතුයි.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මේ දෙයට එකඟ ද කියා කියන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

එය ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

එමනිසා මේ යෝජනාව ස්ථිර කර අපි මෙය යවන්න.

**තීරණය -**

පිඹුරු අංක 3711 මගින් එම්.ඩබ්.චන්ද්‍රලතා මහත්මිය ඇතුලු පවුල් 04 කට නේවාසික භාවිතය සඳහා ලබාදී ඇති , නගර සභාව සතු පොදු කටයුතු සඳහා වෙන්කර තබූ ඉඩම් කොටස වෙනුවට පිඹුරු අංක 3771 හි කැබලි අංක 02 පොදු කටයුතු සඳහා වෙන්කිරීමට අදාල අනුමැතිය ලබාගැනීම සඳහා ඉදිරිපත් කර ඇති ලිපියට අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.12 252-0730 අංක දරණ Mitsubishi L200 2WD double cab රථයේ අළුත්වැඩියාවන් සඳහා ඉදිරිපත් කර ඇති ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

සභාව සතු 252-0730 අංක දරණ Mitsubishi L200 2WD double cab රථයේ අළුත්වැඩියාවන් සඳහා වන ඇස්තමේන්තුව යාන්ත්‍රික ඉංජිනේරු මහතා විසින් ලබා දී ඇති ඇස්තමේන්තුව සභාවට ඉදිරිපත් කරනවා. ඒ අනුව නිර්දේශ මෙවායි. ඔහු යෝජනා කරනවා ක්‍රම දෙකක්. එක්කෝ මේක ට්‍රිංකරින් කරන්න. එහෙම නැතිනම් මිළ ගණන් කැඳවා අලුතින් බෝඩි එකක් තියන්න. සභාවෙන් මේ දෙකෙන් මොකක්ද කරන්නේ කියා යෝජනා කරන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

මා යෝජනා කරනවා . බොඩි එකක් තියන්න කියා අලුතින්.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ඒ යෝජනාව අනුමත කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමා එය සමාගමෙන් ගන්නවාද ? නැතිනම් ටෙන්ඩර් කර ගන්නවාද ?

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මිළ ගණන් කැඳවන්න ඕන.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, එකනෙමේ පාවිච්චි කරපු එකක් ගන්න පුළුවන්ද කියන එක.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

පුළුවන්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ප්‍රශ්නයක් නැහැ. එහෙනම් හරි.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

නිර්දේශ කර තිබෙනවා පාවිච්චි කරන ලද එකක් ගන්න. මා හිතන්නේ අලුත් බොඩි එකක් ලක්ෂ 5කට 6කට ගන්න පුළුවන් ඇති.

**තීරණය -**

252-0730 අංක දරණ Mitsubishi L200 2WD double cab රථයේ අළුත්වැඩියාවන් සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික ඉංජිනේරු එම්.ආර්.එම්.රිස්වි මහතා විසින් එවා ඇති ඇස්තමේන්තුව අනුව සම්පූර්ණ නව බඳක් සවිකිරීමට අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.13 අම්බලන්ගොඩ,කෙරමිණිය,අංක 311/5 ලිපිනයේ පදිංචි කේ.ජී.විපුල් නිශාන්ත මහතා විසින් පොල්වත්ත ශ්‍රී බුද්ධදත්ත ක්‍රීඩාංගනය වෙන්කරගැනීම සඳහා නගර සභාවට රු.5000/- ක මුදලක් ගෙවූ බවත් එදිනට ක්‍රීඩාංගනය පරිහරණය නොකළ බැවින් නගර**

**සභාවට ගෙවන ලද මුදල් නැවත ලබාදෙන ලෙස ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

කේ.ජී.විපුල් නිශාන්ත මහතා සැහැල්ලු පන්දු තරඟයක් පැවැත්වීම සඳහා පොල්වත්ත ක්‍රීඩාංගණය වෙන්කර ඇති අතර පසුගිය දිනවල පැවැති වසංගත තත්ත්වය හේතුවෙන් එම තරඟය පැවැත්විමට නොහැකි වි ඇත. එම මුදල් නැවත ලබා දෙන ලෙස ඔවුන් විසින් ඉල්ලිමක් කර ඇත.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

එය ලබා දෙන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, පොල්වත්ත ක්‍රිඩාංගණයේ විදුලි ආලෝකය ගැන කතා කරන කොට මා මේ වේලාවේ ඉල්ලා සිටිනවා. රාත්‍රි 8.00 න් පසු ක්‍රිඩා කරන්නේ නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා කතා කරමින්</u>**

රාත්‍රි 9.00 වනතුරු එනවා ක්‍රිඩා කරන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙහෙමයි අපේ පොල්වත්තේ මන්ත්‍රිතුමා කියනවා රාත්‍රි 9.00 වනතුරු ළමයින් ක්‍රිඩා කරනවා කියා. එහෙම වෙන්න පුළුවන් . ටිකක් වැස්ස වගේ තිබුණොත් එහෙම එදාට එන්න පුළුවන්. නමුත් අපේ හැමදාම වේලාව 9.00

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

අපට එච්චර ලොකු බිලක් එන්නේ නැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එච්චර ලොකු බිලක් එන්නේ නැහැ.

<u>**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, පොල්වත්තේ මන්ත්‍රීවරයා කිවුවාට පොල්වත්තේ මන්ත්‍රීවරු කිහිපදෙනෙක් සිටිනවා.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

නැහැ. එතුමා පොල්වත්තේ කොට්ඨාශේ මන්ත්‍රීවරයා. අනිවාර්යෙන්ම එතුමා පොල්වත්තේ මන්ත්‍රී. ඔගොල්ලන් පදිංචි ඇති.

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

නැහැ. එතුමා ඉන්නේ කළුවඩුමුල්ලේ.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

පොල්වත්තේ කොට්ඨාශය වෙනුවෙන් ඉන්න මන්ත්‍රීවරයා එතුමා. පොල්වත්ත කොට්ඨාශය වෙනුවෙන් තෙරි පත්වි සිටින මන්ත්‍රීවරයා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

මේ අනිත් මන්ත්‍රීවරුත් තේරි පත්වුණු මන්ත්‍රීවරු තමයි. මොකද ඒ ආණ්ඩුවෙන් තමයි පත්කර තිබෙන්නේ. මේ කියන්නේ එකයි.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

කොට්ඨාශයට මන්ත්‍රීවරයෙක් ඉන්නවානේ. එතුමා තමයි ජයග්‍රහණය කර තිබෙන්නේ. එතුමා කොට්ඨාශ මන්ත්‍රීවරයා වශයෙන් පිළිගන්න වෙනවා. ඔක්කොම මන්ත්‍රීවරු පිළිගන්නවා. ඔබතුමාලත් පිළිගන්නවා. නමුත් ඒ කොට්ඨාශය දිනපු මන්ත්‍රීවරයා ඒ කොට්ඨාශ මන්ත්‍රීවරයා ලෙස ආමන්ත්‍රණය කළ යුතුයි.

<u>**ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා කතා කරමින්**</u>

පොල්වත්තට ඉන්නේ මන්ත්‍රීවරු දෙදෙනෙක් පමණයි. මගෙන් පස්සේ තව එක්කෙනෙක් ඉන්නවා. ධනසේන මාදුවගේ මහතා.

**තීරණය -**

අම්බලන්ගොඩ, කෙරමිණිය, අංක 311/5 ලිපිනයේ පදිංචි කේ.ජී.විපුල් නිශාන්ත මහතා විසින් පොල්වත්ත ශ්‍රී බුද්ධදත්ත ක්‍රීඩාංගනය වෙන්කරගැනීමට නගර සභාවට රු.5000/- ක මුදලක් ගෙවූ බවත් එදිනට ක්‍රීඩාංගනය පරිහරණය නොකළ බැවින් ගෙවන ලද මුදල් නැවත ලබාදෙන ලෙස ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපිය අනුව, රු.5000/- ක මුදල ලබාදීමට අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.14 අම්බලන්ගොඩ, ඕකන්ද, යූ.සී.නිවාස, අංක 04 හි පදිංචිව සිටි ඒ.ඩබ්.මැගිනෝනා මහත්මියගේ ආදාහන කටයුතු සිදුකිරීම සඳහා රු.6000/- ක මුදලක් නගර සභාවට ගෙවූ බවත්, එයින් සමෘද්ධි සහන මුදල වන රු.2000/-ක මුදල ලබාදෙන ලෙස ඉල්ලා ගංගේ ප්‍රදීප් සනත් කුලසමන් ද සිල්වා මහතා සහ ජී.පුෂ්පා ශ්‍රියානි ද සිල්වා මහත්මිය විසින් එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

ඒ.ඩබ්.මැගිනෝනා මහත්මියගේ ආදාහන කටයුතු සිදුකිරීම සඳහා රු.6000/- ක මුදලක් නගර සභාවට ගෙවූ බවත්, එයින් සමෘද්ධි සහන මුදල වන රු.2000/-ක මුදල ලබාදෙන ලෙස ඉල්ලා ගංගේ ප්‍රදීප් සනත් කුලසමන් ද සිල්වා මහතා සහ ජී.පුෂ්පා ශ්‍රියානි ද සිල්වා මහත්මිය විසින් ඉල්ලීමක් කර තිබෙනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>

එය ලබා දෙන්න.

**තීරණය -**

අම්බලන්ගොඩ, ඕකන්ද, යූ.සී.නිවාස, අංක 04 හි පදිංචිව සිටි ඒ.ඩබ්.මැගිනෝනා මහත්මියගේ ආදාහන කටයුතු සිදුකිරීම සඳහා රු.6000/- ක මුදලක් නගර සභාවට ගෙවූ බවත්, එයින් සමෘද්ධි සහන මුදල වන රු.2000/-ක මුදල ලබාදෙන ලෙස ඉල්ලා ගංගේ ප්‍රදීප් සනත් කුලසමන් ද සිල්වා මහතා සහ ජී.පුෂ්පා ශ්‍රියානි ද සිල්වා මහත්මිය විසින් එවා ඇති ලිපිය අනුව, රු.2000/- ක සහන මුදල ගෙවීමට අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ

යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.15 අම්බලන්ගොඩ, ඕකන්ද, යූ.සී.නිවාස, අංක 24/1 හි පදිංචිව සිටි කේ.කරුණාවතී මහත්මියගේ ආදාහන කටයුතු සිදුකිරීම සඳහා රු.6000/- ක මුදලක් නගර සභාවට ගෙවූ බවත්, එයින් සමෘද්ධි සහන මුදල වන රු.2000/-ක මුදල ලබාදෙන ලෙස ඉල්ලා ජේ.එම්.දමිතා මහත්මිය විසින් එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

අම්බලන්ගොඩ, ඕකන්ද, යූ.සී.නිවාස, අංක 24/1 හි පදිංචිව සිටි කේ.කරුණාවතී මහත්මියගේ ආදාහන කටයුතු සිදුකිරීම සඳහා රු.6000/- ක මුදලක් නගර සභාවට ගෙවූ බවත්, එයින් සමෘද්ධි සහන මුදල වන රු.2000/-ක මුදල ලබාදෙන ලෙස ඉල්ලා ජේ.එම්.දමිතා මහත්මිය විසින් ඉල්ලීමක් කර තිබෙනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

එය ලබා දෙන්න.

**තීරණය -**

අම්බලන්ගොඩ, ඕකන්ද, යූ.සී.නිවාස, අංක 24/1 හි පදිංචිව සිටි කේ.කරුණාවතී මහත්මියගේ ආදාහන කටයුතු සිදුකිරීම සඳහා රු.6000/- ක මුදලක් නගර සභාවට ගෙවූ බවත්, එයින් සමෘද්ධි සහන මුදල වන රු.2000/-ක මුදල ලබාදෙන ලෙස ඉල්ලා ජේ.එම්.දමිතා මහත්මිය විසින් එවා ඇති ලිපිය අනුව, රු.2000/- ක සහන මුදල ගෙවීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.16 2020 අවසන් අර්ධ වර්ෂයට අදාළ විගණන සැලැස්ම නිර්දේශ අනුමැතිය සඳහා සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

2020 අවසන් අර්ධ වර්ෂයට අදාළ විගණන සැලැස්ම නිර්දේශ අනුමැතිය ඉදිරිපත් කර තිබෙනවා. එය සභාවේ අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා කතා කරමින්</u>**

එය අනුමත කරනවා.

**තීරණය -**

අභ්‍යන්තර විගණන නිලධාරී විසින් ඉදිරිපත් කර ඇති 2020 අවසන් අර්ධ වර්ෂයට අදාළ අභ්‍යන්තර විගණන සැලැස්ම සඳහා (2020.07.01 සිට 2020.12.31 දක්වා ) අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.17 2020.03.29 දින පැවැත්වීමට තිබූ දූමාර සංගීත ප්‍රසංගය කොරෝනා වසංගතය හේතුවෙන් නොපැවැත්වූ බවත් එහි ප්‍රචාරණ කටයුතු සඳහා බැනර් වෙනුවෙන් රු.43,200/- ක් නගර සභාවට ගෙවූ බවත් එම මුදල් නැවත ලබාදෙන ලෙස ඉල්ලා කොස්ගොඩ, ගල්බොක්ක පාර පදිංචි උද්යෝග අබේගුණවර්ධන මහතා විසින් එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

2020.03.29 දින පැවැත්වීමට තිබූ දූමාර සංගීත ප්‍රසංගය කොරෝනා වසංගතය හේතුවෙන් නොපැවැත්වූ බවත් එහි ප්‍රචාරණ කටයුතු සඳහා බැනර් වෙනුවෙන් රු.43,200/- ක් නගර සභාවට ගෙවූ බවත් එම මුදල් නැවත ලබාදෙන ලෙස ඉල්ලා කොස්ගොඩ, ගල්බොක්ක පාර පදිංචි උද්යෝග අබේගුණවර්ධන මහතා විසින් ඉල්ලීමක් කර තිබෙනවා. එය සභාගත කරනවා. එය ලබා දීමට අනුමැතිය ඉල්ලා තිබෙනවා. මේ විදියට නිර්දේශ ලබා දි තිබෙනවා. ආදායම් පරික්ෂක විසින් මෙන්න මේ විදියට වාර්තාව ලබා දි තිබෙනවා. 2020.03.29 දින පැවත් විමට නියමිත තිබූ දූමාරය ප්‍රසංගය කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් නොපැවැත්විමට තීරණය කර සිටි. ඒ අනුව ප්‍රචාරණ සඳහා දැන්වීම් පුවරු ගාස්තු රු.43200/= ක මුදලක් ගෙවා ඇති අතර එය ලබා දෙන ලෙස ඉල්ලා සිටි. මෙම ප්‍රසංගය නොපැවැත්වුවද අදාල දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කර තිබිණි. එසේම ප්‍රචාරණ ගාස්තු වලට ගෙවන මුදල නැවත ගෙවීමේ හැකියාව නොමැත. එමනිසා දූමාරයේ ප්‍රචාරණ ගාස්තු සඳහා ගෙවන ලද මුදල් නැවත නොගෙවන ලෙසට යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මේක ඉල්ලපු වේලාවෙම කිවුවානම් හරිනේ. මෙය සභාවට දැම්මේ ඇයි? ගරු සභාපතිතුමනි , මෙය ඇත්තටම ලබා දෙන්න පුළුවන්ද කියා බලන්න. මෙය නිත්‍යානුකුලව දෙන්න පුළුවන්ද

කියන එක. දැන් සංගීතය පැවැත්වෙන්නේ නැහැ. බැනර් එක ගැහුවා කියන එකක් වෙනම කතන්දරයක්. මෙහි ප්‍රතිඵලය ඒ අය ගත්තේ නැහැ. දැන් ඒ ප්‍රතිඵලය ඒ අයට ලැබුණේ නැහැනේ. එය ලබා දෙන්න මොනවා හරි ක්‍රමවේදයක් තිබෙනවා ද කියා බලන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නැවත වතාවක් තිබෙන කොට නිදහස් කර දෙන්නම් කියා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමා හේතු කාරණා ලියා යවන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි ඒ අය ව්‍යාපාරයක් කරන්නේ හැදුවේ. ඒ අයට ආදායමක් සත පහක වත් ලැබී නැහැ. හරි පැහැදිලියි ඒ අයගේ අරමුණ. ඒ අයගේ අරමුණ ඉෂ්ඨ වුණේ නැහැ. මා හිතන්නේ සාධාරණයි ඒ අයට එය නැවත ලබා දෙන එක.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

දැන් මේ චක්‍රලේඛය අනුව මෙය ගෙවන්නම බැරිද? මෙය කරන්න විදියක් තිබෙනවාද ? කෙටියෙන් අහන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

ප්‍රචාරක ගාස්තු කියා මෙය වර්ග කරන්න පුළුවන්. දැන් ප්‍රචාරක දැන්වීම් කියන්නේ මෙය මේ දිනයේ කළේ නැහැ. ඒ උත්සවය නැතිනම්. ප්‍රචාරක දැන්වීම් තව කොටසක්. තව කොටසක් තිබෙනවා. දිගටම ව්‍යාපාර කරන කොටසක්. එක මෙකත් එක්ක සංසන්දනය කරන්න බැහැ. මොකද මෙය මේ එක දිනයකට කරන වැඩක්. මේවා මේ එක දිනයකට කරන දෙයක්. අරවා මේ දිගටම කරන ඒවා. එතකොට එකයි මෙකයි එකට සංසන්දනය කරන්න බැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

වැඩය කෙරුණේ නැහැනේ. පාඩුවක් නේ වුණේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපට ලබා දී තිබෙන උපදෙස් අනුගමනය කරන්න වෙනවා. මෙය වෙනස් කරන්න කියා ආණ්ඩුකාරතුමාට ඕන නම් ලියන්න පුළුවන්. මෙන්න මෙහෙම යෝජනා කරනවා මේකට මොකද කරන්නේ කියා. ඒ සඳහා විමසීමක් කරන්නම්.

**තීරණය -**

2020.03.29 දින පැවැත්වීමට තිබූ දූමාර සංගීත ප්‍රසංගය කොරෝනා වසංගතය හේතුවෙන් නොපැවැත්වූ බවත් එහි ප්‍රචාරණ කටයුතු සඳහා බැනර් වෙනුවෙන් රු.43,200/- ක් නගර සභාවට ගෙවූ බවත් එම මුදල් නැවත ලබාදෙන ලෙස ඉල්ලා කොස්ගොඩ,ගල්බොක්ක පාර, "කුමා විලා" හි පදිංචි උද්යෝග අබේගුණවර්ධන මහතා විසින් එවා ඇති ලිපිය අනුව, එම මුදල් නැවත ලබාදීම සම්බන්ධව ගරු ආණ්ඩුකාරතුමාගෙන් විමසීමක් කරන ලෙස ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් දන්වන ලදී.

## 03.18 අම්බලන්ගොඩ මහජන ක්‍රීඩාංගනයේ පස් පිළිබඳ පරීක්ෂණ වාර්තාව සභාගත කරන ලදී .(පස් පරීක්ෂා කිරීම සඳහා රු.696303/- ක මුදලක් වැය වන බව වාර්තා කර ඇත)

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

අම්බලන්ගොඩ මහජන ක්‍රීඩාංගනයේ පස් පිළිබඳ පරීක්ෂණ වාර්තාව පහත පරිදි වේ. මේ සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ පස් සඳහා සිදුකරනු ලබන පහත සඳහන් ගාස්තු අයකරන බව වාර්තා කර ඇත. මෙම මිල ගණන් වර්ග මීටර් 250 ක් සඳහා බවත් එ සඳහා 8%ක වැට් ගාස්තු ගෙවිය යුතු බවත් වාර්තා කර ඇත. කම්පැක්සන් ටෙස්ට් රු.4130/= , ස්ට්‍රිව් ටෙස්ට් 2105/=,සී.බී.ආර්. ටෙස්ට් රු.4380/=, ලෙක්වට් ලිමිටඩ් රු.3200/= , ස්ට්‍රෑන්ඩ් ටෙස්ට් රු.1910/= , රු. 15725/= වැට් රු.1258/= සම්පූර්ණ මුදල රු.16983/=, මහජන ක්‍රීඩාංගණයේ මුළු වර්ග ප්‍රමාණය 10328. 10328÷250=41.3 කි.16983/= වැය වන බැවින් සම්පූර්ණ පරීක්ෂණ ගාස්තු රු.696303/= මුළු ක්‍රීඩාංගණයේ පස් සඳහා පරික්ෂා කිරිමට වැයවන බව වාර්තා කරනවා. ඉදිරි කටයුතු සඳහා යොමු කරනු ලබනවා. ඊට පසු වාර්තාවේ තිබෙනවා මේ විදියට. 1 හි අවධානය යොමු කරමින් එහි සටහන් කර තිබෙනවා. සභාපතිතුමාගේ නිර්දේශ හා තාක්ෂණසේවා නිලධාරි වාර්තා කර ඇති අතර 2020.02.11 දින සභා තින්දු අංක 8.24 පරිදි මහජන ක්‍රීඩාංගණයේ පිරවන ලද පස් සම්බන්ධ වාර්තාවක් මාර්ග සංවර්ධන අධිකාරියෙන් ලබා ගත යුතු අතර ඒ සඳහා තාක්ෂණ ගණනය කිරිම් අනුව රු.696303/= ක මුදලක් දැරිමට සිදුවේ. ඒ අනුව සභා අරමුදලින් රු.696303/= ක මුදල වියදමින් මෙම පරික්ෂණ වාර්තා මුදල ලබා ගත යුතු අතර එනම් පරික්ෂණ බිලෙහි කර්මාන්ත වටිනාකම රු.448188/= ක මුදලක් වේ. මේ සඳහා සභාවේ අනුමැතිය මොකක්ද කරන්නේ කියා ඉල්ලා සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමා, ඕකේ අපි කිවුවේ මුළු ක්‍රීඩාංගණයම පරික්ෂණයක් කරන්න නෙමේ. ගරු උප සභාපතිතුමාත් , ඔබතුමාත් , මාත් අපි මන්ත්‍රිවරු කිහිපදෙනෙකු ගියා. මේ ක්‍රීඩාංගණයේ තිබුණේ අර එහා පැත්තත් බෝගහපැත්තත් දේවානන්ද විද්‍යාලය පැත්තත් ඇස්දෙකට පෙන්න කිරිමැටි දමා තිබ්ලා කිරිමැටිත් ගෙනත් පෙන්නුවා. එතකොට අපි කියන්නේ මේ හදන ක්‍රීඩා පිටිය ඉතාමත් ලස්සනයි. ඔබතුමා ඇතුළු අප සියළු මන්ත්‍රිවරුන්ට එහි ගරුත්වය තිබෙනවා. එතකොට මේ හදන දේ අවුරුදු ගණනාවකට මෙය තිබෙනවා. එතකොට ඔබතුමාත් මමත් මෙතන සිටින බහුතර මන්ත්‍රිවරුත් මේ ක්‍රීඩාංගණයේ සෙල්ලම් කරපු උදවිය. මේ පැත්තේ මුල්ලත් මෙතැන මුල්ලත් , බෝගහ මුල්ලත් අපි කුඩා කාලයේ සිටම වැස්සක් වැස්සොත් මේ තැන් මඩ වෙනවා. එතකොට අපි අත්දැකපු මේ දේ . අපි මේ මිලයන ගණනක් වියදම් කරලා . පිට්ටනිය ලොකු කරලා අපි ඕකමනම් දායද කරන්නේ අපේ අනාගත පරපුරට ඔබතුමා ඇතුළු මන්ත්‍රිවරු මෙහි කොටස්කරුවන් බවට පත්වෙනවා. එමනිසා මේ ලැබුණු ප්‍රතිපාදන වලින් දූවා දරුවාටත් නිසි ප්‍රයෝජන ගන්න ඔබතුමා ඇතුළු මේ සියළු මන්ත්‍රිවරුන්ට පාරේ බැහැලා යන්න උවමනාවකුත් තිබෙනවා. මොකද අපේ ආත්ම ගරුත්වය අපි සවුත්තු කරගන්න කැමති නැහැ. එමනිසා මා කියන්නේ මෙන්න මේ කිරිමැටි තිබුණ ප්‍රදේශය පමණක් අහඹු ලෙස තෝරා ගත්ත ස්ථාන කිහිපයක ඔය පරික්ෂණය කිරිම තුළින් මා හිතන්නේ නැහැ ඔය රු.696303/= ක මුදලක් වැය වෙයි කියා. මොකද අපි කියන්නේ මෙකට අත ඔසවන්න ඕන අත්සන් කරන්න ඕනේ මේ මන්ත්‍රිවරු සියළු දෙනා. මේ ගෙවීම කරන්න. එතුමා වරදක් කර තිබුණා. අපි ඇස්දෙකට දැක්කා. කිරිමැටි කියා. මෙහි තලයක් හදලා වතුර දැම්මොත් වතුර බහින්නේ නැහැ. ඒ කියන්නේ වැස්සට පස්සේ ඔය තලය උඩ වතුර පිරෙනවා. එතකොට මේ මේ මිලයන ගණනක් වියදම් කර හදන ක්‍රීඩාංගණය ඒ තත්ත්වයට පත් වුණහොත් ඔබතුමා ඇතුළු මේ සියළු දෙනාට අහිතකර බලපෑමක් එල්ල කරනවා. එමනිසා මා කියන්නේ එම කොටසේ පමණක් ඒ කිරිමැටි තිබුණා කියන කොටසේ පමණක් යම්කිසි ප්‍රමාණයක් අහඹු ලෙස තෝරා ගත් කොටස් කිහිපයක පමණක් පරික්ෂණ කරලා ඒ පරික්ෂණ වාර්තාව අනුව ගෙවිම් කටයුතු කරන්න. මා හිතන්නේ එයට අපේ මන්ත්‍රිවරු කවුරුත් විරුද්ධ වෙන එකක් නැහැ. මේ අපේ ක්‍රීඩාංගණය . අපි අනාගත පරපුරට දායාද කරන ක්‍රීඩාංගණය. දැන් ඕනෑම ක්‍රීඩාංගණ තරඟයක් පැවැත්විමට හැකියාව තිබෙනවා. එමනිසා අපි ඔබතුමාගෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා. අපි සියළුම මන්ත්‍රිවරු හරියට අවධානය යොමු කරලා . මේ ඕනකරන තැන් අහඹුලෙස තෝරාගත යුතුයි. මෙතැන සිටිනවා ඕනෑම තරම් මන්ත්‍රිවරු අපේ ගරු උප සභාපතිතුමා, අතුල මන්ත්‍රිතුමා, රහුල මන්ත්‍රිතුමා, සරත් චන්ද්‍ර මන්ත්‍රිතුමා අපි කට්ටිය කවුරුත් දැක්කා. අන්න ඒ කිරිමැටි තිබුණ තැන්වල අහඹු ලෙස තෝරාගත් තැන් හයක හතක පමණක් මේ පරික්ෂණය කරලා මේ ගෙවිම කරන්න. එයා එහෙම වරදක් කර

තිබෙනවා නම් එයාට කියන්න හරි පස් දමා මෙය යථා තත්ත්වයට පත් කරලා ඔබතුමා ඇතුළු මේ මන්ත්‍රිවරුන්ගේ අධික්ෂණය යටතේ සිදු කරන්න.

**ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, එතුමාගේ වගේ අදහසක් මගේත් තිබෙනවා. දැන් මෙය මගේ පුද්ගලික අදහස. දැන් මේ පිට්ටනිය හදලා ඉවරයි. දැන් මෙතැන ගැටළුවක් නැහැ වැස්සේදිත්. මේකේ ප්‍රශ්නයක් නැහැ. ජලය රැඳෙන්නේ නැහැ. එමනිසා මා කියන්නේ මුදලක් වියදම් කර පරික්ෂණ කරන එක වැඩක් නැහැ කියා මාගේ මුල්ම අදහස. හැබැයි අපි සභාව ගත් තීරණයක් අනුව එහෙම තිරණය කරන්න පුළුවන් ද කියන එක මා දන්නේ නැහැ. මේ තියෙන තත්ත්වයේදි පරික්ෂණ අවශ්‍ය නැහැ. දැන් අපි මේ පරික්ෂණ කරන්නේ මොන පදනම මත ඉඳගෙනද? මොකක්ද අපේ අවශ්‍යතාවය. කම්පැක්ෂන් 95%ක් තියෙන්න ඕනද ? 98% තියෙන්න ඕනැද ? 90%ක් තියෙන්න ඕනැද ? කොහේද තිබෙන්නේ දිලා කම්පැක්ෂන් මේ සියයට ගණක් තියෙන්න ඕන කියා. කොහේවත් එහෙම කියලා නැහැ. මොකක් හරි අපේ මෙකක් තියෙන්න ඕන පරික්ෂණ කරන්න. අපිට කියනවා නම් මෙතැන 95% කම්පැක්ෂන් තියෙන්න ඕන කියා. අන්න එකට 95% තියනවාද කියා පරික්ෂණ කරන්න පුළුවන්. දැන් වාරිමාර්ගයේ දෙනකොට දෙනවා 95% තියෙන්න ඕන කියා. මෙන්න මේ ටික 90% තියෙන්න ඕන. එහෙම කොහේවත් දිලා නැහැ. ඒක එකක්. ඒ යන වාහනය අනුව ඒ තියෙන්න ඕන තත්ත්වය අනුව තමයි ඒ තියෙන්න ඕන ගණන දෙන්නේ. ඉතිං මෙකේ කොහේවත් දිලා නැහැ. අනිත් එක මෙකේ බර වාහන දමා දුවන්නේ නැහැනේ. මේක මිනිසුන් දුවන ක්‍රිඩාංගණයක්. එක පරික්ෂණ කරන්න කිවුවාට 90%ක් පරික්ෂා කරන්න කිවුවාම ඒක සමත් වෙනවා. මා කියන්නේ මේ වේලාවේ හැටියට එහෙම වියදම් කරලා පරික්ෂණ කරලා වැඩක් නැහැ. මට එක උදවුවක් කරන්න පුළුවන් ඔබතුමලා කියනවා නම් මාගේ ව්‍යාපෘතියේ පරික්ෂාගාරයක් තිබෙනවා . මට පුළුවන් අපි එන්නේ නැතිව අපේ පරික්ෂණාගාරයට ගිහින් පරික්ෂා කර ගත හැකි මෙන්න මේවා තියෙන්නේ කියා. එකට සතපහක්වත් වියදම් කරන්න ඕන නැහැ. මාගේ පරික්ෂණාගාරයේ කරන්න පුළුවන් . ඒ අය පරික්ෂා කර වාර්තාව ලබා දෙයි හරියට. මට මේ උදවුව කරන්න පුළුවන්. මා නම් කියන්නේ මේ වේලාවේ රුපියල් 6000/=වත් වියදම් කරන්න අවශ්‍ය වෙන්නේ නැහැ. මාගේ අදහස . කරන්න ඕන නම් පොඩි ගැටළුවක් තිබෙනවා. අපි ගියපාර කිවුවා මෙය පරික්ෂා කරන් ඕන කියා. එමනිසා එය කරන්න ඕන නම් ඔබතුමලා තීරණය කරන්න. මට ප්‍රශ්නය තියෙන්නේ මේ පරික්ෂණය තියලා මෙය අසමත් කරන්නේ කොහොමද අපි. එම කොන්ත්‍රාත් එකට මේය අසමත් කියා කියන්නේ කොහොමද . මොහොකට විරුද්ධව පරික්ෂණ කරනවාද කියා මටනම් තෙරෙන්නේ නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු මන්ත්‍රතිතුමා තාක්ෂණික ගැටළු තිබෙනවා. දැන් මේ සභාවේ දැක්කාම එය කිරිමැටි කියා කිවුවා. නමුත් එය කිරිමැටිද කියන එක බලා ගන්න තමයි බැලුවේ. දැන් ක්‍රීඩාංගණයට දමන එක කොච්චර සියයට ප්‍රමාණයක් ද කියන එක නෙමෙනේ බැලුවේ. මෙය කිරිමැටිද නැද්ද? එච්චරයි.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ගරු මන්ත්‍රීතුමා අපි ඉවත් කරන්න කියන එක ඉවත් කළා. තාක්ෂණසේවා නිලධාරි මහතා මොකද කියන්නේ. ඔබතුමලා ඉවත් කරන්න කියපු ටික අපි ඉවත් කරන්න කිවුවා. දැන් මන්ත්‍රීතුමන්ලාට මා කියන්න ඕන. ඔය රු.448150/= ගෙවන්න තමයි පරික්ෂණ කරන්න කියන්නේ. එහෙම කරන්න වෙනවා. බිල්පතෙහි වටිනාකමරු.448150/=.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

දැන් අපිටත් ඕනේ කවුරුවත් පස් දමපුවා අපහසුතාවයට පත් කරන්න නෙමේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

සභාවෙන් දාපු ටිකකට . ගෙවීමට විරුද්ධව තමයි . මේ පරික්ෂණය කරන්න කිවුවේ. එහෙනම් සභාවෙන් දාපු ටිකට තමයි මේ පරික්ෂණය කරන්න ඕනේ. එතකොට ගෙවන්න ඕනේ රු.448150/=. ඉතිං මේ පරික්ෂණ සඳහා යන වියදම අපි දරන්න වෙනවා. තේරුමක් නැහැ කියන එක තමයි මගේ අදහස.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මේ ගෙවිම ගැන තර්ක කරන්නේ නැහැ . දැන් මෙහෙමයි වැඩක් කළාම මුදල් ගෙවන්නත් ඕන. මෙහි අපේ තිබෙන මේවා නිසා එම කොන්ත්‍රාත්කරු හරි පස්දමන කෙනා හරි අමාරුවේ වැටෙනවා. එතකොට තමුන්නාසේලාත් මෙහි වගකිමක් ගන්න ඕන. දැම්මට පෙර පස් දැම්මට පෙර පස් දමන වේලාවේ පස් කොහොමද ? නිත්‍යානුකුල තත්ත්වය තුල කොහොමද දන්නේ ? ඒ එන විදිය ක්‍රමවේදය අනුගමනය කරන්න ඕනේ ඔබතුමලා සභාවේ ගත් තින්දුත් එක්ක කටයුතු කරන්න. මේ සම්බන්ධව කතා කරන්න ගියාම දැන් මෙතැන වැඩේත් කරලානේ තියෙන්නේ. වැඩේ කරලා ඇත්තේ මොකද තමුන්නාසේත් ඕකට නිර්දේශ දිලා ඇති. වැඩය කරනවා. කරනකොට ඇත්තටම සභාවේ තින්දුව සලකා නැහැ. ලක්ෂ 10ක් ගියත් සභාව ගත්ත තින්දුව සලකා නැහැ. එකත් මතක තියා ගන්න. අපි මෙකට විරුද්ධ විමක් නෙමේ කියන්නේ. අපි මේක

කළ යුතුයි. අපි විපක්ෂනායකතුමා වගේ කිවුවා මෙහි යම් ගැටළුවක් තිබෙනවා. එක වෙනම කතන්දරයක් . නමුත් මෙය ගත්ත මනුස්සයාත් අමාරුවේ. අපේ සභාවට ඔය වාර්තාව දෙන්න ඕන අපි ඉල්ලපු සභාවට පස්සේ සභාවට. අත්‍යවශ්‍යසේවා කටයුත්තක් කරන්නේ. සංවර්ධනය වේගන යන. මාස හයකට පසු තමයි මේක එන්නේ. මේ කතන්දරය කලින් ආවානම් අපි කතා කරලා මොකක් හරි තින්දුවක් ගන්නවා. දැන් කතා කරලා තින්දුවක් ගන්න. හැබැයි මොනවා හරි කරුණු කරණාවක් වෙලා වගකීම කවුද ගන්නේ කියන එකත් තින්දු කරලා ගන්න . අපට ප්‍රශ්නයක් නැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

සභාවෙන් මේ සභා කළයුතු කාර්ය කුමක්ද කියා විමසනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

අපිත් මේ ගැන කතා කළ යුතුයි. අපිත් ගිහින් බැලුවා මේ දමා තිබෙන පස් මොනවාද කියා. මා , ඩෙනට් මන්ත්‍රීතුමා ඇතුළු අය. නමුත් අද වෙනකොට තත්ත්වය බලා තිබෙන්නේ. හැබැයි ධම්මික මන්ත්‍රීතුමා කියන විදියට අපි මොකකට විරුද්ධව මේ විරුද්ධ වෙන්නේ. මොන දත්තයන් පිළිබඳවද අපි විරුද්ධ වෙන්නේ. එහෙම නම් එතුමා කියන විදියට සම්පූර්ණම කිරිමැටි දමා මේ පිට්ටනිය හදලා දුන්නාත් අපි භාර ගන්න ඕන. මොකද අපි තත්ත්වය පිළිබඳව දිලා නැහැ. කොන්ත්‍රාත්කරුට. පස් දමන්න ඕන කියා. එහෙම කාරණයකුත් මෙතැන තිබෙනවා. එතකොට අපි අසුවෙලා ඉවරයි. මන්ත්‍රිවරු දන්නේ නැහැ ක්‍රිඩා පිටි හදන්න. අපි දැහැට ගිහින් බැලුවාම අපි දුටුවා මෙතැන පස් වර්ග කිහිපයක් තිබෙනවා. අපි පස් පරික්ෂා කරන්න දන්නේ නැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ගරු මන්ත්‍රීතුමා අපි ගිහින් බැලුවාට පස්සේ මෙකේ තිබෙන පස්ටික අයින් කරන්න කියා.එය අයින් කළා. දැන් අයින් කර තමයි මේ තත්ත්වය තිබෙන්නේ. අපිට කමක් නැහැ මේ පරික්ෂණය ඕන දෙයක් කර කළාට. අපි එය කළාට පස්සේ තේරුමක් නැහැ තව දුරටත් මෙහි එල්ලිගෙන ඉන්න එක.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

තාක්ෂණසේවා නිලධාරින් කියනවා නම් මේ පස් අයින් කර වෙනත් පස් පුරවා මෙය හැදුවා කියා අපිට එය භාර ගන්න වෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, සභාවක් විදියට අපේ නිලධාරින් ඊට ඉහළ නිලධාරින්ගෙන් උපදෙස් පතලා තිබෙනවා. සභාවේ අනුමැතිය. ඒ කියන්නේ පළාත් ඉංජිනේරුතුමාගේ. පළාත් ඉංජිනේරුතුමා උපදෙස් දුන්නාට පසු අපිට ඕන තින්දු ගන්න පුළුවන්ද කියන ප්‍රශ්නයත් එනවා. එක තාක්ෂණය. එකනිසා සභාව බේරෙන්නත් ඕන මේ තත්ත්වයෙන්. අධිහාරයක් ආවොත් ඉංජිනේරුවරයාගේ උපදෙස්වලට වැඩ කරලා නැහැ කියන එක. මේ ව්‍යාපෘතියේ වැඩ කරලා නැහැ කියන එක එනවා. එතකොට විගණකවරුන්ගේ තින්දුව කුමක්ද කියන එක බරපතල ප්‍රශ්නයක්. එමනිසා අර මන්ත්‍රීවරුන් යෝජනා කළා වගේ අඩුම වශයෙන් පස් නියැදි තුනක් හෝ දෙකක් පරික්ෂණය කරලා ඒ වාර්තාවක් මෙයට ලබා ගන්න එක හොඳයි කියන එක මා විශ්වාස කරනවා.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අපේ මේ නලින් මහතා පස් අයින් කරලා අලුතින් පස් දමනවා ඡායාරූපයක් අරගෙන තිබෙන්නේ. මට පෞද්ගලික මේකක් නැහැ. සභාවක් ගන්න තින්දුවක් කියන්න.

**ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ. සෝභිත රංජිත් මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, එදා සභාවේදි කිවුවා මෙය පරික්ෂණයට යවා ඒ තීරණය අනුව ගෙවන්න කියා. දැන් පරික්ෂණයට නැර අපි තීරණයක් ගතහොත් මෙය යවන්න කියා මෙහි ප්‍රශ්නයක් වුණොත් එහි වගකිම කවුද භාර ගන්නේ කියා. තාක්ෂණසේවා නිලධාරින් භාර ගන්නවාද එහි වගකීම. මා කැමැත්ත ප්‍රකාශ කරන්නේ කවුරු හරි වගකීම භාර ගන්නවා නම් විතරයි.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

තාක්ෂණසේවා නිලධාරින් මෙහි වගකීම භාර අරගෙන මේ බිල්පතෙහි අත්සන් කර තිබෙනවා. අත්සන් කරලා මෙය සාධාරණව කෙරුණා කියා. ඒක භාර අරගෙන ඉවරයි දැනටත්.

**ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ. සෝභිත රංජිත් මහතා කතා කරමින්**

දැන් අවුරුද්දකින් දෙකකින් ප්‍රශ්නයක් ඇතිවුණොත් අපි හැමෝටම මෙයට බැණුම් අහන්න සිද්ධ වෙන්න පුළුවන්. එමනිසා මා මෙයට කැමැත්ත ප්‍රකාශ කරන්නේ කවුරු හරි වගකීම භාර ගන්න ඕන මෙය හරියටම කරා කියා. අපි සභාව කියා තිබෙන්නේ මෙය පරික්ෂණ වාර්තාව අනුව මේ මුදල ගෙවන්න කියා. අපි දැන් පරික්ෂණ වාර්තාව නැතිව මෙය ගෙවලා මා කැමති නැහැ

වැරදිකරුවෙකු ඉන්නේ. එමනිසා කවදා හරි අධිහාරය වුණොත් එහි වගකීම කවුරු හරි කෙනෙක් භාර ගන්නවා නම් මා එය ගෙවන්න කැමතියි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, දැන් කොන්ත්‍රාත්කරුවන් දැඩි අපහසුතාවයට පත්වෙනවා මේ මුදල් ගෙවන්න පරක්කු වුණාම. ඒ අය අසරණ තත්ත්වයට පත් වෙනවා. හැබැයි මාත් ඉල්ලීමක් කරනවා. මේ පස් පිළිබඳ පරක්ෂණයක් කරන්න කියා සභාවේ ලොකු ප්‍රශ්නයක් ඇති වුණා. එතකොට මාධ්‍යයත් මෙය වාර්තා කළාද දන්නේ නැහැ. එහෙමනම් මෙය අපි තහවුරු කරන්න ඕන. තහවුරු කරලා යන්න වාර්තාවක්. දැන් අපි හැමෝම මෙය පරික්ෂා කරන්න කිවුවානේ. මා නම් පරික්ෂා කරන්න කිවුවේ නැහැ. පරික්ෂා කිරිම් කරන්න කියා සභාව අනුමැතිය දුන්නා නම් එය නිවැරදි කරන්න ඕන . ඒ පස් ඉවත් කළා. පස් පිරවීමේ කටයුතු හරියට කෙරුණා. එමනිසා ක්‍රිඩාංගණයේ වැඩ කටයුතු සිදු කිරිමට බාධාවක් නැහැ කියා. හදිස්සියේ ක්‍රිඩාංගණය හදලා මොනවාහරි ප්‍රශ්නයක් ඇති වුණොත් එහෙම එක කළේ නැහැ. එකයි මේ අපි නවක මන්ත්‍රිවරු අපි කිසිම දෙයක් දන්නේ නැහැ. ඔබතුමලා කරුණ දක්වා කිවුවාම එය කරන්න කියා අපිත් එයට කැමති වෙනවා. එය නිවැරදි විය යුතුමයි. එහෙමනම් මේ සභාවේ සියළුම දෙනා කැමති වෙන්න ඕන. මේ පස් ඉවත් කළා. මෙහි කිසිම ප්‍රශ්නයක් නැහැ. මෙහි පරික්ෂා කිරිම් අවශ්‍ය නැහැ කියා. පරික්ෂා කිරිම් කෙරෙන්න ඕන නම් එය කරන්න ඕනනේ. අයේ නිෂ්ප්‍රභා කරනවා නම් තීරණයකට එන්න ඕන. නැතිනම් මෙතුමා කිවුවා වගේ මා කියනවා වගේ ක්‍රිඩා පිටියේ මොකක්හරි අවුලක් වුණොත් එහෙම මෙන්න මේ විදියට කරලා සභාව අධිහාර කරයි. මේවාට ගෙවිම් කරන්න වෙනවා අපිට. මෙවායින් නිදහස් කරන්න .

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

දැන් තාක්ෂණසේවා නිලධාරිතුමනි, මේ ගෙවීමේ තිබෙන්නේ මේතැන මේ දමනු ලැබු පස් ටිකේ. මෙතැන කොනේ තිබෙන පස්ටිකට අතන පරික්ෂා කරනවා නම් ඇත්තටම මේ පරික්ෂණය සඳහා යන වියදමට මා අද විරුද්ධව ඡන්දය දෙනවා. අවශ්‍යතාවය පරිදි මිසක අනවශ්‍ය විදියට මුදල් වියදම් කරන්න සභාව විසින් කිවුවත් මා විරුද්ධයි. එය මාගේ පෞද්ගලික මතය. හැබැයි බහුතරයේ මතය පරිදි කටයුතු කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, දැන් ඔතන ප්‍රශ්නය තිබුණේ කිරිමැටි දැම්ම සම්බන්ධව. කිරිමැටි දැම්ම තුළින් ජලය බැස යන්නේ නැහැ කියන එකනේ විපක්ෂනායකතුමත් ප්‍රකාශ කළේ. එතකොට මේ කිරිමැටි අයින් කර තමයි මේ පස් දමා තිබෙන්නේ. දැන් පසුගිය කාලයේ අධික ලෙස වර්ෂාව වැස්සා. එහෙමනම් ඒ වර්ෂාව වැස්ස නිසා ජලය බසින්නේ නැතුව ජලය තැන්පත් වෙලා ඇති. එහෙම තත්ත්වයක් නැහැනේ.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

මීට අමතරව කියන්න ඕන. අපේ Screen Printers වැඩ කලාම ලිටර් 64000 ක ජල ප්‍රමාණයක් අපේ ක්‍රීඩාංගණයට වදිනවා. දැන් ඒ විදියේ ඒවා දැන් දවස ගණනෙම වදිනවා. එත් වතුර රැදෙනවා කියා මෙකක් නැහැ කොහේවත්. වැස්ස විතරක් නෙමේ අපි කෘතිම වැස්සක් හැමදාම දෙනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, අපි මෙයට විරුද්ධ වෙනවා නෙමේ. මේ ප්‍රශ්නයට පිළිතුරු එන්න එපැයි. ප්‍රශ්නයක් සභාව දුන්නාම මෙන්න මේ විදියට නිවැරදි වෙන්න ඕන කියා තමුන්නාසේලා නිර්දේශ ලබා දුන්නාම කිසි ප්‍රශ්නයක් නැහැ අපි අනුමැතිය දෙනවා. මොකද නිත්‍යානුකුලව තමුන්නාසේලා නිර්දේශ ලබා දිලා තිබෙනවා. අපි එය දෙනවා.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

මන්ත්‍රීතුමා මෙය කාර්මික නිලධාරි මහතුන් නිර්දේශ කළා. මෙය සභාවයි කිවුවේ අපිට සැකයි. පරික්ෂණයක් කරන්න .

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

මුලින්ම කරුණු කාරණා මෙය වැඩියේ හරන්න අවුසන්න අවශ්‍ය වන්නේ නැහැ. මෙහි කිරිමැටි තිබෙනවා. මෙහි වතුර බහින්නේ නැහැ. එමනිසා මෙය ඉවත් කර පස්කියුබ් හැට ගණනක් දමන්න ඕන කිවුවා. එතකොට තමයි ඔය ප්‍රශ්නය ඇති වුණේ. නැතිනම් ඇත්තටම අපි ක්‍රීඩාංගණය හදන්න ඕන කියන මතයේ අපි සිටියේ. එතකොට අරක අවාට පස්සේ මේ දාපු ටිකත් කිරිමැටියි කියලානේ ප්‍රශ්නය ආවේ. දැන් ඇත්තටම අපි මෙය ගෙවන්නත් ඕන. මේ ක්‍රීඩාංගණය හැදෙන්නත් ඕන. හැබැයි මෙය මන්ත්‍රීවරුන්ගේ අදහස අනුව ක්‍රියාත්මක කරන්න බැලුවාම අපිට ඇත්තටම හරියට කනගාටුදායකයි. මේක තමයි ප්‍රශ්නය. මේකට විතරක් නෙමේ. අපි දැන් සභාවේ උදාහරණයක් විදියට ගත්තාම මේ පස් ප්‍රශ්නය නිසා අපි කතා කරන්නේ. මෙහි ජනතාවට

දෙයක් කරලා බැණුම් අහනවාට වැඩියේ හොඳයි නොකර ඉන්න එක. එතකොට සභාව ගන්න තින්දු තීරණ සභාපතිතුමා තමුන්නාසේලාට භාර දුන්නාම එහි නිවැරදි මාර්ගය සොයා දෙන්න දැන ගන්න ඕන. මේ අලුත් මන්ත්‍රීවරු ඉන්නේ. එතකොට මෙය බලා හරි කිසි ගැටළුවක් නැහැ. අපිට කිසි ප්‍රශ්නයක් නැහැ. එමනිසා තමුන්නාසේලා වගකීම භාර අරගෙන එම කටයුත්ත කරන්න. එහෙම කිසි ප්‍රශ්නයක් නැහැ. එතකොට හරි. මේ ප්‍රශ්නය අද අවසන් කර දමන්න. ලිඛිතව දිලා දමන්න. ඒ කියන්නේ ක්‍රිඩාංගණයේ කිසි ප්‍රශ්නයක් නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මමත් එකඟ වෙනවා. කාර්මික නිලධාරින් එය හරිගස්සා තිබෙනවා. වරදක් වෙලා තිබෙනවා. එම වැරැද්ද නිවැරදි කර තිබෙනවා. මා ලැහැස්තියි අධිභාරය ගන්න වුණත් එතුමන්ලා සමඟ එකට ඉන්න. එතුමන්ලා නිර්දේශ කරනවානම් මා තනියම වුණත් ගෙවන්න කැමැත්ත ප්‍රකාශ කරනවා. ප්‍රශ්නයක් නැහැ. ඒ කොන්ත්‍රාත්කරුට ගෙවන්න. එම භාරලක්ෂ ගණන මාගේ පුද්ගලික මුදලින් මා හරි ගෙවනවා. මිනිසුන් අසරණ කරන්න හොඳ නැහැ. ඒ මිනිසුන් වැඩ කරලා . දැන් අතුල මන්ත්‍රිතුමාට වැඩ කරන්න මිනිසුන් නැහැ. අතුල මන්ත්‍රිතුමාට වැඩ කරන්න කොන්ත්‍රාත්කරුවන් නැහැ සොයා ගන්න. මා කියන්නේ එක ගෙවන්න. අපිට සැහැමකට පත්වෙන්න ඕන නම් ඔය කියන තැන්වල පරික්ෂණ ටිකක් කරන්න. එහෙම කරලා ඒ අය නිදහස් කරන්න. ඒ අයට ගෙවන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මෙතැන දැන් ධම්මික මන්ත්‍රිතුමා කිවූ පරිදි මෙතැන මුල ඉඳලාම වරදක් වෙලා තිබෙනවා. එයට හේතුව එයට වගකියන්නත් ඕන අපේ තාක්ෂණසේවා නිලධාරින්. මොකද හේතුව ක්‍රිකට් ආයතනය මේ ක්‍රිඩාංගණය හදන කොට ක්‍රිකට් ආයතනය විශාල මුදලක් දෙනකොට ක්‍රිකට් ආයතනයක් මෙයට තාක්ෂණ වාර්තාවක් හරියට දෙන්න. අපි ඔබතුමාවත් මේ මන්ත්‍රිවරු කවුරුවත් අපි දන්නේ නැහැ. එතකොට ක්‍රිකට් ආයතනයෙන් මේ සභාවට දෙන්න ඕන මෙන්න මේ පස්වල මේ තත්ත්වය තුළ පස් අඟල් මෙච්චර ප්‍රමාණයකට මෙන්න මේ විදියට මෙය හැදෙන්න ඕන කියා ක්‍රිකට් ආයතනයෙන්. මේ ක්‍රිඩාංගණ හදන්නේ මේ ක්‍රිකට් ආයතනයෙන්.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ගරු මන්ත්‍රිතුමා මෙතනදි කොන්ත්‍රාත් මේවා දෙකක් ගියා. එකක් ඇවිල්ලා අපේ ක්‍රිඩා අමාත්‍යාංශය මඟින් කොටසක් කළා. ඒ කළාට පසු මේ පැත්තේ කොටස නිරන්තරයෙන් ජලය

එන්න ගත්තේ. බට ටික දමන විට අඩියක් හරන විට ජලය එන්න ගත්තේ. එතාකොට මෙහි මේවා දමා පුරවා අවසන්. ක්‍රීඩා අමාත්‍යාංශය කරන ලද කොටස තුළ. එම කොටසේ තමයි මේ ජලය ප්‍රශ්නය තිබෙන්නේ. එතකොට තමයි සභාව තීන්දු කළේ මෙතැනින් පස් අයින් කරලා මේ විදියට පස් දමන්න කියා. එතකොට ක්‍රිකට් ආයතනයෙන් කළේ මෙහි තණකොළ හිටවීම සහ අඟල් 4ක Top Lear එකක් දැම්මා. එය අඟල් 4ක් පමණ. ඊට පස්සේ අඟල් තුනක තණකොළ හිටවන්න දමා තිබෙනවා. ඒ ටික විතරයි ඒ අය දමා තිබෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමා දැන් අපි දැක්කේ මේ බෝගහ පැත්තේ Top Lear එකේ. කිරිමැටි තිබුනේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එම Lear එකේ තමයි අපි උපදෙස් දුන්නේ කිරිමැටි ඉවත් කරන්න කියා. ඒ කිරිමැටි ඉවත්කිරීම සිදු කරනු ලැබුවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

ඒ Lear එකේ ඔබතුමාලත් අපි මන්ත්‍රිවරුත් ගිහින් බැලුවේ. ඔබතුමාත් හිටියා . මා කිවුවේ ඔබතුමා ක්‍රීඩාංගණ මීට කලින් හදා තිබෙනවා නේද?

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපි කොන්ත්‍රාත්කරුට කිවුවා ඔයාට හරියට මුදල් ගෙවනවානම් පස් පිළිබඳ ප්‍රශ්නයක්ද ? එය ඉවත් කර දමන්න කියා. ඒවා ගෙන්න ගත්තා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

එහි මා දකින්නේ මට මේ තාක්ෂණසේවා නිලධාරින් සමඟ කිසිම ගැටළුවක් නැහැ. එගොල්ලන්ගේ වගකීම ඔබතුමා ඇතුළු මේ මන්ත්‍රිවරුන්ට පටවන්න බැහැ. ඇස් පෙන්නේ නැද්ද? පාරේ යන මිනිසුන් අපට දුරකථන ඇමතුම් දි කතා කරනවා. කිරිමැටි දමනවා කියා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එය නිවැරදි වුණා.

ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්

එතකොට අපි ඇවිත් පෙන්නුවාට පසු තමයි මේ අය මෙයට අවතිර්ණ වුණේ. ඇයි එහෙම වුණේ . දැන් අපි කියන්නේ එහෙම වෙන්න බැහැ. එකට තමයි තාක්ෂණ නිලධාරින් ඉන්නේ. දැන් ක්‍රිකට් ආයතනයෙන් අපට මේකට වාර්තාවක් දිලා නැහැ. කොහොමද කරන්නේ කියා. මේ විදියටයි මෙහි පස් වැටෙන්න ඕන කියා. එහෙම දිලා නැහැ. තාක්ෂණසේවා නිලධාරි නගර සභාවේ දෙන්න ඕන ක්‍රිකට් ආයතනයට එගොල්ලන් දෙන්න ඕන එහෙම නැතිනම් උපදෙස් අරගෙන කාගෙන් හරි එගොල්ලන් දෙන්න ඕන මෙන්න මේ දත්ත අනුව තමයි මෙකට පස් වැටෙන්නේ. එතකොට ක්‍රිකට් ආයතනය කරලත් නැහැ. නගර සභාවේ ඉන්න තාක්ෂණසේවා නිලධාරිනුත් ඇස් පියගෙන වැඩේ කරලා නැහැ. දැන් මේ තත්ත්වය තුළ ඔබතුමා කියනවා හරි අපි දකිනවා . අපි දන්නවා. වතුර දමනවා මෙච්චර. දැන් මඩ වෙන්නේ නැහැ කියන එක ගැන අපි සතුටුයි. පිට්ටනිය හදන එකනේ අපි සියළු දෙනාගේම සිහිනය තිබ්බේ. අද අපට එය දකින්න සතුටක් තියෙනවා. අවංකවම. හැබැයි මේ කරපු වැඩය යම්කිසි හෙයකින් ප්‍රශ්නයක් වුණොත් අන්න ඒ ප්‍රශ්නය භාර ගන්නේ කොයි තාක්ෂණ නිලධාරියා ද කියන එක ප්‍රශ්නයක්. එහිදි මේ අම්බලන්ගොඩ මිනිසෙකු කවුරු හරි එකතු වෙලා මෙයට පෙත්සමක් ගසා මෙයට පරික්ෂණයක් කරලා යම් අධිභාරයක් වුණොත් එම අධිභාරය ගෙවන්නේ නගර සභාවේ තාක්ෂණ නිලධරියාද ? වගකීම ගන්නේ ඔහුද ? අන්න එතනයි තිබෙන ගැටළුව. එමනිසා ඒවාට යටත්ව ඉක්මනට ක්‍රිඩා පිටිය හැදිලා අපේ දුවා දරුවන්ට මෙය ප්‍රයෝජනයට ගන්න සලස්වන්න. නගර සභාවේ අප සියළු දෙනාගේම අභිප්‍රාය එයයි. අපි අනිත් ඒවා නතර කරගෙන ඔක කළේත් එකයි. එමනිසා විශාල කැප වීමක් ඔබතුමා ඇතුළු අප සියළු දෙනාම නිලධාරින් , ලේකම්තුමිය ඇතුළු ඔක්කොම ඇතුළු ඒ සියළු දෙනාටම අප ස්තුති වන්ත වෙනවා. මෙය අවසන් විම පිළිබඳව. හැබැයි ගැටළුවක් ආවොත් මෙහි වගකීම ඒ අය ගන්න ඕන. මොකද අපි සභාවේ ඒකමතිකව ඉල්ලන ලද දෙයකි. ඒක ඒ නොයවා තමයි මේ කරන්නේ. අනිත් කරුණ ධම්මික මන්ත්‍රිතුමා කිවූ පරිදි එම කොන්ත්‍රාත්කරුට අපි මුදල් ගෙවන්න ඕන. පව්. ඒ මනුස්සයා දැන් මෙයට මුදල් වියදම් කරලා ඒ මනුස්සයා බලාගෙන ඉන්නනවා. මේ මනුස්සයා අමාරුවේ. මේ මහ විශාල ලාභ නැහැ. එතකොට ඒ පුද්ගලයාට මුදල් ගෙවන්නත් ඕන. එතකොට ඒ කරුණු කාරණා ගොඩක් තිබෙනවා. එමනිසා මේ පස් ගන්න තැන සිට පරික්ෂා කරන්න තිබුණා තාක්ෂණසේවා නිලධාරින්ට. එගොල්ලන්ගේ වගකීම පැහැර හැරිම තුළ තමයි මෙය දකින්නේ. එමනිසා සභාව මේ පිළිබඳ තින්දුවක් ගන්න. මා නම් ප්‍රකාශ කරන්නේ මෙහිදි යම් දෙයක් වුණොත් එහෙම එහි වගකිම කවුද ගන්නේ. ඒ අධිභාර කවුද ගන්නේ කියන එක පිළිබඳව ගැටළුවක් තිබෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මේ ක්‍රිඩා පිටිය ගැන කතා කරද්දි එම පස් දමන විට කෙලින්ම ඇඟිල්ල දික් කළා ක්‍රිඩාභූමි භාරකරුට. ඒ අවස්ථාවේ මා සභාවේ කතා කළා. ක්‍රිඩා භාරකරුට එහෙම කතා කරන්න එපා කියා. පස් දමන වේලාවේ ප්‍රමිතිය බලන්න අපේ තාක්ෂණ නිලධාරි කෙනෙක් ඉන්නවා. ක්‍රිඩාභූමි භාරකරුට ඇඟිල්ල දික් කරලා ලොකු වාදයක් ගියා සභාවේ. එතැන ක්‍රිකට් ආයතනයෙන් එන තාක්ෂණසේවා නිලධාරින් සිටිය යුතුයි. නැතිනම් අපේ තාක්ෂණ නිලධාරින් මේ වගකීම ගන්න ඕන.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයෙන් ඒ වගකීම පවරා තිබෙනවා අපේ තාක්ෂණසේවා නිලධාරින්ට. දැන් ක්‍රිකට් ආයතනයේ වුණත් මේ කරන වැඩ වල ගෙවීම් වලට වුණත් අත්සන් කරන්නේ අපේ තාක්ෂණසේවා නිලධාරින්. ක්‍රිකට් ආයතනය සාධාරණව වැඩ කර තිබෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ධම්මික මන්ත්‍රිතුමා කිවු පරිදි එතුමාගේ ආයතනය ලවා මෙය කරන්න පුළුවන් නම් හරි. කොන්ත්‍රාත්කරු අසරණ කරන්න හොඳ නැහැ. අද මගේ ගමේ වැඩ කර ගන්න විදියක් නැතුව මා අසරණ වෙලා තිබෙනවා. මේ රජයෙන් අනුමත වෙලා තිබෙන වැඩ කරගන්න විදියක් නැහැ. මේ රජයෙන් අනුමත වෙලා තිබෙන ලක්ෂ 20 වැඩ කරගන්න බැරිවෙලා තිබෙන්නේ. කොන්ත්‍රාත්කරුවන් නැතුව අසරණ වෙලා ඉන්නේ. කොන්ත්‍රාත්කරුවන් අසරණ වෙනවා. ලක්ෂ 6ක වගේ අනවශ්‍ය වියදමක් සභාව කරන්නේ. ඇත්තටම අනවශ්‍ය දේවල් අපි නොකළ යුතුයි. මේ ඇඟියිම මාස 6ක් 7ක් ගිහින් ඇවිත් මන්ත්‍රිවරු වශයෙන් අපි අසරණ වෙනවා. අධිභාර වෙනවා අපිට. ලොකු ගැටළුවක්. එම හින්දා ක්‍රිඩා පිටිය හැදෙන්නත් ඕන. කිරිමැටි දමා තිබෙනවා නම් ඒවා අයින් කර තිබෙනවා නම් ධම්මික කොඩිකාර මහතාගේ ආයතනය ලවා හරි ඔය කියන ස්ථාන වලින් පස් නියදි අරගෙන පරික්ෂණය කරන්න. කිසි ගැටළුවක් නැහැ. මුදල් වියදම් කිරිම ගැන නම් මාත් විරුද්ධයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මෙය නිර්දේශ කර තිබෙන්නේ කවුද?

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

දැනටමත් තාක්ෂණසේවා නිලධාරින් නිර්දේශ කර තිබෙන්නේ. ගැටළුවක් නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

එය ගෙවිමටද?

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ගෙවීමට.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, එක වැරදියි. මොවුන්ගේ දැනුම මත ඔවුන්ගේ තාක්ෂණය මත මේ දැනුම දෙනවා තමයි. හැබැයි අතපසු වීමක් වුණොත් හිරේ යන විදයට අපි මෙතැන කටයුතු කරන එක වැරදියි. කවදා හරි දවසක මේ අධිභාරය ගෙවන්න සිදු වුණොත් එහෙම ඔබතුමලා කියන විදියට එතුමන්ලා ගෙවන්නේ. එකත් වැරදියි. එමනිසා තමයි මා පැහැදිලිව කිවුවේ. මෙහි සාම්පල් එකක් මේ සභාව මේ නිලධාරින් බේරා ගැනිමට එක සාම්පල් එකක් පරික්ෂා කරන්න යවන්න. මේ රු.16900/= මා දෙන්නම්. කිසිම ප්‍රශ්නයක් නැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඔක්කොම කරන්න ඕන. මෙකේ තිබෙනවා පරික්ෂණ පහක් තිබෙනවා. මේ පහෙන් ඉවත් කරන්න ඕනේ මොකක්ද කියා කියන්න. අපේ පස් දමා නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

මෙතුමා කිරිමැටි ගෙනාවේ එතැනින්. මෙතුමලා දන්නවානේ ගත්තු තැන. මේ සභාව දැන් එකඟ වෙනවා . මේ සත්‍යයක් ප්‍රකාශ කරන්නේ. අපි එකඟයි. අපි සියළු දෙනාම පිළිගන්නවා දැන් මෙය නිවැරදි වෙලා කියා. හැබැයි මෙය මේ නිතියට නිවැරදි කරන්නනේ මේ හදන්නේ. නිතියට දමා මේ නිලධාරියෙකුට අත පිසදමා ගැනීම අපි කළ යුතු නැහැ. මන්ත්‍රිවරුත් හරි. මන්ත්‍රිවරු වශයෙන් අපිත් මේ අධිභාරය භාර ගන්න කැමති නැහැනේ. ඒ නිසා මේ දෙගොල්ලන්ම බෙරෙන්න තිබෙන

එකම ක්‍රමය මේකනේ. දැන් මෙතුමා ගෙනාවා කිරිමැටි නියඩියක්. ඒ කොටස පරික්ෂා කළානම් හරිනේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

දැන් ඔතන ප්‍රශ්නය වෙන්නේ සභාවෙන් ගෙනා ආ කොටස සඳහානේ. සභාවෙන් මේවාට පස්වලට ගෙවන ලද මුදලට. මේ තැනකින් මේවා කරන්න. දැන් අපි පස් දමන එකටනේ ප්‍රශ්නය ආවේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඒ කියන්නේ සභාව යෝජනා කරන්නේ තනි තැනකින් පස් ගන්න කියාද?

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, දැන් සරත් ශ්‍රී ලාල් මහතා කිවු පරිදි මෙහි නිත්‍යානුකූලව සභාවේ මන්ත්‍රිවරු බේරෙන්නත් ඕන. තාක්ෂණසේවා නිලධාරින්ට ගැටළුවක් නොවෙන්නත් ඕන. අර අපි කිවුව තැන ගරු සරත් මන්ත්‍රීතුමා දන්නවා. රාහුල මන්ත්‍රීතුමා දන්නවා. අන්න එතැනින් පරික්ෂණය කරන්න. එක පරික්ෂණයක් කර ඒ වාර්තාව දමන්න. එතකොට වැඩය අවසන්. නිත්‍යානුකූලව හරි.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඩෙනට් මන්ත්‍රීතුමාගේ යෝජනාව කවුද ස්ථිර කරන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

එය ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඒ යෝජනාව එකඟ කවුද ? මේ සඳහා ගරු මන්ත්‍රිවරු 18කු පක්ෂව ඡන්දය දෙනවා. විපක්ෂව මා ඡන්දය දෙනවා. විපක්ෂව දීමට හේතුව ලියන්න. මෙම පස් සියල්ලම ඉවත් කර නැවත පස් දමා ඇති බව වාර්තා කරන බැවිනුත් ඒ වගේම මෙම ගෙවීම සිදු කරන්නේ නගර සභාව විසින් ගෙවීම් කළ යුතු 488148/= පස් දමනු ලැබූ තැන නොවන බැවින් එම මුදල් සභාවේ මුදල් වියදම් කිරීම සභාවේ මුදල් නාස්ති කිරීමක් බැවිනි.

**03.19 අම්බලන්ගොඩ බැඩ්මින්ටන් ක්‍රීඩාංගනයේ 2020 අප්‍රේල්,මැයි,ජුනි යන මාස 03 සඳහා බදු මුදල් අයකිරීමෙන් නිදහස් කරදෙන ලෙස ඉල්ලා බැඩ්මින්ටන් සංගමය විසින් එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

මෙය 03.09 යටතේ ද ඉදිරිපත් කර ඇති බැවින් ඉවත් කරන ලදි.

**තීරණය -**

අම්බලන්ගොඩ බැඩ්මින්ටන් ක්‍රීඩාංගනයේ 2020 අප්‍රේල්, මැයි, ජුනි යන මාස 03 සඳහා බදු මුදල් අයකිරීමෙන් නිදහස් කරදෙන ලෙස ඉල්ලා බැඩ්මින්ටන් සංගමය විසින් එවා ඇති ලිපිය 03.09 යටතේ ද ඉදිරිපත් කර ඇති බැවින් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් එම ලිපිය ඉවත් කරන ලදී.

**03.20 255 අධිකාරිය වන නගර සභා ආඥා පනතේ වගන්තිය ප්‍රකාරව සභාව වෙත අය විය යුතු මුදල් අත්හැරීම** යන මැයෙන් පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් එවා ඇති ලිපියේ අංක 06 (1) පළාත් පාලන ආයතන විසින් බදු පදනම මත ලබාදී ඇති දේපල යන කාරණය සම්බන්ධව සභාගත කරන ලදි.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

පසුගිය මාසවල කොවිඩ් වසංගතය වෙනුවෙන් පළාත් පාලන ආයතන වල සහන ජනතාව වෙත ලබා දීමටත් ඒ විස්තර අඩංගු පළාත් පාලන කොමසාරිස්ගේ අංක 2020.06 දිනැති ලිපිය හා බැඳේ. එම ලිපිය අනුව කඩ කාමර කුලිය සඳහා 2020.03.20 – 2020.06.15 දක්වා දඩ මුදල සම්පූර්ණයෙන් හෝ අනුමැතිය පරිදි ප්‍රතිශතයක් ගිණුම් වලින් අයින් කිරිම යන කරුණු සඳහන් වේ. ඒ අනුව අම්බලන්ගොඩ නගර සභාව මඟින් කඩකුළී නියමිත දිනට ගෙවීම නොකළ බැවින් අයකරන ලද දඩ මුදල් 2020.03.20 සිට 2020.06.15 දක්වා අය නොකිරිමට සුදුසු යැයි යෝජනා කරනවා. ස්ථිර කිරිම කරන්න. ස්ථිර කිරිමක් නැහැ. එමනිසා යෝජනාව ඉවත් කරනවා. මතක තියා ගන්න මන්ත්‍රිතුමලා . මෙවැනි සහනයක් ඉල්ලාගන්න තව මාස 6කින් බැරි වෙනවා. මොකද යෝජනාව කරලා යෝජනාව ස්ථිර කරන්නේ නැති නිසා

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

මා ස්ථිර කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

දැන් යෝජනාව ඉවත් කර තිබෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

නැහැ මා දන්නේ නැහැ යෝජනාවක් කියා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

දැන් ඉතිං කරන්න දෙයක් නැහැ. දැන් ඉතිං ඉවත් කලානේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මා යෝජනාව ස්ථිර කරන්න. ජනතාවට සහනයක් දෙන්න යෝජනාවක් කළාම

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

එකතමයි මේ කරුණු කරණා මේවා කරනකන් ඉන්න. ඔබතුමා මේ ගහෙන් ගෙඩි එන්න වගේ කියලා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

සභාපතිතුමා කෙන්ති ගන්න එපා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මා කෙන්ති ගන්නවා නෙමේ. ජනතාවට සහන දෙන්න යනකොට කල්පනාවෙන් ඉන්න. මා කඩහිමියන්ට සහනයක් දෙන්න යෝජනාවක් කළා. කඩහිමියනුත් මෙතැන සිටියදි ස්ථිර කළේ නැතිනම් මා අයින් කර දමනවා.

**තීරණය -**

**255 අධිකාරිය වන නගර සභා ආඥා පනතේ වගන්තිය ප්‍රකාරව සභාව වෙත අය විය යුතු මුදල් අත්හැරීම** යන මැයෙන් පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් එවා ඇති ලිපියේ අංක 06 (1) යටතේ **පළාත් පාලන ආයතන විසින් බදු පදනම මත ලබාදී ඇති දේපල** යන කාරණය සම්බන්ධව

**කඩ කාමර කුලී** සඳහා නියමිත දිනය නොගෙවීම මත අයකරනු ලබන දඩ මුදල් 2020.03.20 දින සිට 2020.06.15 දින දක්වා අය නොකිරීමට අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ස්ථිර නොකිරිම හේතුවෙන් ඉවත් කරන ලදී.

**03.21 255 අධිකාරිය වන නගර සභා ආඥා පනතේ වගන්තිය ප්‍රකාරව සභාව වෙත අය විය යුතු මුදල් අත්හැරීම යන මැයෙන් පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් එවා ඇති ලිපියේ අංක 06 (111) වරිපනම් බදු සම්බන්ධව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

2020.03.20 සිට 2020.06.15 දක්වා දඩ මුදල් අය නොකිරිම. ඒ අනුව අම්බලන්ගොඩ නගර සභාවෙන් වරිපණම් බදු නොගෙවිම මත දඩ මුදල් 2020.03.20 සිට 2020.06.15 දක්වා අය නොකරිමට යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

ස්ථිර කරනවා.

**තීරණය -**

**255** අධිකාරිය වන නගර සභා ආඥා පනතේ වගන්තිය ප්‍රකාරව සභාව වෙත අය විය යුතු මුදල් **අත්හැරීම** යන මැයෙන් පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් එවා ඇති ලිපියේ අංක 06 (111) යටතේ **වරිපනම් බදු** යන කාරණය සම්බන්ධව, වරිපනම් බදු අයකිරීම සඳහා 2020.06.15 දක්වා සහන කාලයක් ලබාදීම සහ 2020.03.20 දින සිට 2020.06.15 දින දක්වා දඩ මුදල් අය නොකිරිමට අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රිනී ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.22 255 අධිකාරිය වන නගර සභා ආඥා පනතේ වගන්තිය ප්‍රකාරව සභාව වෙත අය විය යුතු මුදල් අත්හැරීම යන මැයෙන් පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් එවා ඇති ලිපියේ අංක 06 (111) පුස්තකාල දඩ සම්බන්ධව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

පුස්තකාල දඩ . 2020.03.20 සිට 2020.06.15 දක්වා පුස්තකාල දඩ මුදල් අය නොකිරිම. ඒ අනුව අම්බලන්ගොඩ නගර සභාවෙන් පුස්තකාල දඩමුදල් 2020.03.20 සිට 2020.06.15 දක්වා අය නොකරිමට යෝජනා කරනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්**</u>

ස්ථිර කරනවා.

**තීරණය -**

255 අධිකාරිය වන නගර සභා ආඥා පනතේ වගන්තිය ප්‍රකාරව සභාව වෙත අය විය යුතු මුදල් අත්හැරීම යන මැයෙන් පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් එවා ඇති ලිපියේ අංක 06 (111) යටතේ පුස්තකාල දඩ සම්බන්ධව එවා ඇති ලිපිය අනුව, 2020.03.16 දින සිට 2020.06.15 දින දක්වා පුස්තකාල දඩ ගණනය නොකිරීමට අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.23 පරිගණක අලුත්වැඩියා කිරීමේ ආයතනයක් තෝරාගැනීම පිළිබඳ තාක්ෂණික කමිටු වාර්තාව සභාගත කරන ලදී.**

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

පරිගණක අලුත්වැඩියා කිරීමේ ආයතනයක් තෝරාගැනීම පිළිබඳ තාක්ෂණික කමිටු වාර්තාව. ප්‍රසම්පාදන කමිටුව විසින් නම්කරන ලද නිලධාරින් තුන්දෙනෙකුගෙන් යුත් තාක්ෂණ කමිටුව . ඒ අනුව ඔවුන්ගේ වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා. දිග වාර්තාවක්. භාණ්ඩ 33ක් ලබා ගැනීම සඳහා. එම තාක්ෂණ වාර්තාව අනුව මිලදි ගැනිමට සභාවේ අනුමැතිය ඉල්ලා තිබෙනවා. මිල ගණන් සභාව විසින් පිළිගෙන තිබෙනවා. තාක්ෂණසේවා නිලධාරින්ගේ වාර්තාව අනුව ගන්න කියනවා. ඒ අනුව ආර්.යු.ගුණවර්ධන මහත්මිය, හර්ෂණ නිලමුණි, රේණුකා නිලන්ති මහත්මියගේ කමිටුවකින් මෙය නිර්දේශ කර තිබෙනවා. එය පිළිගන්නවා.

**තීරණය -**

පරිගණක අලුත්වැඩියා අමතර කොටස් හා සේවාව ලබාගැනීම සඳහා පත්කළ තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් ගරු සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.

04. නැත

05. යථා පරිදි කල් දී යෝජනා

**05.01 ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

**05.01.01** අම්බලන්ගොඩ නගර සභාවේ පුරප්පාඩුව පවතින පුස්තකාල සහායක තනතුර සඳහා එක් අයෙකු බඳවා ගැනීමට බල ප්‍රදේශයේ අයදුම්කරුවන් 113 දෙනාට පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව සභාගත කරන ලදී.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

අම්බලන්ගොඩ නගර සභාවේ පුරප්පාඩුව පවතින පුස්තකාල සහායක තනතුර සඳහා බඳවා ගැනීම සම්බන්ධව.පුරප්පාඩුව පවතින පුස්තකාල තනතුරු 01 සඳහා බඳවා ගැනීමේ පටිපාටියට අනුව 2018.08.10 වෙනි දින පල කරන ලද නිවේදනයට අනුව ඉල්ලුම්පත්‍ර 3461 ක් පමණ ලැබී ඇත. මෙම දකුණු පළාතේ පමණක් අයදුම්කරුවන් පමණක් ඉල්ලුම් කර ඇත. නමුත් වෙනත් පළාත් වලින් අයදුම්පත් ලැබී ඇත. වෙනත් පළාත් වලින් ලැබී ඇති අයදුම්පත් සංඛ්‍යාව 28කි. දකුණු පළාතෙන් පමණක් ලැබී ඇති අයදුම්පත් සංඛ්‍යාව 3434කි. අම්බලන්ගොඩ බල ප්‍ර දේශයේ පමණක් ලැබිඇති අයදුම්පත් සංඛ්‍යාව 113කි. මෙම දකුණු පළාතට අයත් 3434 අතරින් අම්බලන්ගොඩ අදාල අයදුම්පත්‍ර 113 ක් වේ. ගැසට් කරන ලද ගැසට් පත්‍රයේ සඳහන් පරිදි ලකුණු ලබා දීම සඳහා සහා අයදුම්කරුවන්ට ලකුණු 45ක් ලබා දෙන බව ප්‍රකාශ කර ඇත. මෙසේ අයදුම්කරුවන් 3461 ක් සඳහා සම්මුඛ පරික්ෂණය සඳහා දින ගණනාවක් ගතවන අතර ඒ සඳහා පහත සඳහන් කටයුතු කිරිමට අවශ්‍ය වේ. 3461 සඳහා අවශ්‍ය කරන දින ගණන දින 98ක් ගතවේ. දිනකට 35කු සම්මුඛ පරික්ෂණයට කැඳවන්න වෙනවා. පරික්ෂණ ගාස්තු ලෙස තුන්දෙනෙකුට රු.750/= දින 98කට බැගින් රු.22500/= , සංග්‍රහ වියදම් රු.98000/= , ලිපිද්‍රව්‍ය සඳහා රු.5000/= , තැපැල් ගාස්තු රු.155715/=. මෙසේ විශාල මුදලක් වැයවන අතර කාලය ශ්‍රමය නාස්ති වෙන බැවින් මෙකී කරුණු සැලකිල්ලට ගෙන 2019.01.08 පැවති සභා තීරණ 03.01 තීරණය කළ පරිදි නිලධාරි මට්ටමින් ලකුණු යොදා කමිටුවක් පත්කිරිම . අඩුම පිරිසක් කැඳවීමත්, එම නිලධාරින් ලෙස ලේකම් බී.ඒ. ධම්මිකා, ප්‍රධාන කළමනාකරණ සහකාර මිහිරි කාන්ති ද සිල්වා , ප්‍රජා සංවර්ධන නිලධාරි ඩී. වාසනා තරංගී, මිය පත්කර ඇත. එම අයගේ සහභාගිත්වයෙන් 2019.01.26 දින පවත්වන ලද පුස්තකාල සහායක බඳවා ගැනීමේ කමිටුවේ තින්දුව ගනු ලද්දේ බඳවා ගැනීමේ පටිපාටියට අනුව ලකුණු ලබා දීමේ ක්‍රමවේදයට අනුව ලකුණු 45ක් ලැබෙන නිසා එම තනතුර සඳහා බඳවා ගත හැක්කේ එක් අයෙකු පමණක් බැවින් මේ කරුණු සැලකිල්ලට

ගනිමින් ප්‍රදේශයේ අයදුම්කරුවන් 113 සඳහා පමණක් සම්මුඛ පරික්ෂණ සඳහා කැඳවීම සුදුසු බවත් ඒ සඳහා මේ සභාවේ අනුමැතිය ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

එය ස්ථිර කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, දැන් ප්‍රතික්ෂේප වූ අයදුම්කරුවන්ට ඒ පිළිබඳව දන්වා යවනවාද?

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අවශ්‍ය නැහැ. කොහොම ගත්තාත් මේ 3461න් 113 ට පමණයි මේ ලකුණු 45 ලැබෙන්නේ. ඒ වගේම මේ සභාව ගත් තීන්දුව පළාත් පාලන කොමසාරිස්තුමාට යවා අපි අනුමැතිය අරගෙන තමයි මෙය කළ යුත්තේ.

**තීරණය -**

අම්බලන්ගොඩ නගර සභාවේ පුරප්පාඩුව පවතින පුස්තකාල සහායක තනතුර සඳහා එක් අයෙකු බඳවා ගැනීමට බල ප්‍රදේශයේ අයදුම්කරුවන් 113 දෙනාට පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**05.01.02 අම්බලන්ගොඩ, තල්ගස්ගොඩ, T.H.W.නිවාසවල පදිංචිකරුවන් සඳහා නොමිලේ ඔප්පු ලබාදීමට අනුමැතිය ලබාදීම සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අම්බලන්ගොඩ, තල්ගස්ගොඩ, T.H.W.නිවාසවල පදිංචිකරුවන් සඳහා නොමිලේ ඔප්පු ලබාදීමට අනුමැතිය ලබාදීම සුදුසු බවට යෝජනා කරනවා. එම T.H.W. නිවාස වලට ඔප්පු ලබා දීමේ අඩුපාඩු දෙකක් පෙන්වා දී තිබෙනවා. පළාත් පාලන කොමසාරිස්තුමිය විසින්. මෙන්න මේ වැරදි දෙක පෙන්වා දී තිබෙනවා. අදාළ සභා සම්මුති කිහිපයක් ගෙන තිබෙනවා. ඉඩම් කොටස් බැහැර කරමින් ඔප්පු ලබා දෙන්නේ කිනම් පදනම මත ද කියා සඳහන් කර නැත. විකුණුම්කරය , බදු ඔප්පු , නොමිලේ ආදී. මෙම ඉඩම් ලබාදීමේ නාමලේඛණය සහතික කර නැත. වැරදි දෙකක් සඳහන් කර ඇත. මා විසින් එම් T.H.W.නිවාස යෝජනා ක්‍රමයේ නිවාස ලාභීන් අතර ඔප්පු ලබාදීම නොමිලේ කළ යුතු බවට යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

ඒ යෝජනාව ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ඒකමතිකව සම්මත වෙනවා.

**තීරණය -**

අම්බලන්ගොඩ, තල්ගස්ගොඩ, T.H.W.නිවාසවල පදිංචිකරුවන් සඳහා නොමිලේ ඔප්පු ලබාදීමට අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**05.01.03 මහජන ක්‍රිඩාංගණයේ අදියර 01 යටතේ නැරඹුම් පඩි ඉදිකිරීම (Pavillion) සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මහජන ක්‍රිඩාංගණයේ අදියර 01 යටතේ නැරඹුම් පඩි ඉදිකිරීම (Pavillion) සුදුසු බවට යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

ඒ යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය -**

මහජන ක්‍රිඩාංගණයේ අදියර 01 යටතේ නැරඹුම් පඩි ඉදිකිරීම (Pavillion) සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**05.01.04 මහජන ක්‍රිඩාංගණයේ අදියර 02 යටතේ නැරඹුම් පඩි ඉදිකිරීම (Pavillion) සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මහජන ක්‍රිඩාංගණයේ අදියර 02 යටතේ නැරඹුම් පඩි ඉදිකිරීම (Pavillion) සුදුසු බවට යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

ඒ යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය -**

මහජන ක්‍රිඩාංගණයේ අදියර 02 යටතේ නැරඹුම් පඩි ඉදිකිරීම (Pavillion) සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**05.01.05 මාදම්පා ගඟ පිහිණන ස්ථානයේ විදුලි ආලෝකකරණය කිරිම සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මාදම්පා ගඟ පිහිණන ස්ථානයේ විදුලි ආලෝකකරණය කිරිම සුදුසු බවට යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

ඒ යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය -**

මාදම්පා ගඟ පිහිණන ස්ථානයේ විදුලි ආලෝකකරණය කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**05.01.06 මානාන ක්‍රිඩාංගණයේ පෙර පාසල සහිත භූමිය අඩි 18ක් උසට දැල් ආවරණ ගැසිම සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මානාන ක්‍රිඩාංගණයේ පෙර පාසල සහිත භූමිය අඩි 18ක් උසට දැල් ආවරණ ගැසිම සුදුසු බවට යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

ඒ යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය -**

මානාන ක්‍රීඩාංගණයේ පෙර පාසල සහිත භූමිය අඩි 18ක් උසට දැල් ආවරණ ගැසීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**05.01.07 කළුවඩුමුල්ල ක්‍රීඩාංගණයේ අලුත්වැඩියාවන් කිරිම සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

කළුවඩුමුල්ල ක්‍රීඩාංගණයේ අලුත්වැඩියාවන් කිරිම සුදුසු බවට යෝජනා කරනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>

ඒ යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය -**

කළුවඩුමුල්ල ක්‍රීඩාංගණයේ අලුත්වැඩියාවන් කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**05.01.08 අම්බලන්ගොඩ, තිලකපුර පාරේ සිට අංක 150/3- ඒ නිවස දක්වා මාර්ගය නගර සභාවට පවරා ගැනීමෙන් පසු මිටර් 75 ක් ඉදිකිරිම සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

අම්බලන්ගොඩ, තිලකපුර පාරේ සිට අංක 150/3- ඒ නිවස දක්වා මාර්ගය නගර සභාවට පවරා ගැනීමෙන් පසු මිටර් 75 ක් ඉදිකිරිම සුදුසු බවට යෝජනා කරනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>

ඒ යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය -**

අම්බලන්ගොඩ, තිලකපුර පාරේ සිට අංක 150/3- ඒ නිවස දක්වා මාර්ගය නගර සභාවට පවරා ගැනීමෙන් පසු මිටර් 75 ක් ඉදිකිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**05.01.09 අම්බලන්ගොඩ , පොල්වත්ත බුද්ධදත්ත විද්‍යාලය ඉදිරිපිට නිල සෙවන අසලින් ඇති මාර්ගය අලුත් වැඩියා කිරීම සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

අම්බලන්ගොඩ , පොල්වත්ත බුද්ධදත්ත විද්‍යාලය ඉදිරිපිට නිල සෙවන අසලින් ඇති මාර්ගය අලුත් වැඩියා කිරීම සුදුසු බවට යෝජනා කරනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රිනී නන්දන රාජපක්ෂ මහතා කතා කරමින්**</u>

ඒ යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය -**

අම්බලන්ගොඩ , පොල්වත්ත බුද්ධදත්ත විද්‍යාලය ඉදිරිපිට නිල සෙවන අසලින් ඇති මාර්ගය අලුත් වැඩියා කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**05.01.09 අම්බලන්ගොඩ , පොල්වත්ත බුද්ධදත්ත විද්‍යාලය ඉදිරිපිට නිල සෙවන අසලින් ඇති මාර්ගය අලුත් වැඩියා කිරීම සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

අම්බලන්ගොඩ , පොල්වත්ත බුද්ධදත්ත විද්‍යාලය ඉදිරිපිට නිල සෙවන අසලින් ඇති මාර්ගය අලුත් වැඩියා කිරීම සුදුසු බවට යෝජනා කරනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රිනී නන්දන රාජපක්ෂ මහතා කතා කරමින්**</u>

ඒ යෝජනාව ස්ථිර කරනවා.

**05.01.10 අම්බලන්ගොඩ, පොල්වත්ත පෙර පාසල ඉදිරිපිටින් නාන ලිඳ ඉදිරිපිටින් ඇති මාර්ගය නගර සභාවට පවරා ගැනීමෙන් පසු අලුත් වැඩියා කිරීම සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

අම්බලන්ගොඩ, පොල්වත්ත පෙර පාසල ඉදිරිපිටින් නාන ලිඳ ඉදිරිපිටින් ඇති මාර්ගය නගර සභාවට පවරා ගැනීමෙන් පසු අලුත් වැඩියා කිරීම සුදුසු බවට යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා කතා කරමින්</u>**

ඒ යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය -**

අම්බලන්ගොඩ, පොල්වත්ත පෙර පාසල ඉදිරිපිටින් නාන ලිඳ ඉදිරිපිටින් ඇති මාර්ගය නගර සභාවට පවරා ගැනීමෙන් පසු අලුත් වැඩියා කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මේ න්‍යාය පත්‍රයේ ඉතිරි කොටස් අපට හම්බ වෙන්නේ හැමදාම උදේ. මෙය නිවැරදි කර ගන්න. හැමදාම අන්තිමට හම්බ වෙන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

දැන් වෙලි තිබෙන්නේ මන්ත්‍රිතුමා මෙහෙමයි. සියළුම ඇස්තමේන්තු අද උදේ තමයි මටත් හම්බ වුණේ. එතකොට ඇස්තමේන්තුවත් සමඟ ඉදිරිපත් කරන කොට යෝජනා වාරේ යෝජනාව තිබිය යුතුයි. ඒ නිසා තමයි මෙය සිදු වෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමා , මේ කියන කතාව ඇත්ත. මේක හොයා ගන්න පැය ගණනක් යනවා. වෙන්නේ එකයි. දැන් යෝජනාවක් දමන විට කලින් දින 4කටවත් කලින් අපට ලැබෙන්න ඕන. එහෙම නැතිනම් ඊළඟ එකට දමන්න ඕන.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

තාක්ෂණසේවා නිලධාරින් නිරාකරණය කර දෙන්න. මිට ඉස්සරවෙලා අපිට න්‍යායපත්‍රයට යන්න පුළුවන් වෙන්න ඇස්තමේන්තු ලබා දෙන්න. ගරු ලේකම්තුමිය මේ තිබෙන අපහසුව බලන්න යොමු කරලා. මේ ඇස්තමේන්තු හදන්න කියා යෝජනා වෙන්නේ සභාවට කලින්නේ. එමනිසා අපිට කලින් දෙන්න මේ ටික. නැතිනම් මේ තත්ත්වය ඇති වෙනවා. කාර්මික නිලධාරින්ගේ ප්‍රශ්න සම්බන්ධයෙන් ඒ අය කැඳවා සාකච්ඡා කරන්න. නැතිනම් මෙය දිගින් දිගටම මේ තත්ත්වය සිදු වෙනවා. සභාවටත් හොඳ නැහැ. ඒ අයගේ අවශ්‍ය රාජකාරි ටික හරියට කෙරෙන්න ඕන. නැතිනම් ආමාරුයි මේ වැඩය කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මේ පාර කුමක්ද ? මේ පෙරපාසල අසළින් යන පාරද ? අර පටු අඩි 4ක 5ක වගේ පාරද ?

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මේ 05.01.08 හා 05.01.10 යන යෝජනා පාරවල් පවරා ගැනීමෙන් පසු යෝජනාව දමන්න.

**05.02 ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

**05.02.01** ග්‍රාමසේවා වසම්වල සංවර්ධන කටයුතු සඳහා මධ්‍යම රජයෙන් වෙන් කරන මුදල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට එවීමෙන් පසු සංවර්ධන කටයුතු කිරීමේදී ප්‍රශ්න ගැටලු මතුවන හෙයින් එම මුදල් එවීමේදී පළාත් පාලන ආයතන (නගර සභා ප්‍රාදේශීය සභා) වෙත එවන ලෙස රජයෙන් ඉල්ලීමක් කර රජයට දැනුම් දීම සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදී.

**ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා කතා කරමින්**

ග්‍රාමසේවා වසම්වල සංවර්ධන කටයුතු සඳහා මධ්‍යම රජයෙන් වෙන් කරන මුදල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට එවීමෙන් පසු සංවර්ධන කටයුතු කිරීමේදී ප්‍රශ්න ගැටලු මතුවන හෙයින් එම මුදල් එවීමේදී පළාත් පාලන ආයතන (නගර සභා ප්‍රාදේශීය සභා) වෙත එවන ලෙස රජයෙන් ඉල්ලීමක් කර රජයට දැනුම් දීම සුදුසු බවට මා යෝජනා කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**

එම යෝජනාව ස්ථිර කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, පසුගිය කාලයේ අපට ලක්ෂ 20 එවා තිබූ මුදල් හෙප්පුමුල්ලේ පාර එවන ලද මුදල් වලින් පටන් ගත්තා. පාරේ පලමු අදියර දැන් කර තිබෙනවා. එම මුදල් එව්මේදි ගරු නගරාධිපතිතුමත් අපෙන් ඉල්ලිමක් කළා. නගර සභාවට කරන්න පවරන්න කියා. ඒ වේලාවේ එතුමන්ලා කිවුවා අම්බලන්ගොඩ නගර සභාවෙන් ගිවිසුම අත්සන් කර නැති නිසා අසාදු ලේඛණ ගත වෙනවා. මාත් කැමැත්තෙන් හිටියා මෙය නගර සභාවට අරගෙන කරන්න. නමුත් අපිට කරගන්න බැරිවුණා ඊට පස්සේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය හරහා කොන්ත්‍රාත්කරුවෙකු හරහා කළා. එම කරන අවස්ථාවේදි අපිට ගැටළු මතුවුණා. ඒ පාර කිරිමේදි යම් යම් ප්‍රශ්න මතුවුණා. මේ සභාවේදි මා එම කරුණු කියන්න කැමති වෙන්නේ නැහැ. අන්න එහෙම ප්‍රශ්න ගැටළු කොන්ත්‍රාත්කරුවන් සමඟ ප්‍රශ්න ගැටළු මතුවෙනවා. පාර කිරිමේදි. අපේ ප්‍රදේශයේ පාර අපිට අවශ්‍ය විදියට කරගන්න තිබෙන්න ඕන. ගමේ ඉන්නේ අපි. එමනිසා නගර සභාව කළානම් අපට අවශ්‍ය විදියට පාර කර ගන්න පුළුවන්. ගැටළු නැතිව. උවමනා විදියට කර ගන්න ඉඩ ප්‍රස්ථා තිබෙනවා. දැන් මා හිතන්නේ කොන්ත්‍රාත්කරුට මුදල් ගෙවලත් නැහැ භාගයක්. ගෙවනවා කියා කිවුවා. ඒ වුණාට මුදල් ඇවිත් නැහැ කියා තමයි කියන්නේ. මේ ප්‍රශ්න නිසා මින් ඉදිරියට මා මේ යෝජනාව ගෙන එනු ලැබුවේ අපට නගර සභාව හරහා අපට යම්කිසි විදියකට අපේ ප්‍රයෝජනය සඳහා අපේ ගම්වාසින්ගේ ප්‍රයෝජනය සඳහා මේ කටයුතු සිදු කරගන්න අවස්ථාව ලැබෙනවා කියන එකයි මා මේ යෝජනාවෙන් කියන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, අපි මේ වනකම් දමන ලද ඒවා මේ වනකම් ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඒ අයගේ ක්‍රියාව හරිම මන්දගාමියි. කළුවඩුමුල්ලේ වැඩය කෙරෙන්නේත් නැහැ. ඕකන්දේ වැඩය කෙරෙන්නේත් නැහැ. එහෙම වෙනකොට අපිට ජනතාවගෙන් ප්‍රශ්න එනවා. අපිට ඒවාට මුහුණ දෙන්න බැරි වෙනවා. එමනිසා තමයි මා මේ යෝජනාව ස්ථිර කරනු ලැබුවේ. මා ඉල්ලීමක් කරනවා පුළුවන්තරම් ඉක්මනට ඉහළට මේ ගැන දැනුම් දෙන්න කියා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, අපේ ගරු නගර සභා මන්ත්‍රි ධර්මදාස මහතා ගෙන ආ යෝජනාව ඉතාමත් හොඳ යෝජනාවකි. මෙම සපිරි ගමක් යටතේ ඒ සංවර්ධන යෝජනා 28ක් විතර යෝජනා වෙලා තිබෙනවා. මෙම වැඩසටහන් ක්‍රියාත්මක විමේදී ප්‍රධාන වශයෙන් ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මඟින් ආර්ථික සංවර්ධන නිලධාරි හරහා තමයි මෙය දියත් කරන්නේ. හැබැයි මේවා දියත් කරන්න ගියාම නගර සභාවෙන් ගත්තා ද දන්නේ නැහැ . ගත්තාත් මේවා ක්‍රියාත්මක කරන්නේ නැහැ. මොකද මන්ත්‍රිවරයා දන්නවා මේ වැඩය කරන්න ඕනේ කොහොමද කියා. ඒ පාර වැඩහය කරන්න ගිහින් අතර මග නතර වෙනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මන්ත්‍රිතුමා මේ යෝජනා කොට්ඨාශ මට්ටමින් ඇවිත් කොට්ඨාශ මන්ත්‍රිවරයාගේ එකඟත්වයෙන් තමයි මෙය අරගෙන තිබෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

එක හරි එක දුන්නායි කියන්න. වැඩය කරන්න ගියාම . දැන් මෙතුමා කිවු පරිදි ඕකන්දේ දමන ලද යෝජනාව . එතුමිය ගියා බැම්මක් ද කොහේ කැඩිලා තිබෙන්නේ. එක විසඳන්න ගියේ නැහැ. ඒ මිනිසුන්ට දොස් මුරයක් දැම්මා. මේක කරන්න බැහැ කියා. නමුත් ඕකන්දේ තිබෙන නරකම පාර ඕක . ඕක තමයි හදන්න ඕනම පාර. ඇත්තෙන්ම නගර සභාවට බනිනවා කියන්නේ මළ ගෙදර ගියත් බනින එකතමයි වැඩේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

අපි නගර සභාවට මෙය හදන්න හෙට වුණත් හැකියාව තිබෙනවා. මගෙන් ඇසුවා මෙය හදන්නද කියා. නමුත් සපිරි ගමක් වැඩ සටහන යටතේ මුදල් වෙන්කර තිබෙන නිසා මෙය ප්‍රමාද වෙලා තිබෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

හරියට නිසිලෙස වැඩය කරන්න ඕන. දැන් උදාහරණයක් වශයෙන් ගත්තාම මාර්ග සති පාර. ඔබතුමා ඉන්න කාලේ මාත් ඉන්න කාලේ පවරාගෙන ගොඩක් වැඩ කරලා තිබෙනවා. මෙය කෙරෙන්න ඕන දෙයක්. මේ ඇළට යන මාර්ගය හරියට හදන්න නම් බැම්මක් දමා මෙය කළ යුතුයි. මේ ක්‍රමයට හැදෙන්න ඕන. මේ හැදෙන කොට ආර්ථික සංවර්ධන නිලධාරි මේ සම්බන්ධව

දන්නේ නැහැ හරියට. මොකක්ද කරන්න ඕන කියන එක. එක්කෝ ඔබතුමා සම්බන්ධ වෙන්න ඕන මේ සම්බන්ධව. මේ වගේ ලොකු මේවා එකක්. එක වෙන්නේ නැහැ. සම්බන්ධීකරණ වෙන්නේ නැති නිසා තමයි මේ යෝජනා දමන්නේ. පාරවල් නගර සභාව හරහා කරන්න කියා අපිත් යෝජනා කරනවා. ඉල්ලා හිටිනවා. මෙතුමාගේ යෝජනාව හොඳ යෝජනාවක්. නැතිනම් මොකද වෙන්නේ අපිටත් බැණුම් අහන්න වෙනවා. මන්ත්‍රීවරුන්ටත් බැණුම් අහන්න වෙනවා. අප සියළු දෙනාටම බැණුම් අහන්න වෙනවා. හරි අප්‍රසාදයක් තිබෙනවා. අපිත් එම යෝජනාවට සහාය පල කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, සපිරි ගමක් යෝජනා යටතේ ග්‍රාමීය කමිටු හරහා, ප්‍රජා මණ්ඩල මන්ත්‍රීවරු මේ යෝජනා දමා තිබෙනවා සංවර්ධන කටයුතු සඳහා. විශේෂයෙන්ම මාධ්‍යම රජයෙන් එන ප්‍රතිපාදන ආර්ථික නිලධාරින් හරහා තමයි මේ කටයුතු සිදු වන්නේ. මන්ත්‍රීවරයෙක් විදියට අපි ගොඩක් අසරණ වෙනවා. අන්තිම මොහොතේ මුදල් ප්‍රතිපාදන ඇවිත් වැඩ කරලා අනුමතයි කියා ප්‍රාදේශිය ලේකම් කාර්යාල හරහා කරලා අද කෝටි ගණනක මුදල් ගෙවන්න තිබෙනවා කොන්ත්‍රාත්කරුවන්ට. ප්‍රායෝගික ගැටළු තිබෙනවා. ඇත්තටම කියන්න කනගාටුයි. මේ ලක්ෂ 20 පැමිණ සමිතිය හරහා. සමිති ගිවිසුම් අත්සන් කරන්නේ නැහැ අසාදු ලේඛණයේ ඇති නිසා. අසාදු ලේඛණයේ තිබෙන්නේ එක පාරයි. කොන්ත්‍රාත්කර ගිවිසුම් ගහලා අත්සන් නොකර කොන්ත්‍රාත්කරු කළේ නැහැ. අපේ වැඩිහිටි සමිතිය අසාදු ලේඛණ ගත වෙලා ඉන්නේ. තාම හදාගන්න බැරුව ඉන්නේ. ඉතිං මේ ලක්ෂ 20 වැඩ අද පෝරඹ කොට්ඨාශයට කර ගන්න බැරුව ඉන්නේ. නගර සභාව හරහා මේවා කර ගන්න පුළුවන් නම් අද මන්ත්‍රීවරයාටත් තැනක් එනවා. අපිට ඕන විදියට වැඩය කරගන්න පුළුවන්. එතකොට ප්‍රා දේශිය ලේකම් කාර්යාලය හරහා කරන කොට නොයෙකුත් ගැටළු තිබෙනවා. අන්තිම මොහොතේ මුදල් ඇවිත් වැඩ කළා. ඒ අය අසරණ වෙලා. මුළු ලංකාවේම. මුදල් ගෙවීම සම්බන්ධව. මේ මුදල් ආපසු යන්න පුළුවන්. එමනිසා මේ නගර සභාව හරහා මේ වැඩකටයුතු සිදු කරන්න ලැබෙනවා නම් ගොඩක් සතුටුයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>**

මේ සම්බන්ධව ඇත්තටම ඔබතුමා දන්නවා. ගරු වජිර අබේවර්ධන මැතිතුමා මුදල් වෙන් කරනු ලැබුවා. ප්‍රා දේශිය ලේකම් කාර්යාලයට මේ මුදල් වෙන් කර තිබුණා. ඔබතුමා ඇත්තටම කිවුවා සභාව සතුව පැමිණියත් මට මෙය කරන්න පුළුවන් කියා. ඒ පාර කර ගන්න ඕන. හැබැයි ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මේ ළඟදි ඇවිත් මැන්නා. මැනපු එකේ ඕකන්දේ පොඩි විරෝධතාවයක් පැමිණියා. ශාන් මහතාගේ නිවස අසළින්. ඊට පස්සේ කැමැත්තට ලිපියක් දුන්නා. එය පළල් කරන්න ඉඩමෙන් දෙන්නම් කිවුවා. එයා කැමත්ත ප්‍රකාශ කරලා ලිපියක් දුන්නා. ඉඩමෙන් හරි දෙනවා. එම කාණු පද්ධතිය පළල් කර එය හදා දෙන්න කියා. එය ඇවිත් මැනලා ගියා. ඒ ගොල්ලන්ට ගැටළුව තිබෙනවා. කොන්ත්‍රාත්කරුවන් කොන්ත්‍රාත් ගන්නේ නැති එක. මොකද දැන් කොන්ත්‍රාත් අරගෙන කොන්ත්‍රාත්කරුවන්ගේ මුදල් ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් නොලැබීම නිසා කිසිම කොන්ත්‍රාත්කරුවෙක් කොන්ත්‍රාත් ගන්නේ නැහැ. දැන් එය ලොකු අපහසුතාවයකට පත්වෙලා තිබෙනවා. ඒ අයගේ ගොඩක් මුදල් හිරවීම නිසා. ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් මොනවා කළත් මා කියන්නේ එකයි අපේ තාක්ෂණසේවා

නිලධාරින් මේ ඔක්කොම සම්බන්ධ වෙලා ඕනේ මේ ගමේ පාර හැදෙන්න. අපේ පාරනේ හදන්නේ. එක හරියට හදන්න. ඔබතුමා කතා කරලා සභාව හරහා කරන්න පුළුවන් නම් එය ලබා ගන්න. නැතිනම් ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් කළත් අපේ තාක්ෂණසේවා නිලධාරින්ට අපේ මන්ත්‍රිවරුන්ට සහභාගි වෙලා වැඩය කිරිමට හැකි පරිදි සලස්වා දෙන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පි. ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට මුදල් එව්වාම ගොඩක් ගැටළු වලට මුහුණ දිලා තිබෙනවා. අපේ ලක්ෂ 20. ඉතිං දුන්නා . ඇස්තමේන්තු කළා. අපි දන්නේ නැහැ මොන සමිතියෙන්ද මෙය කරන්නේ කියා. අඩුම ගණනේ මෙය කරනවා කියා මන්ත්‍රිවරයා විදියට මා දන්නේ නැහැ. ඇවිල්ලා දාලා ගිහිල්ලා. දැන් අර අමාත්‍ය රමේෂ් පතිරණ මැතිතුමා දුන් ලක්ෂ 5 පාර කළා. මා දන්නේවත් නැහැ. ඉතිං ඒවා ගිවිසුම් ගහනවා. අපි ඇමතිතුමාටලාට කතා කර මුදල් ඉල්ලා ගන්නවා. කාගේවත් නම යනවා . අපි වැඩ කරනවා. ඉතිං මමත් මේ සම්බන්ධයෙන් කියන්නේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය හරහා කරනවානම් අඩුම ගණනේ මන්ත්‍රිවරයා දැනුවත් විය යුතුයි. කොයි සමිතියත් එක්ක ඒ අය ගිවිසුම් ගතවෙලාද කියන එක වත් අපි දන්නේ නැහැ. අඩුම ගණනේ නිර්දේශයක් මන්ත්‍රිවරයාගෙන් අරගෙන එන්න කියනවා නම් හොඳයි කියා මා යෝජනා කරනවා. ගරු ධර්මදාස මන්ත්‍රිතුමා ගෙන ආ යෝජනාව ඉතාමත් අගනා යෝජනාවක් බව ප්‍රකාශ කරනවා. ඊට අමතරව මා යෝජනා කරනවා සපිරි ගමක් යෝජනා යටතේ යමක් කරනවා නම් මන්ත්‍රිවරයා දැනුවත් වීමට යම් ක්‍රමවේදයක් යොදන්න කියා. නැතිනම් මන්ත්‍රිවරයා කියා පඹයෙක් වගේ පුද්ගලයෙක් මෙහි ඉඳලා වැඩක් නැහැ. ගරුත්වය නැතිවෙලා ගිහිල්ලා. එමනිසා එම ගරුත්වය ආරක්ෂා විමට මන්ත්‍රිවරයා දැනුවත් කරන්න කියා මා අතිරේකයක් විදියට එකතු කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මේ පාරවල් හැදිම සම්බන්ධව ගැටළුකාරි තත්ත්වයක් තමයි ඇති වි තිබෙන්නේ. ගරු ධර්මදාස මන්ත්‍රිතුමා ගෙන එනු ලැබු යෝජනාව ඉතා හොඳ යොජනාවක්. මධ්‍යම රජයෙන් අපේ කලින් ගරු ඩෙනට් මන්ත්‍රිතුමා කළා. ගම්පෙරලියෙන් පාරවල් හැදුවා. හොඳයි. දැන් නගර සභාවෙන් පාරවල් හදනවා. දැන් සපිරි ගමක් එකෙන් පාරවල් හදනවා. මේ හැමෝම පාරවල් හදනවා. හැබැයි පාරවල් ඔක්කොම බොහෝ වේලාවට කැඩිලා. දැන් අපි නාගරික මන්ත්‍රිවරු හැටියට අපිට තමයි දොස් කියන්නේ. අර පාරවල් කැඩිලා . දැන් අපි ඒ විදියට බැණුම් අහනවා. එහෙමනම් මේ යන විදියට කරන්න මධ්‍යම රජය නගර සභා පාරවල් සම්බන්ධව වගකියන්නේ නැහැ. ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට එම වගකීම භාර දෙන්න. එතකොට නගර සභාවට පාරවල් පිළිබඳ වගකීමක් නැහැ. අපි බැණුම් අහන්න ඕන නැහැ. මෙහි පාරවල් හදනවා නම් එක ආයතනයක් විසින් කරන්න. එහෙම නැතිනම් මහා මාර්ග දෙපාර්තමේන්තුවට භාර දෙන්න කියන්න. එහෙම නැතුව හැමෝම පාරවල් හදනවා. මේ එක පාරක් වත් හරියට නැහැ. එමනිසා නගර සභාවට අයිති පාරවල් ටික හදා ගන්න නගර සභාවට බලය පැවරෙනවා නම් තමයි වැදගත්. එමනිසා වීකෘති මානසිකත්වයෙන් නිලධාරින් විසින් කරනු ලබන මෙවැනි යෝජනා ආයතන කිහිපයක් මඟින් පාරවල් හැදිමේ ක්‍රමය මධ්‍යම රජයේ වීකෘති ප්‍රතිඵලයක් හැටියට තමයි මා දකින්නේ. එමනිසා එතුමාගේ යෝජනාවට මා ගරු කරනවා.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඇත්ත වශයෙන්ම මේ වැඩසටහන යටතේ අම්බලන්ගොඩ නගර සභාවට ලබාදෙන ප්‍රතිපාදන මත ලක්ෂ දෙසිය තිස්එකක් පමණ ඉතිරියි. මේ සියල්ලම කවදා හරි හෝ ජනතාවට වියදම් කළ යුතු මුදල්. එමනිසා සියළුම කොට්ඨාශ මන්ත්‍රීවරුන්ගේ වැඩය ඉවර කර තියන්න. මුදල් ලබා දීම සම්බන්ධ වගකීම මා ගන්නම්. කිසි දෙයකට බය වෙන්න එපා. මේ ගම්පෙරළිය යටතේ මුදල් නොලැබුණු නිසා තමයි ඇත්ත වශයෙන්ම මේ කොන්ත්‍රාත්කරුවන්ගේ දැන් තිබෙන මේ ගැටළුව. මේ ගම්පෙරළිය යටතේ තිබුණ කොන්ත්‍රාත්වල මුදල් ගෙවන්න තමයි මුදල් ඇමති වශයෙන් පාර්ලිමේන්තුවට යෝජනාවක් ඉදිරිපත් කළාම මෙය පරාජයට පත්කරන්න එක්සත් ජාතික පක්ෂයේ අයම තමයි කටයුතු කළේ. එහි ප්‍රතිඵලයක් නිසා තමයි දැන් කාලයට කලින් පාර්ලිමේන්තු මැතිවරණයක් ඇවිත් තිබෙන්නේ ජනතාවට තින්දුවක් ගන්න කියා. නමුත් සපිරි ගමක් වැඩ සටහන යටතේ මේ ලක්ෂ දෙසිය තිස් එකම ලබා දිම සඳහා එය වගකිමෙන් මා පොරෝන්දු වෙනවා. ඒ වගේම ගම්පෙරළිය යටතේ ලබා දුන් ඒ රජයේ සම්පත් ඒ මුදලුත් ලබා දෙන්න අපි උනාන්දු වෙන්නම්. එමනිසා මේ යෝජනා වෙච්ච යෝජනා 28ක් තිබෙනවා. මේ 28 තමන්ගේ කොට්ඨාශ තුළ ඇති කරන්න කියන ඉල්ලිම කරනවා. ඒ වගේම මීට කලින් අපි මග නැගුම කියා ව්‍යාපෘතියක් කළා. ඒ මග නැගුම ව්‍යාපෘති යටතේ කරනු ලැබූ ව්‍යාපෘති සියල්ලම අදාළ පළාත් පාලන ආයතනයට ලබා දෙන්න කියා මුළු රටේම මේ විදියට ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට දෙන්න කියා කටයුතු කරන කොට අම්බලන්ගොඩ නගර සභාවේ ව්‍යාපෘති පමණක් නගර සභාවත් එක්ක ගිවිසුම්ගත වෙලා නගර සභාව විසින් තමයි මේ සියළු කටයුතු සිදු කරනු ලැබුවේ. එමනිසා වගකිම අපි භාරගෙන තිබෙන්නේ මේ කටයුත්ත අප සිදු කරන ලෙස ඉල්ලා සිටිනවා.

- පෙරවරු 11.45 විනාඩි දෙකකට සභාව කල් දමන ලදි.
- නැවතත් පෙරවරු 11.47 ට සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

**ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්**

ප්‍රාදේශිය ලේකම්තුමිය හා ආර්ථික සංවර්ධන නිලධාරින් කිවුවා වැඩ කරන්න බය නැතුව කියා. ඔය අන්තිම මොහොතේ වැඩ කරලා කොන්ත්‍රාත්කරුවන් ඉන්නවා මුදල් ගන්න බැරුව. දේශපාලන බල අධිකාරියත් සමඟ ඔබතුමාට චෝදනා කරනවා නෙමේ. පක්ෂ පාට බලා අන්තිමට මුදල් ගෙවන්නම් කියා ඔබතුමා වගකීම අරගෙන අපි කොන්ත්‍රාත් කරලා අන්තිමට අපිට එහෙම අපහසුතාවයට පත්වෙනවා. ඔබතුමාට ඇඟිල්ල දික් කරනවා නෙමේ. ඔබතුමා නෙමේ . කවුරු මේවා කළත් පක්ෂටනේ. දැන් ඔබතුමා තින්දු කරනවා මුදල් සම්බන්ධව කිසි ගැටළුවක් නැහැ. එකේ වගකීම ගන්නවා. මම . ඔබතුමා වෙනම මට සහායෝගය දෙන එක වෙනම කරුණක්. මගේ කොට්ඨාශයේ වැඩ කිරිම සම්බන්ධව. මා ඒ ගැන සතුටු වෙනවා. ඔබතුමා මේ තීරණ අරගෙන හදිස්සියේවත් දේශපාලන හේතුමත කවදාහරි දිනයක ඒ වගකිම ඔබතුමා බැහැර හරින්න පුළුවන් කියන එක ගැන පොඩි සැකයකුත් තිබෙනවා. දේශපාලන මතිමතාන්තර

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මන්ත්‍රිතුමා අපි මේ පුටුවට ඇවිත් මුලින්ම වැඩ කළේ ඔබතුමාගේ කොට්ඨාශයේ කුලරත්න විද්‍යාලයට යන බෝක්කුව . අපිට එහෙම මේවා එකක් නැහැ. අවශ්‍යතාවය පරිදි කරනවා. දැන් ඔබතුමාට දෙයක් කියන්නම්. අපි කලින් මේවා එක යටතේ මග නැගුමට ගත්ත ඒවා කොන්ත්‍රාත්කරුවන්ට තමයි ගෙව්වේ. රජයෙන් අපිට මුදල් එන්න ඉස්සරවෙලා අපි මුදල් ගෙවුවා. මුදල් ගෙවලා අපි අවාට පස්සේ ප්‍රතිපූර්ණය කළා. උදාහරණයක් වශයෙන් පළාත් පාලනයෙන් අපිට අනුමත කරන ලද තුඩුවමුල්ලේ හදන ලද කාණුව ඊයේ පෙරේදා තමයි මුදල් හම්බ වුණේ. නමුත් ගිය අවුරුද්දේ අපි මුදල් ගෙවුවා. අනුමත වු ගමන් අපේ මුදල් වලින් අපි ගෙවුවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, නගර සභාවේ දේවල් වලට අපි දේශපාලනයෙන් තොරව උදවු කරනවා. මා කොහොමත් මා ගන්න තීරණය මා ගන්නවා. දේශපාලන වශයෙන් වට්ටන්නනේ හදන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, දැන් ඔබතුමලාගේ නායකතුමාත් අපේ පැත්තට ඇවිත් ඉවරයි. ඔබතුමාටත් ආරධනා කරනවා. බයවෙන්න එපා ඒක කරන්න.

**තීරණය -**

ග්‍රාමසේවා වසම්වල සංවර්ධන කටයුතු සඳහා මධ්‍යම රජයෙන් වෙන් කරන මුදල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට එවීමෙන් පසු සංවර්ධන කටයුතු කිරීමේදී ප්‍රශ්න ගැටලු මතුවන හෙයින් එම මුදල් එවීමේදී පළාත් පාලන ආයතන (නගර සභා ප්‍රාදේශීය සභා) වෙත එවන ලෙස රජයෙන් ඉල්ලීමක් කර රජයට දැනුම් දීම සුදුසු බවට  ගරු නගර සභා මන්ත්‍රි ඩී.ධර්මදාස මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්රි ලලිත් ධම්මික කොඩිකාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**05.03 ගරු නගර සභා මන්ත්‍රි ඒ.පී. ලක්ෂ්මි හේමන්තා මෙනවිය  විසින් ඉදිරිපත් කරන යෝජනා.**

**05.03.01 තුඩුවමුල්ල කරෝලිස් වෙද මාවතේ ඇති අතුරු මාර්ගය සංවර්ධනය කිරිම සඳහා**

**ආමත්‍ය වෛද්‍ය රමේෂ් පතිරණ මැතිතුමාගේ ප්‍රතිපාදන වලින් රුපියල් ලක්ෂ පහක මුදලක් ලබා දිම වෙනුවෙන් ස්තුතිය පුද කිරිම සුදුසු බවට කරන ලද යෝජනාව සභාගත කරන ලදි.**

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී. ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>**

තුඩුවමුල්ල කරෝලිස් වෙද මාවතේ ඇති අතුරු මාර්ගය සංවර්ධනය කිරිම සඳහා ආමාත්‍ය වෛද්‍ය රමේෂ් පතිරණ මැතිතුමාගේ ප්‍රතිපාදන වලින් රුපියල් ලක්ෂ පහක මුදලක් ලබා දිම වෙනුවෙන් ස්තුතිය පුද කිරිම සුදුසු බවට යෝජනා කරනවා .

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී. ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>**

අම්බලන්ගොඩ මහ අම්බලන්ගොඩ කොට්ඨාශයේ තුඩුවමුල්ල ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ අතුරු මාර්ගය සංවර්ධනය කිරිමට තිබුණා. අපි ගිහින් එය මැන තිබුණා. ඒ අවස්ථාවේ නව පාරක් හදනවා නම් තමයි වෛද්‍ය රමේෂ් පතිරණ ඇමතිතුමා ලක්ෂ 5ක් ලබා දෙන්න පුළුවන් කියා තිබුණේ. ඒ අනුව මා නම් කළා කරෝලිස් වෙද මාවතේන් අතුරු මාර්ගය (තරංගා මහත්මියගේ නිවසට යන මාර්ගය ) සංවර්ධනය කිරිම. ඒ අනුව තමයි වෛද්‍ය රමේෂ් පතිරණ මහතා අපිට ලක්ෂ 5ක් එවා තිබුණේ. එමනිසා ඒ ප්‍රතිපාදන එවිම සම්බන්ධව වෛද්‍ය රමේෂ් පතිරණ මැතිතුමාට ස්තුතිය පුද කර ලිපියක් යවන ලෙස යෝජනා කරනවා.

**තීරණය**

අම්බලන්ගොඩ මහ අම්බලන්ගොඩ කොට්ඨාශයේ තුඩුවමුල්ල ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ අතුරු මාර්ගය සංවර්ධනය කිරිම සඳහා රුපියල් ලක්ෂ පහක මුදලක් ලබාදීම සම්බන්ධයෙන් වෛද්‍ය රමේෂ් පතිරණ මැතිතුමාට ස්තුතිය පුද කිරිම සුදුසු බවට ගරු නගර සභා මන්ත්‍රී ඒ.පි.ලක්ෂ්මි හේමන්තා මෙනවිය විසින් කරන ලද යෝජනාව අනුමත කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් ස්ථිර කරන ලදුව එකමතිකව සභා සම්මත විය.

06 කාරක සභා වාර්තා

**06.01 2020.06.23 දින පැවති මූල්‍ය කමිටු වාර්තාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

2020.06.23 දින පැවති මූල්‍ය කමිටු වාර්තාව සභාගත කිරිමට යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය**

2020.06.23 දින පැවති මූල්‍ය කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**06.02 2020.06.25 දින පැවති ටෙන්ඩර් කමිටු වාර්තාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

2020.06.25 දින පැවති ටෙන්ඩර් කමිටු වාර්තාව සභාගත කිරිමට යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය**

2020.06.25 දින පැවති ටෙන්ඩර් කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**06.03 2020.06.24 දින පැවති පරිසර , සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටු වාර්තාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

2020.06.25 දින පැවති ටෙන්ඩර් කමිටු වාර්තාව සභාගත කිරිමට යෝජනා කරනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය කතා කරමින්**</u>

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය**

2020.06.24 දින පැවති පරිසර,සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රීනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**06.04 2020.06.26 දින පැවති කළමනාකරණ කමිටු වාර්තාව සභාගත කරන ලදී.**

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

2020.06.26 දින පැවති කළමනාකරණ කමිටු වාර්තාව සභාගත කිරිමට යෝජනා කරනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය කතා කරමින්**</u>

එම යෝජනාව ස්ථිර කරනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි , මට ටිකක් කතා කරන්න ඕන. වාහන අංගනය මෙම ස්ථානයෙන් ඉවත් කර හල්වතුර පර්චස් 80ක් පමණ ඉඩම ආවරණය කර වාහන අංගනය සකස් කළ යුතුයි කියා. ආරක්ෂක අංශයද එම ස්ථානයේ සිටිය යුතුයි කියා. ඇත්තටම වාහන අංගනයකුත් අවශ්‍යයි. නමුත් පොඩි ගැටළුවක් තිබෙන්නේ දැන් මෙය අපේ අයවැයේත් නැහැ මේ යෝජනාව. අනිත් එක මෙය හල්වතුර ප්‍රදේශයේ. හල්වතුර පර්චස් 80 කියන්නේ විශාල වටිනාකමක් තිබෙන්නේ. අම්බලන්ගොඩ ගත්තාම පර්චස් 80 ඉඩම් කොටස පර්චස් එක ලක්ෂ 25ටත් එහා යනවා. එතකොට මේ වගේ එකකට මෙය යොදවා ගත්තාම ඇත්තටම අපිට පුළුවන් නගර සභාවට මීටවඩා ඵලදායි ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන්න. මා හිතන්නේ මා මෙයට විරුද්ධ වෙනවා නෙමේ. මෙම ඉඩම ඉදිරියේදි අපි ආරක්ෂා කර තිබුණහොත් මෙහි ජාත්‍යාන්තර පුස්තකාලයක් මීට කලින් යෝජනා වුණා. මෙම ඉඩමේ . ඉතිං මෙය මේ වාහන අංගනය කියන එක දැන් මෙයට එච්චර ලොකු මෙවා එකක් අවශ්‍ය නැහැ. සභාවේ ඔය වාහන අංගනය කිවුවාට. මා හිතන්නේ හල්වතුරේ කුණු දමන ස්ථානයේත් මෙය කරන්න පුළුවන්. ඒ පැත්තටත් කල හැකි. කුණු දමන එක තුළ වාහන අංගනයක් කියන එක එච්චර එකක් නෙමේ. නමුත් පර්චස් අසුවක් වුණත් වටිනාකමක් තිබෙනවා. මොකද අපි කොයි දේ කළත් නීත්‍යානුකූලව කරන්න ඕන. මෙකට ලක්ෂ දෙසියක් විතර යයි. මෙය හදලා අවසන් වනවිට. ඉතිං එක විනිවිදභාවයෙන් තොරව

නිත්‍යානුකූලව . එය ඉදිකරන්නත් ඕන. ඒ කටයුත්තක් කරන්න කියා මතක් කරනවා. මේකටනම් මාගේ නම් විරෝධයක් තිබෙනවා. පර්චස් 80ක් කියන්නේ හල්වතුරේ සෙල්ලම් වටිනාකමක් තිබෙන ඉඩමක් නෙමේ. සැහෙන වටිනාකමක් තිබෙනවා මෙකේ. ඉතිං වාහන අංගනයක් මෙතන දමනවා කියන එකේ වටිනාකමක් තිබෙනවාද කියා තව දුරටත් හිතන්න වෙනවා. මේ යෝජනාව සම්බන්ධව. මෙකට වඩා වැඩි වටිනාකමක් රහිත ඉඩමක් මෙයට යොදවන්න පුළුවන්. එමනිසා මෙය කල්පනා කර මෙය කරන්න.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මා එය පැහැදිලි කරන්නම්. අපි ඔබතුමාගේ අදහස පිළිගන්නවා. මෙහි මීටවඩා වටිනාකමක් වැඩි දෙයක් කරන්න පුළුවන් කියා. මතක තියා ගන්න අපි නගර සභාව සතුව වාහන 40කට වැඩියේ තිබෙනවා. වටිනාකම අතින් බැලුවොත් එහෙම මේ වාහන 40 අඩුම ගණනේ කෝටි 40කට වැඩියේ වටිනවා. ඒ වගේම අම්බලන්ගොඩ නගර සභාවේ භූමියේ ඉඩ මදිවෙලා තොග ගබඩාවේත් අපි වාහන නතර කරනවා. ඒ කියන්නේ සමුපකාර මන්දිරය පැත්තේ. ඒ කියන්නේ අම්බලන්ගොඩ නගර සභාවට ඇහයිම් කටයුතු සඳහා පැමිණෙන සියළුම නිලධාරින් හොඳම නගර සභාව ලෙස තොරන්න ගියාම ඒ අය අසන පලවෙනි ප්‍රශ්නය තමයි ඇයි ඔගොල්ලන් මේ වාහන නතර කිරිම සඳහා වෙනම ස්ථානයක් යොදා ගන්නේ නැත්තේ කියා. මේ වාහන ඔක්කොම අස්සේ මිනිසුන්ගේ වැඩ කරන්නේ කොහොමද කියා. ඒ වගේම අපි දෙවැනි කාරණය තමයි අද අපි මේ සිටින ස්ථානයෙන් ඉවත් වෙලා අලුත් තැනකට අපි යන්න ඕන. එමනිසා අපි කල්පනා කර තිබෙනවා මේ වාහන අංගනයේ පිටුපස කැල්ලේ මහල් දෙකක ගොඩනැඟිල්ලක් ඉදිකර අපේ කාර්යාලයේ කොටස් සහ මේ කොටස අන්තර්ගත කිරිමට. එමනිසා එම ඉදිකිරිම කරනවා නම් මේ තිබෙන වාහන සියල්ලම අයින් කරන්න වෙනවා. අපි මෙය තාවකාලිකව හෝ මෙය අයින් කරලා මෙය මේ විදියට කරලා මාගේ පලවෙනි අදහස වුයේ මෙහි පුස්තකාලයක් මෙතැන ඉදිකරන එකයි. එහිදි මා දැනට සාකච්ඡා කර තිබෙනවා අපේ කැනඩාවේ මිත්‍ර පිරිසක් සිටිනවා. ඔවුන්ට මේ භූමි කොටස ලබා දීම . මේ කොටසේ වාහන නතර කිරිමට කොටසක් වෙන්කළ යුතුයි. ඒ වගේම ඔබතුමා යෝජනා කරන හල්වතුර කුණු දමන කොටසේ වාහන දැමීමට ගියොත් එහෙම නගරයේ වැස්සක් ආවොත් එහෙම පලවෙනියාට යටවෙන්නේ මේ ස්ථානය. එමනිසා අපි නැවත කල්පනා කර බලන්න ඕන. තියෙන මේක අනුව අපි මෙහි හතර වටෙන් තාප්ප ගසා ආරක්ෂා කර ඉවර වෙලා මෙය කිරිම වඩා සුදුසුයි. දැනට අපිට කර්මාන්ත අංශය සහ සෞඛ්‍ය අංශය ස්ථාන ගත කිරිම දැනට අපි අලුත් ගොඩනැඟිල්ල හදනවා නම් මෙය හිස් භූමියක් බවට පත් කරන්න ඕනේ. එතකොට මේ වාහන ටික පාරට දමා හරියන්නේ නැහැ. අද මේ සියළු වාහන ආවරණ රහිතව පාර දිගේ එළියේ තිබෙන්නේ. එමනිසා අපි මෙහි ආවරණයක් ගසා වාහන ආරක්ෂා වෙන විදියට තබන්න ඕන. දැන් අපේ බැකෝ යන්ත්‍රය ගතහොත් එහෙම ලක්ෂ අසුවකට එහා වටිනවා. ට්‍රැක්ටර් ඔක්කොම දිර දිර යනවා. ජනතාවට සේවය කරනවා. මතක තියා ගන්න නගර සභාවේ . එමනිසා අපි මෙය වහලක් සහිත ආරක්ෂාකාරි වෙන විදියට යොදවන්න ඕන. එතුමා කරන යෝජනාව අපි ඉදිරියට කරන්න. ඒ දේ අපි මේවා කරන්න. දැනට

තවකාලිකව අර ගොඩනැඟිල්ල පිටුපසින් හදනවානම් අපි තාවකාලිකව වාහන දැම්මට ස්ථානයක් හදන්න ඕන.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

එතකොට මේ වගේ වටිනා කියන ලියවිල්ලක් ඔබතුමා න්‍යාය පත්‍රයට දැමිය යුතුයි. නීත්‍යානුකූල වෙන්න එපැයි මේ හැමදේම.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ යෝජනාව මේ තාප්පය බැඳීම සම්බන්ධව. මේ පසුගිය සභාවේ ඉදිරිපත් කරලා තමුන්නාසේලා සියළු දෙනාම අත ඔසවා අනුමත කර තිබෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

වාහන අංගනයක් කියන එක.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එහි වාහනය දමනවාද ? කියන එක මේ සියළු දෙනා තේරුම් ගන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ඔබතුමා මෙහෙමයි . ඕක කරනවාට කිසි ගැටවවක් නැහැ. ඔබතුමා දැන් බලන්න අයවැයේ තිබෙනවා යෝජනා ගණනාවක්. එහි ලක්ෂ 8ක් යන ඒවා තිබෙනවා. සමහර ඒවාගේ ලක්ෂ 10 යන ඒවා තිබෙනවා. දැන් මෙයට ඔබතුමා මුදල් දමාවි පලවෙනි අදියර , දෙවැනි අදියර, තුන්වෙනි අදියර කියා. නමුත් නීත්‍යානුකූල වෙනවාද? දැන් මෙහි වාර්තාවක් තිබෙනවා . නගර සභා ක්‍රීඩාංගනයේ ලක්ෂ 5 වගේ කඩලා. යම් දවසක යම් ප්‍රශ්නයක් ගැටළුවක් එවිද කියන එකත් බයයි. මොකද හේතුව මේ වගේ යන්න එපා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

සියළු කාරණා නීත්‍යානුකූල පදනමින් තමයි කර තිබෙන්නේ. මෙහෙමයි අද දවසේ දිහා බැලුවාම ඔබතුමලා මේ නිලධාරීන් බය කරන්න එපා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මේ නිලධාරීන් බය කරන්න එපා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඒ අය නීත්‍යානුකූල පදනමින් කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

නිත්‍යානුකූලව කටයුතු කරන්න කියා තමයි කියන්නේ. අපි ඔබතුමාට අයවැයේදිත් සහායෝගය දුන්නා. ඔබතුමා එක සැරයක් ඇසුවා තල්ගස්ගොඩට කුණුද ඔබතුමා එක පාරක් ඇසුවා. මතකනේ ඇසුවා. මේ නිවැසියන්ට ගෙවල්ද කියන එකක් ඔබතුමා එක සැරයක් සභාවක ඇසුවා. දැන් මමත් අසන්නේ පර්චස් අසූවක ඉඩමක් මේ වගේ නිකං ඕක තාවකාලිකව ගෙනිච්චා කියා ඉවත් කරන්නේ නැහැ. එහෙනම් පාර්ලිමේන්තුව හදා තිබෙන්නේ තනිකර ගංවතුර තිබෙන කුඹුරක. ඕක කරන්න ඔය හැටි වැඩක් නෙමේ ගංවතුරේ. අක්කර දෙසිය ගණනක් අත්පත් කරගෙන තිබෙන්නේ. මා අසන්නේ මන්ත්‍රිවරුන්ගෙන් . මා දන්නේ නැහැ මොන මත දරනවා ද කියා. මේ හදවත වගේ තැන් මේවා. අපි ආරක්ෂා කළ යුතුයි.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ඇයි අපේ නගර සභාවේ තිබෙන වාහන ටික හදවත නෙමේද ?

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

හදවත. එහෙනම් හල්වතුරේ පෝරඹ පැත්තට වෙන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මේ වාහන සියල්ලම තියාගෙන ඉන්නේ අපේ නගර සභාව ඇතුළේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

වසර ගණනක් ඇවිත් දැන් තමයි වාහන මතක් වෙන්නේ. මා දන්නේ නැහැ අපේනම් විරෝධතාවය තියෙනවා. මේ ස්ථානයේ මේවා කිරිම සඳහා. වෙන ස්ථානයක මේවා කරන්න . ඕන සහායෝගයක් ලබා දෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ඔබතුමා මේ ඉඩම සම්බන්ධයෙන් මා නගර සභාවේ සිටින කාලයේ තමයි පුස්තකාලයක් ඉදිකරන්න ඔය ඉඩම වෙන්කරනවා කිවුවේ. අත්‍යවශ්‍ය දෙයක්. ඔබතුමා මේ සම්බන්ධව ඔබතුමා විග්‍රහයක යෙදුණා. මෙන්න මේ විදියට හදන්න බලාපොරෝත්තු වෙන්නේ කියා. මිට වඩා ලොකු සේවාවක් කරන්න අම්බලන්ගොඩ කියන නගරයේ අධ්‍යාපනය හදාරන දරුවන්ට අපෙන් ලොකු සේවයක් විය යුතුයි. ඒ සඳහා ඔබතුමාට එහි අවශ්‍යතාවයක් තිබුණා. දැන් ඔබතුමා එය වෙනස් කරලා. මේ විදියට කටයුතු කිරිම සම්බන්ධව මටත් හරි ප්‍රශ්නයක්. ඇත්තටම ඔබතුමා දන්නවා සමුපකාරයේ කැලේ වැව් ඉඩම් ප්‍රමාණයක් තිබෙනවා. බෞද්ධ මධ්‍යස්ථානය අසළ තිබෙනවා සමුපකාරයට අයිති කොටසක්. ඔබතුමා තමයි එහි බලය ලබා ගන්න මුලික වෙලා කටයුතු කළේ සභාපතිතුමාට. එතකොට ඔබතුමාට පුළුවන් කතා කරලා මේ වේලාවේ ලබා ගන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ඒ සම්බන්ධව කටයුතු කිරීම සමුපකාරයේ වගකීමක්. මේ අපේ ඉඩම් සම්බන්ධයෙන් අපි කතා කරලා මේ ප්‍රශ්නය විසඳා ගන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>**

අපි බද්දකට හරි ගන්න. මේ නගර සභාව එහා පැත්තේ ඒ ප්‍රමාණය නිකං තිබෙන්නේ. ඔබතුමා කතා කරලා එය කරන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

දැන් බද්දකට නෙමෙත නිකං දීලා තිබෙන්නේ. නිකං අපේ වාහන ටික නතර කරනවා. මතක තියා ගන්න මේ කෝටි 15ක 20ක වාහන නිකං දමන්න බැහැ. එක තැනක ආරක්ෂක අංශය යොදා එක තැනක වාහන සේදීමට දමන්න ඕන. ඊට පස්සේ අපේ නගර සභා ගොඩනැඟිල්ල පිටුපසින් අලුත් ගොඩනැඟිල්ලක් හදනවානම් ඒ හදන ගොඩනැඟිල්ලට යන්න ඉස්සරවෙලා එතැන සුද්ද කර තියෙන්න ඕන. තාවකාලිකව මේ වාහන ටික ඉවත් කරන්න ඕන. එක තේරුම් ගන්න. පුස්තකාලය හදන එක මං බැහැර කරලා නැහැ. එතැන පුස්තකාලය හදන එක මට මතකයි. එක හදනවා කවදා හරි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>**

පුස්තකාලයට ප්‍රධාන තැන දෙන්න. එතැන තාවකාලිකව හදනවාට වඩා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

තාවකාලික විසඳුමක් වශයෙන් අපි එය කරන්නම්. නගර සභාව කියන එක පලමුවෙන්ම අර්ථ දක්වන්නේ ජනතාවට හොඳ සෞඛ්‍ය සම්පන්නව සිටීම. එතකොට ඒ තිබෙන වාහන ටික ඔක්කොම අපි ආරක්ෂා කර ගන්න ඕන. දැන් මේ වැස්සට තෙමී තෙමී තිබෙන්නේ. අපරාදයක් මේක. මේ වාහන හරි විදියට කළමනාකරණය කර ගන්න ඕන.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>**

එතැන ගොඩක්ම ජනාකීර්ණ ප්‍රදේශයක්. පුස්තකාලය හදන එක තමයි වඩාත් හොඳ

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

දැන් මේ නගර සභාව ඇතුළේ ජනාකිර්ණ නැද්ද? ඉතිං ඒ නගර සභාවේනේ මේ වාහන ඔක්කොම තිබෙන්නේ. අනිත් එක තමයි ආරක්ෂාවත් තිබෙන්න ඕන. පැහැදිලිව ඒ සියල්ලම තිබෙන්න ඕන. එමනිසා තමයි වෙනත් හොඳ තැනකට යනකම් තාවකාලිකව ඉදිකරන්නේ. අපේ බලාපොරෝත්තුවක් තිබෙනවා අලුත් ගොඩනැඟිල්ලක් මේ පිටු පස්සේ හදන්න. එමනිසා අපිට හැමදාම මෙතැන ඉන්න බැහැ. මෙතැන පුස්තකාලයට අයිති තැන. අපි මෙතැනින් ඉවත් වෙන්න ඕන. පුස්තකාල මණ්ඩලයෙනුත් ඉල්ලා තිබෙනවා මෙතැනින් අයින් වෙන්න කියා. ඉතිං මේ දේ අපි කරලා එතැනට යන්. මෙය හැදුවාට පසු අපිට ඊට වැඩියේ ආවොත් අපි මෙතැනට වාහන ටික ගෙන්නම්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මාත් ගරු මන්ත්‍රි රාහුල මහතා ප්‍රකාශ කළ අදහසට එකඟ වෙනවා. මෙහි වටිනාකම ඉතාමත් වැඩියි. එමනිසා මාත් යෝජනා කරන්නේ මෙය කරන්න ඕන වැඩක්. වාහන අංගයක් අත්‍යාවශ්‍යයි. මාත් එය එකහෙලා ප්‍රකාශ කරනවා වාහන අංගයක් නගර සභාවට අත්‍යාවශ්‍යයි. නමුත් ඒ වාහන අංගනයට සුදුසු තැන මෙතැන නෙමේ කියන එක තමයි මගෙත් මතය. මොකද මෙහි වටිනාකම. මීට වඩා වැඩි ප්‍රයෝජනයක් අපේ නගර සභාවට ගන්න පුළුවන්. එමනිසා මමත් රාහුල මන්ත්‍රිතුමා සමඟ එකඟ වෙනවා. මගේ විරුද්ධත්වය ප්‍රකාශ කරනවා. මේ ස්ථානයේ වාහන අංගනය හදන එකට.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, අද අප මුලිකම බලන්න ඕන අද අපේ නිලධාරින් සහ සභාව තබන්නෙත් මේ පුස්තකාලය තුළ . අපේ නගර සභාවේ ඉඩකඩ කියන ඕනැම කෙනෙකුට දැනෙන දෙයක්. එමනිසා අපි මුලින්ම අවධානය යොමු කළ යුත්තේ අපේ තිබෙන ගොඩනැඟිල්ලේ පෞරාණික බව තියාගෙන ඒ ගොඩනැඟිල්ලට පිටුපසින් ඔබතුමා කිවු පරිදි අපේ මේ ඉඩ පහසුකම ලබා ගැනීම සඳහා අපි ගොඩනැඟිල්ලක් ඉදිකළ යුතුයි. ඒ අතරතුර අපේ ශාලාවේ ඉඩකඩත් වැඩි කරගන්න පුළුවන්. එමනිසා අප සියළු දෙනාම එකමුතුව ඊට සහායෝගය ලබා දිය යුතුයි. ඒ කරන්න නම් අපේ පිටුපස තිබෙන වාහන ඉවත් වෙන්න ඕන. අර කියන හල්වතුරේ ඉඩම ඉතා වටින ඉඩමක්. එතකොට එම ඉඩමේ අපි ප්‍රයෝජනයක් ගන්න ඕනේ අපේ නගර සභාවට ආදායමකුත් සමඟ නිසි කළමනාකරණයකින් නිසි දෙයක් සඳහා ප්‍රයෝජනයට ගැනීමට. එතකොට අපිට වාහන අංගනය සඳහා අපිට දැන් වාහන අංගනය හදන්න බැහැ. ගරු සභාපතිතුමා කිවු පරිදි. ස්ථිර වාහන අංගනයක් අප නගර සභාව සතු විය යුතුයි. කොටි ගණනක් වටිනා මේ දේපල අපි මේ එක් එක් පාර අයිනක දමා තිබෙනවා. ඒවාට ආරක්ෂාවක් තියෙන්න ඕන. එහෙම නම් මේ වාහන අංගනය මාත් යෝජනා කරනවා. හල්වතුරේ අපේ මන්ත්‍රිතුමා කිවු පරිදි එතැන යට වෙනවා. හැබැයි යට වෙනවා කියා එයට අපි විකල්පයක් ගන්න ඕන. එහෙනම් අපි හොඳ ඉඩ තිබෙන භුමි ප්‍රමාණයක් අපි ඉදිරිය ගැන හිතලා අපි ඒ කුණු දමන ස්ථානයේ අතුල් වෙන තැන අත්තිවාරම උස්සා පස් පුරවා කොන්ක්‍රිට් කරලා වහලක් ගසා නඩත්තු කටයුතු සඳහාත් , වාහන නතර කිරිම සඳහා ස්ථානයක් හදන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මන්ත්‍රිතුමා ඒ කොටසේ අක්කර 38ක් ඉඩම් ලියා පදිංචි කිරිමේ දෙපාර්තමේන්තුවට එතකොට අපි ඔය යෝජනා කරන ස්ථානය තිබෙනවානේ එය එම දෙපාර්තමේන්තුව සතුව තිබෙන්නේ. දැන් ඔය මායිම ගත්තොත් එහෙම ඔය කුණු දමන එකේ තව එහාටත් යනවා. දැනට මේ කැල්ලේ තිබෙන්නේ අක්කර 8ක් පමණයි. මේ පැත්තේ කැල්ලේ තිබෙන්නේ තව 8ක් විතර . ඔක්කොම 20 ක් වුණත් තව අක්කර 18ක කොටසක් ඇළෙන් එහා පැත්තේ තිබනවා. එතකොට මතක තියා ගන්න වෙනවා අනුන්ගේ ඉඩමක මේ දේ කරන්න වෙනවා. ඉඩම් ලියා පදිංචි කිරිමේ දෙපාර්තමේන්තුවෙන් අපිට දිපු එකම ඉඩම මෙක විතරයි. එතකොට අපි එහෙනම් යන්න ඕන තවත් එහාට. ගඟ පැත්තටම යන්න ඕන.

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්**

නැහැ මා කියන්නේ අපිට දිපු කොටසේ

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

නැහැ . අපි දිපු තැන තමයි හදන්නේ. එහෙනම් තව ගොඩකරනගෙන යන්න ඕන තව එහාට.

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්**

නැහැ . මා කියන්නේ අපි තාවකාලිකව. මෙය ක්ෂණිකව කරන්න බැහැ. ප්‍රමුඛතාවය අපේ ගොඩනැගිල්ල ඉදිකිරිම. ගොඩනැගිල්ල ඉදිකර ගන්න නම් අපි අකමැත්තෙන් හරි තාවකාලිකව හරි මේ තිබෙන වාහන ටික ගෙනියන්න ඕන ඔය කියන හල්වතුර තැනට. මා යෝජනා කරන්නේ එතැන ඉඳගෙන අපි වෙන ස්ථිර තැනකට යන්නේ . වාහන වලත් ආරක්ෂාව හා එවාගේ නඩත්තු කටයුතුත් එක්ක යන්න. මොකද අපි නිතරම අවධානය යොමු කර ගන්න ඕන අපේ ඉන්න තැන වැඩ කරන තැන පහසුකම් ඇතිව ඉදිකර ගන්න. අපි මේ පුස්තකාලයේ ඉන්න තැන දෙන්න ඕන. පුස්තකාල පහසුකම් අපි මේ පරිහරණය කරන්නේ. එමනිසා අපි මේ පිට්ටනිය හැදුවා වගේ පෞරානික බව තියාගෙන නගර සභා ගොඩනැගිල්ල අඩුපාඩු හදාගෙන එයට ශක්තිමත් පසුබිම හදාගෙන එය වැඩි දියුණු කරන්න පිටුපසින් ගොඩනැගිල්ලක් හදාගෙන ඉඩකඩ පහසුකම් හදාගෙන, සභාව තියන්න ඉඩකඩ පහසුකම් හදාගෙන තාවකාලිකව හරි වාහන ටික ආරක්ෂාකාරිව තබා ගැනීමට ස්ථානය හදාගෙන ස්ථිර වාහන අංගනයක් දැන් අපි කුණු දමන තැන උස්සා ගංවතුරක් ආවොත් එයට අලාභ හානි නොවන පරිදි හදන්න. අපි නිතරම හැම කටයුත්තකදිම සුබවාදිව බලා හැම කටයුත්තක්ම නගර සභාවේ කාර්යක්ෂමතාවය ගැන හිතලා තමයි මේ කටයුතු කරන්නේ.

**ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, අපේ ගරු රාහුල මන්ත්‍රීතුමා, ගරු ධම්මික කොඩිකාර මන්ත්‍රි හා ඩෙනට් පනියන්දුවගේ මන්ත්‍රි ප්‍රකාශ කළ දෙය සමඟ මාත් එකඟයි. වටිනා සම්පතක්. ඔබතුමා කියන පරිදි අපේ නගර සභාවේ තිබෙන වටිනා සම්පත් ටික තමයි මේ විදියට දමා තිබෙන්නේ. හරිම අශෝභනයි. වාහන හැම තැනම දමා. මේ ඉඩම ලොකු වටිනාකමක් තිබෙන ඉඩමක්. අපි වාහන ටික අරගෙන ගිහින් සැලසුම් කරලා කරන්න. වෙන ඉඩමක් නැතිද ?

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අපි දැන් මෙහෙමයි. අඩුම ගණනේ අපි නගර සභාවේ මේ ෂැල්බ් දෙක හරි දමා ගන්නවා. පිටු පසින්. එම ෂැල්බ් එක දමනවා නම් අපි ඒ ටික ඉවත් කරන්න ඕන. වාහන ටික දමා ගන්න අපිට තැනක් තිබෙන්න ඕන. මේ වාහන ටික පාරේ නතර කිරිම නිසා පාරේ ගමන් කරන්නත් බැරි වෙනවා. ඒ තරම් වාහන තොගයක් අපිට තිබෙනවා. එක තමයි කරන්න හදන්නේ.

**ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, තාවකාලිකව ඉදි කරනවා කියා ස්ථිරවම තියෙව්ද දන්නේ නැහැ ඔය වාහන අංගනය.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නැහැ. අපිත් තාවකලික මිනිසුනේ. මෙතැන මේ පුටුවේ අද මා ඉන්න පුළුවන්. හෙට ඔයා ඉන්න පුළුවන්. ඒ ඉන්න මිනිසුන්ට තින්දු කරන්න පුළුවන්. තව අවුරුදු දෙකයි වැඩියේ හිටියත් ඉන්න පුළුවන්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, හොඳ විදියකට මෙය කරන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙහිදි අම්බලන්ගොඩ නගර සභාව කොච්චර හොඳට වැඩ කළත් පලවෙනියා වෙන්න බැරි වෙලා තිබෙනවා. මොකද මෙතැනට එන පරික්ෂක කණ්ඩායම එනවිට මේ වාහන කන්දරාව දැක්කාම මොකක්ද මේ තිබෙන හැටි කියා. මෙය ආරක්ෂා කරන්න වෙනම අංගනයක් හදන්න ඕන. මෙතැන ලස්සනට තිබෙන්න ඕන. හරිම අශෝභනයි. අපි එය පිළි අරගෙන අපි එය කරන්න බලන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

අශෝභනයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>**

මෙතුමලාගේ මතය හරි. නගර සභාවේ හදවත බදු තැනකි. වාහන ටික ආරක්ෂා කරන එක පළමුව කෙරෙන්න ඕන. එක වැදගත් දෙයක්. හැබැයි ඔබතුමා තාවකාලිකව මෙය හදනවා කියා මේ ගොඩක් වටිනා ඉඩම වාහන ආරක්ෂා කිරිම සඳහා කියා වෙනත් විකල්පයක් යොදවා ගන්න. එහෙම තිබෙන කොට මෙය ඉවත් කර ගන්නවා කියන අදහස තිබෙන්න ඕන. වටිනා ඉඩමක්. අපේ නගර සභාවටනේ මේ වටිනාකම තිබෙන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

කොහොම වුණත් අපේ බලාපොරෝත්තුවක් තිබෙන එකක් තමයි හොඳ පුස්තකාලයක් සැදිම. එකට ඔතන හොඳම තැනක්. ඒ අදහස නැති වෙන්නේ නැහැ. අපි මේ වැඩය කරනවා නම් මෙතැන තිබෙන අවහිරතා අයින් කරන්න ඕන. අයින් කරනවා කියා මෙතැන තිබෙන වාහන ටික පාරට දමා බැහැ. මේ වාහන කොයි වැස්සක් වැස්සත් වැස්සට තෙමි තෙමි අව්වට වේලි වේලි තිබෙන්නේ. දැනට මේ වාහන වුණත් අපිට එතැන ගිහින් යට දමන්න පුළුවන්. හොඳ මේවා එකක් අනුව එය සිදු කරගත යුතුයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මේ මාතෘකාවට අදාල ප්‍රදේශයේ මන්ත්‍රීවරයා මා. මා මේ සම්බන්ධව දැනුවත් වෙලා හිටියේ නැහැ. ඔබතුමා කිහිප වතාවක් කිවුවා වාහන අංගනය මෙතැනට ගෙනියන්න ඕන. මේ ගෙනියන අවස්ථාව නෙමේ නැති නිසා මා මේ ගැන කතා කරන්න ගියේ නැහැ. මා නැතත් ගම්වැසියන් 23කු අත්සන් කර ඒ අයගේ විරෝධතාවය ඉදිරිපත් කර තිබෙනවා. හල්වතුර දෙපැත්තේ කට්ටිය. අපි සභාවක් මෙහි තාවකාලික වාහන අංගනයක් හදනවා කියන එක හිතා ගන්න අමාරුයි. වාහන 40කට තාවකාලික අංගනයක් අපි කොහොමද හදන්නේ. ඊළඟට මේ වාහන අංගනය කියන්නේ වාහන නතර කරන එක විතරද ? උදේ සිට රාත්‍රී වෙනකම් වාහන හොදන්නේ නැද්ද ? ඊළඟට වාහන තින්ත ආලේප කරන කෙනා උදේ සිට මේ කාර්ය කරන්නේ නැද්ද? මෙහි වාහන අලුත් වැඩියා කටයුතු සිදු කරන්නේ නැද්ද? එතකොට ගරාජයකට අවශ්‍ය සියළුම යන්ත්‍ර සූත්‍ර අපි මෙහි සවි කරන්නේ නැද්ද? ඒ අවශ්‍ය සියලුම දේ කරන එකට තමයි වාහන අංගනයක් කියන්නේ. එතකොට අවශ්‍යතාවය එක. දැනටත් අපි මෙතැන ඒ සිද්ධ කරනවා. යම් මට්ටමක. හැබැයි අපි ඊට වඩා එහා ගිය පුළුල් ස්ථානයකට යනවා නම් අර ඔබතුමා කිවූ පළාත් පාලන ආයතනයේ පලමු ස්ථානය ගන්න නම් අපි ඒ අකාරයේ වාහන අංගනයක් සැදිය යුතුව තිබෙනවා. බරපතල ප්‍රශ්නය ඔබතුමා දන්නවා ඇති මේ කලාපය පදිංචිකරුවන්ගේ කලාපයක්. මෙය නාගරික සංවර්ධන අධිකාරියෙන් පහත් බිම් අධිකාරියෙන් නිත්‍යානුකූලව පිළිගන්නා කලාපයක්. මේ කොටසේ කිසිම කර්මාන්තයක්

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මෙය කර්මාන්ත කලාපයක්. මෙය ඔබතුමලාගේ කාලයේ තමයි මෙය කර්මාන්ත කලාපයක් ලෙස නම් කළේ. එමනිසා මේ කොටස කර්මාන්ත කලාපයට අයිති වෙන එකක්.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>

මේ කොටස කර්මාන්ත කාලපයට අයිති වෙන්නේ නැහැ. පෙර පාසල දමලත් මෙහි විශේෂ අනුමැතියක් ගන්න වුණා. ශාන්තගේ පෞද්ගලික පංතිය දමලත් විශේෂ අනුමැතියක් ගන්න වුණා. මට මතකයි මා උප සභාපති සිටිය කාලයේ සභාපතිතුමා දුන්නේ නැහැ අවසර. එය නිත්‍යානුකූලම දෙයක්. මෙය පදිංචිය සඳහා පමණයි. අර පැත්ත තමයි කර්මාන්ත වලට තිබුණේ. ඔබතුමා එම ඉඩම් ටික නිවැසියන්ට නිකං බෙදා දිලා නිවාස ගොඩ නැගුනා. ඊළඟට මා කියන්න යන්නේ ඔබතුමා කිවුවා ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයට කියා මේ ඉඩම අයිති එම කුණු දමන කොටසේ අක්කර දෙක අපිට නිවැරදිව අයිතිය තිබෙනවා. ඒ අක්කර දෙක නගර සභාවේ. ඒ අක්කර දෙක පුරවා තිබෙන්නේ. මා මේ ගම්බිමවල විවාදයක් නෙමේ.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

කවදාද පවරලා දුන්නේ.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>

ඒ නගර සභාවේ අක්කර දෙක.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

ඒ නගර සභාවට අයිතියක් නැහැ. මෙහෙමයි දිසාපතිතුමා පවරාගෙන 43වගන්තිය යටතේ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයට. එකට හේතුව ඔකේ සිටින අය මට විරුද්ධව වන්දි ඉල්ලා මානව හිමිකම් එකට ගියා. මා එම කොමිෂන් එකට යනවිට අරගෙන ගියේ එහි පත්ඉරුව. අක්කර 38ක් පවරලා තිබෙනවා. මා කිවුවා මෙන්න පත්ඉරුව තිබෙනවා. මෙය පවරා තිබෙන්නේ ඉඩම් රේජිස්ට්‍රාර් කාර්යාලයට. මෙහි වන්දි ගෙවීම තිබෙන්නේ නගර සභාවට නෙමේ . ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයට. ඒ අය සමඟ කතා කරන්න. ඒ වේලාවේම මාව නිදහස් කළා. ඒක එතැනින් නඩුව ඉවරයි. ඉතිං මා දන්නවා එය පවරලා ඉවරයි. ඔය වැරදි වැටහීමක්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ඔබතුමා ඉදිරිපත් කරන්න කරුණාකරලා සභාවට මෙහි නිවැරදි අයිතිකරුවන්. මා වගකීමෙන් කතා කරන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මාත් වගකීමෙන් කතා කරන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

මේකේ නඩු තීන්දුවක් තිබෙනවා උසාවියේ. නඩු තීන්දුවට අනුව ඔබතුමාට කියන්නම් මා නඩු තීන්දුව ඕනනම්. ඔය කුණු දමන තැන තමයි අක්කර 10 වැව. එය නගර සභාවට අයිති නැතිනම් අපි කොහොමද වැවක් නිර්මාණය කරන්නේ. අඩි 30ක පළලට සංවර්ධනය කරන්න තිබෙන ඇළ . ඒවා ඔක්කොම නඩු තීන්දුවේ තිබෙනවා. අක්කර 10 අපේ නෙමේ නම් අපි කොහොමද එහි වැවක් හදන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

වැව හදන්නේ අරක පිරවීම මත වැව හැදිය යුතුයි කියා තිබෙනවා. එක එගොල්ලන් හදන්න ඕන.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

මෙය පහත් බිම් එකෙන් ගොඩ කරලා ඒ අයගෙන් වන්දි අයකරගෙන අවසන්. ඒ වන්දි අයකිරීම හිලව් කළා හිටපු සභාපතිතුමා වෙන ක්‍රමයකට. අන්තිමටත් ගෙවන්න තිබුණේ සුළු කොටසක්. අනිත් එක ඔබතුමා කිවුවාට මා ගාව තිබෙනවා ඔය ඉඩමේ කැල්ලෙන් කැල්ල අයිතිය පිළිබඳව තහවුරු කරන ලද වාර්තා ඔක්කොම. සියල්ලක 90%ක් තිබෙන්නේ හිමිකම් කියයි. තවත් සියයට ගණනක් තිබෙන්නේ අල්ලාගෙන සිටී. ඉතාම සුළු ප්‍රමාණයක් තිබෙනවා නිවැරදි අයිතිය තිබෙන ඔප්පු කොටස්. මා එකින් එක සනාථ කරන්නම්. එහෙම අපිට සභාවක් නොමඟ යවන්න ඕනේ නැහැ. ඉතාම සරල කාරණාවක්. වැදගත් කරණාවක්. ඔබතුමා ඉන්න මතයේ සියයට ලක්ෂ වාරයක් අපි ඉන්නවා. එක හරි . නමුත් ලක්ෂ 136ක් වටිනා ගරාජයක් ගහන එකද ඔබතුමා යෝජනා කරන්නේ මේ සභාවට. අද ඉඩමේ වෙළඳ වටිනාකම ලක්ෂ 1600කි. මේ ගරු සභාවට තිබෙන්නේ ඕච්චරමයි ඉඩමකට. ඔබතුමාට යම් ව්‍යාපෘතියකට මධ්‍යම රජයෙන් එව්වොත් යම්

මුදලක් යම් ව්‍යාපෘතියකට . කොහේද තිබෙන්නේ ඉඩමක්. එකත් එක ප්‍රශ්නයක්. අනිත් එක අපිට මෙහි නිත්‍යානුකූලව කර්මාන්ත පටන් ගන්න බැහැ. අනිත් එක අපි සර්ව සාධාරණව බැලුවහොත් මේ වටේම නිවාස ඉදිකර අවසන්. මේ පැය 24ම වාහන තින්තා ආලේප කරනකොට වාහන වේගයෙන් හෝදන කොට ඒ ප්‍රදේශයේ ජනතාවට ජීවත් වෙන්න පුළුවන් හැකියාවක් ඇති වෙනවාද? අතන තාම ඒ නිවාස වලට ගොඩක් එහාට වෙන්න. අපිට ඒ නිවාස එකකට වත් නෙදැනෙන්න අර ටික සංවර්ධනය කරලා ස්ථිරවම එතැන ගොඩ නැඟිලි සංකිර්ණයක් හදන්න පුළුවන්. නිවාස තිබෙනවා නම් එතැන සම්පූර්ණම වසා.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

මේ කොටසේ මන්ත්‍රිතුමා නිවාස 15කට වඩා නැහැ.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**</u>

නැහැ මේ හල්වතුර පාර දෙපැත්තේ නිවාස 23නේ මේ අත්සන් කර තිබෙන්නේ.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

ඔය ඉඩම් කැලි අයිතිකරුවන් වෙන්නැති. නමුත් අතන තිබෙනවා නිවාස 84ක්.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, ඒ තිබෙන්නේ ඇළෙන් එහා පැත්තේ. ඇළෙන් මේ පැත්තේ. මා කතා කරන්නේ එකටත් අක්කරයක් එහා.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

මේක නිකං බල්ලෝ දමන්න හදන්න හදපු එක වගේ වෙනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**</u>

මා කතා කරන්නේ පනියන්දුව පැත්තට වෙන්න. ඔබතුමා පනියන්දුව පැත්තට වෙන්න . ඔබතුමා අරක ආරක්ෂා කරන්න කතා කරනවා. මේ ඉඩම දෙන්න කතා කරනවා. ඔබතුමා පාක්ෂපාතියි. විශාල ප්‍රශ්නයක් මේක. ඔබතුමා ඉන්න ඕන අපාක්ෂපාතිව. මෙතුමාගේ ප්‍රදේශයේ එක කරන්න බැහැ. මාගේ ප්‍රදේශයේ මේක කරන්න පුළුවන්. මා විරුද්ධයි කරුණා කරලා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, තාවකාලිකව හදන දෙයක් නම් හොඳයි . එතැන ස්ථිර ගොඩනැඟිල්ලක් නෙමේනේ හදන්නේ. හල්වතුරේ එහා පැත්තේ හදන එකේ නිවාස 82ක් තිබෙනවා. එහි සැදිමේදි ඔය ප්‍රශ්නයම එනවා. දැනටත් කුණු දමා මිනිසුන් නිවාස වසාගෙන ඉන්නේ. මැස්සෝ වසා නිවසක දානයක්වත් දෙන්න බැරි තත්ත්වයක් ඒ හල්වතුර ප්‍රදේශයේ තිබෙන්නේ. මොකද වතුර ගැලුවාට මෙය උස්සා හැදුවාට වාහනයක් එළියට ගෙනියන්න හම්බ වෙන්නේ නැහැ අර වතුර බසිනතුරු. ට්‍රැක්ටර් ටික උඩ තියෙවි. කුණු අදින්න බැරුව. එය ඉස්සුවාට පාර යටවෙනවානේ.

වැස්ස ගමන් නිවාස වලට වතුර දමනවා. කුණුටිකවත් අදින්න බැරි වෙයි. අනිත් එක නිවාස ඔක්කොම විරුද්ධයි. මා ඊයේ කතා කළා . ජනතාව කිවුවා මේ කුණු දමලත් අසරණ වෙලා ඉන්නේ මෙතැන. ජනතාව විරෝධතාවය ප්‍රකාශ කරනවා කිවුවා. මාගේ විරෝධතාවය ප්‍රකාශ කරනවා එතැනට ගෙනයාම සම්බන්ධළු.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මෙහි තින්දුව දෙන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

තින්දුව අපි මේ ගොඩනැගිල්ල ඉදිකරන්න. මෙය තාවකාලිකව එතැනට ගෙනියනවා. අද වුණත් ගෙනියනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ඡන්ද විමසිමක් කරන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

විරුද්ධ අය සිටිනම් අත ඔසවන්න. විරුද්ධව ඡන්ද 11කුත් පක්ෂව ඡන්ද 4කුත් ප්‍රකාශ කර තිබෙනවා. මේ කරපු දෙය තමුන්නාසේලාට තෙරෙයි පස්සේ කාලයක. ඒ කියන්නේ මොකක්ද මේ කියා. නැහැ ඔය විපක්ෂ වෙච්ච මන්ත්‍රීවරුන්ගේ නිවාස ඉදිරිපිට වාහන නතර කරන්න. ඔගොල්ලන් බලා ගන්න. බලාගන්න ඔගොල්ලන්ගේ නිවාස ඉදිරිපිට ඔක්කොම නතර කර තියන්නම්. මේ ගොල්ලන්ගේ නිවෙස් වලට ගිහින් දමනවා. බලාගනිව්නේ. විපක්ෂ වෙච්ච කට්ටිය වාහන ටික ආරක්ෂා කරන්න. ඔයා ඉන්නේත් නගර සභා නිවසක නිසා තමයි. හැල්ලු කරන්න වෙනවා මේවගේ අදහස් තියෙන අය.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ඔබතුමාගේ තමයි බරපතලම හැල්ලු අදහස් තිබෙන්නේ. ඔබතුමා කල්පනා කර බලන්න මේ වගේ දෙයක් කරන්න සුදුසුම තැන කොතනද කියා. මේ සභාවේ සුදුසුම තැන හෘද සාක්ෂියට එකඟව කතා කරන්න. හල්වතුරේ. කුණු ට්‍රැක්ටර් ටික දමන්න. ඒටික හෝදන්න පුළුවන් එතැන. එතැන තමයි .

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඒ ට්‍රැක්ටර් ටික දැන් තිබෙන්නේ නගර සභාවේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

එතැන හදනවාට මා විරුද්ධයි. හැබැයි සභාපතිවරයෙක් වශයෙන් දකින දැක්ම තිබෙන්න ඕන. එතනයි එක හදන්න ඕන.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

එහෙම කොහොමද ඒකාධිපත්‍යට වැඩ කරන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ඒකාධිපත්‍ය නෙමේ. අවශ්‍ය දේ කරන්නේ. අනවශ්‍ය දේ බැහැර කරන්නේ.

**තීරණය**

2020.06.26 දින පැවති කළමනාකරණ කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රීනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත වූ අතර, වාහන නැවතුම් අංගනය කාර්යාල භූමියෙන් ඉවත් කර හල්වතුර පර්චස් 80 ක ඉඩම ආවරණය කර එම ස්ථානයේ වාහන නැවතුම් අංගනය සකස් කළ යුතු බවට ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව සම්බන්ධව ජන්ද විමසීමක් කළ අතර විරුද්ධව ජන්ද 11 ක් සහ පක්ෂව ජන්ද 04 ක් ලැබීම හේතුවෙන් එම යෝජනාව ඉවත් කිරීමට තීරණය කරන ලදී .

**06.05 2020.06.25 දින පැවති ක්‍රීඩා කමිටු වාර්තාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

2020.06.25 දින පැවති ක්‍රීඩා කමිටු වාර්තාව සභාගත කිරිමට යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ ඩබ්.ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය**

2020.06.25 දින පැවති ක්‍රීඩා කමිටුවේ කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී මන්ත්‍රී ඒ ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**06.06 2020.06.22 දින අම්බලන්ගොඩ නගර සභාව හා වෙළඳ සංගමය ඒකාබද්ධව පැවති කමිටුවේ කමිටු වාර්තාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

2020.06.22 දින අම්බලන්ගොඩ නගර සභාව හා වෙළඳ සංගමය ඒකාබද්ධව පැවති කමිටුවේ කමිටු වාර්තාව සභාගත කිරිමට යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය**

2020.06.22 දින අම්බලන්ගොඩ නගර සභාව හා වෙළඳ සංගමය ඒකාබද්ධව පැවති කමිටුවේ කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**07** ටෙන්ඩර් හා මිළ ගණන්

**07.01 ටෙන්ඩර්**

**07.02 මිළ ගණන්**

**07.02.01 අම්බලන්ගොඩ නගර සභාවවේ PF-7424 කැබ් රථයේ ටයිමින් බෙල්ට් එක අලුතින් යෙදීම සඳහා ඉදිරි පත් කර ඇති මිළගණන් සභාගත කරන ලදී.**

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ග්‍රෑන්ඩ් මෝටර් වඳුරඹ | චාමර මෝටර්ස් ගාල්ල | සමන් මෝටර්ස් බද්දේගම |
|---|---|---|---|---|
| 01 | PF-7424 කැබ් රථයේ ටයිවින් බෙල්ට් එක අලුතින් යෙදීම | රු.5473/= | රු.89968/= | රු.89073/= |
| 02 | Balancer shaft (l)01 Seal | රු.2082/= | රු.2282/= | රු.2182 |
| 03 | Balancer shaft Timing Belt | රු.7926/= | රු.7926/= | රු.7926/= |
| 04 | Balancer shaft Timing Belt(R) Oil seal | රු.1260/= | රු.1460/= | රු.1360/= |
| 05 | Balancer shaft Timing BeltTensiees | රු.5665/= | රු.5965/= | රු.5765/= |

| | | | | |
|---|---|---|---|---|
| 06 | Seere Balance Shaft | රු1537/= | රු.1837/= | රු1537/= |
| 07 | Cranles haft oil seal | රු2082/= | රු2132/= | රු2032/= |
| 08 | Cams haft  shft oil seal | රු1343/= | රු1543/= | රු1443/= |
| 09 | Timimg Brelt Adjecster | රු14442/= | රු14742/= | රු14592/= |
| 10 | Timimg Brelt Hler pulley | රු11330/= | රු12530/= | රු12430/= |
| 11 | Timimg Brelt | රු12150/= | රු12350/= | රු12250/= |
| 12 | Timimg Brelt Tensiorer | රු13619/= | රු14919/= | රු14719/= |
| 13 | Timimg Brelt &other belt remove and refit font Engine oil seal | රු10000/= | රු10000/= | රු10000/= |

**තීරණය**

PF-7424 කැබ් රථයේ ටයිමින් බෙල්ට් එක අලුතින් යෙදීම සඳහා මිල ගණන් ඉදිරිපත් කර ඇති ආයතන අතරින් අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති ගාල්ල, වඳුරඹ GRAND MOTORS ආයතනයෙහි මිල ගණන් පිළිගැනීම සුදුසු බවට ගරු සභාව තීරණය කරන ලදී.

**07.02.02 අම්බලන්ගොඩ නගර සභාව මගින් පාලනය වන පෙරපාසල් 07 ක් සඳහා දෑත් සේදීමට සින්ක් 07 ක් සාදා ස්ථානගත කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය හා උපාංග ලබා ගැනීම සඳහා ඉදිරිපත් කර ඇති මිල ගණන් සභාගත කරන ලදී.**

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | වර්ගය | අතුල කලර් හවුස් | රහුදිනි හාඩ්වේයාර් | නන්දනpvc සහ සෙරමික් ට්‍රේඩ් |
|---|---|---|---|---|---|---|
| 01 | 18″×18 ″සින්ක් | 07 | කවුන් | රු.19950/= | රු.19425/= | රු.18900/= |
| 02 | සින්ක් ටැප් | 07 | Slone | රු.8750/= | රු.8050/= | රු3150/= |
| 03 | 1 ½ ″ වෙස්ට් | 07 | ,, | රු.910/= | රු.1190/= | සින්ක් එක සමඟ ලැබේ |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 04 | 1 ½ ″ පෝසෙට් ෂොකට් | 07 | ,, | රු.910/= | රු.805/= | රු.682.50 |
| 05 | 18 ″ පෙප්සිපල් හෝස් | 07 | ,, | රු.1750/= | රු.1820/= | රු.1820/= |
| 06 | 1 ½ ″ එල්බෝ | 14 | ,, | රු.1960/= | රු.2240/= | රු1750/= |
| 07 | 1 ½ ″ PVC පයිප්ප | 07 | ,, | රු.4270/= | රු.5530/= | රු4480/= |
| 08 | ½ ″ PVC පයිප්ප | 25 | ,, | රු.4750/= | රු.4125/= | රු.4000/= |
| 09 | ½ ″ ෂොකට් | 15 | ,, | රු.300/= | රු.285/= | රු.300/= |
| 10 | ½ ″ එල්බෝ | 27 | ,, | රු.540/= | රු.513/= | රු.540/= |
| 11 | ½ ″ වැල් ෂොකට් | 21 | ,, | රු.420/= | රු.525/= | රු.420/= |
| 12 | ට්‍රෙඩ් සිල් | 05 | | රු.225/= | රු.200/= | රු.200/= |
| 13 | PVC ගම් | 100g | ,, | රු.340/= | රු.360/= | රු.330/= |
| 14 | ¾ බොක්ස් බාර් | 07 | | රු.7700/= | රු.5460/= | - |
| 15 | ½ ″ ටී ෂොකට් | 05 | | රු.125/= | රු.125/= | රු.125/= |

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභාව මගින් පාලනය වන පෙරපාසල් 07 ක් සඳහා දැත් සේදීමට සින්ක් 07 ක් සාදා ස්ථානගත කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය හා උපාංග ලබා ගැනීම සඳහා මිල ගණන් ඉදිරිපත් කර ඇති ආයතන අතරින් අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති අම්බලන්ගොඩ ,විලේගොඩ අතුල කලර් හවුස් ආයතනයෙන් අංක 05 ,07 යටතේ ඇති උපාංගද, අම්බලන්ගාඩ,පොල්වත්ත රනුදිනි හාඩ්වෙයාර් ආයතනයෙන් අංක 14 යටතේ ඇති උපාංගද, අම්බලන්ගොඩ,ගාලු පාර නන්දන පී.වී.සී.ඇන්ඩ් සෙරමික් ට්‍රේඩර්ස් ආයතනයෙන් අංක 01,02,03,04,06,08,09,10,11,12,13 සහ 15 යටතේ ඇති උපාංගද මිලදී ගැනීමට මිල ගණන් පිළිගැනීමට සුදුසු ගරු සභාව තීරණය කරන ලදී.

**07.02.03 අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය ටෝනර් මිලදී ගැනීම සඳහා ඉදිරිපත් කර ඇති මිල ගණන් සභාගත කරන ලදී**

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | සී/ස ශ්‍රී ලංකා රාජ්‍ය වානිජ |
|---|---|---|---|

| | | | නිතගත සංස්ථාව |
|---|---|---|---|
| 01 | Toshiba T2309 P Toner | 01 | රු.12981.60 |
| 02 | Toshiba T22507 P Toner | 01 | රු.9428.40 |
| 03. | MP 48A Toner | 01 | රු.9300/= |
| 04 | MP 85A Toner | 01 | රු.13500/= |
| 05 | Epson LQ2090 Printer Ribbon | 01 | රු.4201.20 |
| 06 | Epson LQ2090 Printer Ribbon | 01 | රු.972/= |
| 07 | Canon 325 Catlage | 01 | රු.15930/= |

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභාවට ටෝනර් මිලදී ගැනීම සඳහා මිල ගණන් ඉදිරිපත් කර ඇති ආයතන අතරින් අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති සී/ස. ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව මගින් මිලදී ගැනීමට මිල ගණන් පිළිගැනීම සුදුසු බවට ගරු සභාව තීරණය කරන ලදී.

**07.02.04 අම්බලන්ගොඩ නගර සභාවේ 49-9436 ට්‍රැක්ටර් රථයේ ස්ටාටර් මෝටර් අලුත්වැඩියා කිරීම සඳහා ඉදිරිපත් කර ඇති මිල ගණන් සභාගත කරන ලදී.**

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | සමිත ඔටෝ සර්විස් නින්දාන | චන්දන මෝටර්ස් නින්දාන | ඉන්දික මෝටර්ස් මිටියාගොඩ |
|---|---|---|---|---|
| 01 | 49-9436 ට්‍රැක්ටර් රථයේ ස්ටාටර් මෝටර් අලුත් වැඩියාව සඳහා වියදම | රු.10300/= | රු.9000/= | රු.10100/= |

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභාවේ 49-9436 ට්‍රැක්ටර් රථයේ ස්ටාටර් මෝටර් අලුත්වැඩියා කිරීම සඳහා මිල ගණන් ඉදිරිපත් කර ඇති ආයතන අතරින් අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති නින්දාන, බටපොල පාර, චන්දන මෝටර්ස් ආයතනයේ මිල ගණන් පිළිගැනීම සුදුසු බවට ගරු සභාව තීරණය කරන ලදී.

**07.02.05 අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය ලිපි ද්‍රව්‍ය මුද්‍රණය කිරීම සඳහා ඉදිරිපත් කර ඇති මිල ගණන් සභාගත කරන ලදී.**

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | ග්‍රෑන්ඩ් මෝටර් වඳුරඹ | චාමර මෝටර්ස් ගාල්ල | සමන් මෝටර්ස් බද්දේගම |
|---|---|---|---|---|---|

| | | | | | |
|---|---|---|---|---|---|
| 01 | පුස්තකාල තොග ලේඛණය | 05 | රු.16000/= | රු.18000/= | රු.18250/= |
| 02 | ජලබිල්පත් බෙරුම් කිරිමේ ලේඛණය | 02 | රු.4300/= | රු.5500/= | රු.5000/= |
| 03 | දුරකථන බෙරුම් කිරිමේ ලේඛණය | 02 | රු.4300/= | රු.5800/= | රු.4600/= |
| 04 | විදුලි බිල්පත් බෙරුම් කිරිමේ ලේඛණය | 02 | රු.3750/= | රු.4400/= | රු.4000/= |
| 05 | බඩු වට්ටෝරු ලේඛණය | 05 | රු13750/= | රු.17500/= | රු.7500/= |
| 06 | සාරාංශ ආදායම් ලේඛණය | 10 | - | - | - |
| 07 | දින ලේබල් | 5000 | රු6500/= | රු9500/= | රු7500/= |
| 08 | පොත් තුණ්ඩු | 5000 | රු3750/= | රු4500/= | රු4250/= |
| 09 | පොත් සාක්කු | 5000 | රු9250/= | රු11000/= | රු12500/= |

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය ලිපි ද්‍රව්‍ය මුද්‍රණය කිරීම සඳහා මිල ගණන් ඉදිරිපත් කර ඇති ආයතන අතරින් අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති අම්බලන්ගොඩ, සක්වා ප්‍රින්ටර්ස් ආයතනයේ මිල ගණන් පිළිගැනීම සුදුසු බවට ගරු සභාව තීරණය කරන ලදී.

**07.02.06 අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය ලිපි ද්‍රව්‍ය මුද්‍රණය කිරීම සඳහා මිල ගණන් ඉදිරිපත් කර ඇති මිල ගණන් සභාගත කරන ලදී.**

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | සක්වා ප්‍රින්ටර්ස් අම්බලන්ගොඩ | සුමුදු ප්‍රින්ටර්ස් අම්බලන්ගොඩ | ඩී.ආර්. ප්‍රින්ටර්ස් අම්බලන්ගොඩ |
|---|---|---|---|---|---|
| 01 | කාර්යාලයෙන් පිටතදී මුදල් එකතු කිරිමේ පොත (න:ස 11) | 20 | රු.5750/= | රු.6200/= | රු.6500/= |

| | | | | | |
|---|---|---|---|---|---|
| 02 | කාර්යාලයේ වරිපණම් එකතු කිරිමේ පොත (න:ස 01) | 20 | රු.5500/= | රු.5900/= | රු.6200/= |
| 03 | සාරාංශ ආදායම් ලේඛණය | 10 | රු.13500/= | රු.17500/= | රු.22000/= |

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය ලිපි ද්‍රව්‍ය මුද්‍රණය කිරීම සඳහා මිල ගණන් ඉදිරිපත් කර ඇති ආයතන අතරින් අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති අම්බලන්ගොඩ, සක්වා ප්‍රින්ටර්ස් ආයතනයේ මිල ගණන් පිළිගැනීම සුදුසු බවට ගරු සභාව තීරණය කරන ලදී.

**07.02.07 අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය තණකොළ කපන යන්ත්‍ර මිලදී ගැනීම සඳහා ඉදිරිපත් කර ඇති මිල ගණන් සභාගත කරන ලදී.**

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | සක්වා ප්‍රින්ටර්ස් අම්බලන්ගොඩ |
|---|---|---|---|
| 01 | තණකොළ කපන යන්ත්‍ර | 02 | රු.15900×2=31800/= |

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභාවට තණකොළ කපන යන්ත්‍ර මිලදී ගැනීම සඳහා මිල ගණන් ඉදිරිපත් කර ඇති ආයතන අතරින් අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති සී/ස.ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව විසින් ඉදිරිපත් කර ඇති මිල ගණන් පිළිගැනීම සුදුසු බවට ගරු සභාව තීරණය කරන ලදී.

## 08. ගෙවීම්.

08:01 SL - 3731 අංක දරණ අත් ට්‍රැක්ටරය සඳහා ට්‍රේලරයක් සෑදීම වෙනුවෙන් විමල් ඇග්‍රෝ ට්‍රැක්ටර්ස් පුද්ගලික සමාගම වෙත රු.185500/- ක මුදලක් ගෙවීමට අනුමැතිය ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා

විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රීනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සහා සම්මත විය.

08:02 ZA -5185 අංක දරණ බැකෝ යන්ත්‍රයේ අලුත්වැඩියා කටයුතු කිරීමට අවශ්‍ය අමතර කොටස් ලබාගැනීම වෙනුවෙන් මහ ඉදුරුව සමන් මෝටර්ස්හි වී.එම්.සමන් ප්‍රියන්ත මහතා වෙත රු.136960/- ක් ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08.03 ඇණවුම් අංක 2439 යටතේ ඇණවුම් කරන ලද ලිපිද්‍රව්‍ය ලබාගැනීම වෙනුවෙන් රු.76800/- ක් CHAMARA BOOK SHOP වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08:04 ඇණවුම් අංක 2440 යටතේ ඇණවුම් කරන ලද ගෑස් සිලින්ඩර් 08 ක් ලබාගැනීම වෙනුවෙන් රු.48280/- ක් S.H.N.අරුණ ශාන්ත ද සිල්වා මහතාට ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08.05 ඇණවුම් අංක 2444 යටතේ ඇණවුම් කරන ලද තින්ත වෙනුවෙන් (දේවානන්ද විද්‍යාලයේ එළවළු ගබඩා කරන ශාලාවට) රු.22650/- ක් අතුල ප්‍රදීප් කුමාර මහතාට ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08.06 ඇණවුම් අංක 2441 යටතේ ඇණවුම් කරන ලද මිස්ට් බ්ලෝවර් යන්ත්‍ර 02 ක් ලබාගැනීම වෙනුවෙන් රු.41000/- ක් SOUTHERN AGRO SERVE (GALLE) වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08.07 ඇණවුම් අංක 2283 යටතේ මාර්ග නඩත්තුවට ඇණවුම් කරන ලද චිප් ගල් ලබාගැනීම වෙනුවෙන් රු.21750/- ක් වතුගෙදර,වඩුමුල්ල, අංක 25 හි අයි.ඩී.ප්‍රියන්ත මහතාට ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08.08 ඇණවුම් අංක 2286 යටතේ මාර්ග නඩත්තුවට ඇණවුම් කරන ලද කොන්ක්‍රීට් ගල් ලබාගැනීම වෙනුවෙන් රු.118125/- ක් අම්බලන්ගොඩ,එපිටමුල්ල පාර , අංක 27 හි

පී.එච්.සී.සී. ද සිල්වා මහතාට ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08.09 ඇණවුම් අංක 2443 යටතේ බස් නැවතුම්පොළෙහි වහලේ අලුත්වැඩියා කටයුතු සඳහා ඇණවුම් කරන ලද ලී ලබාගැනීම වෙනුවෙන් රු.17625/- ක් නින්දාන, ගල්පොත්තවල, ශ්‍රී ධර්මපාල මාවතේ නිව් ලකී ලී වෙළඳසැල වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08.10 2020 මාර්තු, අප්‍රේල්, මැයි යන මාස 03 සඳහා අභ්‍යන්තර ජාල දුරකථනයේ බිල්පත වෙනුවෙන් රු.37140.52 ක් ලංකා බෙල් සමාගම වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08.11 අම්බලන්ගොඩ නගර සභාවේ ගරු නාගරික මන්ත්‍රීවරුන්ගේ 2020 ජුනි මස ගමන් වියදම් ලෙස රු.156,000/- ක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08.12 පින්නදූව පාර පැති කාණුව ඉදිකිරීම කර්මාන්තයේ 10% ක රඳවුම් මුදල් නිදහස් කිරීම ලෙස රු.61433.46 ක් පනියන්දූව ප්‍රජා මණ්ඩල කමිටුව වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රීනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08.13 2020 අප්‍රේල් මාසයට සභාව සතු සියලුම වාහන හා යන්ත්‍රෝපකරණ සඳහා ඉන්ධන ලබාගැනීම වෙනුවෙන් රු.187737/- ක් සී/ස. අම්බලන්ගොඩ විවිධ සේවා සමූපකාර සමිතිය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්රීනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08.14 මහජන ක්‍රීඩාංගනයේ නැරඹුම් වේදිකාව ඉදිකිරීම(අදියර 01) වෙනුවෙන් රු.1049194.82 ක් පටබැඳිමුල්ල ප්‍රජා මණ්ඩල කමිටුව වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රීනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08.15 මහජන ක්‍රීඩාංගනයේ නැරඹුම් වේදිකාව ඉදිකිරීම (අවසන් ගෙවීම) වෙනුවෙන් රු.144333.78 ක් ඔකන්ද ප්‍රජා බල මණ්ඩලය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු

නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08.16 ධම්මකුසල මාවතේ කාණුව (ඒ.ජී.අයි. ද සිල්වා මහතාගේ නිවස අසල) කොන්ක්‍රීට් කිරීම කර්මාන්තයේ 10% ක රඳවුම් මුදල් නිදහස් කිරීම වෙනුවෙන් රු.38462.19 ක් පනියන්දූව ප්‍රජා මණ්ඩල කමිටුව වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08.17 පටබැඳිමුල්ල වසමේ චන්ද්‍රාවාස පාර අතුරු මාර්ගයට හැඩ ගල් ඇල්ලීම කර්මාන්තයේ 10% ක රඳවුම් මුදල් නිදහස් කිරීම වෙනුවෙන් රු.33340.72 ක් අම්බලන්ගොඩ, අලුත්වල, තිලෝන කන්ස්ට්‍රක්ෂන් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08.18 මානිමුල්ල නගර සභා නිවාස පාර කාණු පද්ධතිය සකස් කිරීමේ කර්මාන්තයේ 10% ක රඳවුම් මුදල් නිදහස් කිරීම වෙනුවෙන් රු.52445.33 ක් පනියන්දූව ප්‍රජා මණ්ඩල කමිටුව වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08.19 HP 1102 වර්ගයේ මුද්‍රණ යන්ත්‍ර 03 ක් අලුත්වැඩියා කිරීම වෙනුවෙන් Metro Computer Technology ආයතනය වෙත රු.16950/- ක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

08.20 අම්බලන්ගොඩ නගර සභා කාර්යාල ගොඩනැගිල්ලේ 2020.02.23 දින සිදුකරන ලද ක්ෂේත්‍ර පරීක්ෂණය සඳහා සහ ව්‍යුහ ඉංජිනේරු උපදෙස් සඳහා රු.65,718/- (රු.60,850+VAT 8%) ක් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයට ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

09. **ගිණුම් :-**

**09.01 2020 මැයි මාසයට අදාළ වියදම් වාර්තාව , පොදු ගිණුම් හා වියදම් වැය විශ්ලේෂණය සභාගත කරන ලදී.**

**තීරණය**

2020 මැයි මාසයට අදාළ පොදු වියදම් වාර්තාව, වියදම් වැය විශ්ලේෂණය හා 2020 මැයි මස ලැබිම් විග්‍රහය පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**10** ඇස්තමේන්තු :-

## 10.01 මහජන ක්‍රිඩාංගණයේ අදියර 01 යටතේ නැරඹුම් පඩි ඉදිකිරීම (Pavillion) සඳහා රු. 1,760,000/- ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

මහජන ක්‍රිඩාංගණයේ අදියර 01 යටතේ නැරඹුම් පඩි ඉදිකිරීම (Pavillion) සඳහා රු. 1,760,000/- ක ඇස්තමේන්තුව යෝජනා කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා කතා කරමින්**

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය-**

මහජන ක්‍රිඩාංගණයේ අදියර 01 යටතේ නැරඹුම් පඩි ඉදිකිරීම (Pavillion) සඳහා රු. 1,760,000/- ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

## 10.02 මහජන ක්‍රිඩාංගණයේ අදියර 02 යටතේ නැරඹුම් පඩි ඉදිකිරීම (Pavillion) සඳහා රු. 900,000/- ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

මහජන ක්‍රිඩාංගණයේ අදියර 02 යටතේ නැරඹුම් පඩි ඉදිකිරීම (Pavillion) සඳහා රු. 900,000/- ක ඇස්තමේන්තුව යෝජනා කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා කතා කරමින්**

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය-**

මහජන ක්‍රීඩාංගණයේ අදියර 02 යටතේ නැරඹුම් පඩි ඉදිකිරීම (Pavillion) සඳහා රු. 900,000/- ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**10.03 මාදම්පා ගඟ පිහිණුන ස්ථානයේ විදුලි ආලෝකකරණය කිරීම සඳහා 160,000/- ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මාදම්පා ගඟ පිහිණුන ස්ථානයේ විදුලි ආලෝකකරණය කිරීම සඳහා 160,000/- ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එච්.ඉනෝකා ක්‍රිශාන්ති මහත්මිය කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය-**

මාදම්පා ගඟ පිහිණුන ස්ථානයේ විදුලි ආලෝකකරණය කිරීම සඳහා 160,000/- ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී එච්.ඉනෝකා ක්‍රිශාන්ති මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**10.04 මානාන ක්‍රීඩාංගණයේ පෙර පාසල සහිත භූමිය අඩි 18ක් උසට දැල් ආවරණ ගැසිම සඳහා රු.850,000/- ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මානාන ක්‍රීඩාංගණයේ පෙර පාසල සහිත භූමිය අඩි 18ක් උසට දැල් ආවරණ ගැසිම සඳහා රු.850,000/- ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එච්.ඉනෝකා ක්‍රිශාන්ති මහත්මිය කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය-**

මානාන ක්‍රීඩාංගණයේ පෙර පාසල සහිත භූමිය අඩි 18ක් උසට දැල් ආවරණ ගැසිම සඳහා රු.850,000/- ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්,

ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී එච්.ඉනෝකා ක්‍රිශාන්ති මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**10.05 කළුවඩුමුල්ල ක්‍රිඩාංගණයේ අලුත්වැඩියාවන් කිරිම සඳහා රු.,1200,000/- ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

කළුවඩුමුල්ල ක්‍රිඩාංගණයේ අලුත්වැඩියාවන් කිරිම සඳහා රු.,1200,000/- ක ඇස්තමේන්තුව යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රි එච්.ඉනෝකා ක්‍රිශාන්ති මහත්මිය කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය-**

කළුවඩුමුල්ල ක්‍රිඩාංගණයේ අලුත්වැඩියාවන් කිරිම සඳහා රු.,1200,000/- ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී එච්.ඉනෝකා ක්‍රිශාන්ති මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**10.06 අම්බලන්ගොඩ, තිලකපුර පාරේ සිට අංක 150/3- ඒ නිවස දක්වා මාර්ගය නගර සභාවට පවරා ගැනීමෙන් පසු මිටර් 75 ක් ඉදිකිරිම සඳහා රු.,800,000/- ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

අම්බලන්ගොඩ, තිලකපුර පාරේ සිට අංක 150/3- ඒ නිවස දක්වා මාර්ගයේ මිටර් 75 ක් ඉදිකිරිම සඳහා රු.,800,000/- ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

**තීරණය-**

අම්බලන්ගොඩ, තිලකපුර පාරේ සිට අංක 150/3- ඒ නිවස දක්වා මාර්ගය නගර සභාවට පවරා ගැනීමෙන් පසු මිටර් 75 ක් ඉදිකිරිම සඳහා රු.,800,000/- ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**10.07 අම්බලන්ගොඩ , පොල්වත්ත බුද්ධදත්ත විද්‍යාලය ඉදිරිපිට නිල සෙවන අසලින් ඇති මාර්ගය අලුත් වැඩියා කිරීම සඳහා රු.,300,000/- ක ඇස්තමේන්තුව සභාගත කරන ලදි.**

**<u>ගරු නගර සභා මන්ත්‍රි නන්දන රාජපක්ෂ මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය-**

අම්බලන්ගොඩ , පොල්වත්ත බුද්ධදත්ත විද්‍යාලය ඉදිරිපිට නිල සෙවන අසලින් ඇති මාර්ගය අලුත් වැඩියා කිරීම සඳහා රු.,300,000/- ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**10.08 අම්බලන්ගොඩ, පොල්වත්ත පෙර පාසල ඉදිරිපිටින් නාන ලිඳ ඉදිරිපිටින් ඇති මාර්ගය නගර සභාවට පවරා ගැනීමෙන් පසු අලුත් වැඩියා කිරීම සඳහා රු.,510,000/- ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

අම්බලන්ගොඩ, පොල්වත්ත පෙර පාසල ඉදිරිපිටින් නාන ලිඳ ඉදිරිපිටින් ඇති මාර්ගය අලුත් වැඩියා කිරීම සඳහා රු.,510,000/- ක ඇස්තමේන්තුව යෝජනා කරනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා කතා කරමින්</u>

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය-**

අම්බලන්ගොඩ, පොල්වත්ත පෙර පාසල ඉදිරිපිටින් නාන ලිඳ ඉදිරිපිටින් ඇති මාර්ගය නගර සභාවට පවරා ගැනීමෙන් පසු අලුත් වැඩියා කිරීම සඳහා රු.,510,000/- ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් එය සභා අරමුදලින් සිදුකිරීම සුදුසු බවටත්, ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

11. වෙනත් කරුණු

12. න්‍යාය පත්‍රයට ඇතුළත් නොවූ වෙනත් කරුණු :

**12.01 2020 ජාතික කියවීමේ මාසය වැඩසටහන සඳහා රු.4,28,150/- ක මුදලක් වියදම් දැරීමට අනුමැතිය ඉල්ලා ප්‍රජා සංවර්ධන නිලධාරිණිය විසින් ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

2020 ජාතික කියවීමේ මාසය වැඩසටහන සඳහා රු.4,28,150/- ක මුදලක් වියදම් දැරීමට අනුමැතිය ඉල්ලා ඇති ලිපිය සභාගත කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

ස්ථිර කරනවා.

**තීරණය-**

2020 ජාතික කියවීමේ මාසය වැඩසටහන සඳහා රු.4,28,150/- ක මුදලක් වියදම් දැරීමට අනුමැතිය ඉල්ලා ප්‍රජා සංවර්ධන නිලධාරිණිය විසින් ඉදිරිපත් කර ඇති ලිපිය අනුව ඒ සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රිනී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**12:02 සංවර්ධනය වන අම්බලන්ගොඩ නගර සභා මහජන ක්‍රීඩාංගනයේ සංවර්ධන අදියරයන් පියවරයෙන් පියවර විදහා දැක්වෙන පරිදි ඡායාරූප ඇල්බමයක් සකස් කිරීමට අනුමැතිය ඉල්ලා ප්‍රජා සංවර්ධන නිලධාරිණිය විසින් ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

සංවර්ධනය වන අම්බලන්ගොඩ නගර සභා මහජන ක්‍රීඩාංගනයේ සංවර්ධන අදියරයන් පියවරයෙන් පියවර විදහා දැක්වෙන පරිදි ඡායාරූප ඇල්බමයක් සකස් කිරීමට අනුමැතිය ඉල්ලා ප්‍රජා සංවර්ධන නිලධාරිණිය විසින් ඉල්ලා තිබෙනවා. එය ඡායාරූප වලින් එකතු කිරිමක් කරන්න කියා ඉල්ලිමක් කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

ස්ථිර කරනවා.

**තීරණය-**

සංවර්ධනය වන අම්බලන්ගොඩ නගර සභා මහජන ක්‍රීඩාංගනයේ සංවර්ධන අදියරයන් පියවරයෙන් පියවර විදහා දැක්වෙන පරිදි ඡායාරූප ඇල්බමයක් සකස් කිරීමට අනුමැතිය ඉල්ලා ප්‍රජා සංවර්ධන නිලධාරිණිය විසින් ඉදිරිපත් කර ඇති ලිපිය අනුව ඒ සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**12:03 ගෙවතු වගා වැඩසටහන සඳහා නිවාස ඒකක 5543 ක් වෙනුවෙන් වගා බීජ කට්ටල ලබාදීමට රු.1,10,860/- ක් වියදම් වන බවත් එම මුදල් 2020.06.02 දින මාසික සභා රැස්වීමේදී තීරණ අංක 05.02.01 යටතේ තීරණය වූ පරිදි නගර සභාව යටතේ පාලනය වන ප්‍රජා මණ්ඩල ගිණුම්වල ඇති අරමුදල් භාවිත කරමින් සහ මුදල් නොමැති ප්‍රජා මණ්ඩල සඳහා නගර සභා අරමුදලින් ලබාගෙන කටයුතු කරන බවත්, ගෙවතු වගා වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබාදෙන ලෙසත් ඉල්ලා ප්‍රජා සංවර්ධන නිලධාරිණිය විසින් ඉදිරිපත් කර ඇති වාර්තාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ගෙවතු වගා වැඩසටහන අම්බලන්ගොඩ. ග්‍රාම නිලධාරි වසම නිවාස සංඛ්‍යාව වශයෙන් නිවාස 5543 කි. ඒ අනුව බිජ පැකට් සඳහා වැයවන මුදල එක බිජ පැකට් එකක්රු.20/= බැගින් රු.1,10,860/=කි. ක්‍රියාත්මක වන ආකාරය මෙම බිජ පැකට් මිලදී ගෙන ප්‍රජා මණ්ඩල ගිණුමෙන් ලබාගෙන මුදල් ප්‍රමාණය නිදහස් කිරිම. බිජ ලබා ගැනීමට අවශ්‍ය සම්බන්ධිකරණය කිරිම . බිජ වගා කිරිම සඳහා කෘෂි පර්යේෂණ නිෂ්පාදන මගින් ලබා දීම. බිජ සෑම නිවසකටම ලබා දිම සඳහා ප්‍රජා මණ්ඩල මගින් ක්‍රියාත්මක කිරිමට අනුමැතිය ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

මෙය කාන්තා කමිටු හරහා ක්‍රියාත්මක කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මේ වැඩසටහන පිළබඳ විස්තර වාර්තාවක් ලබා දෙන්න. මේ ප්‍රජා මුල සංවිධාන වලින්ද මුදල් ලබා දෙන්නේ. මේ පැළ හරියට හටවනවාද කියා අධික්ෂණය කරන්නේ කවුද ? මෙය ප්‍රජා මණ්ඩල හරහා ක්‍රියාත්මක වෙනවා නම් අපේ නගර සභාවෙනුත් බලන්න ඔන මෙය ක්‍රියාත්මක වෙනවාද කියා. මේ කිවුවා වගේ ගොඩක් දුරට අධික්ෂණය වෙන්නේ නැහැ. පොල්වත්තේ එකනම් සාර්ථකව යනවා. අපේ ගනේද්‍ර මහතා කර එක. මෙහෙම එක්කෙනෙක් දමා ගන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

මා මෙයට පොඩි අදහසක් එකතු කරනවා. කාන්තා කමිටුත් එකතු කරගන්න. දැන් ප්‍රජා මුල සංවිධාන වලට දෙන මුදල අපේ කාන්තා කමිටු වලින් දෙදෙනෙකු දමා ගන්න කියන්න. අපි ඒ පැකට් ලබා දීමේදි ඒ කාන්තාවන් තුන්දෙනා සමඟ ආර්ථික සංවර්ධන නිලධාරි සම්බන්ධ කරලා පැකට් එක ලබා දිමේදි ඒ වැඩ කටයුතු කෙරෙනවාද කියා ප්‍රජා මුල මණ්ඩලයේ කාන්තාවන් දෙදෙනෙකු තුන්දෙනෙකු යොදා ගන්න. ඒ අයට කියනවා මේ පැකට් ටික ලබා දෙනවා. මෙහි වැඩකටයුතු හරියට කෙරෙනවාද කියා බලන්න. ඊළඟ සැරේ බිජ ලබා දිමේදි අපි මේ සම්බන්ධව සොයා බලනවා මොනවාද කර තිබෙන්නේ කියා. එතකොට ඒ කාන්තාව එයට පේළ ගස්වා ගැනීම කරන්න. එතකොට එය ප්‍රජා මුල සමිතිවලට දෙන්න අපිට කාන්තාවන් තුන්දෙනෙකු දෙන්න කියා. එතකොට ඒ සමිතියේ නිලධාරින් කාන්තාවන් තුන්දෙනෙකු දෙයි. කොට්ඨාශයේ

ආර්ථික සංවර්ධන නිලධාරීත් ඉන්නවා. එයාටත් කියනවා . අපි මේ වගේ වැඩ සටහනක් කරනවා. එයට සහායෝගය දෙන්න කියා. එතකොට ගමේ කෙනාට ගිහින් බලන්න පුළුවන්නේ. මෙතුමා කිවුවා වගේ ගමේ කාන්තාවට ගිහින් එය බලන්න පුළුවන්. ඒ වගේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන්න. එතකොට අපට ඒ ගොල්ලන්ගෙන් අපේ කාන්තා කමිටුවේ තිබෙන ප්‍රශ්න ටික අහගන්න පුළුවන්. අපි දෙවැනි අදියර ඊට පස්සේ පටන් ගන්න.

<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>

මේ බිජ වර්ග 20 පැකට් එකක කියන්නේ එක බිජ වර්ගයක්ද ? එක වර්ගයකින් පැකට් එකක් රු.20/=යි. එතකොට රු.100/= ක් වෙනවා. බිජ වර්ග පහම තිබෙන පැකට් එකක් රු.20/=යි. ඒ වර්ග පහ මොනවාද? වැටකොළු , වට්ටක්කා වගේ බිජ වර්ග දුන්නොත් පොඩි නිවෙස් වලට කරන්න බැහැ. ඒ බිජ වර්ගනම් පුළුවන්. කවුරු හරි අධික්ෂණයක් ඕනේ. පොහොර දමන වගේ ඒවා හරියට කරන්න ඕන.

<u>ගරු සභාපති  එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

දැන් කිලෝ දෙකක කොම්පොස්ට් පොහොර පැකට් එකක් කියද? ඔයා ක්‍රියාත්මක කරන්න. සමිති වලින් මුදල් ගෙන එය කරන්න ඕන.

**තීරණය-**

ගෙවතු වගා වැඩසටහන සඳහා නිවාස ඒකක 5543 ක් වෙනුවෙන්  වගා බීජ කට්ටල ලබාදීමට රු.1,10,860/- ක් වියදම් වන බවත් එම මුදල් 2020.06.02 දින මාසික සභා රැස්වීමේදී තීරණ අංක 05.02.01 යටතේ තීරණය වූ පරිදි නගර සභාව යටතේ පාලනය වන ප්‍රජා මණ්ඩල ගිණුම්වල ඇති අරමුදල් භාවිත කරමින් සහ මුදල් නොමැති ප්‍රජා මණ්ඩල සඳහා නගර සභා අරමුදලින් ලබාගෙන කටයුතු කරන බවත්, ගෙවතු වගා වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා  අනුමැතිය ලබාදෙන ලෙසත් ඉල්ලා ප්‍රජා සංවර්ධන නිලධාරිණීය විසින් ඉදිරිපත් කර ඇති වාර්තාව  අනුව ඒ සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර  මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**12:04 බස් නැවතුම්පොළ වෙළඳ සංකීර්ණයේ කඩකාමර සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවේ සංශෝධනයට යටත්ව නැවත අලුත් කරන ලද කඩ කුලියම 2020 ජූලි මස 01 දින සිට අයකරන බව දන්වා කඩහිමියන් වෙත යැවීමට නියමිත ලිපියට අනුමැතිය ඉල්ලා විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති  එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

බස් නැවතුම්පොළ වෙළඳ සංකීර්ණයේ කඩකාමර සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවේ සංශෝධනයට යටත්ව නැවත අලුත් කරන ලද කඩ කුලියම 2020 ජූලි මස 01 දින සිට අයකරන බව දන්වා කඩහිමියන් වෙත යැවීමට නියමිත ලිපියට අනුමැතිය ඉල්ලා විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදී. දැන් මේ සඳහා දිපු කාලය අවසානයි. එතකොට

තක්සේරුව වෙනස් කිරිමක් ඇවිත් නැහැ. එහෙමනම් ආණ්ඩුකාරතුමා දි ඇති කාලය අවසාන නම් අපි සභාව ගත් තින්දුව අනුව අය කරන්න ඕන. ඒ සඳහා සභාවේ අනුමැතිය ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, තව පැහැදිලි කරන්න. දැන් ආණ්ඩුකාරතුමා මොනවාද උපදෙස් දුන්නේ ඒ කාලයේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

තක්සේරු දෙපාර්තමේන්තුවෙන් එම බදු මුදල වෙනස් කර තිබුණා. එය සභාවට දමා අනුමත කරලා එය ක්‍රියාත්මක කරන්න ගියාම වෙළඳසැල් හිමියන් ඉල්ලීමක් කර තිබෙනවා. තක්සේරු දෙපාර්තමේන්තුවෙන් 2020.01.07 වෙනිදා ලිපියක් එවා තිබෙනවා. සභාව විසින් 2020.02.11 තීරණයක් අරගෙන තිබෙනවා. අම්බලන්ගොඩ බස්නැවතුම්පොළේ කඩ කාමර සඳහා අසාධාරණ ලෙස වැඩිකර ඇති කඩකුළිය සංශෝධනය කරන ලෙස කරන ලද ඉල්ලීම යන මැයෙන් ආණ්ඩුකාරතුමා විසින් එවා ඇති 2020 ජුනි මස තක්සේරුව ලබා දෙන බවට ආණ්ඩුකාරතුමා විසින් දැන්වු බවටත් එතෙක් පරන තක්සේරුව මත බදු කුළිය අයකිරිමටත් නව තක්සේරුවක් ලබා ගැනීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවට යැවිය යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ගරු ආණ්ඩුකාරතුමාගේ ලිපියේ තිබෙන්නේ ඒ ලබා දි ඇති කාලය දැන් අවසන්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

දැන් මේ කාලය අවසාන නම් මෙහෙම දෙයක් යෝජනා කරනවා. ගරු ආණ්ඩුකාරතුමා දැනුවත් කර කරන්න. මේ කාල සීමාව ඉවරයි. අපිට ප්‍රශ්නයක් වෙනවානේ ඕකේ. ඒ ප්‍රශ්නයක් නොවන විදියට ගරු ආණ්ඩුකාරතුමාත් දැනුවත් කරලා ඒ වැඩය කරන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ඒ කියන්නේ සභාව යෝජනා කරන්නේ ගරු ආණ්ඩුකාරතුමා දැනුවත් කර කරන්න කියලාද? ඒ විදියට කරන්න.

**තීරණය-**

බස් නැවතුම්පොළ වෙළඳ සංකීර්ණයේ කඩකාමර සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවේ සංශෝධනයට යටත්ව නැවත අලුත් කරන ලද කඩ කුලියම 2020 ජූලි මස 01 දින සිට අයකරන බව දන්වා කඩහිමියන් වෙත යැවීමට නියමිත ලිපියට අනුමැතිය ඉල්ලා විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර ඇති ලිපිය අනුව, ඒ සම්බන්ධව ගරු ආණ්ඩුකාරතුමා දැනුවත් කර ඉන්පසුව කටයුතු කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**12:05 රිදම් WORLD ගුවන් විදුලි නාලිකාව සංවිධානය කළ ප්‍රවර්ධන වැඩසටහන වෙන්කරගත් දිනට නොපැවැත්වීම හේතුවෙන් ඒ සඳහා නගර සභාවට ගෙවන ලද රු.13000/- ක මුදල ලබාදෙන ලෙස ඉල්ලා ප්‍රවර්ධන කළමනාකරු සංජීව මධුරංග මහතා විසින් එවා ඇති ලිපිය සභාගත කරන ලදි.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

රිදම් WORLD ගුවන් විදුලි නාලිකාව සංවිධානය කළ ප්‍රවර්ධන වැඩසටහන වෙන්කරගත් දිනට නොපැවැත්වීම හේතුවෙන් ඒ සඳහා නගර සභාවට ගෙවන ලද රු.13000/- ක මුදල ලබාදෙන ලෙස ඉල්ලා ප්‍රවර්ධන කළමනාකරු සංජීව මධුරංග මහතා විසින් ඉල්ලා ඇති ලිපිය සභාගත කිරිම.. මුදල් ගෙවා තිබෙන්නේ 03.12 වෙනිදා . මේ භූමිය වෙන්කර තිබෙන්නේ 03.19. 15 නිදා සිට හිඟ මුදල් ගෙවන්න තීරණය කර තිබෙනවා.

**තීරණය-**

රිදම් WORLD ගුවන් විදුලි නාලිකාව සංවිධානය කළ ප්‍රවර්ධන වැඩසටහන වෙන්කරගත් දිනට නොපැවැත්වීම හේතුවෙන් ඒ සඳහා නගර සභාවට ගෙවන ලද රු.13000/- ක මුදල ලබාදෙන ලෙස ඉල්ලා ප්‍රවර්ධන කළමනාකරු සංජීව මධුරංග මහතා විසින් එවා ඇති ලිපිය අනුව එම මුදල ලබාදීමට අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**12:06 2020 මහ මැතිවරණය සඳහා තරඟ වැදීමෙන් ඉවත්වීම, නගර සභාවේ විපක්ෂ නායක ධූරයෙන් ඉවත්වීම සහ 2020.07.07 වන දින පැවැත්වෙන මාසික සභා රැස්වීමට සහභාගීවීම සඳහා යන මැයෙන් ගරු නාගරික මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඩෙනට් පනියන්දූවගේ මහතා ඔබතුමා අදහස් දක්වන්න.

**<u>ගරු නාගරික මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මා ඔබතුමාට 2020.06.29 දින ලිපියක් මඟින් ඉදිරිපත් කළා. මොකද මම මහ මැතිවරණය සඳහා තරඟ කිරිමට නාම යෝජනා අත්සන් කරපු නිසා මැතිවරණ නිතිරිති අනුව නගර සභාවේ මන්ත්‍රි ධූරයෙන් ඉවත් වුණා. ඒ අනුව නිවාඩු ගත්තා. ඒ අනුව සමගි ජනබලවේගයෙන් ඉවත් වීම ලිඛිතව මැතිවරණ කොමසාරිස්තුමාටත් පක්ෂයේ මැතිවරන කොමසාරිස්තුමාටත්, පක්ෂයේ මහ ලේකම්තුමාටත් දැනුම් දිම සඳහාත් මා ඔබතුමාට ලිඛිතව එව්වා. මා අද දින මේ සභාව සඳහා සහභාගිවෙලා 2018 අප්‍රේල් මසයේ සිට ඔබතුමා ඇතුළු සියළු මන්ත්‍රිවරුන් හිටපු සහ වත්මන් ලේකම්තුමිය ඇතුළු සියළුම කාර්ය මණ්ඩලය සහ සභාවේ අපි මේ අම්බලන්ගොඩ වෙනුවෙන් ගන්නා තින්දු මාධ්‍ය හරහා රටේ ජනතාවට දැනගැනීමට ලක්වෙනවා. ඒ සියළු දෙනාට ස්තුතිය පුද කිරිම සඳහා අවසාන ලෙස මා ඔබතුමාගෙන් ඉල්ලිමක් කර ගන්නවා. ඒ සඳහා මට අවස්ථාව ලබා දිම පිළිබඳව පලමු කොට මාගේ අවංකව ස්තුතිය පුද කරනවා. මා මේ

ගරු සභාවේ අවධානය යොමු කරනවා. මා හිතන්නේ වසර 2 ½ 3 ½ වැනි කාලයක් තුළ මේ නගර සභාවේ සහ නගරයේ දියුණුවට අපි මෙතැන තර්ක විතර්ක කළා. ඒ හැම දෙයක්ම කළේ නගරයේත් නගරයේ ජනතාවගේත් සුභ සිද්ධිය සඳහා. අපි මෙතැන මොන තර්ක විතර්ක කළත් මේ දොරෙන් එහා පැත්තට ගියාට පසු සභාපතිතුමා ඇතුළු අප සියළු දෙනා එක යාළුවෝ වගේ තමයි කටයුතු කරන්නේ. එමනිසා මා ඉල්ලීමක් කරනවා . දැන් මේ ටික වේලාවකට පෙර මාත් මෙහි මන්ත්‍රීවරයෙක් වෙලා ටික කාලයකට හෝ සිටිය නිසා අසාවක් සතුටක් තිබෙනවා මෙන්න මේ පරණ ගොඩනැගිල්ලේ පෞරාණික බව තියාගෙන අප ඉපදුන ගමේ අම්බලන්ගොඩ නගර සභාව ලංකාවේ හොඳම නගර සභාව බවට පත්වෙන්න ඒ ශක්තිය ධෛර්ය ඔබතුමා ඇතුළු සියළු දෙනාට ලැබේවා කියා. ඒ සඳහා වත්මන් ජනාධිපතිතුමා , අග්‍රමාත්‍යතුමා ඇතුළු වත්මන් රජයේත් සහායෝගය අරගෙන ඔබතුමාට ඒ කටයුතු සිදු කර ගැනීමට හැකිවේවි කියා මා හිතනවා. ඊට අමතරව නගරයේ ජනතාවට ,නගරයේ පැවැත්මට හානිවන කිසිම දෙයකට අපි නගරයේ කොයි පැත්තේ හිටියත් පාට පක්ෂ කොයි දේ වුණත් සමහර වේලාවට ගරු උප සභාපතිතුමාත් මාත් එකම මතය දරපු වේලාවල් තිබෙනවා. මා යෝජනා කරනවා. ගරු උප සභාපතිතුමා ස්ථිර කරනවා. ගරු උප සභාපතිතුමා යෝජනා කරනවා මා ස්ථිර කරනවා. මා හිතන්නේ සමහර නගර සභාවල් වල එහෙම නැතිව ඇති. ඒ සඳහා මේ අම්බලන්ගොඩ නගරයේ සහ නගරයේ ජනතාවගේ උන්නතිය සඳහා සභාවේ අපි හොඳ තීන්දු තීරණ ගනු ලැබුවා. ඒ පිළිබඳව සතුටක් තිබෙනවා. ඒ නිසා අපි අපේ අනාගතයට හානි වන , අම්බලන්ගොඩ නගරයට හානියක් වන කිසිම තීන්දුවක් තීරණයක් ගන්න එපා කියන ඉල්ලීම කරනවා. මා සංවර්ධන කමිටුවේ සභාපතිවෙලා සිටින කාලයේ මා පුද්ගලික යෝජනාවක් ගෙන එනු ලැබුවා මේ අම්බලන්ගොඩ නගරයේ වාහන තදබදය අඩු කිරීම පිළිබඳව. අපේ කොළඹ සිටින මිත්‍රයන් කියා සිටිනවා මේ අම්බලන්ගොඩ නගරයේ වාහනයක් නතර කිරීමට තැනක් නැහැ. වාහනය නතර කර කඩයකට යන්න බැහැ කියා අපිට කියනවා. අපේ ගරු උප සභාපතිතුමා මා ඇතුළු ඒ රථ වාහන හා ත්‍රී රෝද කමිටුව එකතු වෙලා මේ තදබදය නැති කරන්න යම් වැඩ පිළිවළක් සිදු කළා. එම වාර්තාවේ ගත්ත තීන්දු අම්බලන්ගොඩ නගරයේ අලංකාරයට ගනු ලැබූ තීන්දු ජනතාවට හානියක් නොවන පරිදි අපහසුතාවයක් නොවන පරිදි ක්‍රියාත්මක කරන ලෙස මා ඔබතුමා ඇතුළු සියළු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලීමක් කරනවා. ඊට අමතරව මේ අම්බලන්ගොඩ කොට්ඨාශයේ මා විශ්වාස කරනවා 2014 ඔක්තොම්බර් මාසේ 24 දින මා මෙහි එක්සත් ජාතික පක්ෂයේ අම්බලන්ගොඩ ආසනයේ සංවිධායක ධුරය ගන්න කලින් අවුරුදු 6ක කාලයක් තුළ කනගාටුයි කියන්න එක්සත් ජාතික පක්ෂයේ සංවිධායකවරු 10කු ඉඳ තිබෙනවා. එතකොට මා 2014 සිට 2020 දක්වා මා තනියම මේ මැතිවරණ කොට්ඨාශයේ මොන තරම් ගැටළු ආවත් පක්ෂ පාට නොබලා ඒ සංවර්ධනය වෙනුවෙන් මාගේ ඒ නායකත්වය ලබා දුන්නා. අපි මේ අම්බලන්ගොඩ දේශපාලනය ගැන කතා කළාම මේ ගාලු දිස්ත්‍රික්කයේ දකුණු පළාතේ දේශපාලනය කියන්නේ අපේ අනාගතයත් සමඟ තිබෙන දේශපාලනයක් තිබෙන්නේ. අම්බලන්ගොඩ මිනිසුන්ට පාර්ලිමේන්තුව නියෝජනය කරන්න තිබෙන එකම මැතිවරණ කොට්ඨාශය අපේ අනාගතය මත මේ අම්බලන්ගොඩ. මේ අපිට වසර ගණනාවක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් නැහැ. අම්බලන්ගොඩ සිටින යම් යම් ප්‍රාදේශිකව සිටින ඒ කොට්ඨාශභාර දේශපාලකයින් අපේ කම අමතක කරලා , පාට පක්ෂ භේද පැත්තකට දමා තමන් කැමති අය තෝරාගෙන මේ ආසනයට හෙන ගැහිලා ගියත් කමක් නැහැ තමන්ගේ අවශ්‍යතාවය ඉටු කර ගැනීමේ අරමුණයි තිබෙන්නේ. මේ ආකාරයෙන් වැඩ කිරීම නිසා කොයි පක්ෂයෙන් වුණත් අපිට වසර ගණනක් තිස්සේ පාර්ලිමේන්තු නියෝජනයක් අහිමි වෙලා තිබෙනවා. එමනිසා තමුන්නාසේලා ප්‍රාදේශීය දේශපාලනය කරන නිසා මා නිතරම දකින්නේ මැද . මා විශ්වාස කරන්නේ අම්බලන්ගොඩ. මාගේ අනාගතය අම්බලන්ගොඩ. අපි හිතන්නේ අම්බලන්ගොඩ දියුණු කරන්න ඕන කියන මතය. දේශපාලනයට ආවේත් එකයි. එමනිසා මා ඉල්ලීමක් කරනවා අම්බලන්ගොඩින් කොයි පක්ෂයෙන් හෝ වේවා පාර්ලිමේන්තුව නියෝජනය කරන්න අපිට අපේම කියන්න පුළුවන්

මන්ත්‍රීවරයෙක්ට දේශපාලන නායකත්වය දෙන්න. නැතිනම් සමහර මිනිසුන් කරනවා වගේ අපේ මිනිසුන්ගේ ඔලුගෙඩි ටික පෙන්වා ඔහුගේ තිබෙන අවශ්‍යතාවයන් ටික එකතු කරගෙන ඒ අයට තිබෙන වරප්‍රසාද ටික අරගෙන ඒ අයට ඡන්දය දීලා ඒ අයගේ වරප්‍රසාද ටික අරගෙන මන්ත්‍රීවරු වුණාම යනවා. මා දන්නවා මගේ මිත්‍රයා ගරු මන්ත්‍රී සරත් මහතා එතුමා කාලයක් එක්සත් ජාතික පක්ෂයේ සිටින විට මා දන්නවා එතුමා විශාල මුදලක් කැප කරලා මේ ප්‍රදේශයේ මන්ත්‍රීවරයෙක්ට උපකාර කළා. ඔහු ගියා. ඔහු පැමිණ ඔහුගේ සාරය අරගෙන ගියා. අපේ මිනිසුන්ට කරගන්න දෙයක් නැති වෙනවා. තමුන්නාසේලාගේ අවධානය යොමු කරන්න කියා ඉල්ලා සිටිනවා. මා අද අපේ සභාපතිතුමාට දුරකථනයෙන් කතා කරලා මා අද නගර සභාවේ සහභාගී වන අන්තිම රැස්වීම අද. මා නියෝජනය කරන එක්සත් ජාතික පක්ෂයේ නායකතුමාට මේ ලිපිය ලිවුවා. හෙට මේ ලිපිය මා නායකතුමාට යවනවා. එතකොට අදින් පසු මා නගර සභා මන්ත්‍රීවරයෙක් විදියටවත් විපක්ෂ මන්ත්‍රීවරයෙක් විදියටවත් සහභාගී වෙන්නේ නැහැ. එමනිසා තමයි ගරු සභාපතිතුමාට මා කිවුවේ මේ සභවට පැමිණ මට ස්තුතිය පුද කරලා මට ප්‍රකාශයක් කරන්න ඕන කිවුවේ.එතකොට මා 2014 සිට මේ මැතිවරණ කොට්ඨාශයේ එක්සත් ජාතික පක්ෂයේ සංවිධායක ලෙස කටයුතු කළා. ගරු හිටපු ප්‍රධාන අමාත්‍යතුමා මේ මැතිවරණ කොට්ඨාශය වසර 20ක් පමණ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සංවිධායක ලෙස ග්‍රහණය කර තිබුණේ. එතකොට අපිට සතුටුයි. අපේ කෙනෙක් ගරු ප්‍රධාන අමාත්‍යතුමා. එවැනි වකවනුවක් තුළ කිසි කෙනෙක් භාර ගන්නේ නැති වේලාවේ පක්ෂ නායකතුමා මට දුරකථනයෙන් කරන ලද ඉල්ලීමට මා එකඟ වෙලා මා මෙය භාරගෙන 2015ජනවාරි 08 වෙනිදා ජනාධිපතිවරණයේදි ඡන්ද 26183ක්ට ගෙනාවා. ගාලු දිස්ත්‍රික්කයේ තුන්වෙනි ආසනයට එක්සත් ජාතික පක්ෂයේ ඡන්ද ගෙනාවා. එහෙම කරලා අපි මේ ආසනයේ දිවා රෑ නොබලා දුවලා ශාඛා සමිති හදලා තමයි එතැනට ගෙනාවේ. ඇත්ත කියන්න ඕන. මේ ගාලු දිස්ත්‍රික්කයේ මේ මැතිවරණ කොට්ඨාශයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සිටි නායකයන්ට මා අදටත් ගරු කරනවා. හේතුවක් තියෙනවා. මේ ගාලු දිස්ත්‍රික්කයේ එම්.එස් අමරසිරි ,රූපා කරුණාසිරි යන අය නිසා. මේ මේ මැතිවරණ කොට්ඨාශයට එක්සත් ජාතික පක්ෂයෙන් බිහි වු එකම නායකයෙක් මේ ආසනය දූර්වල කළා මිස මේ මැතිවරණ කොට්ඨාශ ඉදිරියට ගෙනයාමට හයිය තිබෙන මිනිසුන් ඉදිරියට දැම්මේ නැහැ. ඒ අය මොකද කළේ ඒ අයට පාර්ලිමේන්තුවට යාම සඳහා අම්බලන්ගොඩ ,රත්ගම ,බලපිටිය යන මැතිවරණ කොට්ඨාශ වලට අපේක්ෂයන් දැම්මේ ශක්තිමත් මිනිසුන් දැම්මේ නැහැ. හැබැයි එහෙම නෙමේ අපි දැක තිබෙනවා රිචඩ් පතිරණ මැතිතුමාගේ කාලයේ සිට අද එතුමාගේ පුත්‍ර රත්නය අද මේ දිස්ත්‍රික්කයට නායකත්වය දෙනවා මේ ආසන වල එහෙම දුර්වලයි කියලා මේ සංවිධායකවරු එහෙම දූර්වල කරලා නැහැ. මේ ඒ වෙනස . මේ දේශපාලන පක්ෂ දෙකේ වෙනස. අපි මේ මැතිවරණ කොට්ඨාශයේ එහෙම කරගෙන ඇවිත් බැරුරුම් අවස්ථාවේ සිට මේ මැතිවරණ කොට්ඨාශය ගොඩ නගලා හැමදාම කළේ මා දිස්ත්‍රික් නායකයා විදියට එක්සත් ජාතික පක්ෂයේ නායකයා මාගේ කකුළෙන් අදින එකේ තමයි. ඒ දිස්ත්‍රික්කයේ තිබෙන නායකයන්ගේ දූර්වලතා නිසා අපේ වගේ ආසන මන්ත්‍රීවරු බිහි නොකරන ආසන බවට පත්වෙනවා. එමනිසා මෙය ඉවත් විය යුතුයි. මා දේශපාලනයට ආවේ හමුදා නිලධාරියෙක් විදියට. මට වෙච්ච අසාධාරණය තුළ මා කෙලින් තීන්දුවක් ගත්තා. සාමාන්‍යයෙන් මෙතනදි වුණත් මා කෙලින් කියන පුද්ගලයෙක්. කරන දේ කරන මිනිහෙක්. ඒ අපි ධර්මාශෝක විද්‍යාලයෙන් ලබපු පන්නරය. ශිෂ්‍ය නායකයෙක් විදියට ලබපු පන්නරය. හමුදා නිලධාරියෙක් විදියට යුධ පිටියේ ලැබබු පන්නරය. තීන්දු තීරණ කල්පනා කරලා ගන්න දෙයක් නැහැ. අපි යුධ පිටියේදි ගත්තේ ක්ෂණික තීන්දු . අපි එහෙම තීන්දු තීරණ ගතපු නිසා තමයි අපි යටතේ හිටපු දහස් ගණන් සෙබළුන් ආරක්ෂා කර ගත්තේ. අපි මැරුණේ නැත්තේ. අපිත් එක්ක හිටපු කිහිප දෙනෙකු මැරුණා. හැබැයි අතපය කැඩුණා. හැබැයි අපි ඒ වගේ තීන්දු තීරණ ගත්ත නිසා අපි සමඟ හිටපු අහිංසක මිනිසුන්ගේ ජීවිත බේරුණා. අන්න ඒ දැකපු පන්නරය අත්දැකීම නිසා තමයි අසාධාරණයක් දුටු තැන අයුතියක් දුටු තැන අපි එකට විරුද්ධව ක්‍රියා මාර්ග ගන්නේ. මා මාර්තු

මාසයේ 16 වෙනිදා සමගි බලවේගයෙන් නාමයෝජනා අත්සන් කරන කොට මා ඇසුවා එක්සත් ජාතික පක්ෂයේ සමගි බලවේගයේ නායකයන් ඉදිරියේදි මා සජිත් ප්‍රේමාදාස මහතගෙන් ඇසුවා මට අම්බලන්ගොඩ දීපු ඒ බලතල දෙනවා නේද? මෙතැන මන්ත්‍රිවරු ඉන්නවා මෙතැන හිටපු . ඒ අවස්ථාවේ හිටපු මන්ත්‍රිවරු ඉන්නවා. එතකොට සජිත් ප්‍රේමදාස කියන පුද්ගලයා පක්ෂ නායකයෙක් විදියට එය හා කියා කිවුවා නම් මට කොන්දක් තිබෙන අම්බලන්ගොඩ ඉපුදුන බෙන්තර ගඟෙන් එහා ඉපදුන කෙනෙකු විදියට මා එය රකිනවා. එහෙමනම් එතුමා මට ඒ දීපු පොරෝන්දුව ඒ විශ්වාසය ජේෂ්ඨ ඇමතිවරු ඉදිරිපිට දීපු පොරොන්දුව කඩ කරපු නිසා 2020.06.09 දින පැවති ගාලු දිස්ත්‍රික් රැස්වීමේදි එය දැන ගැනිමට ලැබී විනාඩි පහක් යන්න කලින් මා දිස්ත්‍රික් කමිටුවෙන් නැගිටලා පැය දෙකක් ඇතුළත මා පක්ෂයෙනුත් අපේක්ෂක ධූරයෙනුත් මා ඉවත් වෙලා මා කල්පනා කළා මා දේශපාලනය කළ කාලය තුළ මේ දිස්ත්‍රික්කයේ සිටි නායකයා අපේ කකුළෙන් ඇද්ද නිසා අපිට දේශපාලන සහායෝගයක් නොදුන් නිසා සජිත් ප්‍රේමදාසගේ කොන්දක් නැති පණ නැති විශ්වාසයක් නැති වචනයක් කිවුවාම ඒ වචනය පරිශමර්ථයෙන් රැක ගන්න බැරි නායකයෙකුට දේශපාලනය කරනවාට වඩා හොඳයි මට වඩා ජේෂ්ඨ එක කාලයේ අපි හමුදාවේ හිටපු අතිගරු ජනාධිපතිතුමාට පූර්ණ කාලිනව දේශපාලන සහාය ලබා දෙනවා කියා මා තින්දුවක් ගත්තා. ඒ තින්දුව අනුව තමයි මා ප්‍රතිපත්ති ගරුකව මා එක්සත් ජාතික පක්ෂ නායකයා ළඟට නොගිහින් අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් පරිදි මා ගියේ අග්‍රමාත්‍යතුමා මුණ ගැසිමට. එතකොට අපි මේ දේශපාලනය කරපු කාල සීමාව තුළ අවංකව හදවතට එකඟව අපි දේශපාලනය කළා. අපි කිසි බෙලි කැපිලි මුකුත් නැතුව අපි කෙලින් දේශපාලනය කළා. ඒ කරපු නිසා තමයි 8192 සිට මාස 4ක් වැනි කෙටි කාලයකදි 26188 කට ජන්ද මේ ආසනයේ ගෙන්න පුළුවන් කම තිබුණේ. අපි නායකයෙක් විදියට මේ මැතිවරණ කොට්ඨාශයේ මගේ දේශපාලනය නොතිබුණා නම් අද මේ අයිරාංගනි මන්ත්‍රිවරියක් විදියට අද මෙතැන නැහැ. බටපොළ ප්‍රාදේශිය සභාවේ ස්වර්ණා කාහිංගල අද මන්ත්‍රිවරියක් විදියට එතැන නැහැ. ඒ මට තිබුන දේශපාලන නායකත්වය. දිස්ත්‍රික්කයේ ලක් වනිතා ලේකම් විදියට අවුරුදු 15කට වැඩි කාලයක් කැප කිරිමක් කරපු කෙනෙකුට පක්ෂයෙන් මන්ත්‍රිකමක් දෙන්න බැරිනම් ඒ වේලාවේ ආසනයේ කාන්තා නායකා විදියට ස්වර්ණා කාහිංගලට දෙන්න බැරිනම් මා දැන් සංවිධායක කමෙන් අයින් වෙනවා කියා තමයි මේ දෙදෙනාට මන්ත්‍රිකම අරගෙන දුන්නේ. එහෙම තමයි මගේ ප්‍රතිපත්තිය. එකතමයි දේශපාලන නායකත්වය. ඒ නායකත්වය ඔය වචනයක් විශ්වාස කරන්නබැරි සජිත් ප්‍රේමදාස නිසා තමයි කොන්ද කෙලින් තියාගෙන සහායෝගය දෙන්න අතිගරු ජනාධිපතිතුමාට එකතු වුණේ. ඒ නිසා අපි මේ අම්බලන්ගොඩ මිනිසුන් . අපට අන්‍යාතාවයක් තිබෙනවා. අපට ආත්ම ගරුත්වයක් තිබෙනවා. අපේ මුතුන් මිත්තන් හදපු ඒ ගරුත්වය අපි ආරක්ෂා කරනවා. වචන දෙකක් නැහැ. සජිත් ප්‍රේමදාස ජේෂ්ඨ ඇමතිවරු ඉදිරිපිට මට දුන්නු ඒ පොරොන්දුව කඩ කරපු නිසා මා තින්දුවක් ගත්ත මිසක් මා කවදාවත් මාගේ දෙමාපියන් කරපු දේශපාලනය මාගේ දේශපාලනය මා කිසි දිනක තනතුරු වලට වෙනත් මේවාට මා ගත්තේ නැහැ. වෙනත් මේවාට ගියේ නැහැ. මාගේ සමකාලිනයෙක් ගරු සභාපතිතුමා පාසලේ. මා ගිය දවසේ රැ නෙමේ ඊට පසුදින කතා කර කිවුවා ගරු සභාපතිතුමා කිසිම අහිතක් හිතන්න එපා. මා මේ අම්බලන්ගොඩ කිසිම තනතුරකට මා එන්නේ නැහැ. මා එතුමාට කිවුවා. මට එහෙම අවශ්‍යතාවයක් නැහැ. මා දේශපාලනය කරන්න ආවේ මුදල් හම්බ කරන්නවත් තනතුරු වලට තිබෙන කැදරකම්වලට වත් නෙමේ . අර දෙමාපියන් අභාෂයෙන් පැමිණි දේශපාලනය නිසා හා ඇසුරු කරපු දේශපාලන නායකයන් නිසා. හොඳ ගුරුවරු දේශපාලන ඇසුරක් ලබපු නිසා. ගාමිණි දිසානායක , එස්.බී දිසානායක මා බොහොම ළඟින් ඇසුරු කරපු පුද්ගලයන්. ඒ අයගෙන් ලබපු පන්නරය නිසා. ඒ අය කෙලින් වැඩ කරන වැඩ කරන වෙලාවේ අවංකව වැඩ කරපු දේශපාලන නායකයන්. ඒ අයගෙන් මා දේශපාලනය ඉගෙන ගත්තේ. එමනිසා දේශපාලන හැසිරිම උඩ තමයි අපේ ප්‍රතිපත්තිය. ඒ දේශපාලනය කරන්න බැරි නිසා තමයි මා මේ තින්දුවට එළඹුනේ. මා ගොඩනගා ගත්ත මේ මැතිවරණ කොට්ඨාශයේ මා සමගි ජන බලවේගයෙන් ඉල්ලුවා නම් මේ මන්ත්‍රිවරු

කවුරුවත් අලියා ළඟ හිට ගන්නේ නැහැ. මේ මන්ත්‍රීවරු ඔක්කොම අද අලියා ළඟ හිටගෙන තිබෙනවා. කිහිප දෙනෙක් හැර. මේ අතුල මන්ත්‍රීතුමා , සෝභිත මන්ත්‍රීතුමා හැරෙන්න අනිත් මන්ත්‍රීවරු තිදෙනාම ඉන්නේ අද අලියා ළඟ. එයට හේතුව හිතට එකඟව නෙමේ මේ අය ගියේ. ගියේ සංවිධායකවරයාට කරපු බලු තින්දුව නිසා. බලු වැඩය නිසා. නින්දිත වැඩය නිසා. නායකත්වයක් නැති නිසා. කොන්දක් නැති නිසා. විශ්වාසයක් නැති නිසා. එවැනි නායකයන්ට දේශපාලනය කර වැඩක් නැති නිසා. මේ තින්දුව ගත්තා. මොකද මා ඒ අය වෙනුවෙන් පෙනී සිට තිබෙනවා. සජිත් ප්‍රේමදාස අම්බලන්ගොඩට ඇවිත් අලුත්වල බල ප්‍රදේශයේදි කැත ප්‍රකාශයක් කළා. ප්‍රකාශය තමයි මා මේ දේශපාලන තින්දුව සැලසුම්සහගතව ගත්තාලු . මා මේ ගියේ ගම්පෙරළියේ කරපු මොකක්ද එකටලු ගියේ. මා කියනවා සජිත් ප්‍රේමදාස මහත්තයෝ ඔබතුමා මා ගැන හරියට දන්නේ නැහැ. මා හමුදාවේ නිලධාරියෙක් විදියට අවුරුදු 17ක් කොන්ද කෙලින් තියාගෙන වැඩ කරලා විශ්‍රාම ගිහින් අද ලංකාවේ 250ක් නොවූ තනිපුද්ගල ආදායම් බදු ගෙවන එක පුද්ගලයෙක් ඩෙනට් පනියන්දුව. එමනිසා අපි හොරකම් කරලා නැහැ. නිදන් හරලා නැහැ. අපි බොහොම සාධාරණව මුදල් හම්බ කර තිබෙන්නේ. එමනිසා මා එතුමාට කියනවා ඔබතුමා මාගේ මේ උපන් ගම වන අම්බලන්ගොඩට පැමිණ කළේ ඉතා කැත ප්‍රකාශයක්. එක එක කෙනාගේ කිම් අහලා , තුට්ටු දෙකේ කුහකයින්ගේ කිම් අහලා ඔබතුමා ඒ කරපු ප්‍රකාශයට මා පිලිතුරු දිලා ඉවරයි. මාධ්‍ය හරහා. එවා දැන් යනවා . සමාජ වෙබ් අඩවි හරහාත් යනවා. මා දන්නවා . දාලා පැය දෙකයි 252ක් බලා තිබුණා. ඊයේ රාත්‍රි වනවිට 2700 ගාණක් බලා තිබෙනවා. මාගේ විඩියෝ එක. එමනිසා මා බය නැහැ. මා සාමාන්‍යයෙන් කෙළින් වැඩ කරන පුද්ගලයෙක්. මා ඉතා අමාරු කාලයක මේ මැතිවරණ කොට්ඨාශය ගත්තේ 2014. එම වර්ෂයේ අපි තර්ජන හමුවේ කළේ. මෙතුමාගෙන්වත් ප්‍රධාන අමාත්‍යතුමාගෙන් වත් නෙමේ. සචින් වාස්ගෙන්. එච්චර බලය තිබුණ පුද්ගලයෙකු සමඟ හැපුනා මේ ආසනය තුළ . වාර්තා වුණත් කමක් නැහැ. මාගේ ඉනේ පිස්තෝලය ඉනේ ගසා මා දිවුවා. මාගේ ආරක්ෂාවට. අපි එහෙමයි මේ කොට්ඨාශයේ මිනිසුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට දේශපාලනය කළේ. එමනිසා මා කනගාටු වෙනවා . මා තනිපුද්ගල ආදායම් බදු ගෙවන පුද්ගලයෙක් විදියට මේ නගර සභාවෙන් ලැබූ මුදල මා දුන්නේ ළමයින් 17කු සඳහා මේ උඩුමහලේදි. එදා සිට මේ මැතිවරණ කොට්ඨාශයේ අහිංසක දූ දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා තමයි මේ නගර සභාවෙන් ලැබූ මුදල ලබා දුන්නේ. ඉතිරි රු.1000/= ක් තමයි පක්ෂ කාර්යාලයට ගියේ. සත පහක් අතපත ගා නැහැ මන්ත්‍රීවරයෙක් විදියට මේ සභාවේ මා. එක මා පැහැදිලිව කියන්න ඕන. මේ මැතිවරණයට සූදානම් වුණේ පොස්ටර් 50000ක් මුද්‍රණය කරලා. 35000කට වැඩි ප්‍රමාණයක් ආසන වල ඇලෙව්වා. මා හිතන්නේ නැහැ මේ සමගි බලවේගයේ එක්කෙනෙකුවත් සිටිනවා කියා මා මේ ගත් ව්‍යායාමය කරලා. මොකද මා මැතිවරණයට පැමිණියේ මාගේ පුද්ගලික වාහන 6ක් සමඟ. මා අනුන්ගේ වාහන ඉල්ලාගෙන ආවේ නැහැ. හැබැයි ඇමතිවරුව සිටින කාලයේ වාහන 4 , 5 පාවිච්චි කරලා හැබැයි අද තිබෙන්නේ එක වාහනයයි හැමෝටම. මා දන්නවා . හැබැයි මා මැතිවරණයට ඉදිරිපත් වුණේ මාගේ පුද්ගලික වාහන මම පාවිච්චි කරන වාහන. මාගේ බිරිඳවත් නෙමේ. මා පාවිච්චි කරන වාහන. එමනිසා අපි කාගෙන්වත් මුදල් ඉල්ලා නැහැ. මේ මැතිවරණ කොට්ඨාශයේ පාන්පිටි කිලෝ එකකටවත් මා ණය නැහැ සජිත් මහත්තයෝ. එක පැහැදිලිව කියන්න ඕන. එතුමා කිවුවා ගම්පෙරළිය වැඩ කර නැති නිසා. මා දැක්කා පුවත් පතක පළවෙලා තිබුණා එක විපක්ෂ නායකයෙක් කියනවා තමන්ගේ සංවිධායකවරයා වැඩ කළේ නැහැ කියා ගම්පෙරළියෙන්. මා අම්බලන්ගොඩ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ව්‍යාපෘති 324 ක් දොළොස් කෝටි 4 ලක්ෂයක් තව ගෝනපිනුවල 227 හත්කෝටි දෙලක්ෂ හැට දෙදහක් වැය වෙනවා. බද‌ෙද්ගම පන්කෝටි හත්ලක්ෂ විසි එක්දහසක් ව්‍යාපෘති 132 ක් ව්‍යාපෘති ඔක්කොම 681 ක් මේ ගම්පෙරළිය හරහා මා ක්‍රියාත්මක කර තිබෙනවා. එතුමා කියනවානම් මා ගම්පෙරළියේ වැඩ කළේ නැහැ කියා එය අසන්න ඕනේ ප්‍රාදේශිය ලේකම්වරුන්ගෙන්. ගම්පෙරළියේ අවසානයේ කරන ලද ව්‍යාපෘති වල මුදල් ප්‍රතිපාදන නැහැ. ඒ මුදල් ප්‍රතිපාදන වල අඩුපාඩුවක් තිබෙනවා. ඒ වුණාට භාගයක් ගෙවා

තිබෙනවා මුදල්. මේ රජයෙන් මේ මුදල් ගෙවයි. නමුත් මට තිබෙන ගැටළුව මා ගම්පෙරළියෙන් උපරිම වැඩ කර තිබෙනවා. එක මැතිවරණ කොට්ඨාශයේ මිනිසුන් සාක්කි දරයි. බටපොළ , මිටියාගොඩ පැත්තේ යනවිට පාරවල් හතක් පහුවෙන කොට බෝඩ් කියක් තිබෙනවාද ? පාරවල් කියක් හදලා තිබෙනවාද කියා මේ මිනිසුන් කියයි. අපි ඒවා ඡන්ද බලාගෙන හදපුවා නෙමේ. ඒ පාරේ එක්සත් ජාතික පක්ෂයේ මිනිහා විතරක් යන්නේත් නැහැ. සමගි බලවේගයේ මිනිහා විතරක් යන්නෙත් නැහැ. ඔක්කොම යනවා. හැම මිනිහාටම පොදුයි දෙයක් කළාම. එමනිසා සචිත් ප්‍රේමදාස මහත්තයා කළ ඒ ප්‍රකාශය මා පිළිකුල් සහගතව හෙලා දකිනවා. මොකද එතුමා ව්‍යාපාරිකයෙක් නොවෙන්න ඇති. අපි ව්‍යාපාරිකයෝ. අපිට ආත්ම ගරුත්වයක් තිබෙනවා. අම්බලන්ගොඩ ප්‍රදේශයට පැමිණ ඒ වගේ කැත ප්‍රකාශ කරන්න හොඳ නැහැ. අපි ඒවාට උත්තර බඳිනවා. මා කියන්න සතුටුයි. අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා , බටපොළ ප්‍රාදේශිය සභාවේ සභාපතිතුමා මට පුද්ගලිකව කතා කළාම මට කිවුවා ඔබතුමාට දේශපාලනය කරන ලද කට්ටිය අද රැස්වීම්වලට පැමිණ තිබෙනවා. දහය පහළොව පැමිණ තිබෙනවා. ඒ දේ වෙනවා. එදේ වෙන්නේ ඒ ගොල්ලන් දේශපාලන තින්දුවක් ගන්න නොහිටිය මිනිසුන්. එදේ වුණේ කොන්දක් නැති මිනිසුන්ට දේශපාලනය කර වැඩක් නැති නිසා. මා තින්දුවක් ගත්තා මාගේ තින්දුව හරහා මා උදවු කරපු මිනිසුන් ඉන්නවා. මා අනිත් එක වහළවල් 561ක් හදා තිබෙනවා මේ මැතිවරණ කොට්ඨාශයේ. ලක්ෂ 1000කට කිට්ටුවෙන්න වහළවල් හදලා දි තිබෙනවා දුප්පත් මිනිසුන්ගේ. අද ඒ මිනිසුන් මා ගත් තින්දුවක් එක්ක මා සමඟ ඉඳගෙන තිබෙනවා. නොහිතපු මිනිසුන් ගණනාවක් තව ඉදිරියට මාත් එක්ක ඉදගන්නත් ඉඩ තිබෙනවා. ඒ අපි ඒ තින්දුව ගතතේ කළ ඒ තුප්පැහි වැඩයට. මෙකේ ප්‍රතිඵල මා සජිත් ප්‍රේමදාස මහතාට පෙන්වනවා අගෝස්තු මාසයේ 06 වෙනිදා සවස වනවිට බලාගන්න පුළුවන් අම්බලන්ගොඩ මැතිවරණ කොට්ඨාශය ගන්නකොට ඡන්ද තිබුණේ 8691කි. දැන් කොතනටද ඉන්න සංවිධායකතුමා මෙය ගෙනවිත් නතර කරන්නේ කියන එක. බලාගන්න පුළුවන් සජිත් ප්‍රේමදාස මහතාට. තව මට ආවා මට වඩා ඡන්ද ගන්නවා කියන එකක් ආවා. මා එය ප්‍රකාශ නොකළ යුතුයි. මා එය කිවු පුද්ගලයාට කිවුවා ලක්ෂ100ක් මා අම්බලන්ගොඩ ඕන බැංකුවක ඔට්ටුව දමන්න කැමතියි . පුළුවන්නම් අන්න මා ගත් ඒ ඡන්ද සංඛයාව ගෙන පෙන්වන්න. මා ගත් ඡන්ද සංඛ්‍යාව ආසනයේ අරගෙන පෙන්වන්න. හැබැයි ඒ ලක්ෂ 100 සම්පූර්ණ දමන්න ඕන බැංකුවට . මොකද ඒ පිළිබඳ විශ්වාසයක් තිබෙනවා. මා තව මේ කොට්ඨාශයේ හිරියට බැස්සේ නැහැ. මා ඒ ආසනය තුළ බැස්සාට පසසේ ඒ ආසනය තුළ විපර්යාසය අපි පස්සේ බලා ගන්නම්. මේ මැතිවරණ කොට්ඨාශයේ එක්සත් ජාතික පක්ෂයට ඡන්ද එච්චර තිබුණේ නැහැ. අපි ඇත්ත කතා කරන්නේ. මුළු ලංකාවේ අලියාට තිබුණ ඡන්ද ප්‍රමාණය සමගි බලවේගයේ එකතු වෙලා තිබුණේ. හැබැයි අද මැතිවරණ කොට්ඨාශ ගණනාවක විවිධ විවිධ ප්‍රශ්න නිසා සමගි ජන බලවේගයෙන් ඉවත් වන කොටස් නැවත වරක් ආණ්ඩුව පැත්තට ( පොදුජන පෙරමුණටත් ) එකතු වෙනවා. මට කතා කළා මේ අම්බලන්ගොඩ පරම්පරා ගණනාවක් එක්සත් ජාතික පක්ෂයේ පවුලක්. එතුමා මට කතා කළ කිවුවා මල්ලි ඔයා ගියා කියලා මට පොදුජන පෙරමුණට එන්න බැහැ. ඔයාට කළ බලු වැඩය නිසා මා අලියාට දෙන්නේත් නැහැ. මා සමගි බලවේගයට දෙන්නෙත් නැහැ. මා ගහනවා කිවුවා පාසැල් ගිය නිසා විජේවිර සහෝදරයා කතිරය ගසනවා කිවුවා ජනතා විමුක්ති පෙරමුණට. එහෙම කොටසක් මේ මැතිවරණ කොට්ඨාශයේ ඉන්නවා. මේ අම්බලන්ගොඩ කොට්ඨාශයේ දේශපාලනය නිසා මේ වගේ දේවල් වුණාම සමහර සමහර තින්දු ගන්න ඒවා අපේ කමත් එක්ක වෙනස් වෙනවා කියන එක මා මුලින්ම කිවුවේ මේ අපේ එක්සත් ජාතික පක්ෂයේ එම්.එස්. අමරසිරි ,රූපා කරුණාසිලිගෙන් පස්සේ මේ ආපු නායකයෝ මේ ආසන හැල්ලු කළා මිසක් මේ ආසන ශක්තිමත් කරන්න කිසිම සහායෝගයක් දුන්නේ නැහැ. තව එක උදාහරණයක් තමයි මේ. මෙතුමා ගියේත් ඔය ප්‍රශ්නය නිසා තමයි. කොන්ද කෙලින් තියාගෙන අපි අපේ දේශපාලනය කළා. අපි කාගේවත් මුදල් වලින් දේශපාලනය කරන්නේ නැහැ. මේ මැතිවරණ කොට්ඨාශය තුළ දේශපාලන වශයෙන් වැඩ කරන්න හයියක් අපිට තියෙන්න ඕන. එහෙම නැති වුණාම තමයි මේ ගැටළුවලට මුහුණ පාන්න

වෙනවා. එමනිසා අද මේ අම්බලන්ගොඩට ඇවිත් සමගි බලවේගයේ නායකතුමා මට දිපු පොරොන්දු එහෙම දුන්නේ නැහැ කියා ප්‍රසිද්ධියේ කිවුවා. අන්න මා ඒවාට මාධ්‍යයටත් , සමාජ වෙබ් අඩවි වලටත් පැහැදිලි ප්‍රකාශයක් කළා. හෘද සාක්ෂියට එකඟව සජිත් මහත්තයෝ ඔබතුමාගෙන් මා ඇහුවේ නැද්ද? ඔබතුමාගෙන් මා අසන විට ඒ ආණ්ඩුවේ සිටින ජේෂ්ය ඇමතිවරු වන තලතා අතුකොරළ , රංජිත් මද්දුම බණ්ඩාර , රවින්ද්‍ර සමරවීර , ඉරාන් වික්‍රමරත්න තවත් කට්ටිය හිටියා. මේ ඔක්කොම හිටියේ නැද්ද ? හෘද සාක්කියට තට්ටු කරලා අහන්න. ඔබතුමා ඇයි අම්බලන්ගොඩට පැමිණ ඒ වගේ අසත්‍ය ප්‍රකාශයක් කළේ ඇයි. මේ කිරිම තුළ ඔබතුමා මේ රටට හරිහමන් නායකයෙක් කොන්ද පණනැති නායකයෙක් , විශ්වාසයක් තිබෙන නායකයෙක් වේදිකාව තුළ ජනතාවට ඔය කියන ප්‍රකාශ විශ්වාස කරන්න පුළුවන් නායකයෙක්ද කියන එක සමාජ වෙබ් අඩවි වලටත් මාධ්‍යයටත් මා කරුණු ඉදිරිපත් කර තිබෙනවා. මේ ඔබතුමාගේ නායකත්වය තුළ ජනතාව අරත මේ ප්‍රශ්නය තිබෙනවා . මා තින්දුවක් ගත්තේ මට කළ බලු පහර වැඩේ අම්බලන්ගොඩ ප්‍රදේශයේ කොන්ද පණ තියාගෙන ජීවත් වෙන මනුස්සයෙක් මා. හිටපු හමුදා නිලධාරියක් විදියට මා. එමනිසා මා ඔබතුමාගේ මේ මැතිවරණයේදි මට පවරන රාජකාරිය මා හරියට ඉටුකරනවා . හමුදා නිලධාරියෙක් විදියට මා ඊයේ අපේ සරත් විරසේකර මැතිතුමාගේ කොළඹ දිස්ත්‍රික්කයේ රැස්වීම්වලට මා සහභාගී වෙනවා. එතුමා වෙනුවෙන් මා මාගේ කැපවීම් දෙනවා හමුදා නිලධාරියෙක් විදියට . එතුමාත් යුධ හමුදාව නියෝජනය කළ නිලධාරියෙක් විදියට. ඊට අමතරව ලංකාවේ අතිගරු ජනාධිපතිතුමා දමා තිබෙන ඒ වියත්මගේ හමුදා නිලධාරි කණ්ඩායමට මාගේ සහායෝගය ලබා දෙනවා. මාගේ සහායෝගය සම්පූර්ණ ලබා දෙනවා. ඔබතුමා දැන ගන්න ඕන සමගි ජනබලවේගයෙන් ඉදිරිපත් වෙලා තිබෙන්නේ එක්සත් ජාතික පක්ෂයේ සංවිධායකවරු ටික. අද ගමට යන්නේ කාට පින්සිද්ධ වෙන්නද ? ඒ රනිල් වික්‍රමසිංහ මහතාට පින්සිද්ධ වෙන්න. හිටපු අග්‍රමාත්‍යතුමාට පින්සිද්ධ වෙන්න. නැතිනම් ඔය කාටවත් අද ගමට ගිහින් ඡන්දය ඉල්ලන්න බැහැ. පරිණත දේශපාලන නායකයෙක් විදියට ලෝකයේ බලවත් නායකයෝ එතුමාට උදවු කළ නිසා. අපට ගම්පෙරළිය ක්‍රියාත්මක කිරිමට පුළුවන් වුණේ කාපට් මාර්ග ටික හදන්න පුළුවන් වුණේ . එමනිසා තමයි ගමට ගිහින් ඡන්දය ඉල්ලන්න පුළුවන් වතාවරණයක් ඇතිවෙලා තිබෙන්නේ. එමනිසා අපි පැහැදිලිව ගෙන එනවා. මේ ඡන්දයේ මා යන හැම තැනකම කියනවා මා. මා ඒ ඔයටික කියනවා. මා ඔය ටික පස්සේ තේරුම් ගත්තා . අපි තව ගොඩක් දේවල් තේරුම් ගත්තා. අපි දැන් හොයාගෙන හොයාගෙන යනවිට අපි තව වෙනත් දේවල් තේරුම් ගන්නවා. මොකද අවුරුදු දෙක තුනක කාලයක සිට සජිත් ප්‍රේමදාස මහතා කලබලයට නායකත්වය ගැනීම සඳහා තමයි මේවා සිදු කළේ. අපි ඉදිරිපත් කරන්න ඕන. මාධ්‍යයට ලියන්න . බය නැතුව කියන්න. සාක්කි රහිතව ඉදිරිපත් කියන්න ඕන. මාධ්‍ය හරහා රනිල්ට බැහැ . රනිල්ට දිනන්න බැහැ. රනිල්ට මේ මැතිවරණය කරන්න බැහැ කියන මතය ගොඩ නැගුවේ වෙන කවුරුත් නෙමේ සජිත් ප්‍රේමදාස මැතිතුමා. මිනිසුන් අතර රනිල් වික්‍රමසිංහ කියන නම රන්ල්ට බැහැ කියන මතය ගොඩනැගුවේ සජිත් ප්‍රේමදාස කියන එක මා බයනැතුව ප්රකාශ කරනවා. එමනිසා දිව්ය ධම්මවේදය කර්මය අගෝස්තු මස 6 වෙනිදා සජිත් ප්‍රේමදාස මහතාට පල දෙනකොට අද එතුමා සමඟ සිටින කොටසක් ආපහු මහ ගෙදරට යනවා . ඉතිරි කොටස අතිගරු ජනාධිපතිතුමාට 2/3 සාදා ගැනීමට අඩුපාඩුවක් වුණොත් ශක්තිය දෙන්න එකතු වෙනවා කියන එක මා මේ වෙලාවේ කියන්න කැමතියි. එමනිසා අපි ගෙදර ඉන්න ගමන් දෙමාපියන්ට වැරදි කරන්නේ නැහැ. දෙමාපියන්ට වැරදි කළොත් ඒ ළමයින්ට හරියන්නේ නැහැ. අපි අදාහන ආගම දහම අනුව අපි එක දන්නවා. එමනිසා පෝෂණය වුණේ එක්සත් ජාතික පක්ෂයේ නායකතුමාගෙන් නම් ඒ තනතුරු ලැබුණා නම් ඒ පක්ෂය ආරක්ෂා කරගෙන පක්ෂයට වින කරන්නේ නැතුව පක්ෂයේ ඉන්න බැරිනම් අයින් වෙලා යන එක පක්ෂ නායකතුමාට අපහාස කර කර . පක්ෂයට අපහාස කර කර ඉන්නේ නැතුව. එකයි අපි තින්දුවක් ගත්තේ. කොන්ද පණ නැති නායකයෙකු සමඟ , පක්ෂයට වින කරන නායකයෙකු සමඟ වචනයකුවත් විශ්වාසයක් නැති නායකයෙකු සමඟ වැඩ කරනවාට වඩා

හොඳයි අතිගරු ජනාධිපතිතුමා ළඟට ගිහින් එතුමාට ශක්තියට වැඩ කරන එක. එමනිසා මා අවසාන වශයෙන් මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ගරු සභාපතිතුමාට , සියළුම ගරු මන්ත්‍රීවරුන්ට ස්තුති වන්ත වෙනවා. ඒ වගේම මේ නගර සභාවේ මන්ත්‍රීවරයෙක් විදියට 2018 අප්‍රේල් මාසයේ සිට අද වෙනකම් සහභාගී විමේදි තර්ක විතර්ක වුණා. ඒ නිලධාරින් කිසිවෙකු සමඟ අමනාපයකින් නොවේ. හැම නිතරම අපි ඒ තර්ක විතර්ක කළේ නගරයට , නගර සභාවට හොඳ දේවල් කරන්න මිස වෙන කිසිම කෙනෙකු සමඟ පුද්ගලික තරහක් නැහැ. පුද්ගලික තරහාට අපි කිසිම වාද භේදයක් කළේ නැහැ. හැම තිස්සේම අපි කතා කළේ තීන්දු ගත්තේ නගරය වෙනුවෙන් . අදටත් කතා කරන්නේ නගරය වෙනුවෙන්. අපි අපේ අම්බලන්ගොඩ මැතිවරණ කොට්ඨාශයට හැමදාම මැරෙනතුරාම ආදරේයි. අපි ඉගෙන ගත් පාසැල් වලට අපි ආදරේයි. අම්බලන්ගොඩ ජනතාවට අපි ආදරේයි. අපි දේශපාලනය නොකරත් අපි පිට හිටියත් අපේ ව්‍යාපාර තුළ අපිට කරන්න පුළුවන් ඕනැම උදව්වක් කරන්න අපි බැඳිලා ඉන්නවා. මේ අම්බලන්ගොඩ වෙනුවෙන් යුතුකම් ඉටු කරන්න. අවසාන වශයෙන් මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ගරු සභාපතිතුමා ඇතුළු සියළුම ගරු මන්ත්‍රීවරුන්ට මේ සභාවේ සිටින කාලය තුළදී හැම අවස්ථාවේදීම පක්ෂ පාට නොබලා හොඳ දෙයට හැම නිතරම සහායෝගය දුන් සියළුම මන්ත්‍රීවරුන්ට මාගේ හෘදයාංගම ස්තුතිය පුද කරනවා. ඒ එක්කම අපි සභාවේ සිටින ඒ කාලය තුළ අපේ සභාවේ ලේකම්වරුන් දෙදෙනෙකු මාරුවෙලා ගියා. දැන් අලුත් ලේකම් කෙනෙක්. අපිත් එක්ක වැඩ කරලා ඒ ගිය ලේකම්වරියන් දෙදෙනාටත් සියළුම කාර්ය මණ්ඩලයටත් මාගේ ස්තුතිය ප්‍රකාශ කරනවා. අද මාගේ දේශපාලන ජීවිතයේ අවසාන දවස ලෙස සනිටුහන් කර ගන්නවා. හැබැයි දේශපාලනය කොයි එකක් වුණත් අපි අම්බලන්ගොඩට සේවය කරනවා. ඒ කරුණ මතක් කරමින් විශේෂයෙන්ම අපි මේ සභාවේ කතා කරන හොඳ නරක දේ නිතරම රටට ජනතාවට දැන ගැනීමට ඉඩ ප්‍රස්ථාව ලබා දෙන අපේ මාධ්‍යවේදින් අපිට කවදාවත් අමතක කරන්න බැහැ. ඒ සියළුම මාධ්‍යවේදින් අද මෙතැන නැහැ. ඒ සියළුම මාධ්‍යවේදින්ට මාගේ හෘදයාංගම ස්තුතිය පුද කරනවා. ඒ එක්කම අපි සභාවට පැමිණි මොහොතේ සිට අපිට වතුර බෝතලයද , අපිට හැම දෙයින්ම සංග්‍රහ කරනන සියළුම අයටත් , ඔවුන්ගේ පවුල් වලට සියළුම අයටත් සුභ අනාගතයක් වේවායි ප්‍රාර්ථනා කරමින් ගරු සභාපතිතුමා , ගරු මන්ත්‍රීවරු සියළු දෙනා , ලේකම්තුමිය ඇතුළු සියළුම නිලධාරි සියළු දෙනාටත් අම්බලන්ගොඩ නගර සභාව ලංකාවේ හොඳම නගර සභාව බවට පත්වෙන්න , පත්කරන්න ඒ අවශ්‍ය කරන ශක්තිය ධෛර්ය ලැබේවා! අම්බලන්ගොඩ නගරය දිනෙන් දින දියුණුවෙන් දියුණුවට පත්වේවා කියා ප්‍රාර්ථනා කරනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, 2014 ගරු ඩෙනට් පනියන්දුවගේ මන්ත්‍රීතුමා අම්බලන්ගොඩ සංවිධායක වන වේලාවේ ඇත්තම කියනවා නම් මා මෙතුමා කියන ගොඩක් දේවල් වලට එකඟයි. අද ගාලු දිස්ත්‍රික්කයේ රූපා කරුණාසිලිගෙන් පස්සේ අපේ දිස්ත්‍රික් නායකයින් වැඩ කරපු විදිය. ඒ දේශපාලන නායකයෝ. අම්බලන්ගොඩ කියන ආසනයට දුර්වල සංවිධායකවරු දමා ඒ කරපු දේවල් සියයට සියක් ඇත්ත. මට වයස අවුරුදු 18 සිට අම්බලන්ගොඩට පත් වෙච්ච සියළුම සංවිධායකවරුන්ට හදවතින් ආදරය කර හදවතින් උදවු කරපු කෙනෙක් තමයි මා. අද මෙතුමා මට යෝජනාවක් දමා තමයි මා අද මෙතැන ඉන්නේ. මා ඒ ගැන සතුටු වෙනවා. විශේෂයෙන් මා එකක් කියන්න ඕන අම්බලන්ගොඩ 18 සිට පළාත් පාලන නියෝජිතයෙකු ලෙස මාගේ කොට්ඨාශය තුළ නියෝජනය කරපු අපේ සරත් මන්ත්‍රීතුමලා , ජී.එම්.එස්. මහතා මට අවුරුදු 18 සිට කතා කළා. පළාත් පාලන නියෝජිතයෙකු ලෙස ඉදිරිපත් වෙන්න කියා. ඇත්තටම මාගේ ලොකු අශාවක් තිබ්බේ නැහැ මන්ත්‍රීවරයෙකු ලෙස ඡන්දය ඉල්ලන්න ලොකු අශාවක් තිබ්බේ නැහැ. මෙතුමා තමයි කිවුවේ. මා ඒ හේතු මෙතැන කියන්න යන්නේ නැහැ. මොකද සංවිධායක තනතුරට මා පෙර කැවේ නැහැ මෙතුමා සමඟ . සංවිධායක කමට පෙරකාපු කට්ටියට දඬුවමක් ලෙසට මෙතුමා මට කිවුවා අතුල පෝරඹ කොට්ඨාශයෙන් ඉල්ලා මෙතුමා සභාපති කරන්න .

කොට්ඨාශය දිනා දෙන්න . අන්න එක මට කර දෙන්න කියා. ඒ කියපු දෙයට මා මෙතුමා සමඟ එකතු වෙලා මෙතුමා සභාපති කරන්න ඒ අවස්ථාව ලබා ගෙන පළාත් පාලන මැතිවරණයේදි මා ඉදිරිපත් වුණා. මොකද මේ පළාත් පාලන මන්ත්‍රී ධුරය වයස අවුරුදු 18 දි මා ගන්නවා. මනාප ක්‍රමය මාගේ කරන්න අශාවක් තිබුණේ නැහැ. පක්ෂේ යන්ත්‍රණය වෙනුවෙන් අපේ මනුලා වගේ ඉදිරියට ගිහින් වැඩ කරන්න උවමනාව තිබුණේ. ඉතිං අද මන්ත්‍රීවරයෙක් විදියට ඒ අවස්ථාව මට දුන්නා. මාගේ උත්සාහයෙන් මා අද දිනුවා. මෙතුමාගේ හොඳ ගතුගුණත් මා කියන්නම්. මෙතුමායි මායි ලොකු ගැටුම් වලට ගියා. මාගේ දේශපාලන ජිවිතයේ වැඩියෙන්ම දුක් වින්දේ මෙතුමා වෙනුවෙන්. මොකද මා අවුරුදු 18 සිට දේශපාලනය කළ සියළු සංවිධායකවරුන්ට මෙතුමා පසු උපාලි මහතාට තමයි මා වැඩියෙන්ම වැඩ කළේ. දිවා රෑ නොබලා. මාගේ ව්‍යාපාරය ගැනවත් හිතන්නේ නැතුව. අද මා කරපු මගේ ව්‍යාපාර ඔක්කොම ඇණ හිටියා. මා රාත්‍රී 1,3,5 ට එනවිට මෙතුමාගේ දේවල් කරලා . මෙතුමා කොළඹ. මෙතුමාගේ ආරක්ෂක අංශයේ සිටින කෙනාට දුරකථනයෙන් කතා කර විස්තරය කියන විට මෙතැන සිට අම්බලන්ගොඩට තනියම වාහනයක්වත් නැතුව කොඩි කණු කරගහගෙන මෙතුමා එනකොට මා වැඩය කර තිබුණා. ඔබතුමාට විතරක් නෙමේ. අවුරුදු 18 සිට එක්සත් ජාතික පක්ෂයේ දේශපාලන අධිකාරිය සියළු සංවිධායකවරුන්ට කැත නැතුව උදවු කළා. කිසිම වාසි ප්‍රයෝජනයක් නැහැ. මා උදේ පාන්දර මෙතුමා එනකොට 9.00 වෙනකොට මා එතැනට යනවා. ඔබතුමා නැති කළේ කවුරුත් . අවංකම ඔබතුමා ළඟ සහෝදරයෙක් වගේ මා සිටියා. මා ඔබතුමා ළඟ විතරක් නෙමේ හැම සංවිධායකවරයෙක් ළඟ. මා අකමැතිම දෙයක් තමයි . ඔබතුමා ළඟට ලේකම් කෙනෙකු ලෙස ඔබතුමාගේ සහෝදරයෙක් දා ගත් එක. මා එයට දැඩිසේ විරුද්ධයි. පවුලේ කෙනෙකු සම්බන්ධ වෙච්ච එකට. අනිත් එක තමයි ඔබතුමා වටේ හිටිය අතුල කියන කෙනා ඔබතුමා තේරුම් ගත්තේ නැහැ. මා පැමිණ අම්මා තාත්තාටත් හරි දේ හරි කියන වැරදි දෙයට වැරදි කියන පුද්ගලයෙක්. මේ මන්ත්‍රීධුරය නැතු වුණත් මෙතැන මා මෙතැන කිව යුතු දේ කියනවා. එමනිසා ඔබතුමා අපහසුතාවයට ලක් වෙන්නේ නැහැ. මෙතුමා ළඟ කැප වෙලා සහෝදරයෙක් වගේ වැඩ කරලා මා ඒ දේ කියන්න බැහැ. නැතිනම් ඒ දේවල් වලට උත්තර මාගේ ළඟ තිබෙනවා. ඔබතුමා අහපු දෙයට කියන්නේ. විශේෂයෙන්ම අම්බලන්ගොඩ මා දන්නේ නැහැ ඔබතුමා දේශපාලනය කරාවිද නැද්ද කියා දේශපාලන සංවිධායකවරයෙක් විදියට මන්ත්‍රීවරුන්ට ඇහුම්කන් දිය යුතුයි. තනි තීරණ නොගත යුතුයි. අද මේ ගරු සභාවට පත්වෙලා මන්ත්‍රීවරු හය දෙනෙක් සිටිනවා. ඔබතුමාට පරිපාලනය පිළිබඳ අවබෝධයක් තිබෙනවා. මට අධ්‍යාපන සුදුසුකම් අනුව මා ධර්මාශෝක විද්‍යාලයට ගිහින්  ඉගෙන ගත් චරිතයක්. අද කණ්ඩායම් රැස්විමක් අපට නැහැනේ කවදාවත් . මෙච්චර කල් අපි අවුරුදු 2 ½ , 3 ½  වෙනවා අපි පැමිණ. කණ්ඩායම් රැස්විම කැදෙව්වාට ප්‍රශ්න වෙච්ච නිසා තමයි කණ්ඩායම් රැස්වීම කැදෙව්වේ. මා කතා කළා. අපි නවක මන්ත්‍රීවරු. නවක මන්ත්‍රීවරු නිසා අපිට අවබෝධය අවශ්‍යයි. ජේෂ්ඨ මන්ත්‍රීවරයෙකුට වඩා. නොදන්න දේවල් තිබෙනවා. අපි මෙතැන සභාවට එන විට මා ආර්ථික විද්‍යාව ඉගෙන ගත් ශිෂ්‍යයෙක් නිසා මට යම්කිසි දැනුමක් තිබෙනවා. මට පුළුවන් නිසා . මෙහි තිබෙනවා ලොකු අඩුපාඩු. ඔබතුමාගේ ලේකම්තුමාගෙන් වෙච්ච දේවල් . ඔබතුමාට හරිදේ කියන් ගිහින් ඔබතුමා සමඟ. ඇයි තරහායි. ඒ ගොල්ලන් බයයි කතා කරන්න. ඇයි තිබෙන ප්‍රතිලාභ නොලැබෙනවා. මෙතුමාට කෙලින් කතා කරන්න බයයි. මේ අතුලට හොඳ කොන්දක් තිබෙනවා. ඒ නිසා ඔබතුමා තරහා වුණත් ලේකම්තුමා තරහා වුණත් මා ඒ දේ කතා කළා. කට්ටිය තමන්ගේ වාසි ප්‍රයෝජන තකා ඒ ඒ කාර්ය වල නිරත වි සිටියා. මා නම් කියන්නේ නැහැ. ඔබතුමා එය තේරුම් ගෙන ඇති කියා හිතනවා. මා තව දෙයක් කියන්නම්. ඔබතුමා ඉස්සර වුණා වැඩි කියා තමයි මා දකින්නේ. මොකද ප්‍රශ්න කියන දේවල් වලදි අපිට හැමදාම තරහා කාරයන් වෙලා ඉන්න බැහැ. වැරදි වෙනවා. අඩුපාඩු හදා ගත්තායින් පසු මිනිස්සු එකතු වෙනවා. ඔබතුමාගේ තිබෙන ලොකුම දුර්වලකම තමයි මන්ත්‍රීවරුන්ට ඇහුම්කන් නොදිම . එකතමයි මා ඔබතුමාට කියන්නම්. විශේෂයෙන්ම මේ ප්‍රශ්න ඇති නම් ඔබතුමාට අපි උදවු කරනවා. ඔබතුමා ගම්පෙරළිය වැඩ සටහන අවාට පසු කෝටි

30ක් ආසනයකට . සෙල්ලම් මුදලක් නෙමේ. කෝටි 30ක් දමන විට ඔබතුමා මට ඡන්දය ඉල්ලන්න අවස්ථාව දිලා ඔබතුමාගේ සියළු දේවල් මා ළඟ සිට කරලා . මා වැඩකට බැස්සොත් බැස්සා තමයි. මට දේශපාලනයේ ලබා ගන්න දෙයකුත් නැහැ. නැතිකර ගන්න දෙයකුත් නැහැ. ඒවා මා ගණන් ගන්නේත් නැහැ. මා සචිත් මහත්තයා ළඟ හිට ගත්තේ කොන්ද කෙලින් තියාගෙන. මා හෙට නැතිවුණත් මේ මන්ත්‍රි ධුරය. නැති කරන්න දෙන්නේත් නැහැ. නැතිකරන්නත් බැහැ. ඔය අනිත් කට්ටිය කොටසක් ගිහින් ඉන්නවා මන්ත්‍රි ධුරය නැතිවෙයි කියා. ඒ ගොල්ලන්ගේ ඒ තිරණ ඒවා. මාගේ කිසි ගැටවවක් නැහැ. ඒ ගැන ගැටළුවක් නැහැ. මා කියන්නේ මෙතැන වෙච්ච දේවල් . ඔයාලාගේ දේවල් ඔගොල්ලන් කතා කරන්න. ගම්පෙරළිය වැඩ සටහනේ හැම ගමකටම ලක්ෂ 30, 40ක් දමද්දි ඔබතුමාට එච්චර යුතුකමක් ඉටු කරපු ළඟ ඉඳගෙන ඔබතුමා දැම්මේ ලක්ෂ 7කි. කණ්ඩායම් රැස්විමේ වාඩිවෙලා අපේ මනු, නෙල්සන් මහතා සමඟ අපේ කණ්ඩායම් රැස්විමේ වාඩිවෙලා සිටියදි මා දහස් වාරයක් කිව්වා සංවිධායකතුමා එහෙම කරන්න එපා. ගම්පෙරලියේ. ඒ සියළු දේවල් කියලා ආවේ. පොඩි පාරවල් කාණු පද්ධති ඒ සියළු දේවල් ඒවාගෙන් හදන්න පුළුවන්. ලක්ෂ 30ක 40ක ගමක වැඩ දමන්න පුළුවන්. ඒ වේලවේ ඔතන මා වෙනුවෙන් කතා කරන්න කිසිම කෙනෙකුට කොන්දක් තිබුණේ නැහැ. අද ඒ දේ තමයි දුරදිග ගිහින් මේ විදියට ගැටුම් ඇතිවුණේ. නැතිනම් ඔබතුමා සමඟ මගේ පුද්ගලික තරහාක් නැහැ. මා ඇත්තටම අවංකව ඔබතුමා ගැන සතුටු වෙනවා. කිසිම සංවිධායකවරයෙක් මේ පුටුවට පැමිණ කිසිම සත පහක් අරයාගෙන් මෙයාගෙන් අරගෙන දේශපාලනය ඔබතුමා කළේ නැහැ. ඔබතුමා ගැන ඇත්තටම මා අගය කරනවා. ඔබතුමා වටේ හිටිය කට්ටිය ඔබතුමාගේ ඔලුව මඤ්ඤං කළා. ඒ පුද්ගලික වාසි ගන්න. ඔබතුමාට තමයි මේ අම්බලන්ගොඩ කොට්ඨාශයේ හොඳට වැඩ කරන්න පුළුවන් අවස්ථාව ලැබුණේ ඔබතුමාට . යම්කිසි ආදායමක් ලබනවා. ඔබතුමාට හැම පැත්තෙන්ම සම්බන්ධ වෙද්දි ඔබතුමා එය නැතිකර ගත්තා . වටේ සිටින කට්ටිය දුන් අදහස්. ඔබතුමා වැඩ කළේ. අපි ඇවිත් කෙලින් වැඩ කරන චරිත. ඉතිං මා ඉස්සර වුණා නම් ඔය ප්‍රශ්නය මේවා කරගන්න තිබුණා. ඉතිං ඒ ගැන කනගාටුයි. ඔබතුමා සමගි ජන බලවේගයේ නායක සජිත් ප්‍රේමදාස මහතා ගැන සඳහන් කළා. අපි දේශපාලනය කරන විට අපි නායකයින් හදන්න ඕනේ. අපි නායකයින් සැදිය යුතුයි. ඔබතුමා ගැන විශ්වාස කරලා මා දේශපාලනය කළේ. ඔබතුමා අපි ආරක්ෂා කරයි කියා ලොකු විශ්වාසයක් තිබුණා. ලේකම්ලා ගැන නෙමේ. ඔබතුමා ගැන විශ්වාසයකින් තමයි වැඩ කළේ. ඔබතුමා ඒ විශ්වාසය කඩ කළා. එමනිසා මා ඔබතුමාට කියා පැමිණියේ. මා මෙතැනට එන්නේ නැහැ. මා මුදලුත් හදා ගත්තා. ඔබතුමාට විරුද්ධව වැඩ කලා.

**<u>ගරු නාගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මට විරෝධතාවයක් දක්වන්න වෙනවා. අපට අදාල නැහැ මේ කියන කාරණා. අපි දැන් මේ පැය ගණනක් අහගෙන ඉන්නවා. ඇති දැන්. ඔබතුමා තීරණයක් ගන්න. අතුල මන්ත්‍රිතුමාට පුද්ගලිකව ගරු කරනවා. නමුත් මේ කතාව අපිට කරදරයක්.

**<u>ගරු නාගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

මෙතුමා කියපු දේවල් වලට උත්තර දෙන්න එපැයි.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මන්ත්‍රිතුමා ඔබතුමා එතුමාට සුබ පතනවා හරි දෙයක් කියන්න. පුද්ගලික දේවල් කියන්න එපා. වාද කරන්න එපා.

**<u>ගරු නාගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

එතනට යන්න තමයි ආවේ. පුද්ගලික දේවල් ප්‍රකාශ කරන්න එපා කියා. මා මෙතනින් මෙය නතර කරනවා.

**<u>ගරු නාගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

මා මෙතන කතා කරනවා නම් සභාවට අදාල නොවන දෙයක් කතා කරනවා නම් විශේෂයෙන් ගරු උපසභාපති කමල් මහතා සිටියා නම් මට ලොකු ගොරියක් දමලා. වාඩිවෙන්න අදාල නැහැ. දැන් අපි හුඟක් ඉවසාගෙන හිටියා. ගම්පෙරළියේ කතාව කියන කොට අපිට අදාල නොවන කොටස් තිබුණා.

**<u>ගරු නාගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

නැහැ මෙතුමා කිවු දේවල් වලට පිළිතරු දෙන්න ඕන. නැතිනම් අපේ මාධ්‍ය ඉන්නවානේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ සභාවේ එතුමාගේ අවසාන දිනය අද.

**<u>ගරු නාගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

හරි සභාවට අවශ්‍ය දේවල් කතා කරන්නම්.

**<u>ගරු නාගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

අපි නවක මන්ත්‍රීවරුන් .

**<u>ගරු නාගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

මා කෙටියෙන් අවසන් කරන්නම්. එකයි ටිකක් ඔබතුමාට ටිකක් තේරුම් කර දුන්නේ. ඔබතුමා සමඟ පුද්ගලිකව කතා කරන්න බැහැ. ඒකයි මා ඒ ටික දැනුවත් කළේ. දුරකථනයටවත් ඔබතුමා කතා කරන්නේ නැහැ. ඔබතුමාට තේරුම් ගන්න මා කතා කළේ. නැතිනම් මා කතා කරන්නේ නැහැ. නිකං කෝඩ් ගහන්න නෙමේ. ඔබතුමාට විපක්ෂ නායකයෙක් විදියට මන්ත්‍රීවරයෙක් විදියට. ඒ හඬ අපට නැති වෙනවා. මේ සිටිය වසර 2 ½ තුළදි ඔබතුමාට කළ හැකි සියළු දේවල් ඒ හයිය ගෙන කළා. ගරු සභාවේ විපක්ෂනායතුමා ඒ හයිය අරගෙන තමයි වැඩ කටයුතු කළේ. කෙටියෙන් මා අවසන් කරන්නම්. ඔබතුමාගේ ව්‍යාපර ආදි සියළු කටයුතු සාර්ථක වේවා කියා මා ප්‍රාර්ථනා කරනවා.

**<u>ගරු නාගර සභා මන්ත්‍රී ඒ.පී. ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, අවුරුදු 2 ½ ක පමණ කාලයක් අප සමඟ ගරු විපක්ෂනායක ලෙස කටයුතු කළ මාගේ පන්තියේ සඟයා , මගේ ගමේ සඟයා අද මන්ත්‍රී ධුරයෙන් සමු ගන්නා දිනය අද. මට හරිම දුකක් දැනුනා. මොකද එතුමා මෙතැන ඉන්නකොට පොඩ්ඩක් හරි සද්දයකුත් තිබුණා. ඒක අවංකවම කියන්න ඕන. මා මේ දෙවන වරට මේ සභාවට පත්වෙලා ආවේ. අපි පසුගිය පාලන කාලයේ විපක්ෂනායක කෙනෙක් සිටියා. නිකං සුළඟට වැනෙනවා වගේ විපක්ෂ නායක කෙනෙක් හිටියේ. ඉතිං එමනිසා හොඳ හඬක් නගපු විපක්ෂනායකවරයෙක්. හොඳ මන්ත්‍රීවරයෙක්. ඇත්තෙන්ම අවංකවම තමන්ගේ පක්ෂය වෙනුවෙන් වැඩ කරන ලද පුද්ගලයෙක්. ඒ සම්බන්ධව මා එතුමාට අවංකවම ස්තුතිය පල කරනවා. කොහොම නමුත් ගරු ඩෙනට් පනියන්දුවගේ මහතාණෙනි අර සජිත් ප්‍රේමදාස මහතාගේ ශ්‍රී මුඛයෙන් වදාරපු ගණන්

ගන්න එපා. තමන්ගේ කටට කියන දෙය දන්නේ නැති මනුස්සයකු බුදු හාමුදුරුවන්ගේ ශ්‍රී මුඛය හා සමාන කර කතා කරන මනුස්සයකු ගැන ඔබතුමා ඒ ගනැන පසුතැවිලි වෙනවා නම් මා ඇත්තටම ඔබතුමා ගැන කනගාටු වෙනවා. ඔබතුමා හොඳ නිලධාරියෙක් විදියට සේවය කළා. දැනටත් ජනතාවට සේවය කරනවා. දැනටත් ඔබතුමා ව්‍යාපාරිකයෙකු ලෙස ඉතාමත් ඉහළ තත්ත්වයේ ඉන්නවා. එමනිසා මෝඩ මනුස්සයකු කියන දෙයක් ගැන කල කිරිලා ඔබතුමා යන දේශපාලන ගමන නතර කරන්න එපා. මොකද ඔබතුමා වගේ කෙනෙක් මේ දේශපාලනයේ ඉන්න ඕන. මේ රටට අවශ්‍ය පුද්ගලයෙක්. මේ රටට අවශ්‍ය වංචාවක් නොකරන පුද්ගලයෙක්. එමනිසා ඔබතුමා බොහොම විනිවිදභාවයෙන් යුතුව කතා කළා. බොහොම අවංකයි. මා දකින නිසා එඩිතරභාවයක් තිබෙන පුද්ගලයෙක්. එමනිසා ඔබතුමා දේශපාලනයේ රැදි සිටින්න මොන පක්ෂයෙන් වුණත්. දේශපාලන ගමන නතර කරන්න එපා. මොකද අම්බලන්ගොඩ ජනතාවට සේවය කරන්න ඕන. විපක්ෂයේ වුණාට මා බොහොම සම්බන්ධයි. අපි පෞද්ගලික දේවල් හරි කතා කරනවා. මාත් නිතරම කියන්නේ මේ අම්බලන්ගොඩට වැඩක් කරන්න කියා තමයි එතුමා සමඟ කතා කළානම් නිතරම කතා කළේ. එමනිසා මා නැවතත් මාගේ සහෝදරයාට කියනවා ඔබතුමා මේ දේශපාලනයෙන් සමුගන්න එපා. මොන පක්ෂයෙන් හරි අම්බලන්ගොඩට ඇවිත් මේ රටට සේවයක් කරන්න. මා සුබ පතනවා. ඒ වගේම ඔබතුමා දැන් හරි මාර්ගයට ඇවිත් අපිත් සමඟ අතිගරු ජනාධිපතිතුමාගේ මේ දැක්ම දැකලා අතිගරු ජනාධිපතිතුමා සමඟ එකතුවීම ගැන මා සතුටු වෙනවා. එමනිසා මේ යන ගමන අපිත් සමඟ හරි දේශපාලනයේ රැදි සිටින්න. අප සමග යන්. ඔබතුමා දේශපාලන ගමන නතර කරන්න එපා. මා ඔබතුමාට දීර්ඝායුෂ පතනවා. නිදුක් නිරෝගිභාවය පතනවා.

<u>ගරු නාගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, ඇත්තටම මට ඩෙනට් පනියන්දුවගේ මහතා ගැන කොන්ද කෙලින් තියාගෙන මට හොඳට කතා කරන්න පුළුවන්. අනිත් අය ගැන නෙමේ. එතුමා ගැන. එතුමා බොහොම එඩිතර කෙනෙක්. මොකද මා මන්ත්‍රි ධූරය ගනිද්දි දිස්ත්‍රික් කමිටුවෙන් ප්‍රශ්නයක් ආවා. ප්‍රදේශයේ . මෙතැන පොඩි අවුලක් ඇති වෙනවා. ඔබතුමිය ආවොත් එහෙම. නමුත් එතුමා කිව්වා දිස්ත්‍රික්කයේ අවුරුදු 21 ක් වැඩ කරලා දිස්ත්‍රික් ලේකම්තුමිය. නිතර කතා කරන එතුමිය මෙකට යා යුතුයි. දිස්ත්‍රික් නායකයාත් මගේ අසරණ වුණා. ඉල්ලීමක් කළා. ඔය ජයන්ත මහත්තයා එහෙම. මෙතැන කොන්ද පණනැතුව වැනි වැනි ඉන්න අය. එගොල්ලන් තමයි ඔය ප්‍රශ්නය ඇති කළේ. ඒ වේලාවේ මෙතුමා කෙලින් හිටියේ. ඇත්තටම සංවිධායකතුමා කෙලින් හිටියා. මා මේ කියන්නේ එතුමා ගත්ත තීරණය හරි කියන්නේ නැහැ මං. හැබැයි ඉතිං එතුමාට දීපු පොරෝන්දු ඉටු නොකර මේ රටේ ඡන්දය ඉල්ලන වැනි වැනි පෙන්දයියලා වගේ නායකයන්ට වැඩ කරනවාට වඩා හොඳයි කෙලින් නායකයෙක් ළඟට ගියඑක. මා ඒ ගැන ආඩම්බර වෙනවා. අපේ පක්ෂයේ ජ්‍යේෂ්ඨ නායකයෙක් රනිල් වික්‍රමසිංහ කියන්නේ. අපි එතුමා තෝරා ගත්තා. මොකද අපේ මහගෙදර. අපි මහගෙදර දමා යන්න ඕනේ නැහැ. තාත්තලා අම්මලා රණ්ඩු වෙනවා. අපි තාත්තා ළඟට යන්න ඕන. එමනිසා මහගෙදරට ගියා. අපට වෙනත් කෙනෙක් සොයාගෙන යන්න බැරි නිසා. මෙතුමා කියනවා මන්ත්‍රි ධූරයට බයේ අපි ගියා කියා. අපි මන්ත්‍රිධූරයට බයවෙලා නැහැ. මේ මන්ත්‍රි ධූරය අපිට ඉපුදුන දවසේ සිට ලැබිලා නැහැනේ. මා එකක් කියනවා මෙතුමාට ඔක්කොම වින ඇද්දේ අපේ අය. ළඟින්ම හිටපු අය. මෙතුමා ඉතාමත් දක්ෂයි. ගම්පෙරළියේ මුදල් වලින් එතුමා කළේ සාධාරණයක්. නගර සභාවේ පාරවල් ඔබතුමලා හදනවා. නගර සභාවේ පාරවල් නැහැ හදන්න. ප්‍රාදේශිය සභාවේ දෙන ඒවාගේ තමයි වැසිකිළි හදන්නේ. මට එක වැසිකිළියක්වත් ලැබුණේ නැහැ. අපේ පැතිවල නිවාස නැහැනේ හදන්න. මේ ඔක්කොම තිබෙන්නේ අලුත්වල ගෝනපිනුවල. එතුමා ඒ සාධාරණය කරන්න ගිහින් තමයි එතුමාට මේ ප්‍රශ්නය ඇති වුණේ. හැබැයි එතුමාට මෙය හදාගන්න තිබුණා. අපිට මේ ගැන කතා කරන්න තිබුණා. ඉරාන් වික්‍රමරත්න මහතා මාගේ හොඳම හිතවතෙක් කබීර් හෂිම් ඇමතිතුමාගේ

පෞද්ගලික ලේකම් හිටියේ මා. මා මෙතුමාට කිවුවා කතා කරන්නද ලක්ෂමන් කිරිඇල්ලට කියා. මෙතුමා කිවුවා කාටවත් කතා කරන්න එපා කියා. කොන්ද කෙලින් තියාගෙන මට මේ දේශපාලනය කරන්න බැහැ කියා. අහන්න මෙතුමාගෙන් මා කිවුවේ නැද්ද කියා. ඔබතුමා ඉක්මන් තීරන ගන්න එපා. මට පොඩ්ඩක් දෙන්න . මට පැය භාගයක් දෙන්න මා ඔබතුමාගේ සංවිධායකම අරගෙන දෙනවා. දැන් අරගෙන දෙනවා. එතුමා කිවුවා අයිරාංගනි ඕන නැහැ. මොකටද අපි එහෙම ගන්නේ . මුදල් වියදම් කරන්නේ. මාගේ ශ්‍රමය කැප කරන්නේ මා. ව්‍යාපාරික කටයුතු කරන්නේ මා. මට මේ දැන් කියන දෙය ඉෂ්ඨ කරන්න බැරි නායකයෙක් සමඟ මට මේ ගමන යන්න බැහැ කියා එතුමා කිවුවා. මා එතුමා ගැන ආඩම්බර වෙනවා. ඔබතුමා හරි . මා දුකෙන් හරි කියනවා . ඔබතුමා හරි. ගියමග හරි. ඔබතුමාගේ ගමනට ආශිර්වාද කරනවා. ඔබතුමා යන යන තැන ඔබතුමාට ශක්තිය ධෛර්ය ලැබෙන්න කියා මා ප්‍රාර්ථනා කරනවා. මොකද ඔබතුමා විපක්ෂනායකතුමා වශයෙන් අපිට ලොකු ශක්තියක් දුන්නා නගර සභාවට. මොන ප්‍රශ්නය කිවුවාත් ඔබතුමා කිවුවේ අයිරාංගනි අපි හොඳ දෙයට සහායෝගය දෙන්න ඕන. සභාපතිතුමාට ශක්තිය දෙන්න ඕන. සභාපතිතුමාට කවදාවත් ලෙඩක් ඇද්දේ නැහැ. අයවැයට මොනවා හරි සම්මත කළත් අයාරාංගනී හොඳට කියවා බලා සම්මත කර ගන්න. මේවා අධ්‍යනය කරන්න කියා ඔබතුමා අපිට උපදෙස් දුන්නා. හැම තිස්සේම ඔබතුමා අපිට ආශිර්වාද කරනවා. ඔබතුමිය නගර සභා ආඥා පණත බලන්න. හැම දේම අධ්‍යනය කරන්න. ඇත්තටම අපි ඔබතුමාට ගරු කරනවා. ඔබතුමා අපිට ශක්තිය දුන්නාට. අපිට දුකයි . ඒ වගේම අපි එතුමාගේ ගමනට ආශිර්වාද කරනවා. හැබැයි මේ කොන්ද කෙලින් නැති අයට තෙරෙයි ඩෙනට් ගිය එක කොච්චර පාඩුවක් ද කියා ආසනයට මැතිවරණ ප්‍රතිඵල එනවිට. එක්සත් ජාතික පක්ෂයේ අලියා ඉදිරියේ නැගි සිටියාට මා එදා සිට එතුමාට කිවුවා මා දිස්ත්‍රික්කයේ වැඩ කරන්නේ රනිල් වික්‍රමසිංහ මහතාට. මාගේ තනතුරු නිසා මට එහෙම කරන්න වෙනවා. මාගේ මන්ත්‍රී ධූරය නිසා මා මෙතෙක් කල් රඳවාගෙන පැමිණි නිසා. මා එකක් කියන්න ඕන ඩෙනට් පනියන්දුව මහතාණෙනි වජිර අබේවර්ධන මහතා ගැන ඒ විදියට හිතන්න එපා. එතුමා දිස්ත්‍රික් නායකයා. එතුමාටත් මේ විෂබීජ තමයි හැමෝම දෙන්නේ. මේ විෂබීජ තමයි ආසනයක් කන්නේ. සභාපතිතුමනි , ඔබතුමාත් බොහොම ප්‍රවේශම් වෙන්න ඕන හැමෝගෙන්ම. මේ නායකයන් වශයෙන් ඉදිරියට යන අය මේ කියන හැම එකාගේම දෙවල් අහලා විෂබීජ නිසා තමයි මේ ගිනි පත්තු වෙන්නේ. ඔය කණ්ඩායම තමයි දිස්ත්‍රික් නායකතුමාගේ ඔලුව කන්නේ. දැන් හොඳටම තෙරෙනවා. එයාටත් මොළේ පැදිලා තිබෙනවා. මා එතුමාටත් කිවුවේ නායකතුමනි කියන දේ කිසිම දෙයක් අහන්න එපා. තමන්ගේ ඇස් දෙකක් තමන්ගේ කන් දෙකක් විශ්වාස කරන්න කිසි දෙයක් අහන්න එපා. කිසි කෙනෙක් කියන දෙයක් අහන්න එපා කියා. එකයි මේ පක්ෂයට වෙලා තිබෙන්නේ. කොයි පක්ෂයටත් වෙලා තිබෙන්නේ. නායකයෝ වුණාම ඇහුම්කන් දීම වැදගත් . දැනීම , දැකිල්ල , ඇසීම වැදගත්. ඉවසීමත් වැදගත්. එහෙම දේවල් නැති නිසා තමයි ඔය ප්‍රශ්නය ඇති වුණේ. ඩෙනට් පනියන්දුවගේ මහතාණෙනි මා බොහොම කනගාටු වෙනවා ඔබතුමා අපෙන් ගියාට. අපි දිවිහිමියෙන් අපේ පක්ෂය රකිනවා. මට අදහා ගන්න බැරි වුණා. මා මේ දිනවල මේ දිස්ත්‍රික්කය පුරා අවිද්දා පුදුම විදියට ගොනු විමක් වුණා සජිත් මහතාගේ කතා නිසා එක්සත් ජාතික පක්ෂයට සෙනඟ පුරාවා ගැනීමට හැකි වීම ගැන ඇත්තටම මා ආඩම්බර වෙනවා. මොකද වැටිලා තිබ්බේ ප්‍රශ්නය. එක්සත් ජාතික පක්ෂය වැටිලා රැල්ලක් හැදෙනවා කිවුවා සජිත් මහතාට. කතා කරන එක දවසින් දවස තප්පරෙන් තප්පරේ විනාශ කරනවා . එකතමයි දේශපාලන නොදැනුවත්කම. දේශපාලනයේ පරිණතභාවය නැති කම. දේශපාලනයේ දැක්මක් නැතිකම. කොහොම වුණත් රනිල් වික්‍රමසිංහ කියන්නේ විශිෂ්ඨ නායකයෙක්. හොඳ දැක්මක් තිබෙන නායකයෙක්. කවදාවත් කිසිම පක්ෂයේ නායකයෙකුට බනින්නේ නැහැ. කිසිම සැලසුමක් විවේචනය කරන්නේ නැති අද්වතිය ගණයේ නායකයෙක් රනිල් වික්‍රම්සිංහ. අපි එතුමාට වැඩ කරනවා. ඔබතුමාට අශිර්වාද කරනවා. ඔබතුමා යන ඉදිරි ගමනේ මල් පිපේවා, ඔබතුමාගේ ජීවිතය සාර්ථක වේවා. අපි සැමවිටම අපේ සහෝදරකම තියා ගන්නා ලෙස මා සහෝදරයෙක්

ලෙස ඔබතුමාට දිර්ඝායුෂ ප්‍රාර්ථනා කරනවා. මන්ත්‍රීවරියක් වශයෙන් මා දුක්වෙනවා ඔබතුමා දේශපාලනයෙන් සමුගැනිම ගැන.

**<u>ගරු නාගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ගරු ඩෙනට් පනියන්දුවගේ මැතිතුමා එතුමාගේ පෞද්ගලික ජීවිතය ගැන තින්දුවක් ගෙන තිබෙනවා. අපිට එයට මුකුත් කියන්න බැහැ. එතුමා අපත් සමඟ වසර 2 ½ පමණ කාලයක් තුළ නගර සභාවේ විපක්ෂයේ නායක ධුරයේ වැඩ රාජකාරි සිදු කළා. මොකද අම්බලන්ගොඩ නගර සභාව තුළ නගර සභාවේ කාර්ය භාර්ය ඉටු කරන්න, බලාපොරොත්තු ඉටු කරන්න. ඔබතුමා ගරු සභාපතිතුමාට නිවැරදි මාර්ගය කියා දෙන්න මෙම සභාව අමාන්ත්‍රණය කරලා වැඩ කටයුතු කළා. මා හිතන්නේ එතුමා සතුටු වෙන්න ඕන. එතුමාගේ දේශපාලන මතය කුමක් වුවත් ගත්ත තින්දුව ඉතාමත්ම නිවැරදි තින්දුවක් ගෙන තිබෙනවා. අදට පවතින රටේ තත්ත්වය තුළ අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ ඒ වැඩපිළිවල ශක්තිමත් කරන්න ඔබතුමා මොන ආකාරයෙන් හිතුවාද කියතොත් ඒ නිර්භිත කම අවංකභාවය ඒ වගේම ඒ කෙලින් ඍජුබව එතුමා හමුදා නිලධාරියෙක් හැටියට  කටයුතු කරන්න වුණා. අතිගරු ජනාධිපතිතුමාට සහායෝගය දෙන්න තින්දු කර තිබෙනවා. ඔබතුමාගේ පක්ෂය තුළ කලින් සිටි සභාව තුළ  ගත්ත ඒ ක්‍රියා මාර්ග ඒ වගේම අපට දුන්න ඒ සහායෝගය ඒ වගේම ගරු සභාවට නගරයේ ජනතාවට යම් වැඩකදි දෙන්න පුළුවන් උපරිම සහායෝගය ආසනය වගේම නගරයටත් ලබා දුන්නා. අපි ඇත්තටම ඔබතුමාට සුභාෂිංසනය කරනවා. අපේ නගරය තුළ ඔබතුමා දේශපාලනය කරන්න අවශ්‍යතාවයකුත් නැහැ. තිබෙන තත්ත්වය අනුව. ඔබතුමා ඉතා ශක්තිමත් කෙනෙක්. පෞද්ගලික මතිමතාන්තර තිබෙනවා පක්ෂය තුළ. ඒ මත ඔබතුමා යම් තින්දුවක් ගෙන තිබෙනවා. අපි ඒ ගැන කියන්න යන්නේ නැහැ. නමුත් අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා ඉදිරියේදිත් අපේ නගරය වෙනුවෙන් ඒ දෙන්න පුළුවන් උපරිම සහායෝගය ලබා දෙන්න කියා. අතිගරු ජනාධිපතිතුමාත් සමඟ සම්බන්ධ වෙලා නගරයේ කටයුතු වලදි  ඔබතුමා මැදිහත් වෙලා අපේ නගරයේ ජනතාවට වැඩ කරන්න ඔබතුමාට හැකිවේවා කියා අපි ප්‍රාර්ථනා කරනවා. ඒ වගේම ඔබතුමාගේ පෞද්ගලික ජීවිතයට ආශිර්වාද කරනවා.  අපි සමඟ මොන මතිමතාන්තර දැරුවත් අපි ඔබතුමා අප සමඟ හිටියා. ඔබතුමාගේ ඉදිරි අනාගතය සාර්වප්‍රකාරයෙන් සාර්ථක වේවා කියා ප්‍රාර්ථනා කරනවා. ඔබතුමාගේ දේශපාලන ජීවිතයෙන් සමුගන්න එපා කියා අපි ප්‍රාර්ථනා කරනවා

**<u>ගරු නාගර සභා මන්ත්‍රී ඩබ්.ඒ.සෝභිත රංජිත් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මාගේ මිත්‍රයා ගැන යමක් සඳහන් කළ යුතුයි. මා අවුරුදු 20 පටන් දේශපාලනයට පැමිණි කෙනෙක්. එත් 2018 පළාත් සභාවට ඉල්ලන අවස්ථාවේ මාගේ කිසිම අදහසක් තිබුණේ නැහැ දේශපාලනයට එන්න. මෙතුමා අපේ නිවසට පැමිණ තමයි කිවුවේ සෝභිත අයියේ දේශපාලනයට එන්න කියා. එත් මගේ නෝනත් දුවත් විරුද්ධ වුණා දේශපාලනය කරන්න එපා කියා. එත් මෙතුමා තමයි මේ තත්ත්වයට ගත්තෙ. මා ඉතිං දේශපාලනය කරපු මුල් අවස්ථාවේම වැඩි ඡන්ද ගෙන එක්සත් ජාතික පක්ෂයෙන් දේශපාලනයට පැමිණියා. එත් මට විපක්ෂ නායක කම ගන්න තිබියදිත් මා එතුමාට එය භාර දුන්නේ මට වඩා දේශපාලනයේ පරිණත දැනුමක් තිබෙන කෙනෙකු නිසා. මා නවක මන්ත්‍රීවරයෙක් වශයෙන් මට වඩා එතුමා පළපුරුද්දක් තිබෙනවා. මා ගැන දුක් වෙන්නේ නැහැ. ඒ වගේම 2015 ලංකා ධිවර සංස්ථාවේ සභාපතිතකම ලැබුණ අවස්ථාවේම මා එතුමාගේ වාහනයෙන්ම එතනට එක්කාගෙන ගිහින් මට ඒ අවස්ථාව ලබා දිලා ඒ අවස්ථාව ලබා දුන්නා. මා එහි සුමාන දෙකක් වගේ තමයි එහි කටයුතු කළේ. ඒ වගේ මට උදවු කරපු මහත්තයෙක්. ඩෙනට් පනියන්දුවගේ කියන්නේ. මේ අම්බලන්ගොඩ සංවිධායකවරු වශයෙන් සිටි දේශපාලනඥයන්ගෙන් අනුන්ගෙන් රුපියලක්වත් ගන්නේ නැතුව තමන්ගේ මුදල් වලින් දේශපාලනය කර පුද්ගලයෙක්. මා එතුමා කිය තිබෙනවා

තමන්ගේ ව්‍යාපාර පැත්තෙන් බලන්න දේශපාලනය කළත් මිනිසුන්ගෙන් හොඳක් නැහැ. ඔයාගේ ව්‍යාපාර පැත්තට යන්න කියා මා කියා තිබෙනවා. මා එතුමා දේශපාලනයෙන් සමුගෙන අනිත් පැත්තට ගිය එකටනම් මා කොහේත්ම කැමති නැහැ. විශේෂයෙන් එතුමා ව්‍යාපාර පැත්තෙන් දියුණුවක් කරගෙන අම්බලන්ගොඩ ජනතාවට සේවයක් කිරිම ගැන මා සතුටු වෙනවා. එතුමා හා මා වසර ගණනාවක් තිස්සේ අපි ආශ්‍රය කර තිබෙනවා. මා එතුමාගේ ව්‍යාපාර වලටත් එතුමාගේ බිරිඳගේ හා දරුවන්ගේ අනාගත කටයුතු සර්වප්‍රකාරයෙන් සාර්ථක වේවා කියා මා ප්‍රාර්ථනා කරනවා.

**<u>ගරු නාගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

අපේ මිත්‍රයා ගැන දැනටමත් හැමෝම වර්ණනා කර තිබෙනවා. මාගේ පාසැල් කාලයේ සිට මිත්‍රයෙක්. එඩිතරව තින්දු ගන්න කෙලින් තීරණ ගන්න අපේ වචනයෙන් කියනවා නම් වලියකට වුණත් එන කෙලින් තින්දු තිරණ ගන්න කෙනෙක්. මා එතුමා ගැන දන්නවා. මා එතුමා ගැන දන්නවා. අපේ සභාවට ශක්තියක් වුණ කෙනෙක්. අපේ සභාවේ වැඩ වලදි කෙලින් කතා කර අපට උදවු කළා. ලොකු පාඩුවක් කියා හිතෙනවා අපටත් මේ අම්බලන්ගොඩ නගර සභාවටත් මේ දේශපාලනයෙන් සමු ගැනීම. එතුමාගේ පුද්ගලික තීරණය . එය එතුමාගේ යහපතට ගන්න ඇති. අපිට තිබෙන්නේ එතුමාට සුභ පතන්න. මා යලිත් කියනවා ඔබතුමා අයින් වීම අපේ සභාවට ලොකු පාඩුවක්. එත් අපි බලාපොරෝත්තු වෙනවා අපේ වැඩ වලට ඉදිරියේදි ඔබතුමාගේ සහායෝගය ලබා දෙයි කියා. අපේ අතිගරු ජනාධිපතිතුමාට සහායෝගය ලබා දීම ගැන අපි ඉතාමත්ම සතුටු වෙනවා. අම්බලන්ගොඩ ගැන කතා කරන හැම වේලාවකම අපි අම්බලන්ගොඩ. අම්බලන්ගොඩට යමක් කරන්න ඕන කියන මතයේ සිටියේ. මෙහේ විතරක් නෙමේ . කොළඹ අපේ ආදි ශිෂ්‍ය සංගමයේ වුණත් දන්නවා පක්ෂය කුමක් වුණත් ඩෙනට් මේ විදියට කතා කරනවා කියා. ඉතිං එය තහවුරු කර තිබෙනවා. අපිට එය පාඩුවක් . අපි ඔබතුමාගේ ඉදිරි අනාගතය සාර්වප්‍රකාරයෙන් සාර්ථක වේවා කියා ප්‍රාර්ථනා කරනවා. එකට ඉන්න අපි දේශපාලනය නොකළත් ඉදිරි කටයුතු වලදි. අපි ඔබතුමාට දිර්ඝායුෂ පතනවා.

**<u>ගරු නාගර සභා මන්ත්‍රී ඩබ්.එම්.නිලානි මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ගරු නගර සභා මන්ත්‍රි ඩෙනට් පනියන්දුවගේ මහතා නගර සභාවෙන් සමුගැනිම ඉතාමත්ම දුකයි. අද මට මේ අවස්ථාවේ මතක් වෙන දෙයක් තමයි අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා කියන දෙයක් තමයි දේශපාලනයේදි සාදාකාලික මිතුරෝත් නැහැ. සාදාකාලික සතුරොත් නැහැ. එමනිසා දේශපාලනයේදි ඔහොම තමයි. එමනිසා දේශපාලනයේදි මා දැක්ක දෙයක් තමයි එතුමාගේ අම්බලන්ගොඩට , අපේ කමට පුදුම ලෙන්ගතුකමක්. ඒ අම්බලන්ගොඩට ආදරේ තිබෙන්නේ. බොරුවට ආදරය කරපු කෙනෙක් නෙමේ. නිත්‍ය වශයෙන්ම අම්බලන්ගොඩ හදන්න ඕන අම්බලන්ගොඩ සංවර්ධනය කරන්න ඕන කියන මතයෙන් තමයි එතුමා ආවේ. ඒ වගේම මා නිතරම දැක තිබෙනවා. ගරු සභාපතිතුමා මොනවාහරි ප්‍රශ්නයකදි කතා කරන්න ගියාම ඡන්දය මට විරුද්ධව නේද ප්‍රකාශ කළේ කියා. මා නම් දැනගෙන තමයි ඒ අවස්ථාවේ ඩෙනට් මහතා සභාපති කරන්න හැදුවේ. එතුමා කවදා හරි අපේ පැත්තට එනවා කියා. මොකද අපි දන්නවා එතුමා මේ පැත්තට එනවා කියා. එමනිසා තමයි මා ඒ ගැන සතුටු වෙනවා. අපි ඒ අවස්ථාවේ එතුමා සභාපති කරන්න කියා කළාට එතුමා අපිට සහායෝගය දෙන්න රජයට සහායෝගය දෙන්න පැමිණ තිබෙනවා. මා හිතන විදියට එතුමා ඒ අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා කරන වැඩපිළිවල ගැන එතුමාට ලොකු විශ්වාසයක් තිබෙනවා. අපිටත් ලොකු විශ්වාසයක් තිබෙනවා. අන්න එ තීරණයට අපි ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. හොඳ රටක් දැන් අවශ්‍ය වෙලා තිබෙන්නේ. පක්ෂ පාට භේද නෙමේ. අපේ ශ්‍රී ලංකාව ගොඩ නගන්න. අපේ ශ්‍රී ලංකාව ගොඩ නගන කොට පාර්ලිමේන්තු මැතිවරණයෙන් පසු ශ්‍රී ලංකා වාසි සියළුම දෙනා

සංවර්ධන කිරිමේ කටයුත්තට මුහුණ දිලා අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට සහායෝගය දෙන්න ඔබතුමා කොහේ හරි ඉඳගෙන. ඇත්තටම අම්බලන්ගොඩ සංවරධන කටයුතු වලදී ඔබතුමා සහායෝගය ලබා දුන්නා. අම්බලන්ගොඩ සංවර්ධනයේදි ඉදිරියේදි එකතුවෙලා කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා. ඔබතුමා ඒ ගත්ත තීරණයේදි ඔබතුමාගේ සුභ සිද්ධිය සඳහා ගත්තා නම් අපි ඒ ගැන කනගාටු වෙන්න ඕන නැහැ. එමනිසා ඔබතුමා ඒ නිවැරදි මාර්ගයේ යන්න ගනු ලැබූ තින්දුව සම්බන්ධයෙන් සුභාෂිංසනය එක් කරනවා. ඉදිරියේදි අපේ අම්බලන්ගොඩ සංවර්ධනය කරන්න ඔබතුමාට කරන්න පුළුවන් සහායෝගයක් ලබා දෙන්න කියා ඉල්ලා සිටිනවා. ඔබතුමාට සුබ අනාතගතයක් ප්‍රාර්ථනා කරනවා.

<u>ගරු නාගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා කතා කරමින්</u>

අපේ නගර සභාවේ කාලයක් විපක්ෂ නායක ධුරය දරමින් කටයුතු කළා. කොයි වේලාවකවත් අපි ගරු නගරාධිපතිතුමාට අකුල් හෙලිමක් සිදු වෙලා නැහැ. එතුමා නිතරම කිවුවේ ඔබතුමාට මා ශක්තියක් වෙනවා. හොඳ දෙයට මා සහායෝගය ලබා දෙනවා. කිසිම දෙයකට බය වෙන්න එපා. අපේ සහායෝගය අපි ලබා දෙනවා කියන එක තමයි නිතරම එතුමා කිවුවේ. විපක්ෂයක් විදියට කවදාවත් එතුමා අකුල් හෙලිමේ කටයුත්තකට ගියේ නැහැ. එතුමා අපි ගෞරව පූර්වකව පිලිගන්නවා එතුමාට සහායෝගය දෙන්න ලැබිම පිලිබඳව. මේ අවස්ථාවේදි මාත් එතුමාට ස්තුතිවන්ත වෙනවා. එතුමාගේ ගම්පෙරළිය වැඩ සටහනේදි හෙප්පුමුල්ල ප්‍රදේශයට යම්කිසි මුදලක් වැය කරලා ඒ පාරක් සකස් කිරිමේ කටයුතු කළා. එතුමාට මා ස්තුතිය මේ අවස්ථාවේදි පුද කරනවා. එතුමා මා හිතන්නේ ලොකු අභියෝගයක් ඉදිරිපත් කළා. බැංකු ගිණුමක මුදල් තැන්පත් කරනවා කියා. එතුමා ගත් ඡන්ද සංඛ්‍යාවට වඩා වැඩි ගණක් ගන්නවා කියන එක. මා හිතන්නේ එතුමා ලොකු අභියෝගයක් ඉදිරිපත් කළේ. එතුමා දක්ෂ දේශපාලනඥයකු වශයෙන් අපිට දැක ගන්නට හැකි වෙයි එතුමාගේ අභියෝගය මැතිවරණ ප්‍රතිඵල අනුව කුමක්ද කියන එක. එතුමාට අපිත් සමඟ මෙතෙක් කල් කටයුතු කරලා සුහදව ඇසුරු කිරිම සම්බන්ධව අපි එතුමාට සුබ පතනවා. එතුමාට අපි කියන්නේ නැහැ දේශපාලනයෙන් සමුගන්න කියා. දක්ෂ හමුදාවේ නිලධාරියෙක් විදියට එතුමාට අතිගරු ජනාධිපතිතුමාට ශක්තියක් වෙන්න පුළුවන්. ඒ කටයුත්තට උර දෙන්න කියා එතුමාගෙන් ඉල්ලිමක් කරමින් එතුමාට සුබ පතනවා.

<u>ගරු නාගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>

අපි සමඟ දිර්ඝ කාලයක් කටයුතු කර අද දින සමුගැනිම සිදු කරන ඩෙනට් පනියන්දුවගේ මහතාට සුභාෂිංසන එකතු කරනවා. මා ඔහුව හඳුන්වනවා හිත හොඳ දඩම්බරයෙක් හැටියට. දේශපාලන පක්ෂය කුමක් වුවත්. ඔහු අප සමඟ සහායෝගයෙන් කටයුතු කළා. ඔහු අද ජාත්‍යාන්තර වේදිකාවක කළයුතු කතාවක් අද අපිට කියා දුන්නේ. කමක් නැහැ. අද ඔහුගේ අවසන් හමුවිම අපේ නගර සභාව තුළ. කෙසේ වෙතත් ඔහුගේ අනාගතයට මා සුබ පතනවා. ඔහු හොඳ ශක්තිමත් ආර්ථිකයක් තිබෙන පුද්ගලයෙක්. එමනිසා ඔහුට දේශපාලනය කළත් එකයි නැතත් එකයි. මට ඔහුගේ ඊළඟ ගමන් මාර්ගය පිළිබඳ ඔහු කරන ලද මට පුද්ගලිකව පිළිගන්න බැහැ. ඔහු කියනවා මා යන්නේ කොන්ද කෙලින් තියාගෙන වැඩ කරන නායකයෙක් ළඟට කියා. මා දන්නේ නැහැ මේ නගර සභාවක් තුළ මෙය කතා කරන්න පුළුවන්ද නැතිද කියන එක. පසුගිය කතා දැක්කාම මට මේ අදහස් ඉදිරිපත් කරන්න අවස්ථාව ලැබෙයි කියා මා විශ්වාස කරනවා. කොන්ද කෙලින් තියෙන නායකයෙක් කිවුවාම ප්‍රශ්නයක් තිබෙනවා නම් කියන්න. කුටු කුටු ගාන්න එපා. විරෝධතාවයක් තිබෙනවා නම් කියන්න.

<u>ගරු නාගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>

මෙහෙමයි . දැන් ඔබතුමා මෙතුමා වෙනුවෙන් මට කතාව ඉදිරිපත් කරන්න දුන්නේ නැහැ. හරිද ? ඔබතුමාත් දේශපාලන කතන්දර ගෙනවා. මට මෙතුමා සමඟ දූරකථනයෙන් වත් කතා කරන්න බැරුව හිටියේ. හිත නරක් වෙලා. මට ගොඩක් දේවල් මෙතුමාට කියන්න තිබුණා. ඔබතුමා ඒ අවස්ථාව නැති කළා. දැන් ඔබතුමාත් දේශපාලන කතන්දරයක් නේ ඇඳලා ගන්නේ මෙතැන. මෙහි හඩ මා කොහොමත් අවදි කරනවා. මෙතුමා වෙනුවෙන් මට ගොඩක් දේවල් කතා කරන්න තිබුණා.

**<u>නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

ඉතාම සංවරව මා කතාව කරන්න පටන් ගත්තේ. නමුත් නොයෙකුත් බාධා පැමිණෙනවා. මා ඒවාට සැලෙන්නේ නැහැ. අපි පසුගිය වකවානුව තුළ දැක්කා. පසුගිය කාලයේ දැක්කා කොන්ද කෙලින් තියාගෙන වැඩ කරන නායකයෝ වැඩ කරපු විදිය. ඉතිං එකයි මා ඩෙනට් පනියන්දුවගේ මහතාට කිවුවේ. මා දේශපාලන කතා කරන්නේ නැහැ. මට විස්තර තියෙනවා කියන්න. නම්ටික විතරයි මා කියන්නේ. නම්ටික විතරයි මා කියන්නේ. කරුණාඅම්මාන් , එම්.සි. සී. නාමයෝජනා . මා දන්නවා ඔබලා විසි දෙනාම මට විරුද්ධ බව. මා කියන්නේ මාතෘකා ටික විතරයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ඔබතුමා මෙතුමා ගැන කතා කරන එක නතර කරලා දේශපාලන කතා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

ඔබතුමලාට මා කියන දේවල් දරා ගන්න බැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

නිශ්ශබ්ද වෙන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ඔබතුමා මට කතා කරන්න දුන්නේ නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

මා කිවුවේ වචන තුනයි. ඒ වචන ඔබලාට දරා ගන්න බැහැ. ලංකාවේ දේශපාලනය ගැන.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ඔබතුමාට ඕන දෙයක් කියන්න පුළුවන් වල්පල් . එවාට පිළිතුරුත් ලැබෙන බව මතක තියා ගන්න. එකනිසා මෙය ඉවර කරන්න බැහැ. එමනිසා නවත්වන්න ඕක. මෙතුමා වෙනුවෙන් කතා කර ඉවර කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, දැන් අපිත් කතා කෙරුවා. මෙතුමාට අපි සුබ පැතුවා. අපි කිසිම දේශපාලන පක්ෂයකට කතා කෙරුවේ නැහැ. අපි එතුමාගේ හොඳ කිවුවේ. එච්චරයි. ඉතිං ඒ විදියට කතා කරන්න හැමෝම. අරවා මේවා කතා වැඩක් නැහැ කාගේවත්

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

මට ඔගොල්ලන්ගේ උපදෙස් එපා. විරෝධතාවයක් තිබෙනවා නම් දක්වන්න. මා කියපු කාරණා ඇත්ත.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ ඔබතුමා කතා කරන්න. ඊළඟට පිළිතුරු ඔබතුමාට ලැබෙයි. හරි ඔයා කතා කර අවසන් කර වාඩි වෙන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

මා එකයි කිවුවේ එතුමා දඩබ්බරයෙක් කියලා. සහෝදර මන්ත්‍රිවරයෙක්. මට කියන්න අයිතියක් තිබෙනවා. එතුමා යම් ගමන් මාර්ගයක් තෝරා ගත්තා නම් එය හරිද වැරදිද . මා කත් ඇදපුවා , මා පොස්ටර් ගහපුවා අරවා මේවා එවා කියන්න පුළුවන්. මට වචන පේළි තුනක් කියන්න තහනම්. මේකද ප්‍රජාතන්ත්‍රවාදය. මේක නෙමේ ප්‍රජතන්ත්‍රවාදය.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ප්‍රජාතන්ත්‍රවාදය එකක්. සභා රීති එකක්. ඒක තේරුම් ගන්න. අපි පුළුවන් තරම් ඉක්මනට කෙටියෙන් මෙය කතා කර අවසන් කරන්න. නැතිනම් ඉතිරි ටිකක් අවසන් කරන්න බැරි වෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඉනෝකා ක්‍රිෂාන්ති මහත්මිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, එතුමා දේශපාලනයෙන් ඉවත් වීම අපට ඉතාමත් පාඩුවක් සේම දුකක්. එතුමා ගනු ලැබු තීරණය එතුමාගේ පැත්තෙන් සාධාරණයි කියා සිතනවා. මා එතුමාට සුබ පතනවා

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, වසර දෙකකට ආසන්න කාලයක් මේ නගර සභාව නියෝජනය කරන ලද ගරු ඩෙනට් පනියන්දුවගේ මන්ත්‍රිතුමා අද එතුමාගේ මන්ත්‍රි ධූරයෙන් ඉවත් වෙලා යන මොහොතේ අද එතුමාගේ නගර සභාවේ අවසන් දේශපාලන කතාව. අප සියළු දෙනාටම ඉතාමත් කනගාටුදායක මොහොතක් . වාද විවාද කිරිම නොවේ. දේශපාලන පක්ෂ පාට ඇඳ ගැනීමක් නොවේ. එතුමා මොන පක්ෂයක් නියෝජනය කළත් අද එතුමා මොන පක්ෂය නියෝජනය කළත් එය එතුමාගේ කැමැත්ත. අපි නගර සභාවක් විදියට මේ මන්ත්‍රිතුමා පිළිබඳව දැඩි කනගාටුවක් දැඩි කනස්සල්ලක් තිබෙනවා. මොකද මේ සභාව නියෝජනය කරලා මේ වසර දෙක තුනක මේ සභාව නිසි මගට ගන්න, මේ නිලධාරින්ගේ ක්‍රියාකාරිත්වය නිසි මගට යන්න එතුමාගේ මට්ටමින් විශාල උත්සාහයක් දැරුවා. ඒ ගැන අපි කෘතඥ වෙන්න ඕනේ. විපක්ෂ නායකයෙකු වශයෙන් ඒ වගකිම තමන්ගේ සහයන් සමඟ අවංකව ඉටු කළා කියා මට හැගෙනවා. එතුමා මාගේ සමකාලින මිත්‍රයෙක් වගේම ධර්මාශෝක විද්‍යාලයේ ආදි ශිෂ්‍යයෙක්. එතුමා දැනුත් උපන් පාසලට අද්විතිය සේවයක් දැනුත් කරමින් ඉන්නේ. ඒ වගේම උපන් බිමට සේවය කළේ අපට සම්බන්ධ වෙන්න කලින්. හමුදා නිලධාරියෙක් විදියට එක්තරා කාලවකවානුවක රත්නපුර ප්‍රදේශය එතුමා නියෝජනය කළා. සියළු ආයුධ නිල ඇඳුම් ඇඳලා ඒ සේවය ඒ රට ජාතිය වෙනුවෙන් කරලා තමයි මෙතැනට මේ දේශපාලනයට ඇවිත් තිබෙන්නේ. එතුමා හිතුවාට වඩා රට ජාතියට සේවය කරන හමුදා සේවයට වඩා දේශපාලනය කරනවාට වඩා

අමාරුයි. මා හිතන්නේ එතුමාට එය තේරිලා ඇති. අපිටත් එය තේරිලා තිබෙන්නේ. එතුමා උපන් ගමට ණය නැති පුද්ගලයෙක්. ඒ වගේ අය බිහි වෙන්නේ කලාතුරකින්. මොකද උපන් ගමට ණය නැති වෙන්නේ , ඉගෙන ගත් පාසැලට ණයගැති වෙන්නේ අවංකව වැඩ කිරිම නිසා. අවංකභාවයෙන් සේවයක් කරන්න ගමට ශක්තියක් තිබුණොත් විතරයි. අන්න ඒ ශක්තිය තිබෙන මිනිසුන් අර කියමනක් තිබෙනවා ලෝකයේ වදවී ගෙන යන සත්ව කොට්ඨාශයක් සිටිනවා ලෝකයේ . අන්න ඒ ගණයට තමයි අයිති වෙන්නේ. ඉතිං ඒ අයගේ ව්‍යාප්තිය අඩු වෙනවා. ඒ නිසා තව අඩු වෙනවා. ඒ එක උදාහරණයක්. ඉතිං එතුමා මොන පක්ෂයක් නියෝජනය කළත් මොන අතතියත් එතුමාට ඇති වුණත් එතුමා මේ දේශපාලනය තුළ රට පාලනය කිරිම තුළ සිටිය යුතු චරිතයක්. මොකද අවංකභාවය ඉතාමත්ම වැදගත්. අපේ මහජන පොදු වැසිකිළියේ එහා පැත්තේ තිබෙනවා බෝඩ් එකක්. අවංකභාවයට තවම දෙවැනි වෙන ආයුධයක් නිපදවා නැහැ කියා. එක තමයි ඇත්ත කතාව. එමනිසා එවැනි ආකාරයෙන් වැඩ කරන ලද පුද්ගලයෙක් නගර සභාවට. තමුන්ගේ ගමට. ඒ ඔහුගේ නික්ම යාම ඔහු මේ නගර සභාවෙන් සමුගැනිම ගමේ ජනතාවටත් සභාවටත් විශාල පාඩුවක්. එමනිසා මා ඉල්ලිමක් කරනවා ඒ ගමට කරන ලද සේවය ගමට රටට කරන ලද සේවය ඒ ආකාරයෙන් කරගෙන යාමට එතුමාට ශක්තියක් තිබෙනවා. එතුමා හොඳ ආර්ථික ශක්තියක් තිබෙන පුද්ගලයෙක්. එතුමා හොඳ ව්‍යාපාරිකයෙක් විදියට එතුමාට ඒ ශක්තිය තිබෙනවා. එතුමාගේ දේශපාලන ජීවිතය තුළ දේශපාලන කාලය තුළ හම්බ කර ගැනීමේ පරමාර්ථයක් තිබ්බේ නැහැ. ඒ සියළු දේ මන්ත්‍රිවරු අතර ජනතාව අතර බෙදලා දුන්නා. යම් යම් අඩුපාඩු දේශපාලනය කරන විට වෙනවා. අපේ ගම් පියසටත් කරිත්ත කන්ද ගම් ප්‍රදේශයටත් ලක්ෂ 30ක ප්‍රතිපාදන එතුමා ලබා දුන්නා. සෙල්ලම් මිදුල් සියළු දේ. තවමත් ඒවා ලැබෙමින් පවතිනවා. ඉතිං මා ඉල්ලිමක් කරලා වත් නෙමේ ඒවා ලබලා දුන්නේ. එතුමා දැක්කා ගමේ යම් යම් අඩුපාඩු. එතුමා මේ මෑතකදි පනියන්දුව කාපට් කළා. අම්බලන්ගොඩ අතුරු මාර්ගයක් කාපට් කර තිබෙනවා නම් ඒ පනියන්දුවේ පාර විතරයි කාපට් කර තිබෙන්නේ. ඒ වා ගරු කටයුතු දේවල් . ඔබතුමා අවුරුදු දෙකක් පමණ මෙහෙට සේවය කරලා සමු ගන්නා මොහොතේ ඉදිරිපත් කිරිම කෘතගුණ දත් මිනිසුන් විදියට . තමුන්නාසේගේ ඉදිරි අනාගතය සාර්ථක වේවා කියා ප්‍රාර්ථනා කරන අතර අපේ සමුගැනිම බොහොම වේදනාවක් කියා කියනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්.ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, අපේ විපක්ෂනායක ඩෙනට් පනියන්දුවගේ මහතා අපෙන් සමු ගන්නා දිනයේ නවක මන්ත්‍රිවරු විදියට එතුමා ගැන වචනයක් කියන්න ඕන. එතුමා මේ සභාවේ ගත් සමහර දේවල් වලදි සිංහයෙක් වගේ එඩිතරව නැගිට කතා කළා. මොකද නවක මන්ත්‍රිවරයෙක් විදියට මා ගරු කරනවා. මොන පක්ෂයේ සිටියත් . එතුමා සාර්ථක ව්‍යාපාරිකයෙක් . එතුමාට මේ දේශපාලනය කර වැඩක් නැහැ. මොකද එතුමා අතින් වියදම් කරගෙ තමයි මේ දේශපාලනය කරන්නේ. අපිත් ව්‍යාපාරිකයෝ විදියට දන්නවා. සමහර අවස්ථාව වල මේ මන්ත්‍රිකමක් අරගෙන මාගේ ව්‍යාපාරත් අත හැර තිබෙනවා. එහෙම වෙලා තිබෙනවා. එතුමාටත් එහෙම වෙලා ඇති. එතුමා ඉතා දක්ෂ එඩිතර කෙනෙක්. අවසාන මොහොතේ හරි අපේ අතිගරු ජනාධිපතිතුමාගේ දැත් ශක්තිමත් කරන්න යාම ගැන සතුටු වෙනවා. ඔබතුමාගේ ව්‍යාපාර සියළුම දේවල් සාර්ථක වෙන්න කියා ප්‍රාර්ථනා කරනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

අපේ ගරු විපක්ෂ නායක ඩෙනට් පනියන්දුවගේ මහතා අප සමඟ එකතු වීම සම්බන්ධව මුලින්ම ඔබතුමා අප සාදරයෙන් පිළිගන්නවා. ඒ වගේම තමයි ඔබතුමා තර්කානුකූලව මේ සභාව තුළ යම් මතයක් දැරිම සඳහා දක්ෂතාවයක් ඇති පුද්ගලයෙක්. අද උදේ වුණත් ඒ යෝජනාවේදි

මන්ත්‍රීවරුන් නොදැකපු ඔබතුමා දැකපු යහගුණය ගමට අවශ්‍යතාවය කුමක්ද ඒ වෙනුවෙන් අපි දැරිය යුත්තේ මතය කුමක්ද කියන එක ඔබතුමා පැහැදිලිව ප්‍රකාශ කළා. එමනිසා මා දකින දෙයක් තමයි හොඳ මාර්ග උපදේශකයෙක් වශයෙන් ඔබතුමා කටයුතු කරනවා. මා 1997 වර්ෂයේ අම්බලන්ගොඩ නගර සභාවේ සභාපතිකමට පත් වුණේ. මේ අවුරුදු විසි ගණන තුළ අපි අයවැය යෝජනා ඉදිරිපත් කිරීමේදී ඒකමතිකව යෝජනා සම්මත කිරීමේදී අපිට අනුග්‍රහය ලබා දුන්නා. ඔබතුමා අපි විවේචනය කළ යුතුයි කියා සිතුනු අවස්ථාවලදී යහපත් විදියට විවේචනයක් කළා. අම්බලන්ගොඩ සංවර්ධනයේදී අපි අතර මොනයම් පක්ෂයකවත් වේවා අපි අතර මතයක් තිබ්බේ නැහැ. විය යුත්තේ අම්බලන්ගොඩ ජනතාවගේ සංවර්ධනය නම් ඔබතුමා ඒ අවස්ථාවේදී ඉදිරිපත් වෙලා තමන්ගේ මතය ප්‍රකාශ කළා. එහිදී අපි වුණත් ඒ දරන සාධාරණ මතය අපි වුණත් අනුමත කළා. සාධාරණ මතය මත අපි වැඩකටයුතු සිදු කිරීම තුළ අපි වැඩ කටයුතු කරගෙන යනවා. එමනිසා මා හිතනවා ආදර්ශමත් මන්ත්‍රීවරයෙක්. ආදර්ශමත් විපක්ෂ නායකවරයෙක් ඔබතුමා මේ අවස්ථාවෙන් නික්ම යාමෙන් සිදු වන්නේ. එමනිසා අපි ඔබතුමාට ආරාධනා කරනවා මේ ඉල්ලා අස්වීම පැත්තකට තියලා අප සමඟ රැදී සිටින්න කියා. අපි මේ තනතුරු දරලා තිබෙන්නේ ගමට සේවය කරන්න. මේ තනතුරු වලින් අම්බලන්ගෙඩ නගර සභාවට පත් වූ කිසිදු මන්ත්‍රීවරයෙක් එහෙම අපේක්ෂා නොකරන මන්ත්‍රීවරයෙක් හැටියට තමයි මා දකින්නේ. මට පෙර සිටි ගරු සභාපතිවරුන් ඒ සියළු නාගරික මන්ත්‍රීවරුන් මේ ප්‍රදේශයේ ගරුත්වය රැකගෙන ඒ සියළු කටයුතු සිදු කළා. ඒ ඔවුන් අනුගමන කරන ලද සියළුම ක්‍රියාදාමයන් ඔබතුමා අනුගමනය කළා. එමනිසා මා ඔබතුමාට ආරාධනා කරනවා. නැවත වරක් සිතා බලන්න. අපි පක්ෂ වලින් පත්වෙන බව ඇත්ත. මේ ස්ථානයට පත්වුණේ ජනතාවට වැඩ කරන්න. ජනතාවට පොදු දෙයක් කරන්න. හරිදේ කිරීම තුළ තමයි අපි බලාපොරොත්තු වෙන්නේ. එමනිසා අපි ඔබතුමාගෙන් නැවත ඉල්ලා සිටිනවා මේ තීරණය සම්බන්ධව. පක්ෂ අතර ප්‍රශ්න තිබෙනවා. ඔබතුමාට වෙච්ච ප්‍රශ්නයම අපි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සිටම අපි අවුරුදු විසි ගණනක් විදලා තිබෙනවා. ඒ තරම් බඩවැල කපලා බඩවැලද කැපුනේ කියා අහනවා. ඉතිං ඒ විදියට අපි කටයුතු කර තිබෙනවා. අපි දේශපාලන කරන්න පටන් ගත්තා නම් ඒ දේශපාලනයේදී පැමිණෙන බාධක අපි ගණන් ගත යුතු නැහැ. ඒ කි කරනවායි කියා කියන පුද්ගලයන් අද ඔබතුමා නරකයි කියන පුද්ගලයන් ඔබතුමා හරි කියා දකින්න පුළුවන්. එක නිකං අපි ක්‍රීඩාංගණය හදනවා වගේ. අපි ක්‍රීඩාංගණය හදනකොට මේක මොකක්ද මේක මොකක්ද කියා බනිනවා. නමුත් එය හැදුවාට පස්සේ ඒක කොච්චර හොඳද කියා වාඩිවෙලා කතා කරනවා. මේ වගේ දෙයක් තමයි අපි මේ පොදු කටයුතු වලට ආවේ. මා ආසම නැති ප්‍රකාශ මේ මන්ත්‍රීවරු කිහිප දෙනෙකුම කිවුවා. දේශපාලනය කරන්න ඇවිත් තිබෙන්නේ ඔබතුමාට ඕන නැහැ. ව්‍යාපාර තිබෙනවා. මේ ඕන කෙනෙක්ට ව්‍යාපාර තිබෙන අය තමන්ට රක්ෂා තිබෙන අය. මා හිතන්නේ නැහැ මෙහි සිටින එක් කෙනෙකුවත් මෙයින් හම්බ කර ගැනීමට ආවා කියා. මොකද අම්බලන්ගොඩ කියන්නේ යම්කිසි කැපකිරීමක් කරන්න පුළුවන් පිරිසක් තමයි සිටින්නේ. මෙතැනට අද ඇවිත් තිබෙන්නේ. එමනිසා ඔබතුමාගේ කැප කිරීම අම්බලන්ගොඩ ජනතාවට ඉතා අත්‍යවශ්‍ය කාලයක තමයි මේ ඔබතුමා මෙතැනින් යනවා කියන්නේ. එමනිසා නැවත සලකා බලන්න කියා අපි ඉල්ලා සිටිනවා. අපේ පැත්තට එන්න අවශ්‍ය නැහැ. මාගේ පැත්තට එන්න නෙමේ. ඔය පුටුවේ ඉඳගෙන විශාල කාර්ය භාර්යක් නගරය වෙනුවෙන් කරන්න පුළුවන්. නිවැරදි දේ දකින්න පුළුවන. නිවැරදි දේ කරන්න පුළුවන්. කිසිදා ඒ කරන විවේචන අපි නිවැරදිව යනවා මිස ඒ විවේචන භාර නොගෙනෙන ඉඳලා නැහැ. මට මතකයි අපි අතර මුල්ම ප්‍රශ්නය ඇතිවුණේ . මහජන ක්‍රීඩාංගණයේ ක්‍රීඩාගාරයේ වහළ හුළඟට ගහගෙන ගිහින් තිබුණේ. එතකොට මෙහි ග්‍රේජ් එක මොකක්ද තහඩුව මොකක්ද කියා ප්‍රශ්න කිහිපයක් එන විට ඇවිල්ලා මන්ත්‍රීවරුන් ප්‍රශ්න කරන කොට මා ඔබතුමාට මා කිවුවා ඩෙනට් අපි මෙය ගිහින් බලා ඇත්ත තත්ත්වය තේරුම් ගන්න කියා. තේරුම් ගන්න කියා අපි ගිහින් බැලුවාට පස්සේ ඔබ කිවුවා මෙය ලොකු විනාශයක් වෙනවා මෙය හැදුවේ නැතිනම් අපි දෙගෙල්ලන්ටම තුන්ගොල්ලන්ටම මෙය නැති වෙනවා යන ප්‍රකාශය ඔබතුමා ඒ මොහොතේම ප්රකාශ කළා.

ක්‍රීඩකයෙක් හැටියට. එමනිසා මට ඇවිත් කිවුවා මෙය මොනා වුණත් කමක් නැහැ මෙය හදන්න. මොන විදියට හරි හදන්න කියන එක කිවුවා. කොච්චර විවේචනය කළත් අපිට දෙයක් නැති වෙනවා නම් අපේ පරපුරට නැතිවෙනවා නම් ඔබතුමාගේ හදවත අඩන ගතියක් තිබුණා. ඒ වෙනුවෙන් වැළපෙන ගතියක් තිබුණා. ඒ නිසා තමයි අර වගේ ප්‍රකාශන කළේ. එමනිසා ඒ වගේ සත්පුරුෂයෙකු අපේ නගර සභාවෙන් නික්මෙනවාට වඩා හොඳයි අපි මෙය ඉටු කරන එක. අපි රැකියාවකට නෙමේ මෙතනට ඇවිත් තිබෙන්නේ. අපි සියළු දෙනාටම හොඳ ආර්ථික තත්ත්වයක් තිබෙන අය. දේශපාලනයෙන් අපි හම්බ කර ගන්න නෙමේ අප සියළු දෙනාම මෙතැනට ඇවිත් තිබෙන්නේ. එමනිසා අපි ඒ තුළ එකට වැඩ කරන්න. මා අස්වැන්න එපා කියා ඉල්ලා සිටිනවා. ඔබතුමා පක්ෂයෙන් එලවා අයින් වෙන්න කිවුවා නම් කරන්න දෙයක් නැහැ. නමුත් සාධාරණව එය ඉෂ්ඨ සිද්ධ කිරිම යෝග්‍යයි කියා සිතනවා. මොකද යහපත් හදවතක් තිබෙන පුද්ගලයෙක් ඔබතුමා. ඒ වගේම යමක් තේරුම් ගන්න පුළුවන් . යමක් විසක්ෂණ බුද්ධියෙන් යුතුව යමක් විමසලා අපි ගතයුතු පියවර ගත්තා. අරුට ටොක්කක් අනින්න අර දේ නිසා අද මේ දෙන්නම් කියා නිසා නෙමේ විය යුත්තේ ජනතාවට මෙය ඒ කාරණය නම් සුහදශීලිව එය යහපත් අන්දමින් සිදු කළා. ඔබතුමාගේ තින්දුව ගැන නැවතත් සලකා බලන්න. ඔබතුමාට ඡන්දය දීලා තිබෙනවා යම් පිරිසක්. කෙසේ වෙතත්. ඒ පිරිසගේ බලාපොරෝත්තුව ඔබතුමා මේ අවුරුදු 4 මේ තනතුර දරයි කියා. දරනවා නම් ඒ දැරිම ගැන නැවත සලකා බලා මෙහි ඉන්න. සමහර වේලාවට මේ පුටුවෙන් ගියාම මේ පුටුවේ ඉන්නේ කවුද කියන එක අපි දන්නේ නැහැ. ඒ පුද්ගලයාගෙන් එවැනිම දෙයක් සිද්ධ වෙනවාද නැද්ද කියන එක අපිට සිතා ගන්න බැහැ. ඒ නිසා මේ ගැන නැවත සලකා බැලිම සුදුසු කියන ඉල්ලිම කරන ගමන් ඔබතුමා මේ ඉතිරි අවුරුදු දෙකත් මේ සභාව තුළ විපක්ෂ නායක තුළ එය ඉතාමත් සංතෝෂයෙන් එය කරන්න කියන ඉල්ලිම කරමින් ඒ වගේම අපේ පිළට එකතු වීම ගැන ඔබතුමා සාදරයෙන් පිළි ගන්නා අතර මා එය දැනගත් මොහොතේම දුරකථනයෙන් දැනුම් දීලා කිවුවා ඔබතුමා සාදරයෙන් පිළිගන්නවා කියා. හෙට වුණත් අපි සමඟ එකතු වෙලා වැඩ කළ හැකියි. මා ආරාධනා කරනවා අනිත් මන්ත්‍රීවරු පස්දෙනාටත් අප සමඟ එකතු වෙලා වැඩ කරන්න කියා. ඔබතුමලා හා තුමියලා අපි සාදරයෙන් පිළි ගන්නවා. අප සමඟ එකතු වෙන්න කියා ප්‍රකාශ කරමින් ඔබතුමාට සුභාෂිංසනය පල කරනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මා ප්‍රතිපත්ති ගරුකව මා ආ ගමනේදි හමුදාවෙන් ඉවත් වෙන්න ගත්තෙත් බලවත් කල කිරිමක් තුළ . ඒ කලකිරිම තුළ ගත් තින්දුව මත මා ඉවත් වුණා කොයි තරම් බාධක තිබුණත් . නැතිනම් මට තව අවුරුදු තුනක් ඉන්න තිබුණා. මාගේ හමුදාපතිතුමා මේ අම්බලන්ගොඩ උපන් කෙනෙක්. එතුමා දෙවැනියා තුන්වෙනියා කිවුව නිසා මා හමුදා මුලස්ථානයට පැමිණ ළඟින් වැඩ කළා. එතුමලා හමුදාවෙන් යනවිට මාත් හමුදාවෙන් අයින් වුණා. එතකොට මා බොහොම කෙලින් තින්දු ගත්තේ. අද මා හමුදාවේ සිටියා නම් පලවෙනි දහදෙනා අතර හමුදාවේ ජෙනරාල්. මට කිසි ගැටළුවක් නැහැ. හැබැයි මා අද සතුටු වෙනවා මා සිටින ආර්ථික ශක්තිමත් බව හා ව්‍යාපාරික ශක්තිමත් බව ගැන. මාගේ කැපවීම. එමනිසා මා මේ තින්දුව ගත්තේ මට කරන ලද ආසාධාරණය මට කරන ලද හැල්ලුව මට කරන ලද අපහාසය නිසා. මා ජීවිතයේ ඒ ගත්ත තින්දුව සාමාන්‍යයෙන් ජීවිතයේ මා තින්දු ගන්නේ එහෙමයි. කිසි කෙනෙකුගෙන් අහන්නේ නැහැ. මට වැරදුනේ නැහැ. නමුත් හමුදාවෙන් අයින් වෙන්න ගත්ත තින්දුවත් සමඟ මා අද හොඳ තැනක ඉන්නවා. එතකොට මා අද ගත් ව්‍යාපාරික තින්දුත් එක්ක මා අද හොඳ තැනක ඉන්නවා. මගේ තින්දු ගරු සභාපතිතුමා අද වෙනකම් ජීවිතයේ අවුරුදු 54ක් මා තනියම ගත් තින්දු. හමුදාවට යන්න ගත්තෙත් තනියම තින්දුව. අම්මාට පස්සේ තමයි කිවුවේ. ඒ තින්දු එකක්වත් මට වැරදිලා නැහැ. එමනිසා මා ඔබතුමාටත් සියළුම මන්ත්‍රීවරුන්ටත් මාගේ හෘදයාංගම ස්තුතිය පුද කරනවා. මාගේ දේශපාලන කැපිකිරිම මා මැනවින් ඉටු කළා කියා මා පිළිගන්නවා. මොකද හේතුව ඔබතුමා සමහරවිට දකිනවා ඇති මා පළාත් පාලන චක්‍ර ලේඛණ

මැනවින් කියවා එන්නේ. මට කොච්චර වැඩ තිබුණත්. මා රෑ 11.00ට පොත පෙරැලුවාම රෑ 1.00 වෙනකම් පොත කියවනවා. සියළුම පළාත් පාලන චක්‍රලේඛණ මා කියවනවා. මා මේ මන්ත්‍රිවරුන්ට කියනවා මේවා කියවන්න. මට කොච්චර කාර්ය බහුල වුණත් මා කියවනවා. මා රියදුරු සමඟ එනවා නම් මා පොත පෙරළාගෙන මා පොත කියවනවා. ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාව මා තුන් ගමනක් විතර කියවා තිබෙනවා. මේ කියවීම තුළ තමයි අපි යම්කිසි දේශපාලන අවබෝධයක් ලබා තිබෙන්නේ. කාර්ය බහුල පුද්ගලයෙක් වුණත් ව්‍යාපාරිකයෙක් වුණත් මා අම්බලන්ගොඩ ජනතාව මා කෙරෙහි වූ විශ්වාසය ඉෂ්ඨ කරන්න මා මේ සභාවට සහායෝගය දෙනවා. කොයි වේලාවේ වත් මා මේ අයට කියා නැහැ අර දේශපාලන කුහකකම කරන්න කියා. පක්ෂ දේශපාලනඥයෝ ඕනතරම් ඒ වගේ වැඩ කරනවා. මා සත්භාවයෙන් කවදාවත් මාගේ මන්ත්‍රිකම රැක්කා. ඔබතුමා කියන ඕන දෙයකට හැමදාම ඒ හොඳ පැත්ත කියා අඩුපාඩුවක් තිබ්බොත් ඒ අඩුපාඩුව කියලා හැම වේලාවේම ඔබතුමාට සහායෝගය දුන්නා. අවසාන වශයෙන් මේ කාල පරිච්ඡේදය තුළ ඔබතුමා ඇතුළු සියළු මන්ත්‍රිවරුන්ටත් , ඒ මා කෙරෙහි තැබූ විශ්වාසය , සහෝදර කම , අපේ ඒ සියළුම බැඳීම අපේ මේ නගර සභාවේ අදින් අවසන් වෙනවා. මෙතැනින් ගියාට අපි හොඳ යාළුවන්. සහෝදරයන්. අපිට දේශපාලන ප්‍රතිපත්ති තිබෙන්න පුළුවන් . අපිට දේශපාලන පක්ෂ පාට තිබෙන්න පුළුවන්. නමුත් අපි අම්බල්නගොඩට ආදරේයි. අම්බලන්ගොඩ ජනතාවට ආදරය කරනවා. අපි මේ සාමාජය තුළ එකතු වෙලා වැඩ කරන්නම්. මට අද නික්ම යන දවසේ මා කෙරෙහි තිබූ දේශපාලන කැප කිරිම පිළිබඳව මාගේ හොඳ දේ හොඳ විදියට දැකපු යම් දෙයක් අඩුපාඩු තිබුණා නම් ඒ අඩුපාඩු විදියට දැකපු සියළු දෙනාට මාගේ හෘදයාංගම ස්තුතියත් සියළු දෙනාගේම අනාගත කටයුතු සාර්ථක වේවා කියාත් වත්මන් ලේකම්තුමියත් ඒ අයත් අනිකුත් සියළුම දෙනාටත් ඔවුන්ගේ පවුල් වලටත් සුබ අනාගතයක් වේවා කියා ප්‍රාර්ථනා කරනවා.

**තීරණය**

2020 මහ මැතිවරණය සඳහා තරඟ වැදීමෙන් ඉවත්වීම, නගර සභාවේ විපක්ෂ නායක ධූරයෙන් ඉවත්වීම සහ 2020.07.07 වන දින පැවැත්වෙන මාසික සභා රැස්වීමට සහභාගීවීම සඳහා යන මැයෙන් ගරු නාගරික මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා විසින් ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාවේ දැනගැනීම පිණිස ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් ඉදිරිපත් කරන ලදී.

**12:07 සපිරි ගමක් ජනතා සහභාගීත්ව ග්‍රාමීය සංවර්ධන වැඩසටහන 2020 යටතේ පටබැඳිමුල්ල ග්‍රාම නිලධාරී වසම තුළ ධීවර ප්‍රජාව සඳහා දැල් මැසීමේ ගොඩනැගිල්ලක් ඉදිකිරීම සම්බන්ධව තාක්ෂණ නිලධාරි විසින් ඉදිරිපත් කර ඇති ලිපි ගොණුව සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

සපිරි ගමක් ජනතා සහභාගීත්ව ග්‍රාමීය සංවර්ධන වැඩසටහන 2020 යටතේ පටබැඳිමුල්ල ග්‍රාම නිලධාරී වසම තුළ ධීවර ප්‍රජාව සඳහා දැල් මැසීමේ ගොඩනැගිල්ලක් ඉදිකිරීම . තාක්ෂණසේවා නිළධාරි විසින් එවා ඇති ලිපිය සභාගත කිරිම. ප්‍රාදේශිය ලේකම් අම්බලන්ගොඩ. සපිරි ගමක් ජනතා සහභාගිත්වය ග්‍රාමිය සංවර්ධන වැඩසටහන 2020. පටබැඳිමුල්ල ග්‍රාම නිලධාරී වසම තුළ ධීවර ප්‍රජාව සඳහා දැල් මැසීමේ ගොඩනැගිල්ලක් ඉදිකිරීමට ලක්ෂ 20යි. ව්‍යාපෘතිය ඉදිකිරිමට සකස් කළ ඇස්තමේන්තුව ලක්ෂ 2239331.91 ක මුදලක් වැයවන අතර සපිරිගම වැඩසටහන යටතේ වෙන්කරන ලද මුදල සඳහා වෙන්කර ඇත්තේ 1980000/= ක ප්‍රතිපාදනයක් පමණි. මෙම වැඩසටහන නිමා කිරිම සඳහා ඔබ ආයතනයෙන් දායකත්වයක් දැක්වීමට හැකියාව තිබේද යන්න

පිළිබඳව මාවෙත දන්වා එවන මෙන් ඉල්ලා ඇත. ඒ අනුව 2.1, 2.2, 5.2 සහ 8.1 යන අයිතමයන් ඔබ ආයතනය මඟින් ඉටු කර දිය හැකි නම් එකඟතාවය ලබා දෙන ලෙස ඉල්ලා සිටි. ඒ අනුව අනුව 2.1, 2.2, 5.2 සහ 8.1 යන අයිතමයන් සඳහා නගර සභාව මඟින් ගිවිසුම්ගත වෙලා ඉතිරි මුදල ලබා දීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලෙස මා යෝජනා කරනවා. ස්ථිර කරන්න.

**තීරණය -**

සපිරි ගමක් ජනතා සහභාගීත්ව ග්‍රාමීය සංවර්ධන වැඩසටහන 2020 යටතේ පටබැඳිමුල්ල ග්‍රාම නිලධාරී වසම තුළ ධීවර ප්‍රජාව සඳහා දැල් මැසීමේ ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ ව්‍යාපෘතියේ ඇස්තමේන්තුවේ සඳහන් පරිදි **2.1**, **2.2**, **5.2** සහ **8.1** යන අයිතමයන්ට ඇස්තමේන්තුවේ සඳහන් ප්‍රමාණයන් (Quantity) පමණක් ගිවිසුම්ගත වීම සුදුසු බවට තාක්ෂණ නිලධාරී විසින් ඉදිරිපත් කර ඇති වාර්තාව සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවටත් ඒ සඳහා නගර සභාවෙන් මූල්‍යමය දායකත්වය ලබාදීම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**12:08 අම්බලන්ගොඩ, පෝරඹ, ලිඳමුල්ලවත්ත මාර්ගය නගර සභාවට පවරා ගැනීම සම්බන්ධව ඉදිරිපත් කර ඇති ලිපිගොණුව සභාගත කිරිම.**

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අම්බලන්ගොඩ, පෝරඹ, ලිඳමුල්ලවත්ත මාර්ගය නගර සභාවට පවරා ගැනීම සම්බන්ධව ඉදිරිපත් කර ඇති ලිපිගොණුව ඉදිරිපත් කර තිබෙනවා. ඒ මාර්ගයේ සිටින රුවන් ධර්මරත්න , ටි.එම්.ජී. ද සිල්වා, ආර්.එම්.එස්. නලින් ද සිල්වා . ටී. නිශාන්ත නලින් යන අය ඉල්ලීමක් කර තිබෙනවා. එය පවරා ගැනීමට සභාවේ අනුමැතිය ඉල්ලා සිටිනවා.

**ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි ඔය සිංහ ක්‍රිඩා සමාජයේ රංජි අයියාගේ නිවසට යන පාරද?

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඔව්.

**තීරණය-**

අම්බලන්ගොඩ, පෝරඹ, ලිඳමුල්ලවත්ත මාර්ගය නගර සභාවට පවරා ගැනීම සම්බන්ධව ඉදිරිපත් කර ඇති ලිපිගොණුවට අනුව එම මාර්ගය පවරා ගැනීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**12:09 කාර්යාල ගොඩනැගිල්ලේ උඩුමහලේ බිත්තිවල ආලේප කිරීමට පිලර් ලීටර් 60 ක් සහ Brillion White(එමල්ෂන්) තින්ත ලීටර් 60 ක් ලබාදෙන ලෙස ඉල්ලා වැඩ ක්ෂේත්‍ර**

**පරිපාලක ඒ.ඩබ්.හිමාල් ගුණවර්ණ මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

කාර්යාල ගොඩනැගිල්ලේ උඩුමහලේ බිත්තිවල ආලේප කිරීමට පිලර් ලීටර් 60 ක් සහ Brillion White(එමල්ෂන්) තින්ත ලීටර් 60 ක් ලබාදෙන ලෙස ඉල්ලා වැඩ ක්ෂේත්‍ර පරිපාලක ඒ.ඩබ්.හිමාල් ගුණවර්ණ මහතා විසින් ඉල්ලීමක් කර තිබෙනවා. එය තාක්ෂණසේවා නිලධාරි විසින් අනුමත කර තිබෙනවා. එයට සභාවේ අනුමැතිය ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

දැන් මෙහි වහළේ ප්‍රශ්නයක් තිබෙනවාද? මා දැක්කා මොකක්ද වාර්තාවක් තිබෙනවා. මෙහි ඇතුලත ප්‍රශ්නයක් තිබෙනවාද?

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙයට අපි අනුමැතිය ලබා දෙන්න. නගර සභා සේවකයන් මඟින් කරයි. කොන්ත්‍රාත් දෙන්න.

**තීරණය-**

කාර්යාල ගොඩනැගිල්ලේ උඩුමහලේ බිත්තිවල ආලේප කිරීමට පිලර් ලීටර් 60 ක් සහ Brillion White(එමල්ෂන්) තින්ත ලීටර් 60 ක් ලබාදෙන ලෙස ඉල්ලා වැඩ ක්ෂේත්‍ර පරිපාලක ඒ.ඩබ්.හිමාල් ගුණවර්ණ මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපිය අනුව එම ද්‍රව්‍ය ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**12:10 ගාල්ල මහා නගර සභා පරිශ්‍රයේ පිහිටා ඇති ජාතික විගණන උප කාර්යාලයේ ඇති NQSA221875 අංක දරණ Canon මුද්‍රණ යන්ත්‍රයට ටෝනර් 01 ක් ලබාදෙන ලෙස ඉල්ලා ජාතික විගණන උප කාර්යාලය විසින් එවා ඇති ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ගණකාධිකාරි, අම්බලන්ගොඩ කියා ලිපියක් එවා තිබෙනවා. ජාතික විගණන උප කාර්යාලය. නගර සභාව , ගාල්ල. මුද්‍රණ යන්ත්‍ර සඳහා ටෝනර් එකක් ලබා ගැනීම. ගාල්ල නගර සභා පරිශ්‍රෙය් පිහිටා ඇති ජාතික විගණන උප කාර්යාලයේ ඇති NQSA221875 අංක දරණ Canon මුද්‍රණ යන්ත්‍රයට ටෝනර් 01 ක් ලබාදෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටි. කියා විගණන අධිකාරිවරයා විසින් ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

එය ලබාදෙන්න .

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එකඟයි. එය ලබා දෙන්න.

**තීරණය-**

ගාල්ල මහා නගර සභා පරිශ්‍රයේ පිහිටා ඇති ජාතික විගණන උප කාර්යාලයේ ඇති NQSA221875 අංක දරණ Canon මුද්‍රණ යන්ත්‍රයට ටෝනර් 01 ක් ලබාදෙන ලෙස ඉල්ලා ජාතික විගණන උප කාර්යාලය විසින් එවා ඇති ලිපිය අනුව ටෝනර් 01 ක් ලබාදීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**12:11 නගර සභා කාර්යාල ගොඩනැගිල්ලේ අලුත්වැඩියා කටයුතු සඳහා කතිර පලංචි 50 ක් (කතිර සහ උඩට දමන තහඩු සහ සම්බන්ධිත කොටස් සමග) සහ අඟල් 1 ½ විශ්කම්භය සහිත 20mm Heavy Duty G.I.බට 30 ක් සමග Clip 60 ක් ලබාදෙන ලෙස ඉල්ලා තාක්ෂණ සේවා නිලධාරී සඳුන් ගුණවර්ධන මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපිය අනුව G.I.බට උපයෝගී කරගනිමින් එම කටයුතු සිදුකිරීම සුදුසු බවත් ඉහත ද්‍රව්‍ය ලබාදීමට අනුමැතිය ලබාදීම**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නගර සභා ගොඩනැගිල්ලේ අලුත් වැඩියාවට පලංචි අවශ්‍යව ඇත. එය මිලට ගතහොත් වැඩි වියදමක් වැය වෙයි. එය සාදා ගැනිමෙන් දිර්ඝ කාලයක් ප්‍රයෝජනයට ගත හැකිය. කතිර පලංචි 50 ක් (කතිර සහ උඩට දමන තහඩු සහ සම්බන්ධිත කොටස් සමග) සහ අඟල් 1 ½ විශ්කම්භය සහිත 20mm Heavy Duty G.I.බට 30 ක් සමග Clip 60 ක් ලබා දෙන ලෙස ඉල්ලිමක් කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

එක හොඳයි . එය ලබාදෙන්න . මෙය බටවලින් ලබා ගන්න තින්දු කරනවා.

**තීරණය-**

නගර සභා කාර්යාල ගොඩනැගිල්ලේ අලුත්වැඩියා කටයුතු සඳහා කතිර පලංචි 50 ක් (කතිර සහ උඩට දමන තහඩු සහ සම්බන්ධිත කොටස් සමග) සහ අඟල් 1 ½ විශ්කම්භය සහිත 20mm Heavy Duty G.I.බට 30 ක් සමග Clip 60 ක් ලබාදෙන ලෙස ඉල්ලා තාක්ෂණ සේවා නිලධාරී සඳුන් ගුණවර්ධන මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපිය අනුව G.I.බට උපයෝගී කරගනිමින් එම කටයුතු සිදුකිරීම සුදුසු බවත් ඉහත ද්‍රව්‍ය ලබාදීමට අනුමැතිය ලබාදීම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් කළ යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**12:12 අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයේ අලුත්වැඩියා කටයුතු සම්බන්ධව තාක්ෂණ සේවා නිලධාරී සඳුන් ගුණවර්ධන මහතා විසින් ඉදිරිපත් කර ඇති වාර්තාව සභාගත කරන ලදී.**

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයේ අලුත්වැඩියා කටයුතු සම්බන්ධවයි. උඩුමහලේ අලුත් වැඩියා කටයුතු මේ වන විට සිදු වෙමින් පවතී. මෙම ගොඩනැඟිල්ලේ අලුත් වැඩියා කටයුතු සිදු වෙමින් පවතී. මෙම ගොඩනැඟිල්ලේ කොන්ක්‍රීට් පුවරු වේ. එය ෂැලැබ් එක පුපුරා නිරික්ෂණය විම නිසා 2017 වසර වලදී මේ සම්බන්ධව වාර්තාවක් ලබා ගන්නා ලදී. මේ සම්බන්ධව ප්‍රධාන ඉංජිනේරුතුමාගේ වාර්තාවෙන් පසු NBRO ආයතනයේ නිරික්ෂණයෙන් පසු ප්‍රදාන ඉංජිනේරුතුමා විසින් වාර්තා කරන ලද්දේ මෙම ගොඩනැඟිල්ල අලුත්වැඩියා කළ හැකි නමුත් වගකිමේ කාලය ගැන කිව නොහැකි බවත්. අලුතින් මෙම ගෙඩනැඟිල්ල ඉදිකිරිම සුදුසු බවත් ලෙස සඳහන් වේ. ඒ සඳහා උඩු මහලේ අලුත් වැඩියා කටයුතු සඳහා කාර්යයන් සිදු කිරිම සඳහා කාර්යාල කටයුතු සඳහා ගෙන යන ලදී. නමුත් නව සභාවක් පත්විමෙන් පසු මෙම කාර්යාලය අලුත්වැඩියා කටයුතු සිදු කර නැවත කාර්යාලය ස්ථාපිත කළ යුතු බවට සභා අනුමැතිය ලබා ගන්නා ලදී. මේ සඳහා ඇස්තමෙන්තු සකස් කර ඉදිරිපත් කරන ලෙස තාක්ෂණ නිලධාරින් වන අපට දැනුවත් කරන ලදි. මේ ගොඩනැඟිල්ල පරණ ගොඩනැඟිල්ලක් වන බැවින් එහි පුපුරා ඇති අලුත් වැඩියාවන් සිදු කර ඒ පුරාවට සිදු කළ යුතු අලුත්වැඩියාවන් මොනවාදැයි ඉංජිනේරුතුමාගෙන් උපදෙස් ගන්නා ලදී. එහිදි එතුමා විසින් ප්‍රකාශ කරන ලද NBRO ආයතනයෙන් මේ සඳහා නිර්දේශ ලබා දි ඇති බැවින් මෙහි ව්‍යුහමය නඩත්තු කටයුතු සඳහා නිර්දේශ හා පිරිවිතර ලබා ගන්නා ලෙසයි. මෙසේ කාලය ගෙවි යමින් තිබියදි කිහිප විටක් ඉංජිනේරුතුමා පැමිණ පරික්ෂා කළද අපහට ඇස්තමේන්තු සකස් කිරිමට නිසි උපදෙසක් නැත. අ NBRO ආයතනයේන් පැමිණ පරික්ෂා කර හර්ෂන මහතාගේ ඊමේල් ලිපිනයට පුපුරා ඇති පුවරුව ආසන්නයේ ඇති බිම් ආධාරක දෙකක් බිම් මහලේ සවි කළ යුතු බවත් එහි සවිස්තරාත්මක සැලසුම් දත්ත පමණක් එවා තිබිණි. මේ වන විට හර්ෂණ මහතා විසින් එහි පිටපතක් ලබා ගෙන ලේකම්තුමියට භාර දී ඇත. මේ ආධාරක පිහිටුවිය යුතු ආකාරය පිළිබඳව නිසි උපදේශයක් හෝ ලිඛිතව ලබා දි නොමැති අතර එම උපදේශයන් ලබා දීමට රු.65000/= ක බිලක් ඉදිරිපත් කර ඇත. එම මුදල ගෙවිමෙන් පසු උපදේශ ලිඛිතව ලබා දෙන බවට ලේකම්තුමියට වාර්තා කර ඇත. එම NBRO වාර්තාව ලැබුණු පසු සැලසුම් ප්‍රධාන ඉංජිනේරුතුමා විසින් උඩු මහලේ ආධාරක යෙදිම සුදුසු බවට වාර්තා කර ඇත. මෙම ආධාර සඳහා අනුමැතිය ලබා ගැනීම සඳහා බිම් මහලේ වැඩ කටයුතු සඳහා ඉංජිනේරුතුමාගේ වැඩ ඇස්තමේන්තු ඇතිව සකස් කිරිමට ඇති බවත් ඇස්තමේන්තු සඳහා සිමාවන් පනවා ඇති බවත් ( මාගේ දැනිමේ හැටියට හා නිරික්ෂණය වන ආකාරයට පහත සඳහන් අලුත්වැඩියාවන් ගොඩනැඟිල්ලේ සිදු කළ යුතුව ඇත.

01. බිම් මහලේ ආධාරක ඉදිකිරිමෙන් පසුව පොළව සම්පූර්ණම ගලවා කොන්ක්‍රීට් කිරිම. බිම සිමෙන්ති යෙදිම සිදු කළ යුතුය.

02. බිත්තිවල තින්ත ආලේප කළ යුතුය.

03. උඩුමහලේ මේ වනවිට කපරාදු කර පොට් ඇඳ ඇති අතර පිලර් ආලේප කර සුදුසු අනුමත තින්ත වර්ණයක් ආලේප කළ යුතුය.

04. එසේම උඩු මහල වායු සමනය කළ යුතු අතර ඒ සඳහා ඉදිරිපස කෝරිඩොවේ පවතින කවුළු තුන ආවරණය කළ යුතුය.

05. උඩුමහලේ පෙර තිබූ සභා ශාලාව සභාපති , උප සභාපති, ලේකම් , ගණකාධිකාරි තනතුරු දරන කාර්යාලය බවට පත්කර වෙන්කළ යුතුය. ඒ කියන්නේ කලින් අපි රැස් වූ රැස්වීම් ශාලාවේ දැන රැස් වෙන්න ඉඩ මදියි. එමනිසා අපි වෙනත් තැනක් හදා ගන්නා තුරු මේ නිලධාරින්ට වෙන්කරන්න ඕනේ.

06. කාර්යාලය එක් එක් අංශ සඳහා වෙන්කිරිමේ කටයුතු සිදු කළ යුතුයි. ඔවුන්ගේ සනිපාරක්ෂක කටයුතු පද්ධති දෙකක් වෙන්කළ යුතුය.

07 උඩුමහලේ දැනට පවතින කොටස එසේම මේ වනවිට ඇතුළ පවතින කොටස අලුත් වැඩියා කටයුතු ප්‍රමාණයක් සිදු කර ඇති අතර නමුත් වහලේ පිටත පිහිටි අගුව කොටස සම්පූර්ණයෙන්ම ගලවා ඉවත් කර නඩත්තු අලුතින් කළ යුතුය. වහල කොටස් හා සිවිලිම

08. පිටත කපරාරුව දුර්වල වි ඇති බව නිරික්ෂණය වේ. එය කඩා ඉවත් කර අලුතින් කපරාදු කර අවශ්‍ය තින්ත ආලේපනයක් යෙදිය යුතුය.

ඉහත කරුණු සියල්ලම සහිත ඇස්තමේන්තුවක් ගරු සභාපතිතුමාගේ අනුමැතිය සහිතව ඉදිරිපත් කළ යුතුව ඇති බවත් මේ වන විට මිනුම් ලබා ගෙන ඇති බවත් , වහලේ අගුවේ මිනුම් ලබා ගැනීමට ඇති බවත් වාර්තා කරනවා. ලබා ගත් කොටස් සඳහා ඇස්තමේන්තු සකස් කරමින් සිටින බවත් වාර්තා කරනවා. ඒ අනුව මේ වැඩ කොටස් නිම කිරිමට සභාවේ අනුමැතිය ඉල්ලා සිටිනවා. ඒ වගේම ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනයෙන් ලිපියක් එවා තිබෙනවා. ලේකම්තුමිය වෙත. උක්ත හිසින් යුතුව ඔබ විසින් යොමු කරන ලද 2020.05.27 දරණ ලිපිය සම්බන්ධයෙන් ඔබ ආයතනයේ සිවිල් ඉංජිනේරු නයෝදා ගමගේ මෙනවිය සමඟ ඔබ විසින් අද දින පවත්වන ලද දූරකථන සාකච්ඡාව හා බැදේ. අම්බලන්ගොඩ නගර සභා ගොඩනැඟිල්ල සම්බන්ධයෙන් 2018 අපවිසින් පිළියල කරන ලද ඔබවිසින් ලබා දි ඇති වාර්තාවේ සඳහන් නිර්දේශයන්වේ. ඉංජිනේරු ක්ෂේත්‍ර පරික්ෂාව මෙම ආයතනයේ ඉංජිනේරුවන් විසින් 2020.02.23 දින පවත්වන ලදී. ඒ අනුව 1938 ගොඩ නගන ලද අම්බලන්ගොඩ නගර සභා ගොඩනැඟිල්ලේ සිදු කළ යුතු ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරිම සඳහා කළයුතු ව්‍යුහමය උපදෙස් සවිස්තරව ලබා දීම සඳහා අප විසින් ගෙවිමට ඇති රු.65718/= ක සහ 8% වැට් මුදල මෙම ආයතනයට ගෙවීමට කටයුතු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා. මෙම ආයතනයට ගෙවීම මඟින් චෙක්පත් නිකුත් කළ යුතු අතර එම චෙක්පත් රේඛණය කළ යුත්තේ ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය නමිනි. එම ආයතනයේ ලියා පදිංචි කිරිමේ බද්ද වේ. මේ ආයතනයේ ගිණුම මහජන බැංකුවේ තිඹිරිගස්යායේ වේ. එම ශාඛාවේ ගිණුමට බැර කර එහි පිටපතක් ව්‍යාපෘති කළමනාකරණ අංශයට යොමු කරන ලෙස එවන ලෙස ලිපියක් එවා තිබෙනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි , අපි මෙය අනුමත කර තිබෙනවානේ. අපිට හෙට වුණත් මෙය ලබා ගන්න පුළුවන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, දැන් කාලය ගිහින් නිසා මෙය ගෙවා ඉක්මනින් ලබා ගන්න. හැබැයි මෙහෙමයි අර ඉංජිනේරුතුමාට එවන්න මොකක්ද කියා තිබෙනවා. ඒවා ඕනේ නැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

තාක්ෂණසේවා නිලධාරි මහතාණෙනි , මේ වැඩය අපේ කට්ටිය දමා නේ කළේ. ඉතිරි ටිකත් අපි කොන්ත්‍රාත් දෙන්න ඕනේ නැහැ. අපිටම කරන්න පුළුවන්. එමනිසා ඉතිරි ටිකක් ඔගොල්ලන්ම ඇස්තමේන්තු හදලා මෙය සරලව අවසන් කරන්න. නැතිනම් මෙය ඇදෙනවා. මේ බාර් සම්බන්ධව සහ ඒ සම්බන්ධව උපදෙස් ගන්න. අනිත් ඒවා ටික ඔගොල්ලන්ම කරන්න. ඔගොල්ලන් දක්ෂයි. මේ අපේ සිටින සේවකයෝ සහ ඔගොල්ලන් දක්ෂයි. මේ ගොඩනැඟිල්ල ඇස්තමේන්තු කරලා ටෙන්ඩර් කළානම් ලක්ෂ 50කට පමණ මුදලක් යනවා. මෙයට ගියේ නැහැ ලක්ෂ 10ක්වත්. බඩු ගෙනවිත් අපේ සේවකයන් ලවා මෙය කර තිබෙන්නේ. ඉතිං අනිත් ටිකක් අපේ සේවකයන් ලවාම කර ගන්න. එමනිසා මුලින් වහළ ටික ඉවර කරන්න. අපේ පොඩි ඉලක්කයක් තිබෙනවා. එකත් කියන්න ඕන. ජාතික කියවීමේ මාසයේ තෑගි උත්සවය නගර සභාවේ පහත මහලයේ සිදු කරන්න. ඔක්තොම්බර් මාසයේ. අන්න ඒ ඉලක්කය සම්පූර්ණ කරන්න එකට අපිට උදවු කරන්න. බිම් එක දැම්මට අපි ඔයාට උදවු කරන්නම්. අපි ගිහින් හරි ඒ අයට කියා අත්සන් කරන්නම්. මෙහෙම දෙයක් තියෙනවා. ඉංජිනේරු මහත්වරු ගාවට ගියාම මෙය ටිකක් දුවනවා. ඇණෙනවා. ඊට වැඩියේ විශ්වාසයි ඔගොල්ලන්. මා පෙරේදා දිනයේ කිවුවා ඔබතුමාට වැඩ බලන වැඩ අධිකාරි තනතුරට පත්කරන්න පුළුවන්ද කියා බලන්න කියා. එහෙම කියලා තියෙන්නේ. එතකොට අනිත් දෙදෙනා ගෝලයන් බවට පත්වෙයි. වැඩ ටික ඒ අය ලව්වා ගන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, දැන් කණු සහ බිම් වලට NBRO එකෙන් එනවානේ. කරන්න මොකක්ද කියා. ඒ කියන්නේ ඉංජිනේරු එකෙන් ආවාට පස්සේ ආයේ යවන්න ඕන කියලද?

**තීරණය-**

අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයේ අලුත්වැඩියා කටයුතු සම්බන්ධව තාක්ෂණ සේවා නිලධාරී සඳුන් ගුණවර්ධන මහතා විසින් ඉදිරිපත් කර ඇති වාර්තාව ගරු සභාවේ දැනගැනීම පිණිස ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් ඉදිරිපත් කරන ලදී.

**12.13 අම්බලන්ගොඩ නගර සභාවට අයත් තනායම භූමියේ වසර 150ක් පැරණි ගසක් කපා දැමීම සම්බන්ධයෙන් ගම්වාසින් විසින් ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ. සෝභිත රංජිත් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මාගේ හිරේවත්ත කොට්ඨාශයේ ප්‍රශ්නයක් ඉදිරිපත් කරන්නේ. සභාවට යොමු කරන්න කියා. ලිපියේ තිබෙන්නේ හිරේවත්ත ගම්වාසින් .අම්බලන්ගොඩ තනායමේ පිහිටි අවුරුදු 150ක් පමණ පැරණි ගසක් කපා ඉවත් කිරිම සම්බන්ධවයි. අම්බලන්ගොඩ තනායමේ පිහිටි අවුරුදු 150ක් පමණ පැරණි ගසක් 2020.06.06 දින කවුරුන් හෝ විසින් කපා ඉවත් කර ඇත. මෙය නගර සභාව දැනුවත්ව නොදැනුවත්ව සිදු වුවක් ද බව ගම්වාසින්ට දැනුවත්ව පරික්ෂණයක් පවත්වන ලෙස ඉල්ලිමක් කර ඇත. මේ ගස අපි දන්න කාලයේ සිට තිබෙන පැරණි ගසකි. මේ ගස අවුරුදු 150ක විතර පැරණි ගසකි. ඒ දිනවල මා නිවසේ සිටියේ නැහැ. දැන්නම් මේ ගස කපා ඉවත් කර තිබෙන්නේ. එහිදි මට දැනගන්න ඕනේ . අපි මේ ඉඩම සභාවට බදු දිලානේ තිබෙන්නේ. එම බදු දිපු අයට පුළුවන්ද මෙච්චර පැරණි ගසක් කපා ඉවත් කරන්න පුළුවන්ද කියන එක මට දැන ගැනීමට අවශායි.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

අපි ඔය සම්බන්ධයෙන් වාර්තාවක් ලබන සභාවට ඉදිරිපත් කරනවා.

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභාවට අයත් තනායම භූමියේ වසර 150ක් පැරණි ගසක් කපා දැමීම සම්බන්ධයෙන් ගම්වාසින් විසින් ඉදිරිපත් කර ඇති ලිපියට අනුව ඒ සම්බන්ධයෙන් ලබන සභාවට වාර්තාවක් ලබා දෙන බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් තීරණය කරන ලදී.

- වෙනත් කරුණු

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, අපේ සභාවෙන් ගලිබවුසරය ලබා ගෙන තිබෙනවා මහ අම්බලන්ගොඩ පියසිරි ද සිල්වා මහතා. එතුමා එම සේවය ලබා ගන්න රු.4680ක මුදලක් බැඳ තිබෙනවා. සේවකයන් පැමිණ ඇවිත් කියා තිබෙනවා මෙහි අස්කරන්න දෙයක් නැහැ කියා. ඒ මුදල් නැවත ගෙවීම සඳහා කටයුතු කරන ලෙස මා ඉල්ලිමක් කරනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

එය මහජන සෞඛ්‍ය නිලධාරි හරහා ඉදිරිපත් කරන්න කියන්න.

**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

මහජන සෞඛ්‍ය නිලධාරි තමයි මෙය කියා තිබෙන්නේ.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඒ කියන්නේ ගෙවන්න බැහැ කියලා තියෙනවාද?

**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

නැහැ. සේවකයෝ ගිහින් තිබෙනවා මෙය අදින්න. මෙහි අදින්න දෙයක් නැහැ.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඔය ලිපිය ලේකම්තුමියට දෙන්න. අපි එය පරික්ෂා කර බලා මොකක්ද කරන්න පුළුවන් කියා බලන්නම්.

**ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී. ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මේ පුද්ගලයා ගරු සභාපතිතුමාටත් ලිපියක් එවා තිබෙනවා. මටත් පිටපතක් ලබා දී තිබෙනවා. ස්වයං රැකියා ස්ථානය නැවත ලබා දෙන ලෙස කරන ඉල්ලීමයි. එතුමා කියනවා වසර 10ක් පමණ කරවල වේලීම කළා. මා නිවස ඉදිරිපිට කරගෙන ගියේ. 2020.05.20 දින සිට පරික්ෂකවරු විසින් එම ස්ථානයේ කරවල වේලීම නතර කරන ලදි. එම ස්ථානය නිසා මෙහි රැකියාවේ යෙදුන පවුල් අටකට පමණ රැකියාව අහිමි වී ඇත. ඒ සියළු දෙනාම දුෂ්කරතාවයකට පත්ව ඇත. ගරු නගරාධිපතිතුමා ඇතුළු නාගරික මන්ත්‍රීතුමන්ලාගෙන් හා තුමියන්ලාගෙන් ඉල්ලා සිටින්නේ මෙම ස්ථානයේ නැවත කරවල වේලීමට හැකි ඉක්මනින් කටයුතු සලසා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඔය සම්බන්ධයෙන් මා පාරේ කරවල වේලන්න දෙන්න කියා මට බලයක් නැහැ.

**ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී. ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්**

කරවල වෙළඳාම නෙමේ. අවුරුදු අටක සිට කරවල වේලනවා.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මෙය පාරේ සිදු කරන නිසා වටේ තිබෙන අයගේ පැමිණිලි නිසා තමයි ගිහින් තිබෙන්නේ. එතකොට අපිට මෙයා ලිපියක් දී තිබුණා. එතන පල්ලෙහා කැල්ලක වේලන්න මට අවසර දෙන්න කියා. මා එය ආදායම් පරික්ෂක මහතාට දැම්මා. එය මෙතුමන්ලා නිර්දේශ කර තිබ්බෙ නැහැ. එය ලබා දෙන්න බැහැ කියා තමයි මට නිර්දේශ ලබා දී තිබෙන්නේ.

**ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී. ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්**

මා දන්නේ නැහැ . මේ පුද්ගලයෝ කාට ඡන්දය දෙනවාද කියා. මේ කොට්ඨාශය මාගේ කොට්ඨාශයට අයිති නැහැනේ. අවුරුදු අටක් මේ අය රැකියාව කර තිබෙන්නේ මෙහි. දැන් අවුරුදු අටක් නොදැකපු එක දැන් දකින්නේ ඇයි. අවුරුදු අටක් ස්වයං රැකියාව කර තිබෙනවා. ඒ අය එකෙන් තමයි ජීවත්වෙලා තිබෙන්නේ. පවුල් අටකුත් ජීවත් වෙලා තිබෙනවා. අනිත් එක එහෙම එකපාරට නතර කළාම පවුල් අටක් එකපාරට අසරණ වෙනවා. දැන් පුරුදු වෙලා තිබෙන්නේ යම් කාර්යකට නම් ඔබතුමාගේ ක්ෂේත්‍රය එක නම් ඔබතුමා දන්නේ එකනේ. එ අය අසරණභාවයට පත්වෙනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

එමනිසා තමයි මා මෙහි නිර්දේශ ලබා දෙන්න එතුමාලාට දුන්නේ. නිලධාරින් නිර්දේශ කරන්නේ නැතිනම් කරන්න දෙයක් නැහැ. ඔබතුමිය අවුරුදු අටක් කියනවානේ. ඔය ප්‍රශ්නේ අවුරුදු අටක් තිස්සේ කියනවානේ . ඔය ප්‍රශ්නය සභාපතිවෙලා මා අවුරුදු 25ක් 30ක් වින්දා. මාගේ නිවස ඉදිරිපිට මොරවළල් වෙලනවා. නිවසට වාඩිවෙන හැමෝම මොකක්ද මේ ගඳ කියනවා. අවුරුදු 20 ගණනකට පස්සේ මට එහට විසඳුම ලැබුණේ එයා වරායේ මේ සඳහා ස්ථානයක් ලබා ගැනීමෙන් පසු.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පි. ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, අපට බැරිද මොකක් හරි තැනක් ලබා දෙන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ඒ අය එම ව්‍යාපාරය කරනවා නම් සුදුසු පරිසරයක් ඒ සඳහා යොදා ගන්න ඕන. ඕවැනි අවස්ථාවකදි දැන් ඔබතුමියගේ නිවස ළඟ කළත් ඒ ගඳ පැතිරෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පි. ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , අපි ඕක කොහේ කළත් ඒ ගඳ පැතිරිම වෙනවානේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

දැන් කරවල වෙලනවානේ. ඒ සඳහා සුදුසු තැනකට ගිහින් වෙලුවාම හරි. මහජනතාවගේ පැමිණිලි නොඑන.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පි. ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>**

මටනම් අදාළ නැහැ. මා ලිපිය ගෙනත් දුන් නිසා තමයි කතා කළේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ඉඩම දෙන්න තමයි නිලධාරින්ට දැම්මෙ. නිලධාරින් එපා කියනවා නම් මා මොකක්ද කරන්නේ.

**ගරු නගර සභා මන්ත්‍රී ජී.ජී.ආර්. පේෂලා කුමාරි මහත්මිය කතා කරමින්**

ගරු සභාපතිතුමනි, නිවාස 76ක් තිබෙනවා එතන . නිවාස 76ක ඔය තිබෙන සෞඛ්‍ය තත්ත්වයේ අපහසුතාවය විඳගෙන දැන් අවුරුදු 10ක් තිස්සේ ඉන්නවා කියන්නේ පවුල් අටක් ජීවත් වෙනවා කියන්නේ පවුල් අටද නිවාස 76ක මහජනතාවද කියන එක ලොකු ගැටළුවක්. අපි සෞඛ්‍ය කමිටුවේදි මේ ගැන කතා කළා. පසුව මහජන සෞඛ්‍ය නිලධාරි මහතා ගිහින් එය සුදුසු නැහැ කියා කිවුවා. එතන පහළ තිබෙන ළිඳෙන් කිවුවා. එම ළිඳ වහන්න කියා ඒ අය කිවුවා. ඊට පස්සේ කිවුවා බැකෝ එක කැඩිලා කියා.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

මෙහි තිබෙන බඩවැල් ටික අර ළිඳට දමනවා. එකයි ප්‍රශ්නේ. හරි ප්‍රශ්නයක් ඕක.

**ගරු නගර සභා මන්ත්‍රී ජී.ජී.ආර්. පේෂලා කුමාරි මහත්මිය කතා කරමින්**

අනිත් එක හිතන්න එතැන මාළු කිලෝ 5000ක්. ඒ අය කියනවා මාළු කිලෝ 5000ක් අපි කපනවාලු . ඒවා ගිහින් පොදු වෙළඳපොළටලු දමන්නේ. ඉතිං එහි ගෙනහින් දමන්නේ ගෝෂර. එතකොට මාළු හෝදන වතුර. මා නම් එකට විරුද්ධයි.

**ගරු නගර සභා මන්ත්‍රී ඒ.පි. ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්**

මාගේ කොට්ඨාශයකුත් නෙමේ. මාගේ ඡන්දදායකයෝත් නෙමේ. මට ලිපිය ගෙනත් දුන් නිසා තමයි මා සභාවට ඉදිරිපත් කළේ.

**ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්**

ඔබතුමාගේ ඉදිරිපත් කිරිම හරි. අපි කාන්තා මන්ත්‍රිවරියන්. මොකද ඒ අයගේ ජිවනෝපායක්. පුළුවන්නම් ඒ වැඩය කරන්න අවස්ථාවක් සුදානම් කර දෙන්න. අර නිවාස 76ටත් කරදර වෙන්න බැහැ. අර අයට ජිවත් වෙන මාර්ගයක් අහිමි කරන එකක් හොඳ නැහැ. ඒ අයත් දරු පවුල් එක්ක ජිවත් වෙන එකනේ කරන්නේ. ඒ ගැන පොඩ්ඩක් ඔබතුමාගේ අවධානය යොමුකර ඒ අයට සහනයක් සලසා දෙන්න. අපිට ඒ අයත් ඕන. මේ අයත් ඕන. අපහසුතාවයට ලක්වෙනවා ඇති. ඒ කියන්නේ ඒ ගඳ උහුලා ගන්න බැරුව. නමුත් ඒ අය ඒ ගඳ විඳගෙන ඒ දේ නියැලෙන්නේ ජිවත් වෙන්න. එතකොට අපි ජිවන මාර්ගයක් අහිමි කිරිම ගැන ටිකක් හිතන්න ඕන. මොකද එත් දරු පවුල් කට්ටියනේ. එමනිසා මා ඔබතුමාගෙන් සාධාරණ ඉල්ලා සිටිනවා . ඒ අයටත් සාධාරණ විසඳුමක් ලබා දෙන්න කියා. එතැන සුදුසු නැතිනම් වෙන තැනක් ලබා දෙන්න. ඒ අයට ඕක කරන්න එපා කියනවාට වඩා ඒ අයටත් සුදුසු තැනක් ලබා දෙන්න. මොකද ඒ අයටත් මේ කැපවීම කරන්න එක පවුලකට හරි. ඒ අයත් දරු පවුල් හිමි අය. මේ අයගෙන් එම පවුල් 76ට කරදර වෙනවාට මා කැමති නැහැ. ගඳ උහුලන්න බැහැ. සෞඛ්‍ය පැත්තෙන් අපහසුයි.

**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, පොල්වත්ත බුද්ධ දත්ත මාවතේ සපත්තු කාණුවක් දමා තිබෙනවා. එයට මා ස්තුතිවන්ත වෙනවා. එහි කපපු පස්ටික තාම පාර මැද තිබෙන්නේ. ඊට උඩ හරස් පාරේත් කාණු

ගොඩ දමා දැන් සති දෙකකට වැඩියි. මා දන්නේ නැහැ . ගොඩ දමන්නේ තව අංශයක් . අදින්නේ තව අංශයක්. එහෙම ප්‍රශ්න තිබෙනවාද?

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මේ සපිරි ගමක් වැඩ සටහන යටතේද? ඒ අයට කියන්න මෙය ඉවත් කරන්න කියා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා කතා කරමින්</u>**

ඒ කොන්ත්‍රාත්කරන අය අස්කරයි. ඒ අය අස්කරන කතාවක් කිවුවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

කොන්ත්‍රාත්කරුවෙක්ද? ඒ අයට කියා අස්කරවන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, දැන් ඕකන්දේ ළිදක් හදන්න ගත්තා. දැන් මාස අටක් විතර වෙනවා. කොන්ක්‍රිට් බිම් බස්සා. ඉඩම් කොටසක් උඩ තිබෙනවා. දැන් වතුර පිරිලා. මාදුරුවෝ බෝවෙලා තිබෙන්නේ. මේ සම්බන්ධව මොකද මෙය පරක්කු වෙන්නේ කියා දැන ගන්න ඕන. නගර සභාවෙන් කිවුවා කරන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නැහැ . නගර සභාවෙන් නෙමේ කරන්නේ. කොන්ත්‍රාත් එකක් දුන්නා. මේ තාක්ෂණසේවා නිලධාරි මහතාණෙනි එය මොකක්ද?

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී  මහත්මිය කතා කරමින්</u>**

ඒය මානේ ඉල්ලා ගත්තේ. කොන්ත්‍රාත්කරන කෙනා ඇත්තටම ඒ සිලින්ඩර බස්සාගෙන ආවා. දැන් පසුගිය දිනවල කොන්ත්‍රාත් කරලා මුදල් අපහසුතාවයක් පැමිණියා. පළාත් සභාවෙන් පාරවල් හදපුවා. නිල සෙවණවල් හදපුවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

එය කරවන්න. ඩෙංගු මදුරුවෝ හැදෙනවා. මදුරුවන්ගෙන් ප්‍රශ්න එනවා. නගර සභාවට තමයි එහි බිල වැටෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී  මහත්මිය කතා කරමින්</u>**

මා අද ගියා එම නිවසට.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ගමේ දෙන්නා ගමේදි බේරා ගන්න. යනගමන් කතා කර බේරා ගන්න.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

මා දන්නේ නැහැ මෙතුමිය කරලා කියා.

**ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී  මහත්මිය කතා කරමින්**

මා කොන්ත්‍රාත් කරලා නැහැ. මැක්සි අරගෙන තිබෙන්නේ එය. ඕකන්දේ එක්කෙනෙක් අරගෙන තිබෙන්නේ.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

මොකද එය නොකළොත් එහෙම අසාදු ලේඛණයට දැම්මොත් හරි ප්‍රශ්නයක් වෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී  මහත්මිය කතා කරමින්**

ප්‍රජා මණ්ඩලය අරගෙන තිබෙන්නේ. අද උදේත් මා මෙය බලන්න  ගියා. ඔය කියන තරම් ඩෙංගු මදුරුවෝ නැහැ. එහෙම ප්‍රශ්නයක් නැහැ.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

ඩෙංගු මදුරුවෝ එන්නේ නැති එක හරි. කොහේවත් නැහැ. අවොතින් එහෙම ප්‍රශ්නයක් වෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී  මහත්මිය කතා කරමින්**

මා අද උදේත් කතා කළා. එයා කිවුවා මට තව මාසයක් දෙන්න . මා එය නිම කරන්නම් කිවුවා. නගර සභාවෙන් සතයක්වත් දිලා නැහැ. අපි සල්ලි දිලා හදනවා නෙමේ.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

නැහැ නගර සභා මුදල්. මුදල් ගෙනත් මෙය ගිය වසරේ දිපු මුදල්. දැන් කළුවඩුමුල්ලේ හා ඕකන්දේ වැඩ වලට බිල්පත් එන්නේ මේ වසරේ. එතකොට මට සිද්ධ වෙන්නේ දෙනවා කියන ලක්ෂ 15න් අඩු කරන්න මිසක ගිය වසරේ කළානම් ගිය වසරේම ගෙවිම ගන්නවා. මේ අවුරුද්දේ දෙනවා කිවුවා නම් මේ අවුරුද්දේම ගෙවිම ගන්න. සත්‍ය වශයෙන්ම වියදම කියන එකේ සම්පුර්ණ තාවය බලන්නේ මුල්‍යමය වශයෙන් ගෙවීම් කළාට පසු. නැතිනම් මෙය අවිච්ජේද මට්ටමට තමයි ඇවිත් තිබෙන්නේ. මා හිතන්නේ ගිය අවුරුද්දේ කළේ.

**ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී  මහත්මිය කතා කරමින්**

නැහැ මේ අවුරුද්දේ කළේ. ගිය අවුරුද්දේ ඇස්තමේන්තු කළාට මේ අවුරුද්දේ තමයි වැඩ පටන් ගත්තේ.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

ගිය අවුරුද්දට තමයි වැටෙන්නේ.

**ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී  මහත්මිය කතා කරමින්**

ගිවිසුම් ගැසුවේ මේ වසරේ.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

ගැටවවක් නැහැ. මෙහි ප්‍රශ්නය වෙලා තිබෙන්නේ අපි බැණුම් අහනවා. ඔබතුමාත් බැණුම් අහනවා. මෙතුමාත් බැණුම් අහනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී  මහත්මිය කතා කරමින්**

මා හොඳ චේතනාවෙන් ඕක කළේ. ගමට ළිඳ ඕන නිසා. මා ගිහින් අද මැක්සිට කැ ගැසුවා. අපිට කොමිස් තියාගෙන කරනවා නෙමේ. මේ වැඩය හරියට කරන්න.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

ලොකු වැඩක් නැහැ මෙහි.

**ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී  මහත්මිය කතා කරමින්**

එයාට වුණේ එයා මේ වසරේ තමයි ගිවිසුම් අත්සන් කළේ. ගිය අවුරුද්දේ අනුමත කළාට ගාල්ලට ගිහින් අනුමත වෙනකම් ඉන්න කිවුවානේ. අනිත් එක තමයි ප්‍රජා ශාලාව.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

තව එකක් ගස් කොළන් කපා පාරට දමා තිබෙනවා. දැන් සති දෙකක් විතර එවා ගෙනියන්නේ නැහැ. මෙය ගෙනියන්නේ නැතිනම් කපන්නත් එපා. මොකද කිසි ප්‍රශ්නයක් නැහැ. මා දැක්කා දැන් ඕකන්දේ වටරවුමේ වැටෙන්න යනවා. මෙය තැලිලලා ගස්කොළන් වලට වතුර වැටි ලිස්සා යනවා. එහි වගකීම නගර සභාවට එනවා. ආයේ මුකුත් නැහැ. එතනම ඉවර වෙනවා. කපන්න එපා ගෙනියන්නේ නැතිනම්. සුද්ද කරනවා නම් ඊට පස්සෙන්දා අයින් කර ගන්න.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

හිමාල් මහතා මෙය සුද්ද කරනවා නම් අයින් කරන්න. ඔගොල්ලන් හොඳ වැඩක් තමයි කරන්නේ. හොඳ වැඩය වුණත් භාගයට කළොත් නරක තත්ත්වයට එනවා.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

අනිත් එක තමයි ඔය වතුර ගන්න ගිහින් පාර කඩපු එක. දැන් අපේ ප්‍රජා ශාලාවට වතුර දුන්නානේ. එතැන කඩා දැන් කොක්කක් වගේ ගැට්ටක් තිබෙනවා. වාහන ඇවිත් මොනවා හරි හානියක් සිදු වුණොත් එහෙම එතනත් හානියක් වෙනවා. එමනිසා එයට කවුරු හරි යවා මොනවා

හරි කරන්න. කොන්ක්‍රීට් එකක් හරි දමන්න . තාර නැතිනම්. මොකද නැතිනම් එය හරි ගැටළුවකට මුහුණ පානවා. ප්‍රජා ශාලාව ඉදිරිපිට. දැන් පාර කඩලානේ අරගෙන තිබුණේ. පස් දමා. මෙය දැන් වාහන ගිහින් මේවා වෙලා තිබෙන්නේ. අනිත් එක තමයි ප්‍රජා ශාලාව . එහි ෂීට් දෙක තුනක් ගිහින් වතුර වැටෙනවා. පොඩි පොඩි වැට ටිකක් තිබෙන්නේ. මා කියනවාට කරන්න එපා. මට ඔබතුමා නොකරුවාට කිසි ප්‍රශ්නයක් නැහැ. මහජනතාවගේ වැඩ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, නිල සෙවණ හදන්න හම්බ වුණේ නැහැනේ. නිල සෙවණ හදන්න හැදුවාම කිවුවා ප්‍රජා ශාලාව ඇති කියා. ප්‍රජා ශාලවේ ඔක්කොම කරන්න පුළුවන් කිවුවා. දැන් උළුවහු දිරලා. දැන් ප්‍රජා ශාලව ගිහින් බලන්න. තින්ත නැහැ. හැම තැනම බිත්ති හිල් වෙලා. දැන් මරණාධාර සමිතියේ බඩු දමාගන්න විදියක් නැහැ. මරණාධාර සමිතියේ ගොඩක් බඩු තිබෙනවා. ඔක්කොම බඩු අඩුක්කු කර එහි දමාගෙන තිබෙනවා. දැන් මෙතුමලා කිවුවා ප්‍රජා ශාලාව හදන්න ඕනේ නැහැ. ප්‍රජා ශාලාවට කැල්ලක් එකතු කර දෙනවා කියලා. කිවුවා වගේ කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මරණාධාර සමිතියේ පොතේ මුදල් තිබෙනවා. දැන් මෙය කියලා කරන්නේ නැතිනම්. අපි සහායෝගය දෙන්නම්. මෙහි අත්තිවාරමක් සම්පූර්ණ වටේ කපා දමන්න. හැබැයි මෙහෙම දෙයක් කරන්න වෙනවා. ප්‍රජා ශාලාව වටේ ඒ මායිම් දමා ගන්න. මායිම් නොදැම්මොත් එහෙම හරි ගැටවවක් වෙනවා. එය නිරවුල් කර දෙන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

නැහැ. මරණාධාර සමිතිය නියෝජනය කරන්නේ මා. එහි එච්චර මුදලක් නැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

වැඩිහිටි සමිතියේ තිබෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

සමිතියට වෙන වැඩ කරන්න තිබෙනවා. මට කිවුවා දැන් නිල සෙවණට සටන් කරන්න එපා. දැන් එක හදා දෙන්න. දැන් නිල සෙවණ අතහැරියා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ප්‍රජා ශාලාව ගැන වරදක් තිබෙනවා නම් එය රාහුල මන්ත්‍රිතුමා එය නිවැරදි කරයි. එහි වගකීම එතුමා තමයි දරන්න වෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

එතුමායි මායි එකම ගමේනේ. එතුමා කතා කරන්නේ නැහැ එතුමාලා හදපු ගොඩනැඟිල්ල නිසා. එක විවෙචනය කිරිමක් නෙමේ. එතුමා ලොකු සේවයක් එතුමා ප්‍රජා ශාලාවට ගත් එක. මාත්

ලොකු සටනක් කරන්න ගියා. නිල සෙවණ හදන්න. දැන් නිල සෙවණත් අහිමි එකේ . එය කරන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

තාක්ෂණසේවා නිලධාරි මහතාණෙනි , ඕකන්ද ප්‍රජා ශාලාව ප්‍රතිසංස්කරණය කිරිමට ඇස්තමේන්තුවක් දෙන්න. හැබැයි ඕක හදපු කාලයත් සමඟ එය කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මෙයට කැල්ලක් එකතු කර දෙන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මඟගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, දැන් යෝජනාවක් ගෙනාවා මැෂින් පහක් ගන්නවා කියා. හරි අශෝභනයි. කොට්ඨාශ 13ම කැලේ වැටිලා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී. ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>**

අපේ මානිම්මුල්ල ආදර්ශ නිවාස වටරවුම. එම නිවාස වලට එතැන හරවන්න තිබුණ තැන. ඔබතුමා දන්නවා. දැන් ඒක වහලා තිබෙන්නේ. අනේ එය කඩලා යථා තත්ත්වයට පත් කර දෙන්න. මිනිසුන් හරියට දොස් කියනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙහි අනවසර ඉදිකිරිමක් තිබෙනවා. නගර සභාවෙන් තමයි හැදුවේ වටරවුම. වාර්තාවක් දෙන්න. එය නඩු දමා කඩන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මඟගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මා ඉල්ලිමක් කරන්නම්. නවක මන්ත්‍රිවරු ඉන්නේ. බාධා කළාම අර හිතාගෙන ඉන්න ටික කියා ගන්න බැරි වෙනවා. අශෝභන විදියට එහෙම කරන්න එපා. හරි කැතයි. මට අවස්ථා දෙකක් කවදාවත් දිලා නැහැ. මට හිතට අමාරුයි. මට තව කතා කරන්න දේවල් තිබුණා මෙතුමා සම්බන්ධව. එහෙම කරනන් එපා. මන්ත්‍රිවරුන්ගේ හඬ පාලනය කරන්න යන්න එපා. බොහොම කැතයි එක.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මඟගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

මා කනගාටුව ප්‍රකාශ කරනවා අතුල මන්ත්‍රිතුමාට . එහෙම බාධාවක් වෙනවා නම්. මා ඒ පිළිබඳව සමාව ගන්නවා. මා කනගාටු වෙනවා. අපි එහෙමයි . අවුලක් නැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

රැස්වීමේ වැඩ කටයුතු මෙයින් අවසන් කරනවා.

පස්වරු 03.30 ට ගරු සභාවේ වැඩ කටයුතු අවසන් විය.

ඩබ්.ඩී.ආර්.ජේ.රුද්‍රිගු මිය
ලේකම්
අම්බලන්ගොඩ - නගර සභාව

අරුණ ප්‍රදීප් මණිමෙල්වඩු
සභාපති
අම්බලන්ගොඩ - නගර සභාව

2020.07.31

වන දින

අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයේදී.